

ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික ආර්ථික විවරණය 2024

ශ්‍රී ලංකා මහ බැංකුව

වාර්ෂික ආර්ථික විවරණය

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 80(3) වගන්ති ප්‍රකාරව නියම වී ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරාලමින් මෙම වාර්තාව ප්‍රකාශයට පත් කර ඇත.

2024

පිටපතක මිල

මහ බැංකු කවුන්ටරයෙන් මිලදී ගැනීමේ දී - පිටපතක මිල රුපියල් 600 යි.

ISBN 978-624-5917-91-4

කොළඹ 05, හැව්ලොක් පාර, අංක 107D, දරන ස්ථානයේ පිහිටි සොෆ්ට්වේව් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින් (පුද්ගලික) සමාගම විසින් මුද්‍රණය කරන ලදුව, කොළඹ 01 ජනාධිපති මාවතේ, අංක 30 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කරන ලදී.

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
අධිපති

ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත,
කොළඹ 01, ශ්‍රී ලංකාව.

2025 අප්‍රේල් 02

අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා
මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍ය
මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විවරණය 2024

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 80(3) වගන්ති ප්‍රකාරව, මහ බැංකුව විසින්, සෑම මුදල් වර්ෂයක් අවසාන වී මාස හතරක කාල සීමාවක් ඇතුළත තම ප්‍රතිපත්ති අරමුණු සහ මූල්‍ය පද්ධතියේ තත්ත්වය අවධාරණය කරමින්, එම මුදල් වර්ෂය තුළ ආර්ථිකයේ තත්ත්වය පිළිබඳව මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්තාවක් ප්‍රසිද්ධ කර, එය ගරු මුදල් අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එම මුදල් වර්ෂය තුළ මහ බැංකුව විසින් අනුගමනය කළ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනයක් සහ තක්සේරුවක් එම වාර්තාවේ ඇතුළත් විය යුතු වේ.

මෙම නීතිමය අවශ්‍යතාව සපුරාලමින්, 2024 වර්ෂයට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද මහ බැංකුවේ දෙවන වාර්ෂික ආර්ථික විවරණය මේ සමඟ ඉදිරිපත් කරමි.

මෙයට විශ්වාසී,

පටුන

මූලික ආර්ථික දර්ශක

මූලික සමාජ දර්ශක

සමස්ත සාරාංශය

පිටුව

1.	**සාර්ව ආර්ථික ප්‍රවණතා**	
	සාරාංශය	1
1.1	උද්ධමනය සහ මිල ප්‍රවණතා	2
	1.1.1 උද්ධමනය	2
	1.1.2 මිල	5
	1.1.3 පාරිභෝගික මිල මට්ටම සහ ජීවන වියදම	6
	1.1.4 උද්ධමන අපේක්ෂා	7
	1.1.5 වැටුප්	7
1.2	මූර්ත අංශයේ ප්‍රවණතා	9
	1.2.1 ආර්ථික වර්ධනය	9
	1.2.2 නිෂ්පාදිතය	10
	1.2.3 වියදම	11
	1.2.4 ආදායම	12
	1.2.5 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය	12
	1.2.6 ආර්ථික යටිතල පහසුකම්	13
	1.2.7 සමාජ යටිතල පහසුකම්	17
1.3	මුදල් අංශයේ ප්‍රවණතා	19
	1.3.1 වෙළඳපොළ පොලී අනුපාතික	19
	1.3.2 දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව	22
	1.3.3 ණය සමස්ත	23
	1.3.4 මුදල් සමස්ත	25
1.4	විදේශීය අංශයේ ප්‍රවණතා	27
	1.4.1 ගෙවුම් තුලනය	27
	1.4.2 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, සංචිත වත්කම් සහ සමස්ත ශේෂය	40
	1.4.3 විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම්	42
	1.4.4 විනිමය අනුපාතිකයේ හැසිරීම	45
1.5	රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා	47
	1.5.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්	47
	1.5.2 රාජ්‍ය ආදායම, වියදම සහ ශුද්ධ ණය	47
	1.5.3 අයවැය හිඟය මූල්‍යනය	51
	1.5.4 මධ්‍යම රජයේ ණය	51

පිටුව

2.	**මූල්‍ය පද්ධතියේ තත්ත්වයන්**				
	සාරාංශය	...	...	...	55
2.1	බැංකු අංශය	...	...	...	56
2.2	බැංකු නොවන මූල්‍ය ආයතන අංශය	...	...	...	62
2.3	මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය	...	...	...	66
2.4	මූල්‍ය අන්තර්ගතභාවය	...	...	...	69
2.5	මූල්‍ය යටිතල පහසුකම්	...	...	...	69
2.6	තිරසර මූල්‍ය	...	...	...	72
3.	**මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය**				
	සාරාංශය	...	...	...	75
3.1	මුදල් ප්‍රතිපත්ති රාමුව	...	...	...	76
3.2	මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග	...	...	...	77
3.3	විදේශීය අංශයේ ප්‍රතිපත්ති	...	...	...	85
3.4	මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති	...	...	...	86
4.	**සාර්ව ආර්ථික ඉදිරි දැක්ම**				
	සාරාංශය	...	...	...	97
4.1	ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම	...	...	...	98
4.2	දේශීය ආර්ථිකයේ ඉදිරි දැක්ම	...	...	...	100
	4.2.1 උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම	...	...	...	100
	4.2.2 මුදල් අංශයේ ඉදිරි දැක්ම	...	...	...	102
	4.2.3 විදේශීය අංශයේ ඉදිරි දැක්ම	...	...	...	102
	4.2.4 මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම	...	...	...	103
	4.2.5 රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම	...	...	...	105
	4.2.6 වර්ධන අපේක්ෂා	...	...	...	106
4.3	සමාප්ති සටහන	...	...	...	107

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

සංඛ්‍යා සටහන්

		පිටුව
1.	**සාර්ව ආර්ථික ප්‍රවණතා**	
1.1	උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)	5
1.2	කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම	10
1.3	පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම්	11
1.4	පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක	12
1.5	කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය	13
1.6	ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය	17
1.7	පොලී අනුපාතිකවල හැසිරීම	21
1.8	මුදල් සමස්තවල ප්‍රවණතා	26
1.9	ජංගම සහ ප්‍රාග්ධන ගිණුම	28
1.10	වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය	28
1.11	වෙළඳ මිල අනුපාතයෙහි සාරාංශය (2010=100)	31
1.12	ශ්‍රී ලංකාව වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන	32
1.13	මූල්‍ය ගිණුම	39
1.14	අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (සාරාංශය)	41
1.15	දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය	41
1.16	නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය	44
1.17	විදේශීය ණය සේවාකරණ ගෙවීම්	45
1.18	විනිමය අනුපාතික වෙනස්වීම්	46
1.19	නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික	47
1.20	රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය	48
1.21	මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී)	52
2.	**මූල්‍ය පද්ධතියේ තත්ත්වය**	
2.1	මූල්‍ය අංශයේ සමස්ත වත්කම්	56
2.2	බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය	57
2.3	බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය	57
2.4	බැංකු අංශයේ තැන්පතු සංයුතිය	57
2.5	බැංකු අංශයේ ලාභදායීත්වය	58
2.6	බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය	62
2.7	සේවක අර්ථසාධක අරමුදලෙහි කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය	65

රූප සටහන්

		පිටුව
1.1	ශ්‍රී ලංකාවේ උද්ධමනයේ හැසිරීම	4
1.2	කොපාමිද. සහ මතුපිට උද්ධමනය	6
1.3	ජීවන වියදම	7
1.4	අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2018=100) (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)	8
1.5	අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2018=100) ...	8
1.6	රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2016=100) (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)	9
1.7	රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2016=100)	9
1.8	වාර්ෂික මූර්ත ද.දේ.නි. වර්ධන අනුපාතික	9
1.9	2024 වසරේ ආර්ථික කටයුතුවල වර්ධනය	11
1.10	විදුලිබල හා බලශක්ති අංශයේ ප්‍රවණතා	15
1.11	තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම	20
1.12	රජයේ සුරුකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය	22
1.13	ප්‍රධාන කෙටි කාලීන පොලී අනුපාතික සහ වෙළඳපොළ ද්‍රවශීලතාව	22
1.14	බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබාදුන් ණය	24
1.15	බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශයට ලබාදුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස	25
1.16	පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා තුඩු දුන් සාධක	27
1.17	අපනයන සංයුතිය	30
1.18	ආනයන සංයුතිය	31
1.19	ද්වීපාර්ශ්වීය වෙළඳ ශේෂයන්	32
1.20	සේවා අංශයේ ලැබීම් සහ ගෙවීම්	33
1.21	දෛනික විනිමය අනුපාතිකයේ වෙනස්වීම්	45
1.22	සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) - මුදල් වර්ග 24 පැස අනුව	47
1.23	රාජ්‍ය ආදායමේ සංයුතිය - 2024	49
1.24	රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2024	49
2.1	බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2024 අවසානයට)	57
2.2	බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක	58
2.3	බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය	58
2.4	සමස්ත ණය සහ අත්තිකාරම් (ශුද්ධ) - ණය කාණ්ඩ අනුව	62
2.5	2024 වසරේ විවට වෙළඳපොළ කටයුතු, චික්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම ...	67
2.6	මිල දර්ශකවල විචලනයන් සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය	68
2.7	කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය සහභාගීත්වය (ද්විතීයික වෙළඳපොළ)	68
2.8	කුඩා වටිනාකම් සහිත ගනුදෙනු	70
4.1	ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය	98
4.2	මතුපිට උද්ධමනයේ පුරෝකථන (කාර්තුමය සාමාන්‍යය, කොපාමිද., වාර්ෂික ලක්ෂ්‍යමය, %) ...	101
4.3	කාර්තුමය මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙහි පුරෝකතන (වාර්ෂික ලක්ෂ්‍යමය, %) ...	106

විශේෂ සටහන්

පිටුව

1. විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත වැඩිදියුණු කිරීම: සේවා වෙළඳාම පිළිබඳ ප්‍රධාන කරුණු ... 35
2. බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ 59
3. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම 78
4. මුදල් ප්‍රතිපත්තිමය වගවීම සහ උද්ධමන ඉලක්ක 82

විශේෂාංග සටහන - ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග 91

විශේෂාංග රූප සටහන්

පිටුව

1.1 දේශීය ඉන්ධන අලෙවියෙහි සහ මිල ගණන්වල ප්‍රවණතා 14
1.2 විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණයේ වැදගත්කම ... 16
1.3 මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත 29
1.4 අර්බුදයට පෙර ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සහ අර්බුදයෙන් පසු මූල්‍ය ගිණුමේ හැසිරීම ... 40
1.5 ශ්‍රී ලංකාවේ සංචිත ප්‍රමාණාත්මකතා දර්ශක වර්ධනය වීම 42
1.6 ආර්ථික අර්බුදයෙන් පසු ජාත්‍යන්තර සංචිත නැවත යථා තත්ත්වයට පත් වීම 43
1.7 නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ වන විනිමය අනුපාතික ප්‍රවණතා 46
1.8 රාජ්‍ය ආදායම, වියදම සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් 50

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

		සංඛ්‍යා සටහන
1.	**මූර්ත අංශය**	
	දළ දේශීය නිෂ්පාදිතය	1
	ජනගහනය, ශ්‍රම බලකාය සහ විදේශ සේවා නියුක්තිය	2
	කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021 = 100)	3
	ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද, 2021 = 100)	4
	වැටුප් ප්‍රමාණ දර්ශක	5
2.	**විදේශීය අංශය**	
	අපනයන සංයුතිය	6
	ආනයන සංයුතිය	7
	අපනයන වෙළඳ දිශාව	8
	ආනයන වෙළඳ දිශාව	9
	ගෙවුම් තුලනය - ජංගම ගිණුම්	10
	ගෙවුම් තුලනය - මූල්‍ය ගිණුම්	11
	අන්තර්ජාතික ආයෝජන තත්ත්වය	12
	නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය	13
	විනිමය අනුපාතිකයේ හැසිරීම (විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය)	14
3.	**රාජ්‍ය මූල්‍ය අංශය**	
	ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය මූල්‍ය කටයුතු	15
	මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී)	16
4.	**මුදල් අංශය**	
	මහ බැංකුවේ සහ වාණිජ බැංකුවල පොළී අනුපාතික	17
	ඒකාබද්ධ පුළුල් මුදල් සමීක්ෂණය - M_{2b}	18
	වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය හා අත්තිකාරම්	19
	මූල්‍ය ශක්තිමත්භාවය පිළිබඳ දර්ශක/ බැංකු අංශය	20
	මුදල් සමාගම් පිළිබඳ තොරතුරු	21

විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

					සංඛ්‍යා සටහන
1.	**මූර්ත අංශය**				
	ජනගහනය සහ ශ්‍රම බලකාය	...	...	...	1
	ජාතික නිෂ්පාදිතය	...	...	...	2
	මිල	...	...	...	3
2.	**විදේශීය අංශය**				
	ගෙවුම් තුලනය	...	...	...	4
	සංචිත, මුළු විදේශීය වත්කම්, විදේශීය ණය සහ විනිමය අනුපාතික		...	...	5
3.	**රාජ්‍ය මූල්‍ය අංශය**				
	රාජ්‍ය මූල්‍ය කටයුතු	...	...	...	6
	මධ්‍යම රජයේ ණය	...	...	...	7
4.	**මුදල් අංශය**				
	පොලී අනුපාතික	...	..	..	8
	මුදල් සමීක්ෂණය (M_{2b})	...	..	..	9

සංඛ්‍යා සටහන් සඳහා අදාළ විග්‍රහ හා විස්තර සටහන් සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

පහත දැක්වෙන පොදු සටහන් එක් එක් සංඛ්‍යා සටහනෙහි පාදක සටහන් සඳහා පරිපූරක වෙයි.

1. සම්පූර්ණත්වය සඳහා සමහර සංඛ්‍යා සටහන්වල තාවකාලික සංඛ්‍යාවන් ඇතුළත් කොට ඇත.
2. ඇතැම් සංඛ්‍යා සටහන්වල සංඛ්‍යාවන් ආසන්නම පූර්ණ සංඛ්‍යාවට දක්වා ඇත. එබැවින් දක්වා ඇති එකතුවෙහිත්, සංඛ්‍යා එකතු කළ විට ලැබෙන මුළු එකතුවෙහිත් සුළු වෙනස්කම් පැවතිය හැක.
3. කලින් පළ කොට ඇති සංඛ්‍යාවන්ගෙන් වෙනස් වන්නේ, පසුව කළ සංශෝධන නිසාය.
4. වරහන් තුළ සඳහන් කර ඇති සංඛ්‍යා ඍණ වටිනාකම වේ.
5. පහත සඳහන් සංකේතයන් යොදා ඇත.

... = සැලකිය යුතු නොවේ

\- = නැත

ලැ.නො. = ලැබී නොමැත

මූලික ආර්ථික දර්ශක

	2018	2019	2020	2021	2022	2023	2024(අ)
ජනගහනය							
මධ්‍ය වාර්ෂික ජනගහනය (පුද්ගලයන් දහස්) (ආ)(ඇ)	21,670	21,803	21,919	22,156	22,181	22,037	**21,916**
මධ්‍ය වාර්ෂික ජනගහනයෙහි වර්ධන අනුපාතය (%) (ආ)	1.1	0.6	0.5	1.1	0.1	-0.6	**-0.5**
ජනගහන ඝනත්වය (වර්ග කි.මී. ට පුද්ගලයන්) (ආ)	346	348	350	353	354	351	**352**
ශ්‍රම බලකාය (පුද්ගලයන් දහස්) (ඈ)	8,388	8,592	8,467	8,553	8,547	8,408	**8,316**(ඉ)
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (%) (ඈ)	51.8	52.3	50.6	49.9	49.8	48.6	**47.4**(ඉ)
සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ %ක් ලෙස) (ඈ)	4.4	4.8	5.5	5.1	4.7	4.7	**4.4**(ඉ)
නිමැවුම (රු)							
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.හි. (රුපියල් බිලියන)	15,352	15,911	15,646	17,612	24,063 (උ)	27,420 (අ)(උ)	**29,899**
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (රුපියල් බිලියන)	14,962	15,470	15,223	17,217	23,446 (උ)	26,586 (අ)(උ)	**29,154**
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.හි. (ඒ.ජ. ඩොලර් බිලියන) (උ)	94.7	89.0	84.4	88.6	76.8 (උ)	83.8 (අ)(උ)	**99.0**
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.ජා.ආ. (ඒ.ජ. ඩොලර් බිලියන) (උ)	92.4	86.5	82.1	86.6	75.0 (උ)	81.2 (අ)(උ)	**96.5**
ඒක පුද්ගල ද.දේ.හි. පවත්නා වෙළඳපොළ මිල අනුව (රුපියල්) (ඒ)	708,442	729,761	713,821	794,926	1,084,855 (උ)	1,244,262 (අ)(උ)	**1,364,235**
ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (රුපියල්) (ඒ)	690,463	709,516	694,520	777,073	1,057,035 (උ)	1,206,441 (අ)(උ)	**1,330,255**
ඒක පුද්ගල ද.දේ.හි. පවත්නා වෙළඳපොළ මිල අනුව (ඒ.ජ. ඩොලර්) (උ)(ඒ)	4,372	4,082	3,851	3,999	3,464 (උ)	3,801 (අ)(උ)	**4,516**
ඒක පුද්ගල ද.ජා.ආ. පවත්නා වෙළඳපොළ මිල අනුව (ඒ.ජ. ඩොලර්) (උ)(ඒ)(ඒ)	4,263	3,968	3,747	3,910	3,379 (උ)	3,685 (අ)(උ)	**4,404**
මූර්ත නිමැවුම (වෙනස්වීමේ %) (ර)							
දළ දේශීය නිෂ්පාදිතය	2.3	-0.2	-4.6	4.2	-7.3 (උ)	-2.3 (අ)(උ)	**5.0**
දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රධාන ආර්ථික කටයුතු							
කෘෂිකර්මය	6.3	0.5	-0.9	1.0	-4.1 (උ)	1.6 (අ)(උ)	**1.2**
කාර්මික	-1.1	-4.1	-5.3	5.7	-16.0 (උ)	-9.2 (අ)(උ)	**11.0**
සේවා	4.3	2.9	-1.9	3.4	-2.6 (උ)	-0.2 (අ)(උ)	**2.4**
දළ ජාතික ආදායම	2.2	-0.5	-4.5	4.7	-7.6 (උ)	-2.8 (අ)(උ)	**5.5**
සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් (ද.දේ.හි. % ක ලෙස) (ර)							
පරිභෝජනය	68.9	71.7	73.3	70.7	76.3 (උ)	77.6 (අ)(උ)	**75.7**
පෞද්ගලික	60.3	62.7	62.9	61.2	69.1 (උ)	70.8 (අ)(උ)	**68.7**
රජය	8.6	9.0	10.4	9.5	7.2 (උ)	6.8 (අ)(උ)	**7.0**
ආයෝජනය	38.1	34.1	32.9	36.7	27.3 (උ)	24.6 (අ)(උ)	**27.0**
භාණ්ඩ සහ සේවා ශුද්ධ අපනයන	-6.9	-5.8	-6.2	-7.4	-3.6 (උ)	-2.2 (අ)(උ)	**-2.6**
භාණ්ඩ සහ සේවා අපනයන	21.4	21.8	15.5	16.9	21.6 (උ)	20.7 (අ)(උ)	**19.9**
භාණ්ඩ සහ සේවා ආනයන	28.4	27.6	21.6	24.3	25.1 (උ)	22.8 (අ)(උ)	**22.5**
දේශීය ඉතිරිකිරීම්	31.1	28.3	26.7	29.3	23.7 (උ)	22.4 (අ)(උ)	**24.3**
විදේශීය ශුද්ධ ප්‍රාථමික සහ ද්විතීයික ආදායම	4.0	3.7	4.7	3.6	2.3 (උ)	3.9 (අ)(උ)	**4.0**
ජාතික ඉතිරිකිරීම්	35.1	32.0	31.3	33.0	26.0 (උ)	26.3 (අ)(උ)	**28.3**
මිල සහ වැටුප් (වෙනස්වීමේ %)							
කො.පා.මී.ද. (2021 = 100) - වාර්ෂික සාමාන්‍යය	-	-	-	-	-	17.4	**1.2**
කො.පා.මී.ද. (2021 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත (කාලපරිච්ඡේදය අවසානයට)	-	-	-	-	-	4.0	**-1.7**
කො.පා.මී.ද. (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය (ඕ)	4.3	4.3	4.6	6.0	46.4	-	**-**
කො.පා.මී.ද. (2013 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත (කාලපරිච්ඡේදය අවසානයට) (ඕ)	2.8	4.8	4.2	12.1	57.2	-	**-**
ජා.පා.මී.ද. (2021 = 100) - වාර්ෂික සාමාන්‍යය	-	-	-	-	-	16.5	**1.6**
ජා.පා.මී.ද. (2021 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත (කාලපරිච්ඡේදය අවසානයට)	-	-	-	-	-	4.2	**-2.0**
ජා.පා.මී.ද. (2013 = 100) - වාර්ෂික සාමාන්‍යය (ඕ)	2.1	3.5	6.2	7.0	50.4	-	**-**
ජා.පා.මී.ද. (2013 = 100) - වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත (කාලපරිච්ඡේදය අවසානයට) (ඕ)	0.4	6.2	4.6	14.0	59.2	-	**-**
හි.මී.ද. (2018 4 වන කාර්තුව = 100) - වාර්ෂික සාමාන්‍යය	-	-	5.8	10.9	74.0	11.5	**...**
ද.දේ.හි. අවධමනකය (ඊ)	4.3	3.9	3.1	8.0	47.5 (උ)	16.7 (අ)(උ)	**3.8**
ද.ජා.ආ. අවධමනකය (ඊ)	4.4	3.9	3.0	8.1	47.4 (උ)	16.7 (අ)(උ)	**3.9**
නාමික වැටුප් ප්‍රමාණ දර්ශක							
විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (1978 දෙසැ. = 100) - වාර්ෂික සාමාන්‍යය (ක)	0.6	2.9	0.2	74.4	9.8	0.4	**0.1**
රාජ්‍ය අංශයේ සේවකයන් (2016 = 100) - වාර්ෂික සාමාන්‍යය	0.2	4.7	9.2	-	16.1	-	**18.5**
අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන් (2018 = 100) - වාර්ෂික සාමාන්‍යය	-	-	6.4	9.2	24.5	11.4	**6.0**
විදේශ වෙළඳාම							
වෙළඳ ශේෂය (ඒ.ජ. ඩොලර් මිලියන)	-10,343	-7,997	-6,008	-8,139	-5,185	-4,900	**-6,069**
අපනයන	11,890	11,940	10,047	12,499	13,106	11,911	**12,772**
ආනයන	22,233	19,937	16,055	20,637	18,291	16,811	**18,841**
වෙළඳ මිල අනුපාතය (වෙනස්වීමේ %)	0.02	-1.6	2.5	-8.6	-11.6	-0.6	**1.3**
අපනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %)	4.2	-6.3	-6.8	5.4	0.9	-11.3	**-3.7**
ආනයන ඒකක වටිනාකම් දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %)	4.1	-4.8	-9.1	15.2	14.1	-10.8	**-4.9**
අපනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %)	0.5	7.2	-9.7	18.0	3.9	2.4	**11.3**
ආනයන පරිමා දර්ශකය (2010 = 100) (වෙනස්වීමේ %)	1.8	-5.8	-11.4	11.5	-22.4	3.0	**17.9**
විදේශ මූල්‍ය (ඒ.ජ. ඩොලර් මිලියන)							
සේවා හා ප්‍රාථමික ආදායම් ගිණුම (ශුද්ධ)	1,381	388	-1,386	-373	240	505 (උ)	**836**
ජංගම පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ)	6,155	5,757	6,194	5,221	3,493	5,815	**6,429**
ජංගම නිල සංක්‍රාම (ශුද්ධ)	8	9	13	6	3	20	**10**
ජංගම ගිණුමේ ශේෂය	-2,799	-1,843	-1,187	-3,284	-1,448	1,439 (උ)	**1,206**
සමස්ත ශේෂය	-1,103	377	-2,328	-3,967	-2,806	2,826	**2,890**

(අ) තාවකාලික
(ආ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව
(ඇ) 2012 ජන හා නිවාස සංගණනය මත පදනම්ව ඇත.
(ඈ) ශ්‍රම බලකාය ගණනය කිරීමේ දී වයස අවුරුදු 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය සලකා බලනු ලැබේ.
(ඉ) කාර්තු තරංගහිත සාමාන්‍යය මත පදනම් වේ.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු මාසයේ දී නිකුත් කරන ලද ද.දේ.හි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.
(උ) සංශෝධිත
(ඌ) 2015 සිට කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතිකය යොදාගෙන ද.දේ.හි./ද.ජා.ආ., ඒ.ජ. ඩොලර්වලින් ගණනය කර ඇත.
(ඒ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඒ) ඒ.ජ. ඩොලර්වලින් ද.ජා.ආ. ගණනය කිරීම් සඳහා වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතික හා සැසඳීමේ දී කාර්තුමය සාමාන්‍ය විනිමය අනුපාතික භාවිතය තුළින් ඇතිවන වෙනස්කම් හේතුවෙන් මෙම අගයන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අගයන්ගෙන් වෙනස් විය හැකිය.
(ඔ) මෙම දර්ශකය ගණනය කිරීම 2023 පෙබරවාරි මස සිට අත්හිටුවා ඇත.
(ඕ) මෙම දර්ශකය ගණනය කිරීම 2023 ජනවාරි මස සිට අත්හිටුවා ඇත.
(ක) පඩිපාලක සභා මඟින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර් = 100) මඟින් ගණනය කරනු ලබයි.

මූලික ආර්ථික දර්ශක (සම්බන්ධයි)

	2018	2019	2020	2021	2022	2023	2024 (අ)
ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි. %ක් ලෙස) (ඊ)(ග)	-3.0	-2.1	-1.4	-3.7	-1.9	1.7(උ)	**1.2**
මුළු විදේශීය වත්කම් (වීම වර්ෂයේ ආනයන වටිනාකම් අනුව මාස ගණන) (ඒ)	5.2	6.3	6.4	3.6	3.9	6.7	**7.2**
දළ නිල සංචිත (වීම වර්ෂයේ ආනයන වටිනාකම් අනුව මාස ගණන)	3.7	4.6	4.2	1.8	1.2	3.1	**3.9**
සම්මත ණය සේවා අනුපාතය (ජ)							
භාණ්ඩ හා සේවා අපනයනයේ %ක් ලෙස	28.9	29.7	35.2	30.7	15.4	15.9	**21.1**
ජංගම ලැබීම්වල %ක් ලෙස	21.3	21.8	22.6	22.3	12.3	11.6	**15.4**
මුළු විදේශීය ණය: වෙළඳපොළ අගය මත පදනම්ව (ද.දේ.නි. %ක් ලෙස) (ඊ)(ග)	55.3	61.6	58.1	58.4	64.6	64.8(උ)	**57.7**
විනිමය අනුපාතික							
වර්ෂය අවසානයේ දී							
එ.ප. ඩොලරයකට රුපියල්	182.75	181.63	186.41	200.43	363.11	323.92	**292.58**
ඒ.ගැ.හි. ඒකකයකට රුපියල් (ට)	253.51	251.17	268.48	280.53	483.24	434.60	**381.57**
වාර්ෂික සාමාන්‍යය							
එ.ප. ඩොලරයකට රුපියල්	162.54	178.78	185.52	198.88	324.55	327.53	**302.12**
ඒ.ගැ.හි. ඒකකයකට රුපියල් (ට)	229.90	246.97	258.61	283.18	431.91	436.88	**401.07**
නා.ඇ.ඒ.අ. (2017= 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැස) (ඩ)	94.05	88.17	85.93	78.64	53.99	53.30	**58.56**
මූ.ඇ.ඒ.අ. (2017 = 100) (ව්‍යවහාර මුදල් වර්ග 24 කින් සමන්විත පැස) (ඩ)(ත)	95.45	90.42	91.52	83.58	77.49	71.73	**74.77**
රාජ්‍ය මූල්‍ය (ද.දේ.නි.යෙහි %ක් ලෙස) (ඊ) (උ)							
ආදායම සහ ප්‍රදාන	12.6	11.9	8.8	8.3	8.4	11.2	**13.7**
ආදායම	12.5	11.9	8.7	8.3	8.2	11.1	**13.5**
ඉන්, බදු ආදායම	11.2	10.9	7.8	7.4	7.3	9.9	**12.4**
ප්‍රදාන	0.1	...	...	...	0.1	0.1	**0.2**
වියදම් හා ශුද්ධ ණය දීම්	17.5	21.0	19.4	20.0	18.6	19.5	**20.5**
පුනරාවර්තන වියදම්	13.6	15.2	16.3	15.6	14.6	17.1	**17.9**
ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්	3.9	5.7	3.1	4.4	4.0	2.4	**2.6**
වර්තන ගිණුමේ ශේෂය	-1.1	-3.4	-7.5	-7.3	-6.4	-6.0	**-4.4**
ප්‍රාථමික ශේෂය	0.6	-3.4	-4.4	-5.7	-3.7	0.6	**2.2**
සම්මත අයවැය ශේෂය	-5.0	-9.0	-10.7	-11.7	-10.2	-8.3	**-6.8**
අයවැය හිඟය මූල්‍යනය	5.0	9.0	10.7	11.7	10.2	8.3	**6.8**
විදේශීය	2.1	3.4	-0.5	-0.1	1.8	1.8	**1.1**
දේශීය	2.8	5.6	11.2	11.8	8.5	6.5	**5.7**
මධ්‍යම රජයේ ණය (ත)	78.4	81.9	96.6	100.0	114.2 (උ)	104.7 (ප)	**96.1(ක)**
විදේශීය	38.8	39.0	38.7	37.0	51.8 (උ)	42.5 (ප)	**34.9(ක)**
දේශීය (ඛ)	39.5	42.9	57.9	63.0	62.5 (උ)	62.2 (ප)	**61.2(ක)**
මුදල් සම්පත (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස - %)							
සංචිත මුදල්	2.3	-3.0	3.4	35.4	3.3	-1.5	**15.8**
පටු මුදල් (M_1)	4.7	4.2	36.0	24.0	-0.4	14.1	**16.1**
පුළුල් මුදල් (M_{2b})	13.0	7.0	23.4	13.2	15.4	7.3	**8.6**
බැංකු ක්‍රමය සතු ශුද්ධ විදේශීය වත්කම්	-155.1	250.3	-308.0	-368.8	-79.9	74.2	**225.6**
බැංකු ක්‍රමය සතු ශුද්ධ දේශීය වත්කම්	16.3	4.6	27.8	20.9	20.9	-2.9	**0.8**
බැංකු ක්‍රමය මඟින් සපයන ලද දේශීය ණය							
රජයට (ශුද්ධ)	16.1	11.1	62.7	28.2	28.1	10.9	**-0.2**
රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට	40.7	8.3	22.5	18.6	47.3	-56.0	**-14.7**
පෞද්ගලික අංශයට	15.9	4.2	6.5	13.1	6.2	-0.6	**10.7**
M_{2b} සඳහා මුදල් ගුණකය (වර්ෂ අවසාන)	7.42	8.18	9.75	8.15	9.11	9.93	**9.30**
M_{2b} හි සංසරණ ප්‍රවේගය (වර්ෂය සඳහා සාමාන්‍යය) (ඊ)	2.27	2.16	1.84	1.73	2.04	2.17(උ)	**2.18**
පොලී අනුපාතික (වර්ෂ අවසානයේදී වර්ෂයකට %)							
එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) (ම)	-	-	-	-	-	-	**8.00**
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) (ම)	8.00	7.00	4.50	5.00	14.50	9.00	**7.50**
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) (ම)	9.00	8.00	5.50	6.00	15.50	10.00	**8.50**
බැංකු අනුපාතිකය (ය)	15.00	15.00	8.50	9.00	30.22	14.50	**10.00**
ගෙනෙහිර පොලී අනුපාතිකය/වෙළඳපොළ පොලී අනුපාතිකය (ර)	9.08	11.50	11.64	10.12	7.48	16.97	**15.15**
මුදල් වෙළඳපොළ පොලී අනුපාතික							
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය	8.95	7.45	4.55	5.95	15.50	9.24	**8.00**
භාණ්ඩාගාර බිල්පත් ඵලදු අනුපාතික							
දින - 91	10.01	7.51	4.69	8.16	32.64	14.51	**8.62**
දින - 364	11.20	8.45	5.05	8.24	29.27	12.93	**8.96**
තැන්පතු අනුපාතික							
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය	8.81	8.20	5.80	4.94	14.06	11.64	**7.53**
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය	10.85	10.05	7.14	5.94	18.49	14.88	**9.27**
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය	10.94	8.89	4.93	6.45	23.07	11.06	**6.52**
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය	11.27	9.17	5.08	6.67	23.73	11.33	**6.57**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ තැන්පතු අනුපාතිකය	4.00	4.00	3.50	3.50	3.00	3.00	**3.00**
ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මාස 12 ස්ථාවර තැන්පතු අනුපාතිකය	10.50	9.83	5.25	5.50	12.00	8.00	**7.00**
ණය පොලී අනුපාතික							
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය-සතිපතා	12.09	9.74	5.81	8.61	27.24	12.13	**8.90**
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය	14.40	13.59	10.29	9.87	18.70	14.21	**11.93**
වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය	14.54	12.80	8.38	9.48	26.20	14.38	**10.77**
ප්‍රාග්ධන වෙළඳපොළ							
සම්මත කොටස් මිල දර්ශකය (1985 = 100)	6,052.4	6,129.2	6,774.2	12,226.0	8,489.7	10,654.2	**15,944.6**
S&P SL20 දර්ශකය (2004 දෙසැ. = 1,000)	3,135.2	2,937.0	2,638.1	4,233.3	2,635.6	3,068.4	**4,862.1**
ගනුදෙනු කළ කොටස් වටිනාකම (රුපියල් මිලියන)	200,069	171,408	396,882	1,173,157	686,602	410,629	**537,635**
ශුද්ධ විදේශීය මිලදී ගැනීම් (රුපියල් මිලියන)	-23,239	-11,735	-51,356	-52,648	30,625	4,363	**-10,479**
වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රුපියල් බිලියන)	2,839.5	2,851.3	2,960.7	5,489.2	3,847.2	4,248.9	**5,695.6**

(ග) එ.ප. ඩොලර්වලින් ගණනය කරන ලද ද.දේ.නි. මත පදනම් වේ.

(ඒ) විදේශීය සෘජු ආයෝජන සහ වෙළඳ ණය සහ අත්තිකාරම් ලෙස ලද විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ජ) සම්මත ණය සේවා අනුපාතය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ.අ.) විදේශීය ණය සංඛ්‍යාන සංස්කරණය (2003)ට අනුරූප වන පරිදි ණය සේවාකරණය ඇතුළත් වන ලෙස ප්‍රතිවිමර්ශනාත්මක කර ඇත.

(ට) ජා.මූ.අ. ගිණුම් ඒකකය වන විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)

(ඩ) විනිමය අනුපාතික, දර්ශකයක් අනුව ඇවර දක්වා ඇති අතර, ඒ අනුව අගෙනකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සවල විනිමය අනුපාතික දර්ශකවල අගය ඉහළැයෙම හෝ පහළැයෙම මඟින් සෘජුවම පිළිබිඹු වේ.

(ත) මූර්ත සවල විනිමය අනුපාතිකය (මූ.ඇ.ඒ.අ.) ගණනය කිරීම සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකය භාවිතා කර ඇත. මූ.ඇ.ඒ.අ. ගණනය කරනුයේ පසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නාමික සවල විනිමය අනුපාතිකයට (නා.ඇ.ඒ.අ.) ගැලපීම මඟිනි.

(ද) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය ආංශයේ සංඛ්‍යාලේඛන කිහිපයක් සංශෝධනය කර ඇත.

(න) 2014 වසරේ දී ජා.මූ.අ. විසින් ප්‍රකාශයට පත් කරන ලද රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශයන්ට අනුව, අගෝස්තික ගොපියවූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසික ගොපියවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර 2019 වසරේ සිට දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, ණය පිළිබඳ දත්ත ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත. තවද, මූල්‍ය, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (මුදල් අමාත්‍යාංශය) යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (රා.ණ.ක.කා) පිහිටුවීමත් සමඟ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන මඟින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ව්‍යාකූල කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම රා.ණ.ක.කා. සතුවේ. ඒ අනුව, රා.ණ.ක.කා. විසින් ප්‍රකාශයට පත් කරන ලද කාර්තුමය ණය දත්ත ප්‍රකාශනය, ණය සංඛ්‍යාලේඛන සඳහා නිල මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ. දත්ත අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මහ බැංකුව මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබෙන දත්ත මත පදනම්ව මෙම ණය දත්ත සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇත.

(ප) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ හොඟවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක්වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලට අදාළව හොඟවූ ණය පොලී ගෙවීම් මෙම හොඟවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ. 2023 වසරේ සිට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අදල නොවේ.

(බ) 2022 වසර දක්වා මහ බැංකුවේ මූල්‍ය සමීක්ෂණයෙහි වාර්තා කර ඇති මධ්‍යම රජය වාණිජ බැංකු වෙත ඇති වගකීම් දේශීය ණය සම්පාදනය කිරීමට යොදා ගන්නා ලදී. 2023 වසරේ සිට ඉදිරියට දේශීය ණය සම්පාදන ක්‍රමය වෙනස් කර ඇති අතර එය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් තහවුරු කරන ලද දත්ත මත පදනම් වේ.

(භ) 2024 ඔක්තෝම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි විස්ථිත ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස ඒරව දක්වේ. මහ බැංකුව විසින් තීරණය කරන ලද ආන්තිකයක් සමඟ නිත්‍ය තැන්පතු පොලී අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කර ඇත.

(ය) අවසාන ණය ලබා දෙන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු ආයතනවලට සපයනු ලබන ආන්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය වේ.

(ර) ගෙනෙහිර පොලී අනුපාතිකය 1990 අංක 6 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ නීත්‍යනුකූල නිතිමය ක්‍රියාමාර්ගයක ප්‍රතිඵල වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයක දී රුපියල් 150,000කට වඩා වැඩි ණය මුදලක් අය කර ගැනීමේ දී ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් හොමැති විටක ඇදාළ වේ. සෑම වසරක් සඳහා වූ ගෙනෙහිර පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අතර ඉදිරි වසර සඳහා අදාළ වන පොලී අනුපාතිකය පෙර වසරේ දෙසැම්බර් මාසයේදී රජයේ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2025 වසර සඳහා වූ ගෙනෙහිර පොලී අනුපාතිකය සහ වෙළඳපොළ අනුපාතිකය වාර්ෂිකව 12.12%ක් වේ.

මූලික සමාජ දර්ශක

භෞතික ලක්ෂණ සහ දේශගුණය

භූගෝලීය පිහිටීම

උතුරු අක්ෂාංශ 5º 55' සහ 9º 50' අතර
නැගෙනහිර දේශාංශ 79º 41' සහ 81º 53' අතර

දුර ප්‍රමාණය

උතුරේ සිට දකුණට කි.මී. 433 (සැතපුම් 269) (උපරිම දිග)
බටහිර සිට නැගෙනහිරට කි.මී. 241(සැතපුම් 150) (උපරිම පළල)

උස ප්‍රමාණය

උපරිම උස මීටර් 2,525 (අඩි 8,284)

භූමි ප්‍රමාණය

මුළු ප්‍රමාණය	:	වර්ග කි.මී. 67,240	භූමි ප්‍රමාණය	:	වර්ග කි.මී. 62,302
අභ්‍යන්තර ජලාශ	:	වර්ග කි.මී. 3,186	කලපු ප්‍රමාණය	:	වර්ග කි.මී. 1,406.5
මුහුදු බොක්ක	:	වර්ග කි.මී. 345.5			

දේශගුණය

පහත රට	:	අවම 25.1º සෙල්සියස් - උපරිම 32.5º සෙල්සියස්
කඳු රට	:	අවම 19.2º සෙල්සියස් - උපරිම 28.0º සෙල්සියස්
වාර්ෂික වර්ෂාපතනය (සාමාන්‍යය)	:	2022 : 2,371 මිලි මීටර 2023 : 2,536 මිලි මීටර

ජනගහනය සහ ජීව සංඛ්‍යාති

ජනගහන සංඛ්‍යාති (අ)

මධ්‍ය වාර්ෂික ජනගහනය ('000) (2024)	: 21,916
වයස් කාණ්ඩ අනුව ව්‍යාප්තිය ('000) (2024)	
අවු 0 - 14	: 5,538
අවු 15 - 64	: 14,662
අවු 65 සහ ඊට වැඩි	: 1,716
ජනගහන ඝනත්වය වර්ග කි.මී. ට පුද්ගලයින් (2024)	: 352
දළ උපත් අනුපාතය ජනගහනය 1,000කට (2024)	: 10.1
දළ මරණ අනුපාතය ජනගහනය 1,000කට (2024)	: 7.8
ස්වාභාවික වර්ධන වේගය ජනගහනය 1,000කට (2024)	: 2.3
ළදරු මරණ අනුපාතය සජීවී උපත් 1,000කට (2020)	: 6.4 (සංශෝධිත)
යැපීම් අනුපාතය (2024)	: 49.5%
සාමාන්‍ය ගෘහ ඒකකයක සාමාජික සංඛ්‍යාව (2019) (ආ)	: 3.7

සේවා නියුක්තිය (2024)

සේවා නියුක්තිකයන් ('000) (ඈ)	: 7,910
කෘෂිකර්මාන්ත	: 25.7%
කර්මාන්ත	: 25.5%
සේවා	: 48.8%
රාජ්‍ය අංශයේ සේවකයන් සංඛ්‍යාව ('000) (ඉ)	: 1,336
රාජ්‍ය අංශය	: 84.9%
රජය සතු ව්‍යවසායයන්	: 15.1%

ආදායම් ව්‍යාප්තිය (ආ)

ගෘහ ඒකක ආදායමේ ගිනි සංගුණකය (2019)	: 0.46
මධ්‍යන්‍ය ගෘහ ඒකක ආදායම (2019)	: මසකට රුපියල් 76,414
මධ්‍යස්ථ ගෘහ ඒකක ආදායම (2019)	: මසකට රුපියල් 53,333

දරිද්‍රතාව (ආ)

දිනකට ලබා ගන්නා කිලෝ කැලරි ප්‍රමාණය (2019)	: 2,120
ජනගහන දරිද්‍රතා දර්ශකය (ඇ)	: 14.3 (2019)
	: 16.0 (2016)
	: 22.5 (2012/13)

මානව සංවර්ධන දර්ශකය (2022) : 0.780
රටවල් 193 ක් අතර ශ්‍රී ලංකාවේ තත්ත්වය : 78

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය (2021) : 0.796

ආර්ථික සහ ව්‍යාපාර පරිසරය උපදර්ශකය	: 0.825
ජන ජීවිතයේ යහපැවැත්ම උපදර්ශකය	: 0.786
සමාජ ආර්ථික යටිතල පහසුකම් උපදර්ශකය	: 0.777

උපතේදී ජීවිත අපේක්ෂාව (2017) : අවු 75.5

සාක්ෂරතාව (2023) (ඈ)

සාමාන්‍ය	: 93.2%
පිරිමි	: 94.0%
ගැහැණු	: 92.6%

භෞතික, සමාජ සහ මූල්‍ය යටිතල පහසුකම්

	ඒකකය	2024		ඒකකය	2024
ප්‍රවාහනය			**ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව**		
මහා මාර්ගවල දිග ප්‍රමාණය (ඒ සහ බී)	කි.මී.	12,263	පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය	%	98.8
අධිවේගී මාර්ගවල දිග ප්‍රමාණය	කි.මී.	312.6	නළ ජල පහසුකම් සඳහා ප්‍රවේශය	%	63.1
මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන දුම්රිය මාර්ගවල දිග ප්‍රමාණය (2022)	කි.මී.	1,610.9			
විදුලිබලය			**සාමාන්‍ය අධ්‍යාපනය (2023)**		
විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය (2016)	%	99.3	පාසලකින් ආවරණය වන භූමි ප්‍රමාණය (ඒ)	වර්ග කි.මී.	6.5
ඒක පුද්ගල විදුලිබල පරිභෝජනය	කි.වොපැ.	693.2	ගුරු/ශිෂ්‍ය අනුපාතය (ඒ)	සංඛ්‍යාව	16.3
පණිවිඩ හුවමාරුව			වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි)	%	89.1
දුරකථන ඝනත්වය			ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය	%	83.1
ස්ථාවර දුරකථන	පුද්ගලයින් 100කට	9.7			
ජංගම දුරකථන ද ඇතුළත්ව	පුද්ගලයින් 100කට	141.2			
අන්තර්ජාල ඝනත්වය (ඊ)	පුද්ගලයින් 100කට	105.6			
තැපැල් කාර්යාලයකින් සේවාව ලබන පුද්ගලයන්	සංඛ්‍යාව	5,296	**විශ්වවිද්‍යාල අධ්‍යාපනය (ඒ)**		
			ගුරු/ශිෂ්‍ය අනුපාතය	සංඛ්‍යාව	23.0
මූල්‍ය ආයතන			වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (වයස අවුරුදු 18-22) (ඔ)	%	9.9
බැංකු			අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ ප්‍රමාණය	%	64.3
බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛා (උ)	සංඛ්‍යාව	2,936	ඇතුළත්වීම් - සුදුසුකම් ලැබුවන්ගේ %ක් ලෙස	%	24.9
බලපත්‍රලාභී විශේෂිත බැංකු ශාඛා (උ)	සංඛ්‍යාව	706	අධ්‍යාපනය සඳහා රජයේ වියදම (ඕ) (2023)	දැ.දේ.හි. %ක් ලෙස	1.6
භාවිතයේ පවතින ණය කාඩ්පත්	පුද්ගලයින් 100,000කට	9,081			
බැංකු ඝනත්වය	පුද්ගලයින් 100,000කට බැංකු ශාඛා	17			
අනෙකුත් මූල්‍ය සමාගම්					
බලපත්‍රලාභී මුදල් සමාගම් ශාඛා	සංඛ්‍යාව	1,908	**මහජන සෞඛ්‍යය**		
විශේෂිත කල්බදු සමාගම් ශාඛා (උඅ)	සංඛ්‍යාව	05	ආරෝග්‍යශාලා ඇඳන් (ක)	පුද්ගලයින් 1,000කට	4.1
බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශාඛා	සංඛ්‍යාව	134	වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් (ක)	සංඛ්‍යාව	985
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs),			හෙද සේවක (ක)	පුද්ගලයින් 10,000කට	17.8
මුදල් ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර (CRMs) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs)	පුද්ගලයින් 100,000කට	33	සෞඛ්‍ය සඳහා රජයේ වියදම (2023)	දැ.දේ.හි. %ක් ලෙස	1.5

සටහන: 2024 වර්ෂය සඳහා වන දත්ත තාවකාලික වේ.

මූලාශ්‍ර: අදාළ ආයතන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාලේඛන

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2019 මත පදනම් වේ.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණ වාර්තාවේදී, 2002 සමීක්ෂණ දත්ත මත පදනම්ව ගණනය කළ ගිනි දර්ශක දේබාව, 2012/13 සමීක්ෂණ දත්ත භාවිතයෙන් සංශෝධනය කර ඇත. ගිනි දර්ශක දේබාවේ සංශෝධනය සමඟ, ජනගහන දර්ශක දත්ත ද සංශෝධනය කර ඇත.
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයේ 2024 පළමු කාර්තු තුනෙහි සාමාන්‍යය මත පදනම් වේ.
(ඉ) මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද දත්ත මත පදනම් වේ.
(උ) ජංගම අන්තර්ජාල සේවා ඇතුළත්ය.
(උඅ) සිසු තැන්පතු ඒකක රහිතව සියලු බැංකු ශාඛා
(උආ) අනෙකුත් ඒකක ද ඇතුළත් වේ.
(ඒ) රජයේ පාසල් පමණි.
(ඒඒ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලවල සොරතුරු ඇතුළත් වේ.
(ඔ) අභ්‍යන්තර වශයෙන් ලියාපදිංචි සිසුන් පමණක් ඇතුළත් වේ.
(ඕ) සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම්
(ක) 2023 ජූනි අවසානයට

සමස්ත සාරාංශය

වසර දෙකකට පෙර අත්විඳින ලද දරුණුතම ආර්ථික පසුබෑමෙන් පසුව, 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම අඛණ්ඩව සිදු විය. යථා තත්ත්වයට පත් වීමේ මාවත දුෂ්කර වූවද, අධික ණය බර හේතුවෙන් පීඩාවට පත් වූ බොහෝ රටවලට සාපේක්ෂව, එය සැලකිය යුතු ලෙස වේගවත්ව සිදු විය. අර්බුදයෙන් පසු ක්‍රියාවට නැංවූ ප්‍රතිසංස්කරණවල ධනාත්මක ප්‍රතිඵල පෙන්නුම් කිරීම ආරම්භ වී ඇත. ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩිදියුණු වීම, මිලදී ගැනීමේ හැකියාව යම් දුරකට යථා තත්ත්වයට පත්වීම සහ අවිනිශ්චිතතා අඩු වීම පිළිබඳ සලකුණු දක්නට ලැබේ. ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වීම සහ ප්‍රතිපත්ති නොවෙනස්ව පවත්වා ගෙන යෑම පිළිබඳව වූ පැහැදිලිභාවයන් සමඟ, මැතිවරණ ආශ්‍රිත අවිනිශ්චිතතා 2024 වසරේ අගභාගය වන විට පහව ගියේය. මේ සමඟ ම, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම බොහෝ දුරට අවසන් වීම සහ "සීමිත පැහැර හැරීමේ" ශ්‍රේණිගත කිරීමෙන් රට ඉවත්වීම ආයෝජකයන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීමට සමත් වී ඇත.

ආර්ථික වර්ධනය පිළිබඳව සලකා බැලූ විට, ශ්‍රී ලංකා ආර්ථිකය අපේක්ෂා කළ මට්ටමට වඩා යහපත් කාර්යසාධනයක් 2024 වසරේ දී පෙන්නුම් කළේය. බලශක්ති මිල ගණන් පහළ දැමීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන උද්ධමනය අඩු වී, 2024 සැප්තැම්බර් මාසයේ සිට අවධමනයක් වාර්තා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස උද්ධමනය එහි ඉලක්කගත මට්ටමට වඩා පහළ ගියේය. අඩු පොලී අනුපාතිකවල සහාය ඇතිව 2024 වසරේ දී ගෘහ ඒකක සහ ව්‍යාපාර සඳහා ණය ලබා දීම වර්ධනය විය. විසංගතය පැවති සමයේ සහ ඉන් අනතුරුව ආර්ථික අර්බුදය හමුවේ අහිමි වූ ආර්ථිකයේ නිමැවුම යම්තාක් දුරකට නැවත අත්පත් කර ගනිමින්, ලිහිල් මුදල් තත්ත්ව දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වේගවත්ව යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය විය. මේ අතර, වසර තුළ දී විදේශීය අංශයේ කාර්ය සාධනය ශක්තිමත්ව පැවතුණි. රටට ලැබෙන ශුද්ධ විදේශ විනිමය ගලා ඒම් වැඩි වීමත් සමඟ බාහිර ස්වාරක්ෂකවල සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබුණි. විදේශීය ජංගම ගිණුමේ අතිරික්තයක් අඛණ්ඩව වාර්තා විය. පවතින නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය. විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමේ ප්‍රතිලාභ ආනයනවල මිල ගණන් අඩු වීම හරහා පාරිභෝගිකයින් වෙත ලැබුණ ද, එය විදේශ විනිමය උපයන්නන් කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළේය. 2024 වසරේ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වූ අතර ප්‍රාථමික ශේෂය අඛණ්ඩව දෙවන වසරටත් අතිරික්තයක් වාර්තා කළේය.

2023 වසරේ දී ලබාගත් ප්‍රගතිය මත පදනම්ව, මහ බැංකුවේ ප්‍රතිපත්ති මඟින් දේශීය මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු විය. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ වන ප්‍රමුඛතාවන්ට අනුකූලව, අඩු උද්ධමන ඉදිරි දැක්ම සැලකිල්ලට ගෙන දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වෙමින් මහ බැංකුව අඛණ්ඩව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය. මේ අතර, විදේශීය අංශයේ යහපත් කාර්ය සාධනය හේතුවෙන් ආනයන සහ ප්‍රාග්ධන ප්‍රවාහ සඳහා නවදුරටත් පැවති සීමා, මහ බැංකුවේ උපදෙස් ද සලකා බලමින්, රජය විසින් ක්‍රමානුකූලව ඉවත් කරන ලදී. බලපත්‍රලාභී බැංකුවල පාලනය සඳහා නීතිමය රාමුව ශක්තිමත් කරමින් බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීමත් සමඟ මූල්‍ය පද්ධති ස්ථායීතාව නවදුරටත් ශක්තිමත් විය. සාර්ව මූල්‍ය තත්ත්ව වැඩිදියුණු වීම සහ වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය වීම මඟින් 2024 වසර තුළ දී මූල්‍ය අංශයේ සමස්ත කාර්ය සාධනය ක්‍රමයෙන් වැඩිදියුණු විය. අවදානම් කළමනාකරණය සහ ආයතනික පාලනය

පිළිබඳ නියාමන ක්‍රියාමාර්ග රාශියක් ද මෙම වසර තුළ දී හඳුන්වා දෙන ලදී. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ වැකක පිහිටුවීම කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරමින් කටයුතු කරන ලදී. මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම, මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය ක්ෂේත්‍රයේ ඩිජිටල් පරිවර්තනයට සහාය දැක්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

2022 වසරේ දී මුහුණ දුන්, පෙර නොවූ අන්දමේ අර්බුදයෙන් පසු, රට තුළ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක දුර්වලතා නිවැරදි කිරීම ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි අරමුණ විය. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමට සහාය වන අතර ම, ණය තිරසාරභාවය ඇති කිරීම අරමුණු කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය හිමි විය. සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් දිළිඳු සහ අවදානමට ලක් විය හැකි ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම කෙරෙහි ද රජයේ විශේෂ අවධානය යොමු විය. තවද, දූෂණය හා සම්බන්ධ අවදානම් සඳහා විසඳුම් ලබා දීමට ද පියවර ගනිමින් සිටී. අඩු උද්ධමනය හා අඩු පොලී අනුපාතික සහිත පරිසරයක් සමඟ ස්ථාවර මූල්‍ය අංශයක් මඟින් ශ්‍රී ලංකා ආර්ථිකයට එහි විභවතාවයට ළඟා වීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කර ඇත. තවද, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වා ගැනීම සමඟ ධනාත්මක වෙළඳපොළ අපේක්ෂා සහ පවතින ස්ථාවර දේශපාලන වාතාවරණය විසින් රටෙහි දියුණුවට අවශ්‍ය පරිසරය සකස් කර ඇත. එසේ වුවත්, ගෝලීය භූ දේශපාලනික අවිනිශ්චිතතා ඉහළ යාම, විශේෂයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය විසින් යෝජිත තීරු බදු පැනවීම සහ එයින් ඇති විය හැකි වක්‍රාකාර බලපෑම් හේතුවෙන් විදේශීය අංශය සහ පුළුල් ආර්ථිකයේ ඉදිරි දැක්මට අහිතකර ලෙස බලපෑම් ඇති විය හැකිය. එබැවින්, අඛණ්ඩ විචක්ෂණශීලිභාවයකින් යුතුව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහි සහ බාහිර සහ රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක නවදුරටත් ශක්තිමත් කිරීමෙහි දැඩි අවශ්‍යතාවක් පවතී.

රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික අර්බුදයෙන් රට යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා පැහැදිලි සහ ශක්තිමත් පියවර ක්‍රියාත්මක කර තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්න ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ මාවතේ වැදගත් ම අංග වේ. නැවත ස්ථාවරත්වයට පත් වීම සඳහා අවශ්‍ය ප්‍රධාන ප්‍රතිසංස්කරණ බොහොමයක් සාර්ව ආර්ථික ගැළපුම් වැඩසටහනේ මුල් අවධියේදීම සම්පූර්ණ කිරීම විශේෂිත කරුණකි. මේ දක්වා ආර්ථිකය සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇතත්, තව බොහෝ දුරක් යා යුතුව ඇත. වර්තමානයේ දී සාර්ව ආර්ථික ස්ථාවරත්වය බොහෝ දුරට යථා තත්ත්වයට පත් වී ඇති බැවින්, සියලුම පුරවැසියන්ගේ සමෘද්ධිමත්භාවය සහතික කරන රටේ දිගුකාලීන වර්ධනය සඳහා බෙහෙවින් අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට ඇති කැපවීම ඉතා වැදගත් වේ.

1 පරිච්ඡේදය

සාර්ව ආර්ථික ප්‍රවණතා

සාරාංශය

ශ්‍රී ලංකාව, විවිධ අංශ කරා ව්‍යාප්ත වූ පුළුල් ආර්ථික ප්‍රගතියක් 2024 වසරේ දී වාර්තා කළේය. නිදහසින් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික අර්බුදයෙන් වසර දෙකකට පසු මෙම යථා තත්ත්වයට පත්වීම වාර්තා විය. 2022 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක කරන ලද ඵලදායී සහ නිවැරදි කිරීමේ රාජ්‍ය මූල්‍ය මෙන්ම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වඩාත් ස්ථායී ආර්ථික පරිසරයක් ඇති කිරීමට හේතු වූ අතර තිරසාර වර්ධනයක් සඳහා මග පෑදීය. දැනට ක්‍රියාත්මකවන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන, අවසාන අදියරේ පවතින විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සහ ආයෝජක විශ්වාසය වැඩිදියුණු වෙමින් පැවතීම මෙම ආර්ථික ප්‍රගතිය සඳහා සහාය විය. මෙම නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ධනාත්මක බලපෑම දැනටමත් ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශවල ප්‍රවණතා මගින් පෙන්නුම් කෙරේ. දේශීය මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව දැරූ උත්සාහයේ ප්‍රතිඵල පැහැදිලිව දැකගත හැකිය. අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ සිදු වූ පෙර නොවූ ආකාරයේ මිල ගණන් ඉහළ යෑම මගින් මහජනතාව, ව්‍යාපාර මෙන්ම සමස්ත ආර්ථිකය මත අහිතකර බලපෑම් ඇති කළේය. කෙසේ වෙතත්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා වූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ හිතකර ගෝලීය මිල ප්‍රවණතා සමඟ උද්ධමනය 2023 වසරේ සිට සැලකිය යුතු නිර්-උද්ධමන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. පරිපාලිත සහ පිරිවැය පිළිබිඹු කරන බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ දැමීම 2024 සැප්තැම්බර් මාසයේ සිට උද්ධමනය සෘණ අගයක් ගැනීම සඳහා හේතු විය. දැනට තාවකාලිකව පවතින අවධමන තත්ත්වය, ජීවන වියදම මෙන්ම නිෂ්පාදන පිරිවැය යම් ප්‍රමාණයකට අඩු කිරීමට සහාය වනු ඇත. ලිහිල් මුදල් ප්‍රතිපත්තිය වෙළඳපොළ පොලී අනුපාතික පුළුල් ලෙස අඩු කිරීමට හේතු වූ අතර, ව්‍යාපාර සහ කුටුම්භවල පරිභෝජනය සඳහා ණය මෙන්ම ආයෝජන ද දිරිගැන්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් 2024 වසරේ දෙවන භාගයේ දී, මූල්‍ය ආයතන විසින් පෞද්ගලික අංශයට ණය ලබා දීම ඉහළ ගියේය. අභියෝගාත්මක ගෝලීය වාතාවරණය මධ්‍යයේ විදේශීය අංශය සැලකිය යුතු ලෙස ස්ථාවරවීමක් පෙන්නුම් කළේය. මේ අතර, අවසාන අදියරේ පවතින විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථක ලෙස අඛණ්ඩව පවත්වාගෙන යෑම විදේශීය අංශය ශක්තිමත් වීමට සහාය විය. වෙළඳ භාණ්ඩ ආනයන යථා තත්ත්වයට පත්වීමත් සමඟ වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වුවද, 2024 වසර තුළ දී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් අඛණ්ඩව දෙවන වසරටත් විදේශීය ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීමට හැකි විය. විදේශ විනිමය සැලකිය යුතු ලෙස රට තුළට ගලා ඒම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වර්ධනය වීම සඳහා සහාය විය. මෙම වර්ධනයන් හේතුවෙන් 2024 වසර තුළ දී ඉතිහාසයේ ඉහළම විදේශ විනිමය ප්‍රමාණයක් මිලදී ගැනීමට මහ බැංකුවට හැකි වීමත් සමඟ දළ නිල සංචිත ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, විනිමය අනුපාතිකය අඛණ්ඩව දෙවන වසරටත් අතිප්‍රමාණය විය. මේ අතර, 2024 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. රාජ්‍ය අදායම ඉහළ ගිය අතර, ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් ද 2024 වසර තුළ දී වාර්තා විය. පුළුල් සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ සමස්ත ආර්ථිකයේ ප්‍රගතිය මෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය මගින් රටේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන පෙළඹවූ අතර, එමඟින් ආයෝජකයින් සහ ජාත්‍යන්තර ණය හිමියන් අතර රට කෙරෙහි විශ්වාසය යළි ස්ථාපිත කිරීම සඳහා සහාය සැලසිණි.

1

1.1 උද්ධමනය සහ මිල ප්‍රවණතා

1.1.1 උද්ධමනය[1]

2024 වසර තුළ උද්ධමනය, වසර ආරම්භයේ දී ඉහළ යෑමකින් අනතුරුව සමස්තයක් ලෙස අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, සැප්තැම්බර් මාසයේ සිට අවධමන මට්ටම් කරා ළඟා විය. 2024 වසරේ මුල් කාලයේ දී උද්ධමනය ඉහළ යෑමට එකතු කළ අගය මත බදු වැඩිවීම, පාරිභෝගික පැසෙහි ඇති වියදම් අයිතම කිහිපයකින් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සහ සැලකිය යුතු ලෙස ආහාර උද්ධමනය ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, 2024 වසරේ මාර්තු මාසයේ දී විදුලි ගාස්තු අඩු කිරීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් උද්ධමනය ඉහළ යෑම අඛණ්ඩව නොපැවතුණි. තවද, පැවති අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ, එකතු කළ අගය මත බදුවල වූ වෙනස්කම් හේතුවෙන් ඇති වූ මිල ඉහළ යෑමෙන් කොටසක් ව්‍යාපාර විසින් අවශෝෂණය කර ගෙන තිබීමේ හැකියාවක් ද ඇත. ඒ අනුව, 2024 වසරේ මාර්තු මාසයේ සිට මතුපිට උද්ධමනය, 5%ක ඉලක්කයට වඩා අඩු, ධනාත්මක තනි අගය මට්ටම්වල පැවතුණි. පසුව, 2024 වසරේ ජූලි මාසයේ දී විදුලි ගාස්තු තවදුරටත් අඩු කිරීම ද මිල මට්ටම් පහළ යෑමට දායක වූ අතර, 2024 වසරේ මාර්තු සහ අගෝස්තු මාසවල වාර්තා වූ විශාල සෘණාත්මක මාසික ලක්ෂ්‍යමය උද්ධමනය මගින් මෙම පරිපාලන මිල වෙනස්වීම්වල බලපෑම උද්ධමනය තුළ පිළිබිඹු විය. තවද, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම ද උද්ධමනය පහළ යෑමට දායක විය. අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ කුටුම්බ මුහුණ දුන් ඉහළ ජීවන වියදම ලිහිල් වීමට, මිල පීඩන මෙසේ අඩු වීම යම් තරමකට උපකාරී විය. මෙම තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 0.5%ක අවධමනයක් වාර්තා කරමින් අවධමනකාරී මට්ටමකට ළඟා වූ අතර, පසුව අවධමනය තවදුරටත් ඉහළ ගියේය.[2] සමස්තයක් ලෙස, 2024 වසරේ දී ආහාර, බලශක්ති සහ ප්‍රවාහන අංශවල මිල ගණන් ඉහළ යෑම් අඩු මට්ටම්වල පැවතුණි. විශේෂයෙන් ම, 2024 වසරේ මාස කිහිපයක දී ම, ප්‍රධාන වශයෙන් ඉහත සඳහන් කළ විශාල විදුලි ගාස්තු අඩු කිරීම්, ගෝලීය බොරතෙල් මිල සාමාන්‍යකරණය වීම මධ්‍යයේ පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන මිල අඩු කිරීම් සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන්, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන කාණ්ඩය සහ ප්‍රවාහන කාණ්ඩය අවධමන වාර්තා කරන ලදී. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කොළඹ පා.මි.ද., 2021=100)[3] මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2023 වසර අවසානයේ වාර්තා වූ 4.0%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට -1.7%ක් ලෙස වාර්තා වූ අතර, කොළඹ පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 17.4% සිට 2024 වසරේ දී 1.2%ක් දක්වා පහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100)[4] මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද මීට සමාන හැසිරීමක් පෙන්නුම් කරමින්, 2023 වසර අවසානයේ වාර්තා වූ 4.2%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට -2.0%ක් දක්වා පහළ ගිය අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 16.5% සිට 2024 වසරේ දී 1.6%ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2025 වසරේ පළමු කාර්තුවේ අවධමනය තවදුරටත් ඉහළ යෑමට 2025 වසරේ ජනවාරි මාසයේ දී විදුලි ගාස්තු පහළ දැමීම හේතු විය. 2025 වසරේ මුල් කාලයේ දී සමස්ත වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ යෑමට 2024 වසරේ මුල් කාලයේ දී සිදු කරන ලද එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් මිල ඉහළ යෑම් සහ කැපී පෙනෙන ආහාර උද්ධමනය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය පදනම් බලපෑම ද දායක විය. ඒ අනුව, 2025 වසරේ මාර්තු මාසයේ දී කොළඹ පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -2.6%ක් ලෙස වාර්තා වූ අතර, 2025 වසරේ පෙබරවාරි මාසය වන විට ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -3.9%ක් විය.

මූලික උද්ධමනය 2024 වසරේ පළමු භාගයේ දී, මතුපිට උද්ධමනය සඳහා වන ඉලක්කයට අනුකූල වෙමින්, ක්‍රමයෙන් ඉහළ ගිය අතර, ඉන් අනතුරුව පහළ ගියේය. එසේ නමුත්, වසර පුරා මූලික උද්ධමනය මතුපිට උද්ධමනය සඳහා වන ඉලක්කයට වඩා පහළින් පැවතුණි. 2024 වසරේ මුල් කාලයේ දී සිදු කරන ලද එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් ආහාර නොවන කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම් වාර්තා විය. කෙසේ වෙතත්, මූලික උද්ධමනය ගණනය කිරීමේ දී සලකනු ලබන පාරිභෝගික පැසට ඇතුළත් කර ඇති ආහාර මිල ගණන්හි විශාල වැඩිවීමක් වාර්තා නොවීම හේතුවෙන් මූලික උද්ධමනය ඉහළ යෑම සුළු වශයෙන් සිදු විය. තවද, මතුපිට උද්ධමනයේ වාර්තා වූ සැලකිය යුතු පහළ යෑම් සඳහා විශාල වශයෙන් හේතු වූ බලශක්ති ආශ්‍රිත මිල අඩු කිරීම්, මූලික උද්ධමනය ගණනය කිරීමේ දී සලකනු ලබන පාරිභෝගික පැසෙන් බැහැර කර ඇති බැවින්, මූලික උද්ධමනයේ එවැනි සැලකිය යුතු පහළ යෑමක්

1 උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා පිළිබඳ වැඩි විස්තර මහ බැංකුව විසින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද මුද්‍රල් ප්‍රතිපත්ති වාර්තාවේ සාකච්ඡා කෙරේ.

2 උද්ධමන ඉලක්කයෙන් උද්ධමනය අපගමනය වීම පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදය බලන්න.

3 කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කොළඹ පා.මි.ද.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මාසිකව සම්පාදනය කරනු ලැබේ. කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික කුටුම්බයන් භාවිතා කරන පාරිභෝගික අයිතම පැසෙහි මිල හැසිරීම් කොළඹ පා.මි.ද. මගින් නිරූපණය කෙරේ.


4 ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මාසිකව සම්පාදනය කරනු ලැබේ. ජාතික මට්ටමින් භාවිතා කරන පාරිභෝගික අයිතම පැසෙහි මිල හැසිරීම් ජා.පා.මි.ද. මගින් නිරූපණය කෙරේ.

1


ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව


උද්ධමනය
(කො.පා.මි.ද., වාර්ෂික සාමාන්‍ය, %)




පොලී අනුපාතිකය
(වසර අවසානයට, ප්‍රමුඛ ණය අනුපාතිකය, %)



විනිමය අනුපාතිකය
(වසර අවසානයට, එ.ඇ. ඩොලරයට රුපියල්)



අක්‍රීය ණය අනුපාතය/තුන්වන අදියරේ ණය අනුපාතය*
(වසර අවසානයට, %)



*2020 වසරෙන් පසු දක්ත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මත පදනම් වූ වාර්තාකරණයට අනුකූල වේ

අර්බුදයේ උච්චතම සහ 2024 අවස්ථාව

උද්ධමනය
(කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)

69.8 සැප්. 2022 — -1.7 වසර අවසානයට

ද.දේ.නි.යේ වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය, %)

-7.3 2022 — 5.0

ඒක පුද්ගල ද.දේ.නි.
(එ.ඇ. ඩොලර්)

3,464 2022 — 4,516

පොලී අනුපාතිකය
(ප්‍රමුඛ ණය අනුපාතිකය, %)

29.7 4 වන සතිය, ජනවා. 2022 — 8.9 වසර අවසානයට

පෞද්ගලික අංශයේ ණය වර්ධනය
(වාර්ෂික ලක්ෂ්‍යමය, %)

-9.7 මැයි 2023 — 10.7 වසර අවසානයට

විනිමය අනුපාතිකය
(එ.ඇ. ඩොලරයට රුපියල්)

365 2 වන සතිය, මැයි 2022 — 293 වසර අවසානයට

දළ නිල සංචිත
(චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු සහසුකම ද ඇතුළත්ව, එ.ඇ. ඩොලර් බිලියන)

1.7 අගෝ. 2022 — 6.1 වසර අවසානයට

අක්‍රීය ණය අනුපාතය/තුන්වන අදියරේ ණය අනුපාතය* (%)

13.6 සැප්. 2023 — 12.3 වසර අවසානයට

මධ්‍යම රජයේ ණය**
(ද.දේ.නි.යෙහි % ලෙස)

114.2 2022 — 96.1 වසර අවසානයට


රජයේ මුළු ආදායම සහ ප්‍රදාන
(ද.දේ.නි.යෙහි % ලෙස)

8.3 2021 — 13.7


සමස්ත රාජ්‍ය අයවැය ශේෂය
(ද.දේ.නි.යෙහි % ලෙස)

-11.7 2021 — -6.8


මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය, %)




ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
(එ.ඇ. ඩොලර්)




පෞද්ගලික අංශයේ ණය වර්ධනය
(වසර අවසානයට, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



දළ නිල සංචිත
(වසර අවසානයට, එ.ඇ. ඩොලර් බිලියන)




මධ්‍යම රජයේ ණය**
(වසර අවසානයට, ද.දේ.නි.යෙහි % ලෙස)




**2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 1.21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පාද සටහන වෙත යොමුවන්න

රජයේ මුළු ආදායම සහ ප්‍රදාන
(ද.දේ.නි.යෙහි % ලෙස)




සමස්ත රාජ්‍ය අයවැය ශේෂය
(ද.දේ.නි.යෙහි % ලෙස)



1


1.1 රූප සටහන: ශ්‍රී ලංකාවේ උද්ධමනයේ හැසිරීම

මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම
(කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම
(ජා.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආහාර සහ ආහාර නොවන උද්ධමනයේ හැසිරීම
(කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආහාර සහ ආහාර නොවන උද්ධමනයේ හැසිරීම
(ජා.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා
දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)



ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා
දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන (2021=100) යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත හිඟයක් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 වසරේ ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

1

1.1 සංඛ්‍යා සටහන: උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)

%

		2013=100			2021=100				
		දෙසැ-20	දෙසැ-21	දෙසැ-22	දෙසැ-23	දෙසැ-24	ජන-25	පෙබ-25	මාර්-25
මතුපිට උද්ධමනය	කොං.පා.මි.ද.	4.2	12.1	57.2	4.0	**-1.7**	-4.0	-4.2	**-2.6**
	ජා.පා.මි.ද.	4.6	14.0	59.2	4.2	**-2.0**	-4.0	-3.9	
මූලික උද්ධමනය	කොං.පා.මි.ද.	3.5	8.3	47.7	0.6	**2.7**	1.2	0.7	**0.7**
	ජා.පා.මි.ද.	4.7	10.8	57.5	0.9	**1.3**	-0.2	-0.6	
ආහාර උද්ධමනය	කොං.පා.මි.ද.	9.2	22.1	64.4	0.3	**0.8**	-2.6	-0.2	**0.6**
	ජා.පා.මි.ද.	7.5	21.5	59.3	1.6	**-1.0**	-2.5	-1.1	
ආහාර නොවන උද්ධමනය	කොං.පා.මි.ද.	2.0	7.5	53.4	5.8	**-3.0**	-4.7	-6.1	**-4.1**
	ජා.පා.මි.ද.	2.2	7.6	59.0	6.3	**-2.9**	-5.2	-6.0	

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කොං.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත හිඟුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කොං.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දක්නට නොලැබුණි. වසරේ අවසාන භාගයේ දී, ප්‍රධාන වශයෙන් මූලික උද්ධමනය සඳහා වන පාරිභෝගික පැසෙහි ඇතුළත් ආහාර කාණ්ඩයේ අවධමනය සහ ජල ගාස්තු පහළ දැමීම හේතුවෙන් මූලික උද්ධමනයේ ක්‍රමානුකූල පහළ යෑමක් වාර්තා කළේය. ඒ සමඟම, මූලික උද්ධමනය පහළ යෑමට ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම යම්තාක් දුරකට හේතු විය හැකි අතර, බලශක්ති ආශ්‍රිත මිල අඩු කිරීම් මගින් ඇති වූ යම් වක්‍ර බලපෑම් ද එය තුළින් පිළිබිඹු කෙරේ. ඒ අනුව, කොං.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2023 වසර අවසානය වන විට පැවති 0.6%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට 2.7%ක් ලෙස වාර්තා වූ අතර, කොං.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 14.5%ට සාපේක්ෂව 2024 වසරේ 3.3%ක් ලෙස වාර්තා විය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 වසර අවසානයේ වාර්තා වූ 0.9%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට 1.3%ක් ලෙස පැවතුණි. ඒ හා සැසඳීමේ දී, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 15.8% සිට 2024 වසරේ දී 2.5%ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2025 වසරේ මුල් කාලයේ දී වූ සංඛ්‍යානමය පදනම් බලපෑම මගින් ඇති කරන ලද හැසිරීම මූලික උද්ධමනයෙහි ද දැක ගත හැකි විය.

1.1.2 මිල

කොං.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශක ද්විත්වය මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, ආහාර සහ ආහාර නොවන අයිතමවල දක්නට ලැබුණු සමස්ත මිල පහළ යෑමත් සමඟ, 2024 වසරේ දී පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. පොදු මිල මට්ටම මෙසේ පහළ යෑම සඳහා, වැය කළ හැකි ආදායම අඩුවීම හේතුවෙන් ඉල්ලුම පහළ යෑම, බලශක්ති සහ ප්‍රවාහන ආශ්‍රිත මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම ආදී විවිධ සාධක හේතු විය.

ආහාර අයිතමවල මිල ගණන් 2024 වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, අස්වනු හිඟ කාල සීමාවල දී සහ ඉනා අයහපත් කාලගුණ තත්ත්වයන් පැවති කාල සීමාවන්හි දී ආහාර අයිතමවල මිල ගණන් වර්ධන වර ඉහළ ගියේය. ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2024 වසරේ ජනවාරි මාසයේ දී ඉහළ යෑම සඳහා අහිතකර කාලගුණ තත්ත්ව මත සැපයුම සීමිත වීම සහ උත්සව සමයේ පැවති ඉහළ ඉල්ලුම හේතුකොටගෙන නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවිය. ඊට අමතරව, චිකතු කළ අගය මත බද්ද සඳහා සිදුකරන ලද සංශෝධන හේතුවෙන් නිතර මිල උච්චාවචනය නොවන ආහාර අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම ද ඒ සඳහා දායක විය. ඉන් අනතුරුව, 2024 වසරේ මැයි මාසය දක්වා කාලය තුළ දී මහ කන්නයේ අස්වැන්න වෙළඳපොළට ලැබීමත් සමඟ නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතමවල මිල ගණන් පහත වැටීම, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම සඳහා බලපෑවේය. ඉන් පසු 2024 වසරේ ජූනි සහ ජූලි මාසවල දී ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑම සඳහා, වීම කාල සීමාවේ දී අස්වනු අවාරය වීම මෙන්ම එවකට පැවති අහිතකර කාලගුණ තත්ත්ව හේතුවෙන් අස්වනු හිඟ වීම ද බලපාන ලදී. කෙසේ වුවද, යල කන්නයේ අස්වැන්න වෙළඳපොළට ලැබීමත් සමඟ එළවළු මිල පහළ යෑම හේතුවෙන් 2024 වසරේ අගෝස්තු මස සිට නොවැම්බර් මාසය දක්වා කාල සීමාව තුළ දී ආහාර මිල ගණන් නැවතත් පහත වැටුණි. උත්සව සමයේ දී ඇතිවන ඉහළ ඉල්ලුම වැනි සාධක සහ දිවයින පුරා පැවති අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, ආහාර අයිතමවල මිල ගණන් නැවතත් ඉහළ ගියේය. ආහාර කාණ්ඩයේ සමස්ත මිල පහළ යෑම සඳහා ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම නිසා ආනයනික ආහාර අයිතමවල මිල ගණන් අඩු වීම ද හේතු විය. මීට අමතරව, විදුලි ගාස්තු සහ ඉන්ධන මිල අඩු කිරීමෙන් ඇති වූ වක්‍ර බලපෑම් ද ආහාර අයිතමවල මිල ගණන් පහළ යෑමට දායක විය.


1

ප්‍රධාන වශයෙන් පරිපාලිත මිල සංශෝධන හේතුකොටගෙන, ආහාර නොවන අයිතමවල මිල ගණන් 2024 වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. වසර ආරම්භයේ දී විකතු කළ අගය මත බද්ද 15% සිට 18%ක් දක්වා ඉහළ දැමීම සහ ඇතැම් ආහාර නොවන අයිතම සඳහා පැවති විකතු කළ අගය මත බදු නිදහස් කිරීම් කිහිපයක් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දී ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ ගියේය. එසේ වුවද, 2024 වසරේ ඉතිරි මාසවල දී ආහාර නොවන අයිතමවල මිල ගණන් පහළ ගිය අතර, ඒ සඳහා මිල සූත්‍ර මත පදනම්ව ගණනය කරනු ලබන පරිපාලිත මිල ගණන් සැලකිය යුතු ලෙස පහත දැමීම ප්‍රධාන වශයෙන් දායක විය. ඒ අනුව, 2024 වසරේ දී විදුලි ගාස්තුව දෙවරක් සැලකිය යුතු ලෙස පහත දමන ලද අතර, ඒකක 90ක් සඳහා වූ විදුලි ගාස්තුව[5] 2024 වසරේ මාර්තු මස 05 වන දින සහ 2024 වසරේ ජූලි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පිළිවෙළින් 29.8%කින් සහ 34.3%කින් පහත දමන ලදී. මෙම විදුලි ගාස්තු පහත දැමීමට සමගාමීව, 2024 වසරේ අගෝස්තු 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ඒකක 22ක් සඳහා වූ ජල ගාස්තුව[6] ද මිල සූත්‍රයට අනුකූලව 8.8%කින් පහත දමන ලදී. මේ අතර, 2024 වසරේ ජනවාරි මාසයේ දී විකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීමත් සමඟ ඉහළ ගිය පෙට්‍රල් (ඔක්ටේන් 92) සහ සුදු ඩීසල් මිල ගණන් ඉන් අනතුරුව කිහිපවරක් පහළ දමනු ලැබිණි. තවද, 2024 වසර තුළ මාස කිහිපයක දී භූමිතෙල් මිල ගණන් ද පහළ දමන ලදී. එමෙන්ම, විකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය එල්.පී. ගෑස් මිල, 2024 වසරේ අප්‍රේල් මස සිට ජූලි මස දක්වා කාල සීමාව තුළ දී අඩු කරන ලද අතර, වසරේ ඉතිරි කාලය තුළ දී නොවෙනස්ව පැවතුණි. සුදු ඩීසල් මිල අඩුකිරීමට සමගාමීව, 2024 වසරේ ජූලි මස 02 වන දින සිට 5.07%කින් සහ 2024 වසරේ ඔක්තෝබර් මස 02 වන දින සිට 4.24%කින් බස් ගාස්තු පහත දමන ලදී. කෙසේ වෙතත්, 2024 වසරේ දී දුම්රිය ගාස්තු සංශෝධනයක් සිදු නොවිණි.

1.1.3 පාරිභෝගික මිල මට්ටම සහ ජීවන වියදම

ඉහත සඳහන් කළ පසුබිම තුළ, නිල පාරිභෝගික මිල දර්ශක ද්විත්වයම 2024 වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, කොපාමිද. (2021=100), 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී

1.2 රූප සටහන: කොපාමිද. සහ මතුපිට උද්ධමනය



(අ) 2022 වසර සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය කොපාමිද. (2013=100) මත පදනම් වේ

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පැවති දර්ශකාංක 195.1හි සිට විකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී දර්ශකාංක 200.7ක් දක්වා ඉහළ ගොස් ඉන් පසුව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 191.7ක් දක්වා පහත වැටුණි. පාරිභෝගික මිල දර්ශකවල දක්නට ලැබුණු මෙම පහළ යෑම සඳහා මිල සූත්‍ර පදනම් කරගත් පරිපාලිත මිල ගණන් පහළ යෑම සහ ආහාර අයිතමවල මිල ගණන් පහළ යෑම හේතු විය. එමෙන්ම, ජාපාමි. දර්ශකය (2021=100) ද, 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති දර්ශකාංක 208.8හි සිට 2024 වසරේ ජනවාරි මාසයේ දී දර්ශකාංක 215.0 දක්වා ඉහළ යෑමෙන් පසුව, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 204.6 දක්වා පහත වැටුණි.

පාරිභෝගික මිල දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් පෙන්නුම් කරන පරිදි, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ජීවන වියදම,[7] සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. කොපාමි. දර්ශකයට (2021=100) අනුව, කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන වියදම,[8] 2023 වසරේ දී පැවති රුපියල් 176,253හි සිට 2024 වසරේ දී රුපියල් 178,438ක් දක්වා 1.2%ක සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. මේ අනුව, කොපාමි. දර්ශකයට (2021=100) අනුව කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන වියදමේ වර්ධන වේගය, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී වාර්තා වූ 63.5%ක වැඩිවීමට සහ 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී පෙන්නුම් කළ 17.4%ක වැඩිවීමට සාපේක්ෂව, 2024 වසරේ දී සැලකිය යුතු අඩුවීමක් පිළිබිඹු කරයි. එමෙන්ම, ජාපාමි. දර්ශකයට (2021=100) අනුව, කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන

5 කොපාමිද. (2021=100) සහ ජාපාමිද. (2021=100) ගණනය කිරීමේ දී ගෘහස්ථ කාණ්ඩයේ ඒකක 90ක් සඳහා වූ විදුලි ගාස්තුව සලකා බලනු ලැබේ. 2024 වසරේ මාර්තු මස 05 වන දින සහ 2024 වසරේ ජූලි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි, විදුලි ගාස්තු සමස්තයක් ලෙස පිළිවෙළින් 21.9%කින් සහ 22.5%කින් පහළ දමන ලදී.


6 කොපාමිද. (2021=100) සහ ජාපාමිද. (2021=100) ගණනය කිරීමේ දී ගෘහස්ථ කාණ්ඩයේ ඒකක 22ක් සඳහා වූ ජල ගාස්තුව සලකා බලනු ලැබේ. 2024 වසරේ අගෝස්තු මස 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ගෘහස්ථ පාරිභෝගිකයන් සඳහා ජල ගාස්තුව සමස්තයක් ලෙස 7.0%කින් පහළ දමන ලදී.

7 පාරිභෝගික මිල දර්ශක, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව හඳුනාගත් ස්ථාවර පරිභෝජන පැස මත පදනම් වේ. එබැවින් කාලයත් සමඟ ගෘහස්ථ පරිභෝජන රටාවල සිදුවන වෙනස්කම් මෙමගින් පිළිබිඹු නොවේ.

8 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ සාමාන්‍ය කුටුම්බයක් පුද්ගලයන් 3.8කින් සමන්විත වේ.

1

1.3 රූප සටහන: ජීවන වියදම



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වියදම,[9] 2023 වසරේ දී පැවති රුපියල් 103,383හි සිට 2024 වසරේ දී රුපියල් 105,063ක් දක්වා 1.6%කින් ඉහළ ගොස් ඇති අතර, එය 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී වාර්තා වූ 74.9%ක වැඩිවීමට සහ 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී වාර්තා වූ 16.5%ක වැඩිවීමට සාපේක්ෂව කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කරයි. කො.පා.මි. දර්ශකයට (2021=100) සහ ජා.පා.මි. දර්ශකයට (2021=100) අදාළ පරිභෝජන පැස දෙකෙහි ම, කුටුම්බයක සාමාන්‍ය මාසික පරිභෝජන වියදම් බෙදී යෑම සැලකීමේ දී, කුටුම්බයක් විසින් තම වියදමින් වැඩි කොටසක් ආහාර නොවන අයිතම සඳහා යොදවන අතර, ආහාර කාණ්ඩයට යොදවන වියදම් ප්‍රමාණය 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි.

1.1.4 උද්ධමන අපේක්ෂා

ආයතනික සහ කුටුම්බ යන දෙඅංශයෙහි ම 2024 වසර තුළ දී උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, එය ප්‍රකාශිත උද්ධමනයේ හැසිරීමට අනුකූල විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් පෙන්නුම් කරන පරිදි, මෙම වසර ආරම්භයේ දී, ආයතනික හා කුටුම්බ දෙඅංශයෙහි ම කෙටි කාලීන, විනම් ඉදිරි මාස 3, ඉදිරි මාස 6 සහ ඉදිරි වසර යන කාලපරිච්ඡේද සඳහා වූ උද්ධමන අපේක්ෂා, ඉලක්කගත 5%ක උද්ධමන මට්ටම ඉක්මවා ගිය අතර, ඒ සඳහා, එකතු කළ අගය මත බදු සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ දැමීම හේතුවෙන් උද්ධමනයේ සිදු වූ ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, ඉන් පසුව උපයෝගිතා මිල ගණන් පහත දමනු ලැබූ බැවින්, කෙටි කාලීන උද්ධමන අපේක්ෂා ක්‍රමයෙන් පහළ ගියේය. කෙටි කාලීන උද්ධමන අපේක්ෂා, 2024 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ඉලක්කගත 5%ක උද්ධමන මට්ටමට වඩා පහළින් පැවතුණ අතර, මේ සඳහා 2024 වසරේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා කාල සීමාව තුළ පැවති අවධමන තත්ත්වය හේතුවිය. ආයතනික අංශයේ මධ්‍ය කාලීන උද්ධමන අපේක්ෂා 5%ක උද්ධමන ඉලක්කගත මට්ටමේ සිට ±2% පරාසය තුළ පැවතෙමින් සමස්ත පහළ යෑමේ ප්‍රවණතාවක් 2024 වසර පුරා පෙන්නුම් කළ අතර, මේ සඳහා කෙටිකාලීන උද්ධමන අපේක්ෂාවල හැසිරීම මූලික විය. සමස්තයක් ලෙස, 2024 වසරේ දී උද්ධමන අපේක්ෂා පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, වසරේ අග භාගයේ දී ආයතනික සහ කුටුම්බ යන දෙඅංශය ම විසින් ඉදිරි කාලයේ දී ක්‍රමයෙන් උද්ධමනයේ වැඩිවීමක් අපේක්ෂා කරන ලදී.

1.1.5 වැටුප්

පවතින දත්තවලට අනුව,[10] 2024 වසරේ දී පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයෙහි ම සේවකයන්ගේ නාමික වැටුප් පෙර වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කෙරේ. අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ඉහළ යෑම සඳහා, ප්‍රධාන වශයෙන්, ශ්‍රම හිඟය සහ සේවකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම හේතු වූ අතර, රාජ්‍ය අංශයේ නාමික වැටුප් ඉහළ යෑමට මෙම අංශයේ සේවා නියුක්තිකයන්ගේ ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත, රාජ්‍ය අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී ඉහළ ගිය අතර, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප්, පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවද, 2023 වසරේ දී විධිමත් පෞද්ගලික අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් 2022 වසරට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ නාමික වැටුප් නොවෙනස්ව පැවතුණි.

පෞද්ගලික අංශයේ වැටුප්


අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, 2024 වසර පුරා ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන මෙම වැටුප් දර්ශකය, 2023 වසරේ දී වාර්තා වූ 11.4%ක ඉහළ යෑමට සාපේක්ෂව 2024 වසරේ දී

9 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය කුටුම්බයක් පුද්ගලයන් 3.7කින් සමන්විත වේ.

10 මෙම කොටසෙහි දක්වා ඇති තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මත පදනම් වේ. කෙසේ වෙතත්, පවතින වැටුප් දර්ශකවල තිබෙන්නා වූ යම් යම් සීමාකාරී ස්වභාවයන් හේතුකොටගෙන, ආර්ථිකයේ සියළු අංශවල වැටුප් පිළිබඳ සමස්ත උපනතීන් මෙමගින් ආවරණය නොවිය හැකිය.

1


1.4 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2018=100) (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

6.0%කින් ඉහළ ගියේය. මෙම වැටුප් දර්ශකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය ම, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සහ සේවා ක්‍රියාකාරකම් වර්ධනයන් පෙන්නුම් කළ අතර, ඒ අතරින් සේවා ක්‍රියාකාරකම් ඉහළම වැටුප් වර්ධනය වාර්තා කළේය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන උප ක්‍රියාකාරකම් 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී, පිළිවෙළින්, 6.3%කින්, 5.5%කින් සහ 7.2%කින් ඉහළ ගියේය. මේ සඳහා ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම සහ සේවකයන් සොයා ගැනීමේ දුෂ්කරතා හේතු වූ අතර, පළපුරුදු සේවකයන් රඳවා ගනිමින් ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ඔවුන්ගේ දෛනික වැටුප් වැඩි කිරීමට සේවායෝජකයන්ට සිදුවිය. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, උද්ධමන පීඩනය ලිහිල් වීමට අනුකූලව මන්දගාමී විය. තවද, උද්ධමනය අඛණ්ඩව පහළ යෑමත් සමඟ 2024 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය තවදුරටත් ඉහළ ගියේය.

1.5 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2018=100)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, පඩි පාලක සභා මගින් පාලනය වන සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2024 වසරේ දී සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, විධිමත් පෞද්ගලික අංශයේ අවම නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය, වාර්ෂික සාමාන්‍ය පදනම මත 2023 වසරේ දී වාර්තා වූ 0.4%ක ඉහළ යෑමට සාපේක්ෂව 2024 වසරේ දී 0.1%ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලැබූ අවම මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය, 2024 වසරේ දී 1.1%කින් පහළ ගියේය. මේ සඳහා, මෙම කාලය තුළ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක ඉතා සුළු ප්‍රතිශතාත්මක වැඩිවීම් වාර්තා කිරීම හේතුවිය. මේ අතර, 2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත පරිදි පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සඳහා දැනට පවතින රුපියල් 21,000ක අවම මාසික වැටුප 2025 වසරේ අප්‍රේල් මස සිට රුපියල් 27,000ක් දක්වාත් 2026 වසරේ සිට රුපියල් 30,000ක් දක්වාත් ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. මීට අමතරව, වතු අංශයේ සේවකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ සහ පවතින වැටුප් හා සම්බන්ධ ගැටලු විසඳීමේ අරමුණින් ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා ඉහළ නැංවීමට රජය විසින් මැදිහත් වීමේ යෝජනාවක් ද 2025 අයවැය මගින් ඉදිරිපත් විය.

රාජ්‍ය අංශයේ වැටුප්

රාජ්‍ය අංශයේ සේවක වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, වසර දෙකක් පුරා නොවෙනස්ව පැවතීමෙන් අනතුරුව, 2024 වසරේ දී ඉහළ ගියේය. 2024 අයවැය මගින් යෝජනා කළ පරිදි රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා වන ජීවන වියදම් දීමනාව 2024 වසරේ ජනවාරි මස සිට රුපියල් 10,000කින් වැඩි කරන ලදී. එසේ වුවද, පැවති රාජ්‍ය මූල්‍ය සීමා හේතුවෙන් 2024 වසරේ මාර්තු මස දක්වා රාජ්‍ය සේවකයන්ට රුපියල් 5,000ක අර්ධ ගෙවීමක් සිදු කළ අතර, 2024 වසරේ අප්‍රේල් මස සිට රුපියල් 10,000ක සම්පූර්ණ වැටුප් වැඩිවීම ලබා දෙන ලදී. මේ අතර, 2024 වසරේ මුල් මාස තුන සඳහා වූ හිඟ මුදල, 2025 වසරේ ජනවාරි මාසයේ සිට සමාන වාරික තුනකින් ලබා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී 18.5%කින් ඉහළ ගියේය. මේ අතර, 2024 වසරේ දී උද්ධමනය අඛණ්ඩව අඩුවීම හේතුවෙන්, 2023 වසරේ දී සිදු වූ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප්හි පහළ යෑම, 2024 වසරේ දී දක්නට නොලැබුණි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම මාසික මූලික වැටුප ඉහළ දැමීමෙන් සහ විවිධ දීමනාවන් විධිමත් කිරීම තුළින් රාජ්‍ය සේවක වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීමේ යෝජනා 2025 අයවැය මගින් ඉදිරිපත් කෙරිණි. ඒ අනුව, 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට

1


1.6 රූප සටහන: රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2016=100) (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම මාසික මූලික වැටුප රුපියල් 24,250හි සිට රුපියල් 40,000ක් දක්වා රුපියල් 15,750කින් ඉහළ දැමීමට යෝජනා විය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා දැනට රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්හට ලබා දෙන රුපියල් 2,500ක තාවකාලික අතුරු දීමනාව සහ රුපියල් 5,000ක විශේෂ දීමනාව මූලික වැටුපට එකතු කරනු ලබන අතර, ඒ අනුව රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අවම මූලික වැටුපෙහි රුපියල් 8,250ක ශුද්ධ වැඩිවීමක් සිදුවනු ඇත. මෙම වැටුප් ඉහළ දැමීම අදියර කිහිපයකින් සිදුකිරීමට නියමිත අතර, ඒ අනුව, රුපියල් 5,000ක ශුද්ධ වැඩිවීමක් සහ ඉතුරු මුදලින් 30%ක වැඩිවීමක් 2025 වසරේ අප්‍රේල් මාසයේ දී ලබාදීමට යෝජනා වී ඇත. ඉතිරි 70%ක වැඩිවීම, 2026 වසරේ ජනවාරි මස සහ 2027 වසරේ ජනවාරි මස සිට සමාන වාරික දෙකක් වශයෙන් ලබාදීමට සැලසුම් කර ඇත. මීට අමතරව, 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ වාර්ෂික වැටුප් වර්ධකය 80%කින් ඉහළ නැංවීමට ද යෝජනා විය. ඒ අනුව දැනට රුපියල් 250ක් වශයෙන් පවතින අවම වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 450ක් දක්වා ඉහළ යනු ඇත.

1.7 රූප සටහන: රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2016=100)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1.2 මූර්ත අංශයේ ප්‍රවණතා

1.2.1 ආර්ථික වර්ධනය


ශ්‍රී ලංකා ආර්ථිකය, අඛණ්ඩව වසර දෙකක් පුරා පැවති සංකෝචනයෙන් පසුව, 2024 වසරේ දී 5.0%ක මූර්ත ආර්ථික වර්ධනයක් වාර්තා කළේය. මෙම ධනාත්මක ප්‍රවණතාව වසර මුළුල්ලේ ම දක්නට ලැබුණු අතර, 2017 වසරෙන් අනතුරුව ප්‍රථම වතාවට, කාර්තු හතරෙහි ම දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.)[11] වර්ධනයන් මෙම වසර තුළ දී වාර්තා විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් කර්මාන්ත අංශයේ දායකත්වය හේතු වූ අතර, එහිදී නිෂ්පාදන කර්මාන්ත සහ ඉදිකිරීම් කටයුතුවල ඉහළ වර්ධනය කැපී පෙනුණි. එසේම, නවාතැන් සැපයීමේ සහ ප්‍රවාහන සේවාවල අඛණ්ඩ වර්ධනය හේතුවෙන් සේවා කටයුතු ද සමස්ත වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් දැක්වූ අතර, කෘෂිකාර්මික කටයුතු ද ධනාත්මකව දායක විය.

පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. 2024 වසරේ දී රුපියල් බිලියන 29,898.6ක් දක්වා ඉහළ ගිය අතර, මේ සඳහා මූර්ත ආර්ථික වර්ධනය මෙන්ම 3.8%ක් වූ ද.දේ.නි. ගම්‍ය අවධමනකය ද හේතු විය. තවද, ද.දේ.නි. සඳහා ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැළපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන දළ ජාතික ආදායම (ද.ජා.ආ.) ද 2024 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව රුපියල් බිලියන 29,153.9ක් දක්වා ඉහළ ගියේය. ව.ජ. ඩොලර් වටිනාකම අනුව ද.දේ.නි. 2023 වසරේ වාර්තා කළ බිලියන 83.8 සිට 2024 වසර වන විට බිලියන 99.0ක් දක්වා ඉහළ ගියේය.

පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.හි ඉහළ යෑම සහ මධ්‍ය වාර්ෂික ජනගහනය පහත වැටීම හේතුවෙන් 2023 වසරේ දී රුපියල් 1,244,262ක් වූ ඒක පුද්ගල ද.දේ.නි., 2024 වසරේ දී රුපියල් 1,364,235ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2023 වසරේ දී රුපියල් 1,206,441ක් වූ ඒක පුද්ගල ද.ජා.ආ. 2024 වසරේ දී රුපියල් 1,330,255ක් දක්වා ඉහළ ගියේය. රුපියල් වටිනාකම අනුව නාමික ද.දේ.නි.

11 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

1.8 රූප සටහන: වාර්ෂික මූර්ත ද.දේ.නි. වර්ධන අනුපාතික (අ)



(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

ඉහළ යෑම සහ මධ්‍ය වාර්ෂික ජනගහනයේ පහත වැටීමට අමතරව, 2024 වසරේ දී ඒ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන්, ඒ.ජ. ඩොලර් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි., 2023 වසරේ දී වාර්තා කළ 3,801 සිට 2024 වසරේ දී 4,516ක් දක්වා ඉහළ ගිය අතර, ඒක පුද්ගල ද.ජා.ආ. 2023 වසරේ දී වාර්තා කළ 3,685 සිට 4,404ක් දක්වා 2024 වසරේ දී ඉහළ ගියේය.

1.2.2 නිෂ්පාදිතය

කෘෂිකර්මාන්තය

කෘෂිකාර්මික ක්‍රියාකාරකම්, 2023 වසරේ දී වාර්තා කළ 1.6%ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසරේ දී 1.2%කින් වර්ධනය විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සත්ත්ව නිෂ්පාදන සහ පළතුරු වගා කටයුතු දායක වූ අතර, පොල් වගා කටයුතුවල අඩණ්ඩ පහත වැටීම හේතුවෙන් සමස්ත වර්ධන වේගය සීමා විය. තවද, විශේෂයෙන්, වසරේ සිව්වන කාර්තුව තුළ පැවති අයහපත් කාලගුණික වාතාවරණය හේතුවෙන් වී සහ අනෙකුත් ධාන්‍ය වගාව මෙන්ම ධීවර කටයුතු ඇතුළු ප්‍රධාන කෘෂිකාර්මික කටයුතුවලට බාධා සිදු වූ අතර, එය කෘෂිකාර්මික කටයුතුවල සමස්ත වර්ධන වේගය අඩාල කිරීමට හේතු විය.

කර්මාන්ත

2024 වසරේ දී කර්මාන්ත කටයුතු, 2023 වසරේ දී වාර්තා කළ 9.2%ක පහත වැටීමට සාපේක්ෂව, දේශීය මෙන්ම විදේශීය ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ 11.0%ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතුවල අඛණ්ඩ වර්ධනය මෙන්ම රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් වර්ධනය වූ නිෂ්පාදන කර්මාන්ත කටයුතු, සමස්ත කර්මාන්ත කටයුතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, පෙර වසරේ වාර්තා වූ පහත වැටීමට සාපේක්ෂව, හිතකර ආර්ථික තත්ත්වයන් හමුවේ නව ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමයෙන් ආරම්භ වීම හේතුවෙන් 2024 වසරේ දී ඉදිකිරීම් කටයුතු වර්ධනය විය.

සේවා

2023 වසරේ දී 0.2%කින් පහත වැටුණු සේවා ක්‍රියාකාරකම්, ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ 2024 වසරේ දී 2.4%කින් වර්ධනය විය. සංචාරක ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනය තුළින් නවාතැන් පහසුකම් සැපයීමේ සේවා, ආහාර හා පාන සැපයීමේ සේවා, ප්‍රවාහන සහ වෙළඳ කටයුතු ආදී අනෙකුත් ක්ෂේත්‍ර රැසකට සිදුකළ යහපත් බලපෑම මෙම වර්ධනයට බෙහෙවින් දායක විය. මේ අතර, පොලී අනුපාතික පහත වැටීමෙන් සහ ණය ලබාදීමට ඇති නැඹුරුව ඉහළ යෑමෙන් ඇති වූ යහපත් ව්‍යාපාරික වාතාවරණය හේතුවෙන් මූල්‍ය සේවා සහ දේපළ වෙළඳාම් කටයුතුවල ද වර්ධනයක් දක්නට ලැබුණි. තවද, පරිගණක වැඩසටහන් සහ විදුලි සංදේශ සේවාවල වර්ධනය ද සේවා කටයුතුවල වර්ධනය කෙරෙහි ධනාත්මකව දායක විය.

1.2 සංඛ්‍යා සටහන: කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)


ආර්ථික කටයුතු	වර්ධනය (%)		වර්ධනය සඳහා දායකත්වය (%)		ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%)	
	2023 (අ)	2024	2023 (අ)	2024	2023 (අ)	2024
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**1.6**	**1.2**	**0.1**	**0.1**	**7.8**	**7.5**
කර්මාන්ත	**- 9.2**	**11.0**	**- 2.5**	**2.8**	**25.3**	**26.7**
නිෂ්පාදන කර්මාන්ත, පතල් සහ කැණීම් සහ අනෙකුත් කර්මාන්ත	- 4.7	**8.3**	- 0.9	**1.6**	19.1	**19.7**
එයින්: නිෂ්පාදන කර්මාන්ත කටයුතු	- 3.2	**7.6**	- 0.5	**1.2**	16.0	**16.4**
ඉදිකිරීම්	- 20.8	**19.4**	- 1.6	**1.2**	6.2	**7.0**
සේවා	**- 0.2**	**2.4**	**- 0.1**	**1.5**	**60.7**	**59.2**
තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවා සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ සේවා	3.2	**3.9**	0.9	**1.1**	28.0	**27.7**
තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවා	- 13.2	**5.0**	- 0.5	**0.2**	3.0	**3.0**
මූල්‍ය හා රක්ෂණ කටයුතු	- 4.8	**- 1.2**	- 0.2	**- 0.1**	4.9	**4.6**
නිවාස අයිතිය හා දේපළ වෙළඳාම	- 6.0	**4.2**	- 0.3	**0.2**	4.4	**4.4**
වෘත්තීයමය සේවා	2.4	**3.5**	0.0	**0.1**	2.1	**2.1**
රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවා	- 0.6	**- 1.1**	- 0.1	**- 0.1**	9.8	**9.2**
වෙනත් පෞද්ගලික සේවා	0.3	**1.5**	0.0	**0.1**	8.4	**8.1**
මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය	**- 2.6**	**4.6**	**- 2.5**	**4.3**	**93.8**	**93.4**
භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර	2.6	**10.6**	0.2	**0.7**	6.2	**6.6**
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය	**- 2.3**	**5.0**	**- 2.3**	**5.0**	**100.0**	**100.0**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	- 15.9	**12.1**				
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**- 2.8**	**5.5**				

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

1.9 රූප සටහන: 2024 වසරේ ආර්ථික කටයුතුවල වර්ධනය (අ)



(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1.2.3 වියදම

2024 වසර තුළ දී දේශීය ඉල්ලුම, පවත්නා මිල අනුව 9.5%කින් වර්ධනය වූ අතර, මේ සඳහා පරිභෝජන වියදමෙහි 6.4%ක වර්ධනය සහ ආයෝජන වියදමෙහි 19.6%ක වර්ධනය දායක විය. ප්‍රධාන වශයෙන්, ඉදිකිරීම් වියදම ඉහළ යෑම හේතුවෙන් ආයෝජන වියදමෙහි ප්‍රධාන අංශය වන දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මෙම කාලපරිච්ඡේදය තුළ දී යළි වර්ධනය විය. මේ අතර, මිල මට්ටම් පහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් පෞද්ගලික පරිභෝජන වියදම අඩු වේගයකින් වර්ධනය වීම හේතුවෙන්, සමස්ත පරිභෝජන වියදම පෙර වසර හා සැසඳීමේ දී අඩු

1.3 සංඛ්‍යා සටහන : පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් (අ)(ආ)

ආර්ථික කටයුතු	රුපියල් බිලියන		වර්ධනය (%)		ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%)	
	2023 (ඇ)	2024	2023 (ඇ)	2024	2023 (ඇ)	2024
1. දේශීය ඉල්ලුම	**28,011.5**	**30,683.4**	**12.4**	**9.5**	**102.2**	**102.6**
1.1 පරිභෝජනය	21,270.3	**22,623.0**	15.9	**6.4**	77.6	**75.7**
පෞද්ගලික	19,412.0	**20,542.2**	16.8	**5.8**	70.8	**68.7**
රාජ්‍ය	1,858.4	**2,080.8**	6.8	**12.0**	6.8	**7.0**
1.2 ආයෝජන (දළ ප්‍රාග්ධන සම්පාදනය)	6,741.2	**8,060.3**	2.7	**19.6**	24.6	**27.0**
දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	4,891.8	**5,618.8**	-15.0	**14.9**	17.8	**18.8**
තොග වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කරගැනීම් හා අත්හැරීම්	1,849.3	**2,441.5**	128.9	**32.0**	6.7	**8.2**
2. ශුද්ධ විදේශීය ඉල්ලුම	**-591.7**	**-784.8**	**31.0**	**-32.6**	**-2.2**	**-2.6**
භාණ්ඩ හා සේවා අපනයන	5,672.9	**5,945.7**	9.3	**4.8**	20.7	**19.9**
භාණ්ඩ හා සේවා ආනයන	6,264.6	**6,730.5**	3.6	**7.4**	22.8	**22.5**
3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)	**27,419.8**	**29,898.6**	**13.9**	**9.0**	**100.0**	**100.0**
4. දේශීය ඉතුරුම් (3-1.1)	**6,149.5**	**7,275.5**	**7.8**	**18.3**	**22.4**	**24.3**
පෞද්ගලික	7,800.3	**8,584.7**	7.7	**10.1**	28.4	**28.7**
රාජ්‍ය (ඈ)	-1,650.9	**-1,309.1**	-7.2	**20.7**	-6.0	**-4.4**
5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඉ)	**-833.5**	**-744.7**	**-35.1**	**10.6**	**-3.0**	**-2.5**
6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඉ)	**1,906.8**	**1,942.7**	**64.5**	**1.9**	**7.0**	**6.5**
7. ජාතික ඉතුරුම් (4+5+6)	**7,222.8**	**8,473.5**	**15.6**	**17.3**	**26.3**	**28.3**
8. ඉතුරුම්-ආයෝජන පරතරය						
දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2)	-591.7	**-784.8**			-2.2	**-2.6**
ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2)	481.7	**413.2**			1.8	**1.4**
9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඉ)	**481.7**	**413.2**			**1.8**	**1.4**

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙය මධ්‍යම රජයේ වර්ෂාන ගිණුමේ ශේෂය වේ.
(ඉ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1

වේගයකින් වර්ධනය විය. මේ අතර, ආනයන වියදම වැඩිවීම හේතුවෙන් 2024 වසර තුළ ශුද්ධ විදේශීය ඉල්ලුම පහත වැටුණි.

ස්ථාවර මිල අනුව සලකන විට, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල ඉහළ යෑමත් සමඟ ආයෝජන වියදමේ ඇතිවූ 21.1%ක වර්ධනය හේතුවෙන් 2024 වසරේ දී දේශීය ඉල්ලුම ඉහළ ගියේය. තවද, පෞද්ගලික පරිභෝජන වියදම ඉහළ යෑමෙන් වසර තුළ දී පරිභෝජන වියදම 3.2%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, ආනයන ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම මෙම කාලය තුළ දී පහත වැටුණි.

2024 වසරේ දී, ප්‍රධාන වශයෙන් දේශීය ඉතුරුම්වල 18.3%ක වර්ධනය හේතුවෙන්, පවත්නා මිල අනුව ජාතික ඉතුරුම් 17.3%කින් වර්ධනය විය. තවද, විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම සහ ශුද්ධ ද්විතීයික ආදායම 2024 වසරේ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කරමින් ජාතික ඉතුරුම් ඉහළ යෑමට ධනාත්මක ලෙස දායක විය. ජාතික ඉතුරුම්වල මෙම වර්ධනයත් සමඟ ජාතික ඉතුරුම් සහ ආයෝජන අතර පරතරය 2024 වසරේ දී ද ධන අගයක පැවතුණි.

1.2.4 ආදායම

ආදායම් ප්‍රවේශයේ ඇස්තමේන්තුවලට අනුව, 2024 වසරේ දී විශාලතම ආදායම් සංරචකය වන දළ මිශ්‍ර ආදායම, පවත්නා මිල ගණන් අනුව දළ එකතු කළ අගයෙන් 37.4%කට දායක වෙමින් 6.0%කින් වර්ධනය විය. තවද, දෙවන ප්‍රධාන ආදායම් සංරචකය වන දළ මෙහෙයුම් අතිරික්තය 2024 වසරේ දී 6.8%කින් වර්ධනය විය. මේ අතර, සේවක ආදායම සහ නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද බදු 2024 වසරේ දී තවදුරටත් ඉහළ යමින්, පිළිවෙළින්, 5.2%කින් සහ 30.4%කින් වර්ධනය විය. දළ එකතු කළ අගය සඳහා දායකත්වය දක්වන ආයතනික අංශ අනුව ආදායම ජනනය කිරීම සැලකීමේ දී, මූල්‍ය නොවන ආයතනික අංශය ප්‍රධානතම දායකත්වය ලබා දුන් අතර, ඉන් අනතුරුව, පිළිවෙළින්, ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන අංශය, මූල්‍ය ආයතන අංශය සහ රාජ්‍ය අංශය දායක වී ඇත.

1.2.5 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය 2024 වසරේ දී මිලියන 21.916 දක්වා 0.5%කින් අඩු විය. මේ සඳහා, උපත් හා මරණ අතර පරතරය වන ස්වභාවික වර්ධනය වසර තුළ දී අඩු වීමත්, ශුද්ධ විදේශ සංක්‍රමණ සෘණ අගයක් ගැනීමත් හේතු විය. මෙම ජනගහනය සහ රටේ සමස්ත භූමි ප්‍රමාණය[12] අතර අනුපාතයක් ලෙස ගණනය කරනු ලබන ජන ඝනත්වය 2024 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 352ක් විය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයෙන් පිළිබිඹු වන පරිදි, 2024 වසරේ දී ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය[13] (ශ්‍රම බලකාය), 2023 වසරේ වාර්තා වූ මිලියන 8.408 සිට මිලියන 8.316ක් දක්වා අඩු වී ඇත. ශ්‍රම බලකාය සහ කුටුම්බ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතිකය ද 2023 වසරේ වාර්තා වූ 48.6%ට සාපේක්ෂව 2024 වසරේ දී 47.4%ක් දක්වා අඩු විය.

විරැකියා අනුපාතිකය 2023 වසරේ වාර්තා කළ 4.7%ට සාපේක්ෂව 2024 වසරේ දී 4.4%ක් දක්වා අඩු විය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී සේවා වියුක්ත[14] සහ සේවා නියුක්ත[15] ජනගහනය ද අඩු විය.

12 ශ්‍රී ලංකා මිහින්දෝරු දෙපාර්තමේන්තුව 2024 වසරේ දී රටේ ප්‍රමාණය වර්ග කිලෝමීටර 67,240ක් ලෙස (භූමි ප්‍රමාණය: වර්ග කිලෝමීටර 62,302) නැවත ගණනය කරන ලද අතර, එය මෙයට පෙර වර්ග කිලෝමීටර 65,610ක් (භූමි ප්‍රමාණය: වර්ග කිලෝමීටර 62,705) ලෙස වාර්තා විය. (මූලය: **https://www.survey.gov.lk/sdweb/pdf/latestpost/Recalculation%20of%20Country%20Extent.pdf**)

13 සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

14 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාරගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

15 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේවයන් සහ තමාගේ ම වැඩ කටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම වශයෙන් පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට අදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

1.4 සංඛ්‍යා සටහන: පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ) (ආ)

ප්‍රතිශත දායකත්වය (%)

ශීර්ෂය	2023 (අ)					2024				
	මූල්‍ය නොවන අංශය	මූල්‍ය අංශය	රාජ්‍ය අංශය	ගෘහ ඒකක හා ලා.නො.ගෘ.සේ.ආ.* අංශය	දළ එකතු කළ අගය	මූල්‍ය නොවන අංශය	මූල්‍ය අංශය	රාජ්‍ය අංශය	ගෘහ ඒකක හා ලා.නො.ගෘ.සේ.ආ.* අංශය	දළ එකතු කළ අගය
සේවක ආදායම	53.3	9.3	20.1	17.3	100.0	**53.8**	**7.7**	**20.9**	**17.7**	**100.0**
දළ මෙහෙයුම් අතිරික්තය	82.2	15.5	2.3	-	100.0	**81.8**	**16.0**	**2.2**	**-**	**100.0**
දළ මිශ්‍ර ආදායම	-	-	-	100.0	100.0	**-**	**-**	**-**	**100.0**	**100.0**
නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා වූ සහනාධාර)	64.6	14.6	-	20.8	100.0	**66.2**	**13.9**	**-**	**19.9**	**100.0**
මූලික මිල ගණන් අනුව දළ එකතු කළ අගය	43.1	7.9	6.4	42.5	100.0	**43.2**	**7.7**	**6.6**	**42.5**	**100.0**

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
*ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

1.5 සංඛ්‍යා සටහන: කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)

ශීර්ෂය	2023	2024 (ආ)
කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000	17,306	**17,551(ඇ)**
ශ්‍රම බලකාය පුද්ගලයන් '000	8,408	**8,316**
සේවා නියුක්ත	8,010	**7,949(ඇ)**
සේවා වියුක්ත	398	**367(ඇ)**
සේවා වියුක්ත අනුපාතිකය	4.7	**4.4**
පුරුෂ	3.6	**ලැ.නො.**
ස්ත්‍රී	7.0	**ලැ.නො.**
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (අෑ)	48.6	**47.4**
පුරුෂ	68.6	**ලැ.නො.**
ස්ත්‍රී	31.3	**ලැ.නො.**

මූලාශ්‍රය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) කාර්තු හතරෙහි සාමාන්‍යය
(ඇ) මෙම අගයන් 2025.03.28 දිනට පවතින තොරතුරු වලින් ව්‍යුත්පන්න කර ඇති අතර, ඉදිරියේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන සංඛ්‍යාලේඛනවලට වඩා වෙනස් විය හැක.
(අෑ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස
ලැ.නො. - ලැබී නොමැත

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව, විදේශ රැකියා සඳහා පිටත්වීම් 2023 වසරේ දී වාර්තා කළ 297,656ට සාපේක්ෂව 2024 වසරේ දී 314,828ක් දක්වා 5.8%කින් ඉහළ ගියේය. වසර තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාවෙන් 59.3%ක් පුරුෂයින් ද 40.7%ක් කාන්තාවන් ද විය.

1.2.6 ආර්ථික යටිතල පහසුකම්

විදුලිබලය හා බලශක්තිය

බනිජ තෙල්

2024 වසර තුළ දී ගෝලීය බොරතෙල් මිල ගණන් නිරන්තරයෙන් විචලනය වෙමින් පැවතුණු අතර, ආරම්භයේ දී මිල ඉහළ යෑමේ ප්‍රවණතාවක් ද, වසරේ අවසාන භාගය වන විට මිල ගණන් ක්‍රමයෙන් පහළ වැටීමක් ද දක්නට ලැබුණි. මෙම විචලනයට, භූ දේශපාලනික ප්‍රවණතා සහ ඇමරිකා එක්සත් ජනපදයේ හා චීනයේ මන්දගාමී ආර්ථික වර්ධනය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතා බොහෝ දුරට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2023 වසරේ දී වාර්තා වූ ඇ.ජ. ඩොලර් 82.22 සිට 2024 වසරේ දී ඇ.ජ. ඩොලර් 79.79ක් දක්වා 3.0%කින් පහළ ගියේය. මෙම පහළ යෑම 2022 වසර සහ 2023 වසර අතර වාර්තා වූ 17.0%ක පහත වැටීමට සාපේක්ෂව ඉතා අඩු අගයක් විය.


ගෝලීය බලශක්ති මිල ගණන් පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල අනිප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, 2024 වසරේ මුල් භාගයේ සිට බනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ක්‍රමයෙන් පහළ ගියේය. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි වාර්ෂික සාමාන්‍යය, 2023 වසරේ වාර්තා වූ ඇ.ජ. ඩොලර් 89.60 සිට 2024 වසරේ දී ඇ.ජ. ඩොලර් 84.69ක් දක්වා 5.5%කින් පහළ ගියේය. 2024 වසර තුළ දී පිරිවැය පිළිබිඹු කෙරෙන ඉන්ධන මිල සංශෝධන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වසර අවසන් වන විට දේශීය බනිජ තෙල් නිෂ්පාදිතවල සිල්ලර මිල ගණන් සමස්තයක් ලෙස පහළ ගියේය. ඒ අනුව, 2023 වසර අවසානයේ පැවති මිල ගණන්වලට සාපේක්ෂව, ලං.ඛ.නී.සං. විසින් අලෙවි කරන ලද පෙට්‍රල් 92, සුදු ඩීසල් සහ භූමිතෙල් නිෂ්පාදිතවල සමස්ත මිල ගණන්, පිළිවෙළින්, 10.7%කින්, 13.1%කින් සහ 23.9%කින් පහළ යෑම් වාර්තා කළේය. මෙය 2022 වසරේ සිට 2023 වසර දක්වා මෙම බනිජ තෙල් නිෂ්පාදිත තුනෙහි සිල්ලර මිල ගණන්වල දක්නට ලැබුණු පහළ යෑමේ ප්‍රවණතාවයේ අඛණ්ඩ පැවැත්මක් වන අතර, 2022 වසර අවසානයේ පැවති මිල ගණන්වලට සාපේක්ෂව පෙට්‍රල් 92, සුදු ඩීසල් සහ භූමිතෙල් මිල ගණන්, පිළිවෙළින්, 16.5%කින්, 31.9%කින් සහ 48.5%කින් පහළ යෑම් වාර්තා කර ඇත.

ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් නැවත පණ ගැන්වීම පිළිබිඹු කරමින් 2024 වසරේ දී බනිජ තෙල් නිෂ්පාදිත විකුණුම්වල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. 2024 වසරේ දී, බනිජ තෙල් නිෂ්පාදිතවල විකුණුම් පරිමාව පෙර වසරට සාපේක්ෂව 11.3%ක වර්ධනයක් වාර්තා කළේය. ආර්ථිකයේ වෙනස් වන අවශ්‍යතා සපුරාලීම සහ කාර්යක්ෂමතාව හා තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ දේශීය බනිජ තෙල් වෙළඳපොළ විවෘත කිරීමේ ප්‍රයත්න වසර තුළ දී ක්‍රියාත්මක විය. මෙම සංක්‍රාන්තියේ කොටසක් ලෙස, 2024 වසර අවසානය වන විට, නව පෞද්ගලික සමාගම් තුනක් ක්‍රියාත්මක වෙමින් තිබූ අතර, ඉන් සමාගම් දෙකක් වසර තුළ දී ආරම්භ කරන ලද අතර එක් සමාගමක් 2023 වසරේ දී ආරම්භ කරන ලදී.

පිරිවැය පාදක මිලකරණය අනුගමනය කිරීමෙන් පසුව, මෑත අතීතයේ සිදු වූ සැලකිය යුතු අලාභ හා සසඳන විට, 2024 වසරේ දී අඛණ්ඩව දෙවන වසරටත් ලං.ඛ.නී.සං. ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කළේය. මෙම පසුබිම තුළ, ලං.ඛ.නී.සං., 2022 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 617.6ක සැලකිය යුතු අලාභයෙන් සහ 2023 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 120.3ක ලාභයෙන් අනතුරුව, 2024 වසරේ දී රුපියල් බිලියන 33.3ක ලාභයක් වාර්තා කළේය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ලාභය පහත වැටීමට බොහෝ දුරට හේතු වූයේ පෞද්ගලික අංශයේ තරඟකරුවන්ගේ ආගමනයෙන් පසු ලං.ඛ.නී.සං.වේ වෙළඳපොළ කොටස හැකිලීමය. ලං.ඛ.නී.සං.වේ මූල්‍ය ශක්‍යතාව වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස, 2022 වසරේ දී ඇ.ජ. ඩොලර් බිලියන 2.5ක වටිනාකමක් ඇති රජයේ ඇපකර සහිත විදේශ විනිමය ණය තොගය රජයට පවරා ගැනීමට ගත් තීරණයට අනුව 2024 වසර අවසානයේ දී එම ආයතනයේ නොපියවූ විදේශ විනිමය ණය සහ ආනයන බිල්පත් ඇ.ජ. ඩොලර් බිලියන 0.3ක් විය. මේ අතර, 2024 වසර අවසන් වන විට රජයේ ආයතනවලින් ලං.ඛ.නී.සං.ට ලැබිය යුතු මුළු හිඟ වෙළඳ ලැබීම් ප්‍රමාණය රුපියල් බිලියන 10.0ක් විය.

1

1.1 විශේෂාංග රූප සටහන්
දේශීය ඉන්ධන අලෙවියෙහි සහ මිල ගණන්වල ප්‍රවණතා



2022-2024 කාලය තුළ දී පෙට්‍රල් 90/92 සහ සුදු ඩීසල් විකුණුම් පරිමාව සහ දේශීය සිල්ලර මිල අතර සම්බන්ධතාවය රූප සටහන් මගින් නිරූපණය කෙරේ. 2022 වසරේ මැද භාගයේ දී බනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන් ඉහළ යෑමත්, මිල සූත්‍රය පදනම් කරගත් මිල නියම කිරීමේ ක්‍රමවේදය ක්‍රියාවට නැංවීමත් සමඟ ඉන්ධන වර්ග දෙකෙහි ම මිල තියුණු ලෙස ඉහළ ගියේය. ආර්ථික අර්බුදය පැවති කාලපරිච්ඡේදය තුළ දී දේශීය මිල ගණන් ඉහළ යෑම, ඉන්ධන සලාක වශයෙන් නිකුත් කිරීම සහ මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් විකුණුම් පරිමාවට බලපෑම් ඇති විය. මෙම වර්ධනයන්හි ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, එම කාලය තුළ දී දේශීය වෙළඳපොළේ බනිජ තෙල් නිෂ්පාදිතවල සමස්ත විකුණුම් පරිමාව තියුණු ලෙස පහළ ගියේය.

අර්බුදයෙන් පසුව, ගෝලීය සහ දේශීය මිල ගණන් ස්ථාවර වී, දේශීය ඉන්ධන සැපයුම යථා තත්ත්වයට පත් වුව ද, සමස්ත ප්‍රවණතාවලින් පෙනී යන ආකාරයට ඉහළ ඉන්ධන මිල ගණන් විකුණුම් පහළ යෑමටත්, පහළ ඉන්ධන මිල ගණන් විකුණුම් ඉහළ යෑමටත් හේතු වන අතර, එමගින් මිල උච්චාවචනයන්ට වෙළඳපොළ සංවේදී වන බවත්, පාරිභෝගික ඉල්ලුමෙහි වෙනස්වීම් සිදු විය හැකි බවත් ඉස්මතු කෙරේ. මේ අනුව, අහිතකර ලෙස ගෝලීය භාණ්ඩ මිල වෙනස් වන අවස්ථාවන්හි දී රටට ඇතිවන අයහපත් බලපෑම් අවම කිරීම සඳහා පිරිවැය පාදක මිලකරණය උපකාරී වේ.

විදුලිබලය


ආර්ථික කටයුතු යළි යථා තත්ත්වයට පත්වීම මෙන්ම, විදුලි ගාස්තු දෙවරක් පහළ දැමීමත් සමඟ 2024 වසරේ දී විදුලිබල ඉල්ලුම අඛණ්ඩව යථා තත්ත්වයට පත් විය. 2024 වසරේ දී, සියලුම පාරිභෝගික කාණ්ඩ සඳහා සිදු කළ විකුණුම් ඉහළ ගිය අතර, එය සමස්තයක් වශයෙන් විදුලිබල ඉල්ලුමෙහි 7.3%ක වර්ධනයකට හේතු විය. විශේෂයෙන් ම, ගෘහස්ථ සහ ආගමික අංශ සඳහා විකුණුම් 2024 වසරේ පළමු කාර්තුවේ දී සුළු වශයෙන් පහළ ගිය ද, ඉන් අනතුරුව සිදු වූ විදුලි ගාස්තු අඩු වීම හේතුවෙන් නැවත ඉහළ ගියේය. ඉහළ ගිය විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා වසර තුළ දී විදුලිබල උත්පාදනය ද 7.8%කින් වර්ධනය විය.

කාලගුණික බලපෑම් හේතුවෙන්, විදුලිබල උත්පාදන සංයුතියෙහි යම් විචලනයන් දක්නට ලැබිණි. වසරේ පළමු කාර්තුවේ පැවති වියළි කාලගුණික තත්ත්වය සහ අන්තර් මෝසම් වර්ෂාපතනය අඩු වීම හේතුවෙන්, 2024 වසරේ මාර්තු, අප්‍රේල් සහ ඔක්තෝබර් මාසවල දී විදුලිබල අංශය මත ඇති වූ අයහපත් බලපෑම නිසා ද්‍රව ඉන්ධන පදනම් කරගත් තාප විදුලි උත්පාදනය මත වැඩි වශයෙන් යැපීමට සිදු විය. කෙසේ වෙතත්, මැයි මාසයේ මැද භාගයේ දී දක්නට ලැබුණු හිතකර වර්ෂාපතනය සහ නොවැම්බර් මාසයේ අග වන විට ලැබුණු සාමාන්‍ය අගයට වඩා වැඩි වර්ෂාපතනය, ඉහළ ජල විදුලි උත්පාදනයක් සහිතව විදුලි උත්පාදනය සිදු කිරීමට දායක විය. වසර තුළ දී ජලය, ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් සමස්ත බලශක්ති උත්පාදනය සඳහා දැක්වූ දායකත්වය, පිළිවෙළින්, 32.3%ක්, 13.9%ක්, 32.6%ක්, සහ 21.2%ක් විය.

විදුලි ගාස්තු දෙවරක් අඩු කරනු ලැබුව ද, 2024 වසරේ දී ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) ලාභදායීව ක්‍රියාත්මක විය. 2024 වසර සඳහා මුළු වාර්ෂික ලාභය රුපියල් බිලියන 148.6ක් ලෙස වාර්තා විය. මෙම ලාභය හේතුවෙන්, ලං.වි.ම.හි කෙටිකාලීන ණය ගැනීම් සහ වගකීම් 2023 වසර අවසානයේ තිබූ රුපියල් බිලියන 292.8ක සිට 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 123.6ක් දක්වා අඩු වූ අතර, දිගුකාලීන වගකීම්

1

1.10 රූප සටහන: විදුලිබල හා බලශක්ති අංශයේ ප්‍රවණතා



රුපියල් බිලියන 413.3ක සිට රුපියල් බිලියන 409.0ක් දක්වා අඩු විය. කාර්තුමය පදනමෙන් සංශෝධන ක්‍රියාත්මක කිරීම අක්‍රමවත් වුවද, වසර තුළ දී පිරිවැය පිළිබිඹු කෙරෙන විදුලි ගාස්තු සංශෝධන අඛණ්ඩව සිදු විය. ඒ අනුව, වසර තුළ දී දෙවරක් විදුලි ගාස්තු සංශෝධන සිදු කරන ලද අතර, සාමාන්‍යයක් ලෙස ගත් කල, මාර්තු මාසයේ දී 21.9%ක අඩු කිරීමක් සහ ජූලි මාසයේ දී තවත් 22.5%ක අඩු කිරීමක් සිදු කරන ලදී. අඛණ්ඩව සිදු කරන ලද මෙම සැලකිය යුතු විදුලි ගාස්තු අඩු කිරීම් හේතුවෙන් වසරේ අවසාන භාගයේ දී මාසිකව උපයන ලද ලාභය සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි. 2025 වසරේ ජනවාරි මාසයේ දී, විදුලි ගාස්තු 20.0%ක සාමාන්‍යයකින් පහළ දමමින් ගාස්තු සංශෝධනයක් සිදු කරන ලද අතර, එවැනි සංශෝධනයක් කෙතරම් දුරට පිරිවැය පිළිබිඹු කරනුයේ ද යන්න පිළිබඳ අවිනිශ්චිතතා ඇති විය. එබැවින්, පිරිවැය පහළ යෑමක් නොමැතිව තවදුරටත් ගාස්තු අඩු කිරීම මගින් ලං.වි.ම. මූල්‍ය ක්‍රියාකාරිත්වය විශාල ලෙස අඩපණ විය හැකිය.


වර්ධනය වන විදුලිබල ඉල්ලුම සපුරාලීමට දරන ප්‍රයත්න මධ්‍යයේ, පවතින යටිතල පහසුකම් සම්බන්ධ ගැටලු නිරාකරණය කරමින්, රජය දේශීය විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු කළේය. 2024 වසරේ ජූනි මාසයේ දී, අංශය තුළ අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් සක්‍රියව සිදු කිරීම සඳහා 2024 අංක 36 දරන විදුලිබල පනත බලාත්මක කරන ලදී. මෙම නීති සම්පාදනය මගින්, විදුලිබල අංශය නියාමනය, වෙළඳපොළ තරගකාරීත්වය, පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම සහ ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම්

1

1.2 විශේෂාංග රූප සටහන්
විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණයේ වැදගත්කම

පිරිවැයට වඩා අඩු අගයකින් මිල නියම කිරීම මගින් විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම පිළිබඳව නොසලකා සැමට එක ලෙස සලකා විවෘත ලෙස සහනාධාර ලබා දීමේ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුව පවතී. මෙම සහනාධාර, ලං.වි.ම. සහ ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්ය සාධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගේ ද්‍රවශීලතා හිඟයන් බැංකු අංශය විසින් මූල්‍යකරණය කරන ලද අතර, එමගින් අනෙකුත් ඵලදායී ආයෝජන සීමා විය. 2022 වසරේ දී, මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි මූල්‍යමය ශක්‍යතාව සුරක්ෂිත කිරීම සඳහා එම ආයතනයන්හි දිගු කාලීන ණයවලින් කොටසක් රජය වෙත පවරා ගැනීමට සිදු වූ අතර, පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයකට අනුකූලව, 2022 සහ 2023 වසරවල දී ඉන්ධන මිල ගණන් සහ විදුලිය ගාස්තුවල සැලකිය යුතු සංශෝධන කිරීමට සිදු විය. ඉන් පසුව, ලං.වි.ම. සහ ලං.ඛ.නී.සං. යන ආයතන දෙකම වාර්ෂිකව ලාභ ලබමින් ඇත. උපයෝගිතා සඳහා වන සහනාධාර මගින් මහජනතාවට සහ ව්‍යාපාරවලට කෙටි කාලීන සහනයක් ලැබුණ ද, අවසානයේ දී, එහි දිගුකාලීන පිරිවැය, ඉහළ බලශක්ති මිල ගණන්, බදු සහ සමස්ත උද්ධමනයේ ඉහළ යෑම හරහා දරා ගැනීමට ඔවුන් හට සිදු වන බව ඉහත අත්දැකීම මගින් අනාවරණය වේ. කෙටි කාලීන වාසි වෙනුවෙන් සාර්ව ආර්ථිකයට දිගු කාලීන අයහපත් බලපෑම් ඇති වන අයුරින් පිරිවැයට වඩා අඩුවෙන් මිල නියම කිරීමේ විෂම චක්‍රය වැළැක්වීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන ආකාරයේ මිල නියම කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. එබැවින්, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන ආකාරයේ මිල නියම කිරීමේ ක්‍රමවේදයෙන් අපගමනය වීම, රජය හෝ ව්‍යාපාර හෝ මහජනතාව සඳහා දිගු කාලීනව වාසිදායක නොවේ. එබැවින්, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු නොවන ආකාරයෙන් මිල නියම කිරීම තුළින් සැමට විවෘත ලෙස සහන ලබා දීම වැනි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට වෙනුවට, ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම හරහා, ආර්ථිකයේ අවශ්‍යතා ඇති ජන කොටස්වලට අමතර සහන සැපයිය හැකිය. තවද, නිෂ්පාදන පිරිවැය අඩු කරන අතරතුර මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම තුළින් පාරිභෝගිකයාට ප්‍රතිලාභ ලබා දීමට ක්‍රියාමාර්ග ගත හැකිය.

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා බහිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය (වාර්ෂික ලාභය/අලාභය)



මූලාශ්‍ර: ලංකා විදුලිබල මණ්ඩලය
ලංකා බහිජ තෙල් නීතිගත සංස්ථාව

▲

වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන අතර, එමගින් බලශක්ති අංශයට අදාළ නීති සම්පාදන රාමුවේ සැලකිය යුතු පරිදි මූලික පරිවර්තන ඇති කිරීම අරමුණු කර ගෙන ඇත. රජය වෙනස් වීමෙන් අනතුරුව, ආරක්ෂිත, තිරසාර සහ පාරිභෝගික කේන්ද්‍රීය විදුලිබල අංශයකට මෙම පනත ඵලදායී ලෙස සහාය වන බව සහතික කිරීම සඳහා, ඒ පිළිබඳ සමාලෝචනය කර තවදුරටත් සංශෝධන නිර්දේශ කිරීමට 2024 වසර අවසානයේ දී කමිටුවක් පත් කරන ලදී. තවද, සොබාදනවි බලාගාරය සඳහා අපේක්ෂිත මෙහෙයුම් පද්ධති වැඩි දියුණු කිරීම මගින් එය රට තුළ විදුලිය නිෂ්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු භාවිතා කළ හැකි පළමු විදුලි බලාගාරය බවට පත් වනු ඇත. මෙම වැඩි දියුණු කිරීම් 2025 වසරේ පළමු භාගය වන විට නිම කිරීමට අපේක්ෂා කරන අතර, ද්‍රවීකෘත ස්වභාවික වායු ගබඩා පහසුකම් ඇතුළු අනෙකුත් ආධාරක යටිතල පහසුකම් සංවර්ධනය 2028 වසර වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, වර්තමාන වෙළඳපොළ තත්ත්වයන්ට සහ රටේ අනාගත බලශක්ති ඉල්ලුමට වඩාත් ගැළපෙන පරිදි 2025-2044 සඳහා විදුලිබල උත්පාදනය කිරීමේ දිගුකාලීන සැලැස්ම යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක ලං.වි.ම. නිරතව සිටී.

ප්‍රවාහන අංශය

අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ සිදු වූ සැලකිය යුතු පසුබෑම්වලින් අනතුරුව 2024 වසරේ දී ප්‍රවාහන අංශය මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. මාර්ග ප්‍රවාහන දර්ශකවල ක්‍රියාකාරීත්වය, ධාවන කිලෝමීටර ගණන අනුව සුළු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ටිකට්පත් ලබාගත් මගීන් සංඛ්‍යාව පදනම්ව ගණනය කෙරෙන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලං.ග.ම.) මගී කිලෝමීටර ගණනෙහි පහළ යෑමක් දක්නට ලැබුණි. තවද, දුම්රිය ප්‍රවාහන ක්‍රියාකාරකම් මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ අතර, ගුවන් ප්‍රවාහන දර්ශක වර්ධනයක්

පෙන්නුම් කළේ ය. 2023 වසරේ දී පෙන්නුම් කළ වර්ධන ගම්‍යතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, වරාය අංශ ක්‍රියාකාරකම් 2024 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

අනෙකුත් ප්‍රවණතා

2024 වසර තුළ දී, කොළඹ වරාය නගරය, නාවික වරායන්, මහාමාර්ග, නාගරික සංවර්ධනය සහ නිවාස ඇතුළු ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති වැඩි දියුණු කිරීම සඳහා රජය අඛණ්ඩව ප්‍රයත්න දැරුවද, එක් එක් අංශයන්හි ප්‍රගතිය අසමානව පැවතුණි. කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් පැවති අතර, මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු සහ තෙවන අදියර සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ සිවිල් වැඩ කටයුතු වසර තුළ සිදු විය. විදේශ රාජ්‍ය ආධාර වැඩසටහනක් යටතේ නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දුන් අතර, ප්‍රමාණවත් පහසුකම් නොලැබෙන ප්‍රජාවන් සඳහා යෝග්‍ය පහසුකම් සහිත නිවාස සැපයීම කෙරෙහි අවධානය යොමු කරමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් තවත් අඩු ආදායම්ලාභී සහ මධ්‍යම ආදායම්ලාභී නිවාස වැඩසටහන් කිහිපයක් ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුලපුරන ලද ප්‍රධාන වැඩසටහන් වන, සියක් නගර සංවර්ධන වැඩසටහන සහ රාජ්‍ය ආයතන සංවර්ධන වැඩසටහන යටතේ නාගරික යටිතල පහසුකම් සහ පොදු පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් වසර තුළ නිම කරන ලදී. කොළඹ වරාය නගරයේ සිදුවෙමින් පවතින සංවර්ධන කටයුතුවල කොටසක් ලෙස, කලාපයේ පළමු තීරුබදු රහිත සාප්පු සංකීර්ණය වසර තුළ දී නිම කර විවෘත කරන ලදී. තවද, 2024 වසරේ දී කොළඹ වරාය නගරයට අදාළව නව බැංකු රෙගුලාසි හඳුන්වා දෙන ලද අතර, එමගින් ඉහළ මට්ටමේ නියාමනයක් පවතින බව සහතික කිරීම හරහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඇති සූදානම ඉස්මතු කෙරේ. වරාය යටිතල පහසුකම් සම්බන්ධයෙන් සලකා බලන විට, වසර තුළ දී කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තයෙහි සහ බටහිර බහාලුම් පර්යන්තය Iහි සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් අත්පත් කර ගත් අතර, නැගෙනහිර බහාලුම් පර්යන්තය හා බටහිර බහාලුම් පර්යන්තය I, පිළිවෙළින්, 2026 සහ 2027 වසරවල දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සංවර්ධන කටයුතු තුළින් කොළඹ වරායේ තරගකාරිත්වය තවදුරටත් ඉහළ නැංවෙන අතර, අනාගතයේ දී වරාය කර්මාන්තයේ ඉදිරි අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමෙන් සහ වර්ධනය වන ඉල්ලුම සපුරාලීමෙන් අනෙකුත් අසල්වැසි වරායන් සමඟ වඩාත් දැඩි ලෙස තරග කිරීමට හැකියාව ලැබෙනු ඇත.

1.2.7 සමාජ යටිතල පහසුකම්

අධ්‍යාපනය

කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ පසුබෑම් මාලාවකින් පසුව, 2024 වසරේ දී අධ්‍යාපන අංශය බොහෝ දුරට යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ ද, එම අර්බුදවල දිගුකාලීන අයහපත් බලපෑම් තවදුරටත් දක්නට ලැබේ. වසර තුළ දී, අදාළ බලධාරීන් විසින් රටෙහි අධ්‍යාපනයේ සාධාරණ ප්‍රවේශය සහ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පුළුල් පරාසයක පියවර ගන්නා ලදී. එබැවින්, නිදහස් අධ්‍යාපනය සඳහා වූ ප්‍රවේශයේ සමානාත්මතාව තහවුරු කිරීම සඳහා, 2024 වසර තුළ දී රජය ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන ගියේය. මේ අනුව, සිසුන් මිලියන 4.5කට වැඩි පිරිසකට පාසල් නිල ඇඳුම් බෙදා දීම, සිසුන් මිලියන 1.4ක් ආවරණය වන පරිදි පාසල් ආහාර වැඩසටහන දියත් කිරීම සහ නොමිලේ පාසල් පෙළපොත් බෙදා දීම සිදු කරන ලදී. මීට අමතරව, ශිෂ්‍ය සුබසාධනය තවදුරටත් වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2024 වසරේ දී, සුභග, සුජාත දියණී සහ මහත්මා ගාන්ධි යන ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර වැනි ප්‍රදාන යෝජනා ක්‍රම පාසල් සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලදී. තවද, 2025 අයවැය මගින් වෘත්තීය අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා වන දීමනාව, මහපොළ ශිෂ්‍යත්වය සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා මාසික ශිෂ්‍යාධාර ගෙවීම් වැඩි කිරීමට රජය විසින් ප්‍රතිපාදන සලසා ඇත. 2023 වසර සඳහා වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග 2024 වසරේ දී පවත්වන ලද අතර, 2024 වසර සඳහා වන සාමාන්‍ය පෙළ විභාගය 2025 වසර දක්වා කල් ගියේය. වසංගතයෙන් හා ආර්ථික අර්බුදයෙන් පසුව විභාග පැවැත්වීම අඛණ්ඩව ප්‍රමාද වීම, අධ්‍යාපනය ලබා දීමේ රටාවට අහිතකර ලෙස බලපා ඇත. තවද, වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් පාසල් හැර යෑමේ අනුපාතය සහ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන් මත පැටවෙන මූල්‍යමය පීඩනය තීව්‍ර වී ඇත.

1.6 සංඛ්‍යා සටහන: ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය

අංශය	2023 (අ)	2024 (අ)	වෙනස 2023/2024 (%)
මාර්ගස්ථ ප්‍රවාහනය (ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය)			
ධාවන කිලෝමීටර (මිලියන)	364	**371.7**	**2.1**
මගී කිලෝමීටර (මිලියන)	14,272	**13,153**	**-7.8**
දුම්රිය ප්‍රවාහනය (ශ්‍රී ලංකා දුම්රිය සේවය)			
මගී කිලෝමීටර (මිලියන)	7,044	**6,000**	**-14.8**
භාණ්ඩ ටොන් කිලෝමීටර (මිලියන)	159	**172**	**8.1**
ගුවන් ප්‍රවාහනය			
මගී මෙහෙයුම් (මිලියන) (ආ)	7.5	**8.8**	**17.8**
ශ්‍රීලංකන් ගුවන් සේවය	3.7	**3.5**	**-6.1**
භාණ්ඩ (මෙ.ටො. දහස්)	158.6	**195.4**	**23.2**
ශ්‍රීලංකන් ගුවන් සේවය	79.3	**93.0**	**17.2**
මුහුදු ප්‍රවාහනය (කොළඹ වරාය)			
බහාලූ මෙහෙයුම් (TEUs දහස්)	6,950	**7,792**	**12.1**
පැමිණි නැව් සංඛ්‍යාව	4,237	**3,968**	**-6.3**

(අ) තාවකාලික
(ආ) සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ
TEUs = අඩි 20ට සමාන බහාලූ ඒකක

මූලයන්: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
ශ්‍රී ලංකා වරාය අධිකාරිය

1

සෞඛ්‍යය

සීමාසහිත සම්පත් මධ්‍යයේ වුවද, 2024 වසරේ දී සෞඛ්‍ය අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. ඒ අනුව, සෞඛ්‍ය සේවා පද්ධතිය හා සේවාවන් නගා සිටුවීම සහ වැඩි දියුණු කිරීම සඳහා, රජය ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ක්‍රියාමාර්ග ගන්නා ලදී. වසර තුළ, දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි සෞඛ්‍ය සේවාවන්හි සාධාරණ සහ සැමට ප්‍රවේශයක් ඇති කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනයේ සැලකිය යුතු සන්ධිස්ථාන සපුරා ගන්නා ලදී. අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ද ඇතුළුව, ජර්මානු රජයේ අරමුදල් යටතේ කරාපිටිය ජර්මානු-ශ්‍රී ලංකා මිත්‍රත්ව මාතෘ හා ළමා සෞඛ්‍ය රෝහල විවෘත කිරීම සහ කුරුණෑගල ශික්ෂණ රෝහලේ පස් මහල් වාට්ටු සංකීර්ණයක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ හෘද ප්‍රතිකාර සඳහා කැතීටරීකරණ රසායනාගාරයක් සහිත සය මහල් ගොඩනැගිල්ලක් හා යාපනය ශික්ෂණ රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකයක් ආරම්භ කිරීම කැපී පෙනෙන සංවර්ධන ව්‍යාපෘති වේ. තවද, 2025 වසරේ මුල් භාගයේ දී, විවිධ පරිත්‍යාගශීලීන්ගේ මූල්‍ය ආධාර ඇතිව, පිළිකා රෝගයෙන් පෙළෙන දරුවන් සඳහා රජයේ රෝහලක, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම ඇටමිදුළු සහ ජනන සෛල බද්ධ කිරීමේ ඒකකය මහරගම අපේක්ෂා පිළිකා රෝහලේ දී ආරම්භ කරන ලදී.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා අංශයේ අඛණ්ඩ ප්‍රගතියක් නිබුණ ද, අභියෝගතා රැසක් නවමත් පවතී. සෞඛ්‍ය සේවා පද්ධතිය නවීකරණය, මානව සම්පත්, අරමුදල් හා සම්පත් බෙදා හැරීම සහ කලාපීය විෂමතා මෙම අභියෝග අතරට අයත් වේ. ප්‍රමාණවත් රසායනාගාර පරීක්ෂණ ධාරිතාවක් සහ ප්‍රවාහන පහසුකම් නොමැතිකම වසර තුළ රෝග නිරීක්ෂණ සහ පාලන කටයුතුවලට අහිතකර ලෙස බලපාන ලදී. කොවිඩ්-19 වසංගතයෙන් හා ආර්ථික අර්බුදයෙන් පසුව, මාතෘ හා ළමා පෝෂණය, නව යොවුන් හා තරුණ ප්‍රජාවගේ මානසික සෞඛ්‍යය සහ වතු හා නාගරික අංශවල අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර සෞඛ්‍ය ගැටලු කෙරෙහි උපායමාර්ගික අවධානය යොමු විය යුතු ක්ෂේත්‍ර වේ. එබැවින්, මෙම ක්ෂේත්‍රවලට අදාළ සෞඛ්‍ය සේවා අංශයේ සිදුවන මූලික පරිවර්තන සහ රටේ වයස්ගත ජනගහනය වැඩිවීම, බෝ නොවන රෝග ශීඝ්‍රයෙන් පැතිරී යාම සහ දේශගුණික විපර්යාස හා සම්බන්ධ සෞඛ්‍ය අවදානම්වලට මුහුණ දීම ආදිය සඳහා ක්‍රියාකාරී උපාය මාර්ග සකස් කළ යුතුය.

සමාජ ආරක්ෂණ ජාල

ඉලක්කගත පිරිස් වෙත ආධාර ලබා දීම සහ දිගුකාලීනව ආර්ථිකමය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සහතික කරන අතර ම, අවදානමට ලක්විය හැකි ජනකොටස් මුහුණ දෙන අඛණ්ඩ අභියෝග හඳුනා ගනිමින් සමාජ ආරක්ෂණ ජාල පුළුල් කිරීමට සහ වැඩි දියුණු කිරීමට රජය ගන්නා ප්‍රයත්න නවදුරටත් ශක්තිමත් කරන ලදී.

මේ අනුව, සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය යටතේ 2023 වසරේ ජූලි මාසයේ දී ආරම්භ කරන ලද අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මගින් 'අන්ත දිළිඳු', 'දුප්පත්', 'අවදානමට ලක් වූ' සහ 'සංක්‍රාන්තික' ලෙස වර්ගීකරණය කරන ලද අඩු ආදායම්ලාභී පවුල් සඳහා මූල්‍ය ආධාර සැපයීම අඛණ්ඩව සිදු කළ අතර, වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා තනි පුද්ගල දීමනා ද පිරිනමන ලදී. 2024 වසරේ දී, මෙම වැඩසටහන මගින් ප්‍රතිලාභී පවුල් මිලියන 1.8කට මුදල් ප්‍රතිලාභ ලබා දුන් අතර, හිඟ මුදල් ද ඇතුළුව ලබා දුන් මුළු ප්‍රතිලාභ ප්‍රමාණය රුපියල් බිලියන 145.6කි. මීට අමතරව, වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්ට, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන්ට රුපියල් බිලියන 34.2ක පුද්ගල දීමනා ද ලබා දෙන ලදී. අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන් මිලියන 1.1කට පොත්පත් මිලදී ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා දෙන වැඩසටහනක් ද සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සාර්ථකව ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා වැය වූ මුළු මුදල රුපියල් බිලියන 6.6කි. මේ අතර, 2024 වසරේ මැයි සහ දෙසැම්බර් මාසවල දී සුභසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයට සංශෝධන හඳුන්වා දෙන ලදී. මේ සමඟ ම, අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ තවදුරටත් ප්‍රතිලාභ ඉහළ නැංවීම සහ පුළුල් කිරීමට 2025 වසරේ අයවැය හරහා ද කටයුතු කරන ලදී. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී නිකුත් කරන ලද අති විශෙෂ ගැසට් පත්‍රයට අනුව, මෙම යෝජනා ක්‍රමය යටතේ සිටින ප්‍රතිලාභීන් ගණන මිලියන 2.4ක් දක්වා ඉහළ නැංවීම ඉලක්ක කර ඇති අතර, වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන් සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් ආවරණය වන පරිදි පුද්ගලයින් මිලියන 1.28කට ද ප්‍රතිලාභ ලබා දීමට අරමුණු කෙරේ. මේ අතර, අවශ්‍යතා සහිත පුද්ගලයන්ට ප්‍රතිලාභ ලබා දීම පුළුල් කිරීමේ අරමුණින්, සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් අස්වැසුම දෙවන අදියර 2025 වසරේ මුල් භාගයේ දී ආරම්භ කරන ලදී. ආධාර සඳහා සුදුසුකම් ලත් පවුල් තක්සේරු කර තෝරා ගැනීම දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. කෙසේ වෙතත්, ඇතැම් ප්‍රතිලාභීන්ට බැංකු ගිණුම් සහ ජාතික හැඳුනුම්පත් නොමැති වීම වැනි පරිපාලනමය ගැටලු හේතුවෙන් ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ සමාජ ආරක්ෂණ වියදම් ඉලක්ක පූර්ණ වශයෙන් සපුරා ගැනීමට නොහැකි වී ඇති අතර ම, ඒ හේතුවෙන් තෝරාගත් ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ලබා දීම ද මන්දගාමී වී ඇත. ඒ අනුව, ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් ප්‍රමාණවත් ලෙස ආවරණය කිරීමට හැකි වන පරිදි මෙම ගැටලු කඩිනමින් විසඳීමට අවධානය යොමු කර ඇත. ග්‍රාමීය සංවර්ධන,

සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ඒකාබද්ධ වැඩසටහනකින් සමන්විත ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා 2025 වසරේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා දී ඇත. අවදානමට ලක්විය හැකි ජනකොටස් සඳහා තිරසාර සහයෝගයක් ලබා දීම සහතික කරමින්, සමාජ ආරක්ෂණය, ආර්ථික බලගැන්වීම සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ මූලපිරීම් ඒකාබද්ධ රාමුවක් යටතට ගෙන ඒම මගින් දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වූ බහුවිධ ප්‍රවේශයන් එකිනෙකට සම්බන්ධ කිරීමට මෙම වැඩසටහන මගින් ප්‍රයත්න දරනු ලැබේ.

2024 වසරේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ ජාතික සංවර්ධන වැඩසටහන් කිහිපයක් ආරම්භ කළේය. සමාජ සුබසාධනය වැඩි දියුණු කිරීම සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහාය වීම සඳහා අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණ සහ සහනාධාර වැඩසටහන්වලට සමගාමීව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අමාත්‍යාංශය විසින් 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ඇතුළු ප්‍රධාන නීතිමය පියවර හඳුන්වා දෙමින් ඒ හරහා ජාතික කාන්තා කොමිසම පිහිටුවීම, කාන්තා අයිතිවාසිකම් සහතික කිරීම සඳහා කාන්තා ඔම්බුඩ්ස්මන්වරයක් පත් කිරීම, කාන්තාවන් සඳහා ජාතික අරමුදලක් පිහිටුවීම සහ ජාතික ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා කාන්තා බලගැන්වීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. වසර තුළ දී, අමාත්‍යාංශය විසින් පෝෂණ හා උදෑසන ආහාර දීමනා සහ පෙර පාසල් ගුරුවරුන් සඳහා මූල්‍ය ආධාර ඇතුළු කාන්තා හා ළමා සුභසාධන වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

1.3 මුදල් අංශයේ ප්‍රවණතා

1.3.1 වෙළඳපොළ පොලී අනුපාතික


2023 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් 2024 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි. 2023 ජූනි මාසයේ සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික සමස්තයක් ලෙස පදනම් අංක 775කින් පමණ අඩු කළ අතර, ඉන් පදනම් අංක 125ක් පමණ අඩු කිරීම 2024 වසරේ දී සිදු විය. ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමු වෙමින් 2024 නොවැම්බර් මස අවසාන කාලයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය[16] හඳුන්වාදීමත් සමඟ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 50කින් පමණ අඩු කිරීම ද මෙයට ඇතුළත් වේ. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීම සහ දේශීය මුදල් වෙළඳපොළ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වයන්ට අනුකූලව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය[17] 2024 වසරේ දී පහළ ගියේය. 2024 නොවැම්බර් මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දීමෙන් පසුව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද ක්‍රමයෙන් අඩු වී, 2024 වසර අවසානය වන විට 8.00% ආසන්නයේ පැවතුණි. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට අමතරව උද්ධමනය අඩු වීම, උද්ධමන අපේක්ෂා පහළ මට්ටමක පැවතීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් අදියරේ පැවතීමත් සමඟ අවදානම් අධිමිල අඩුවීම 2024 වසර තුළ දී වෙළඳපොළ පොලී අනුපාතිකවල සමස්ත අඩු වීම සඳහා සහාය විය. 2024 වසරේ පළමු භාගයේ දී වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වුවද, 2024 වසර මැද භාගයේ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල දක්නට ලද තාවකාලික ඉහළ යෑම හේතුවෙන් සමස්ත වෙළඳපොළ පොලී අනුපාතිකවල පහළ යෑමේ වේගය මන්දගාමී විය. කෙසේ වෙතත්, 2024 වසර අවසාන කාලය වන විට වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු විය. 2024 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික, එනම් බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය, ප්‍රතිශතාංක 4.1-5.6කින් අඩු විය. බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය වසර මුළුල්ලේ සැලකිය යුතු ලෙස අඛණ්ඩව අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත් 2024 වසර අවසාන භාගයේ දී එම පහත වැටීමේ වේගය තරමක් මන්දගාමී විය. බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය මගින් පිළිබිඹු වන මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික 2024 වසරේ දී ප්‍රතිශතාංක 4.5-4.8කින් අඩු විය. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හා අනුකූලව 2024 වසරේ මුල් කාලයේ දී බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එම තීව්‍ර ගැළපීම්වල යම් මන්දගාමී වීමක් පිළිබිඹු කරමින් 2024 වසරේ අග භාගයේ දී මිශ්‍ර විචලනයන් පෙන්නුම් කළේය. ණය පොලී අනුපාතික, විශේෂයෙන් ම වෙළඳපොළ පදනම් පොලී අනුපාතිකයක් ලෙස සලකනු ලබන, සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දෙන කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය) 2024 වසරේ දී ප්‍රතිශතාංක 3.2කින් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම ණය හා අත්තිකාරම්වලට

16 එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා "තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම" යන විශේෂ සටහන 3 බලන්න.

17 නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මෙහෙයුම් ඉලක්කය ලෙස මහ බැංකුව විසින් සමීපව නිරීක්ෂණය කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතිකය වේ.

1

1.11 රූප සටහන: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම



සටහන: ස්ථිමිත ප්‍රස්ථාරයෙන් 2023 සහ 2024 වසරවලදී පොලී අනුපාතිකවල වාර්ෂික වෙනස්වීම් නිරූපණය වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අදාළ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය) සහ මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව ණය හා අත්තිකාරම්වලට අදාළ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය) 2023 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 4.5කින් සහ ප්‍රතිශතාංක 11.8කින් අඩු වීමට සාපේක්ෂව 2024 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 2.3කින් සහ ප්‍රතිශතාංක 3.6කින් අඩු විය. පදනම් ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වුවද, ඇතැම් ණය උපකරණ සඳහා අදාළ උපරිම ණය පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවති අතර, එමගින් එවැනි ණය පොලී අනුපාතික තවදුරටත් අඩු වීමේ හැකියාව පෙන්නුම් කෙරේ. මේ අතර, අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු වීම හා සමගාමීව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතික ද මෙම වසර තුළ දී අඩු විය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් සියලුම ණය හා අත්තිකාරම් මත පදනම් වූ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය) සහ මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් නව ණය හා අත්තිකාරම් සඳහා වූ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය) 2024 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 2.9කින් සහ ප්‍රතිශතාංක 3.4කින් අඩු විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතිකවල සමස්ත අඩු වීමක් වාර්තා වුවද, ණය ස්වභාවය සහ ඒ ආශ්‍රිත අවදානම් හේතුවෙන් ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ණය ලබා ගන්නන් සඳහා ලබා දෙන ණය සඳහා වූ පොලී අනුපාතික අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික හා සැසඳීමේ දී සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. නාමික වෙළඳපොළ පොලී අනුපාතික අඩු වුවද වාර්තා වූ උද්ධමන අගයන් ගැළපීමෙන් මනිනු ලබන මූර්ත පොලී අනුපාතික අඩු උද්ධමනය සහ 2024 සැප්තැම්බර් මාසයේ සිට පැවති අවධමනකාරී තත්ත්වය හේතුවෙන් 2024 වසරේ දී ඉහළ ධන අගයන් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2025 වසරේ දෙවන භාගයේ දී උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ළඟාවනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ හේතුවෙන් මූර්ත පොලී අනුපාතිකවල පහළ යෑමක් අපේක්ෂා කෙරේ. 2024 වසරේ දෙවන භාගයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීමේ පසු බලපෑම පිළිබිඹු කරමින් 2025 වසරේ මුල් කාලයේ දී වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.

රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වීම, මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ අවදානම් අධිමිල ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ ගියේය. කෙසේ වෙතත්, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2024 වසරේ මැද භාගයේ දී වරින් වර ඉහළ යෑම් වාර්තා කළේය. 2024 වසරේ ජූනි සහ සැප්තැම්බර් අතර කාලය තුළ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා

1

1.7 සංඛ්‍යා සටහන: පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂිකව %

පොලී අනුපාතිකය	2023 අවසානයට	2024 අවසානයට	ප්‍රතිශතාංක වෙනස
ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය			
එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) (අ)	-	8.00	-
නිත්‍ය පහසුකම් අනුපාතික (ආ)			
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)	9.00	7.50	-1.50
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)	10.00	8.50	-1.50
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය	9.24	8.00	-1.24
රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික			
ප්‍රාථමික වෙළඳපොළ (ආ)			
භාණ්ඩාගාර බිල්පත්			
දින 91	14.51	8.62	-5.89
දින 182	14.16	8.77	-5.39
දින 364	12.93	8.96	-3.97
භාණ්ඩාගාර බැඳුම්කර			
වසර 2	13.87(ඇ)	13.83(ඈ)	-0.04
වසර 3	14.07(ඇ)	11.63(ඈ)	-2.44
වසර 4	14.21(ඇ)	10.42(ඈ)	-3.79
වසර 5	14.32(ඇ)	10.75(ඈ)	-3.57
වසර 10	-	-	-
ද්විතියික වෙළඳපොළ			
භාණ්ඩාගාර බිල්පත්			
දින 91	14.13	8.43	-5.70
දින 182	13.86	8.61	-5.25
දින 364	12.71	8.81	-3.90
භාණ්ඩාගාර බැඳුම්කර			
වසර 2	13.52	9.31	-4.21
වසර 3	13.62	9.87	-3.75
වසර 4	13.66	10.30	-3.36
වසර 5	13.74	10.61	-3.13
වසර 10	13.10	11.27	-1.83
තැන්පතු පොලී අනුපාතික			
බලපත්‍රලාභී වාණිජ බැංකු (ඉ)			
ඉතිරිකිරීමේ තැන්පතු	0.25-13.00	0.25-9.00	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඊ)	1.00-22.00	2.50-18.39	-
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය	11.64	7.53	-4.11
බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය	14.88	9.27	-5.61
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය	11.06	6.52	-4.54
බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය	11.33	6.57	-4.76
අනෙකුත් මූල්‍ය ආයතන (උ)			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව			
ඉතිරිකිරීමේ තැන්පතු	3.00	3.00	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	8.00	7.00	-1.00
බලපත්‍රලාභී මුදල් සමාගම් (උඉ)			
ඉතිරිකිරීමේ තැන්පතු	4.33-6.62	3.91 - 6.03	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	11.88-13.56	9.23 - 11.00	-

වාර්ෂිකව %

පොලී අනුපාතිකය	2023 අවසානයට	2024 අවසානයට	ප්‍රතිශතාංක වෙනස
ණය පොලී අනුපාතික			
බලපත්‍රලාභී බැංකු (ඒ)			
බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය	15.33	12.48	-2.85
බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය	14.96	11.59	-3.37
බලපත්‍රලාභී වාණිජ බැංකු (ඉ)			
බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික)	12.39	8.92	-3.47
බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය	14.21	11.93	-2.28
බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය	14.38	10.77	-3.61
බලපත්‍රලාභී විශේෂිත බැංකු (උ)			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	15.00-20.00	12.75-18.00	-
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඒ)	9.50-21.00	9.00-20.00	-
බලපත්‍රලාභී මුදල් සමාගම් (උඉ)			
මූල්‍ය කල්බදු	14.98-32.48	10.99 - 31.75	-
සාංගමික ණය වෙළඳපොළ			
ණයකර	13.50-29.50	12.00-15.25	-
වාණිජ පත්‍රිකා	17.00-26.50	12.00-13.75	-


මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව
අදාළ මූල්‍ය ආයතන

(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. මහ බැංකුව විසින් තීරණය කරන ලද ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කර ඇත.
(ආ) ආසන්නතම වෙන්දේසියේ දී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික
(ඇ) 2023 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය:
වසර 2 - දෙසැ. 28| වසර 3 - දෙසැ.12|
වසර 4 - දෙසැ.28| වසර 5 - දෙසැ.12
(ඈ) 2024 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය:
වසර 2 - ජන.11| වසර 3 - නොවැ.12|
වසර 4 - දෙසැ.30| වසර 5 - දෙසැ.12
(ඉ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඊ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.
(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(උඉ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේදී තැන්පතු ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2024 වසර සඳහා දත්ත තාවකාලික වේ.
(ඒ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඒඒ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.

අනුපාතික ඉහළ යෑම සඳහා වෙළඳපොළ සතු රජයේ සුරැකුම්පත් කල්පිරීම් ඉහළ මට්ටමක පැවතීම මධ්‍යයේ රජයේ අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ සුරැකුම්පත් වෙන්දේසිවල ඉදිරිපත් කළ ප්‍රමාණයන් ඉහළ යෑම මෙන්ම, දේශපාලන අවිනිශ්චිතතා හේතුවෙන් ඇති වූ වෙළඳපොළ අපේක්ෂා යනාදී සාධක ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, වෙනස්වන වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූලව මනා හැඩගැස්වීමක් පෙන්නුම් කරමින් 2024 සැප්තැම්බර් මස මැද භාගයේ සිට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික අඛණ්ඩව පහළ යෑමේ ප්‍රවණතාව නැවත ආරම්භ විය. රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සමස්තයක් ලෙස අඩු වීම සඳහා විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය කළමනාකරණය මෙන්ම, රජය විසින් ප්‍රමාණවත් ස්වාරක්ෂක පවත්වා

1

1.12 රූප සටහන: රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය




මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගැනීම, රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ ප්‍රගතිය සහ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හා වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ යෑම මධ්‍යයේ හිතකර උද්ධමන ප්‍රවණතා සහාය විය. මීට අමතරව, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවය සඳහා 2024 වසර අවසානය වන විට රජයේ සුරැකුම්පත් වෙළඳපොළට ශුද්ධ විදේශ විනිමය ගලා ඒම් වැඩි වීම මෙන්ම උද්ධමනය අඩු වීම සහ හිතකර උද්ධමන අපේක්ෂා තවදුරටත් සහාය විය. 2024 වසර තුළ දී සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික ප්‍රතිශතාංක 4.0-5.9කින් අඩු විය. මෙම ප්‍රවණතාවයට අනුකූලව, භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ද පහළ ගියේය. 2024 වසරේ දී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම්වලින් බොහොමයක් මැදිකාලීන කල්පිරීම් විය. 2024 වසර තුළ දී සිදු වූ විවිධ කල්පිරීම්වලට අදාළ ඵලදා අනුපාතික ආසන්න වශයෙන් ප්‍රතිශතාංක 1.0-4.0කින් පහළ ගියේය. 2023 වසර අවසානයේ දී දක්නට ලැබුණු ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රයේ පැතලි ස්වභාවය හා සැසඳීමේ දී 2024 වසරේ දී ඵලදා වක්‍රය පහළට විතැන් වී ඉහළ-බෑවුම් වක්‍රයක ස්වභාවය ගෙන සාමාන්‍ය තත්ත්වයට පත් විය. එහෙත්, දිගු කාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික අඩු වීම මන්දගාමීව පැවතුණි.

1.3.2 දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව

ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් හරහා රුපියල් ද්‍රවශීලතාව වෙළඳපොළ වෙත සැපයීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ද්‍රවශීලතා මට්ටම් ඉහළ යෑම සහ දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු වීම සැලකිල්ලට ගනිමින් 2023 වසරේ මුල් කාලයේ දී සහභාගීත්ව ආයතන වෙත මහ බැංකුවේ නිත්‍ය පහසුකම් භාවිතය සඳහා පනවන ලද සීමාවන් 2024 පෙබරවාරි මාසයේ දී ලිහිල් කරන ලද අතර, 2024 අප්‍රේල් මාසයේ සිට එම සීමාවන් සම්පූර්ණයෙන් ම ඉවත් කරන ලදී. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ආසන්න වශයෙන් රුපියල් බිලියන 858ක ප්‍රමාණයකට සමාන ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්වලට අමතරව, විශේෂයෙන් ද්විපාර්ශ්වික හවුල්කරුවන් විසින් රජයට ලබා දුන් ශුද්ධ විදේශ ණය ලැබීම් සහ මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සිදු වූ ශුද්ධ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් හරහා ද දේශීය මුදල් වෙළඳපොළට රුපියල් ද්‍රවශීලතාව සැපයිණි. කෙසේ වෙතත්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කූපන් ගෙවීම්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් සහ ව්‍යවහාර මුදල් බැංකු පද්ධතියෙන් ලබා ගැනීම් මෙන්ම කාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු කල්පිරීම් මගින් 2024 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව යම්තාක් දුරකට අවශෝෂණය කර ගැනුණි. ඒ අනුව, 2023 වසරේ දී සාමාන්‍යයක් ලෙස රුපියල් බිලියන 70ක පමණ පැවති දෛනික ද්‍රවශීලතා හිඟය 2024 වසරේ මැද භාගය වන විට රුපියල් බිලියන 120ක පමණ ද්‍රවශීලතා අතිරික්තයක් දක්වා ඉහළ ගිය අතර, 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 168ක් පමණ දක්වා තවදුරටත් වර්ධනය විය. සමස්ත ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමක පැවතුණ ද සහභාගීත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතාවයේ අසමමිතික ව්‍යාප්තිය හේතුවෙන් විශේෂයෙන් 2024 වසරේ පළමු භාගයේ දී අන්තර් බැංකු වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් සීමිත විය. ගනුදෙනු සඳහා පවතින ප්‍රතිපාර්ශ්වීය සීමාවන් හේතුවෙන් විදේශීය බැංකුවල පැවති අතිරික්ත ද්‍රවශීලතාව, ද්‍රවශීලතා හිඟ බැංකුවලට බොහෝ දුරට ලබා ගත නොහැකි වූ නමුත් 2024 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම හේතුවෙන් මෙම තත්ත්වය තරමක් දුරට වෙනස් විය. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට

1.13 රූප සටහන: ප්‍රධාන කෙටි කාලීන පොලී අනුපාතික සහ වෙළඳපොළ ද්‍රවශීලතාව



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුකූලව අවශ්‍යතා පදනම මත ද්‍රවශීලතාව සම්පාදනය කරමින් වෙළඳපොළ සහභාගීත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතා අසමමිතික ව්‍යාප්තිය අවම කිරීම සඳහා දේශීය මුදල් වෙළඳපොළට විවට වෙළඳපොළ කටයුතු ඔස්සේ නිරන්තර මැදිහත් වීම් සිදු කිරීම මහ බැංකුව අඛණ්ඩව සිදු කළේය. කෙසේ වෙතත්, ද්‍රවශීලතාව අඛණ්ඩව සැලකිය යුතු ලෙස අතිරික්ත මට්ටමක පැවතීමත් වෙළඳපොළ සහභාගීත්ව ආයතන අතර ක්‍රියාකාරකම් ඉහළ යෑමත් සමඟ මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු ක්‍රමයෙන් අඩු කළ අතර, 2024 වසරේ දෙසැම්බර් මස මුල් කාලයේ සිට විකදින ප්‍රතිවිකුණුම් මෙහෙයුම් නතර කළේය.

1.3.3 ණය සමස්ත


බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය. වෙනස් වෙමින් පවතින ආර්ථික තත්ත්ව මධ්‍යයේ ණය ලබා දීම වඩාත් සුපරීක්ෂාකාරීව සිදු කිරීම සහ ණය සඳහා වූ අඩු ඉල්ලුම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසරේ මුල් කාලය තුළ දී අසමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, 2024 වසරේ මැද භාගයේ සිට සාධක කිහිපයක බලපෑම හේතුවෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය තිරසාර සහ සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමක් පෙන්නුම් කළේය. මෙහිදී, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ලිහිල් කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම හේතුවෙන් ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීම සහ ණය ගැනීමේ පිරිවැය අඩු වීම සිදු වූ අතර, එමගින් ව්‍යාපාර සහ පුද්ගලයින් යන දෙපිරිසට ම මූල්‍යන පහසුකම් ලබා ගැනීම දිරිගන්වන ලදී. මීට අමතරව, වර්ධනය වූ ව්‍යාපාරික විශ්වාසය මෙන්ම දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම ද විශේෂයෙන් ම 2024 මැයි මාසයේ සිට ණය වර්ධනය සඳහා දායක විය. ඒ අනුව, 2023 වසර අවසානයේ වාර්තා කළ සංකෝචනය වීමට සාපේක්ෂව 2024 දෙසැම්බර් මාසයේ දී 10.7%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර තුළ දී රුපියල් බිලියන 789.6කින් ඉහළ ගියේය. මේ අතර, අඩු පොලී අනුපාතික පරිසරය මධ්‍යයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර අවසානය වන විට 2.5%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 27.9කින් පමණ ඉහළ ගියේය. එසේ වුවද, මූල්‍ය අංශය තුළ ද්‍රවශීලතා තත්ත්ව වර්ධනය වීමේ සහාය ද සමඟ පාරිභෝගික ණය විශේෂයෙන් රන් සහ පෞද්ගලික ණය මෙන්ම වාහන ලීසිං සඳහා වූ ණය ඉල්ලුම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර අවසානය වන විට 21.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 277.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.


ව්‍යාපාර විශ්වාසය වැඩිදියුණු වීම මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වෙත ලබා දුන් ණය[18] 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් කර්මාන්ත අංශය වෙත ලබා දුන් ණය (සමස්ත ණය ප්‍රමාණයෙන් 39.7%ක් වන) 2024 වසර අවසානයේ දී 8.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. දීර්ඝ කාලයක් මුළුල්ලේ මන්දගාමීව පැවති ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, කර්මාන්ත අංශය සඳහා විශාලතම දායකත්වය සපයන ඉදිකිරීම් උප අංශයට ලැබුණු ණය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 5.5%ක වර්ධනයක් වාර්තා කළේය. රෙදිපිළි හා ඇඟලුම්; රසායනික, බනිජ තෙල්, ඖෂධ හා සෞඛ්‍ය සේවා සහ රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන; ලෝහ නිමැවුම් නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ; සහ ආහාර සහ පාන යනාදී උප අංශවලට ලබා දුන් ණය ද ප්‍රසාරණය වීමක් වාර්තා කළේය. 2024 වසර අවසානයේ දී 12.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් සේවා අංශය වෙත ලබා දුන් ණය ද (සමස්ත ණය ප්‍රමාණයෙන් 27.4%ක් වන) වසර තුළ දී ඉහළ ගියේය. සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් තොග සහ සිල්ලර වෙළඳාම; මූල්‍ය හා ව්‍යාපාරික සේවා; සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය; සහ නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශන යන උප අංශ වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෘෂිකාර්මික අංශය වෙත ලබා දුන් ණය (සමස්ත ණය ප්‍රමාණයෙන් 9.0%ක් වන) 2024 වසර අවසානය වන විට 12.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය තුළ, ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සහ අපනයන ඉලක්කකරගත් වෙළඳ භාණ්ඩ සඳහා වන ණය වර්ධනය වීම පිළිබිඹු කරමින් තේ, පොල්, වී සහ ධීවර කටයුතු සඳහා ලබා දුන් ණය ඉහළ ගියේය. පෞද්ගලික ණය සහ අත්තිකාරම් ද (සමස්ත ණය ප්‍රමාණයෙන් 23.9%ක් වන) 2024 වසර අවසානය වන විට 11.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. මෑත වසරවල දී අඛණ්ඩ ප්‍රසාරණයක් පෙන්නුම් කළ උකස් ණය 2024 වසරේ දී 20.5%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රත්‍රන් මිල ඉහළ යෑම මෙන්ම ණය ලබා ගැනීමේ පහසුම සහ කඩිනම් ක්‍රමය රන් භාණ්ඩ උකස් කිරීම වීම මෙම සැලකිය යුතු ණය ප්‍රසාරණයට හේතු විය. තවද, පාරිභෝගිකයන්ගේ වියදම් කිරීමේ හැකියාව සහ මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම

18 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත මෙම කරුණු පදනම් වී ඇත.

1

1.14 රූප සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


පිළිබිඹු කරමින් ණය කාඩ්පත් ආශ්‍රිත ණය ද වසර තුළ දී වර්ධනය විය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සඳහා අදාළ පරිණත කාල ආවරණ වර්ගීකරණය සැලකූ විට, දිගු කාලීන ණය වර්ධනයට වඩා කෙටි කාලීන සිට මැදි කාලීන ණය වර්ධනය ඉහළ අගයක පවතින බව පෙන්නුම් කෙරේ. ආර්ථික ක්‍රියාකාරකම් අඩණ්ඩව යථා තත්ත්වයට පත් වීමත් සමඟ මැදි කාලීන සහ දිගු කාලීන ණය ප්‍රසාරණය ඉදිරියේ දී අඩණ්ඩව සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2023 වසර තුළ දක්නට ලද ප්‍රවණතාව අඩණ්ඩව පවත්වා ගනිමින් 2024 වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලබා ගත් ණය ප්‍රමාණය නවදුරටත් පහළ ගියේය. ප්‍රධාන වශයෙන් පිරිවැය පිළිබිඹු කෙරෙන මිල වෙනස් කිරීම් අඩණ්ඩව සිදු කිරීම සහ රජය සතු වාණිජ ව්‍යාපාරවල මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අඩණ්ඩව සිදු කරන ලද අනෙකුත් ප්‍රතිසංස්කරණ මගින් රජය සතු වාණිජ ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය වර්ධනය වීම මධ්‍යයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර සිය ණය වගකීම් ශුද්ධ පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නැවත පියවීම හේතුවෙන් 2024 වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 113.1කින් පහළ ගියේය. ප්‍රධාන රජය සතු වාණිජ ව්‍යාපාර අතුරින්, ලං.බ.නී.සං. 2023 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත පැවති සිය ණය වගකීම් රජය වෙත පැවරීමෙන් පසු 2024 වසර තුළ දී ශුද්ධ පදනම මත රුපියල් බිලියන 59.4ක් නැවත පියවීම සිදු කළ අතර එමගින් ලං.බ.නී.සං. බැංකු අංශය මත රඳා පැවතීම සැලකිය යුතු ලෙස අඩු විය. පිරිවැය පිළිබිඹු කෙරෙන මිල වෙනස් කිරීම් හේතුවෙන් මූල්‍ය තත්ත්වය වර්ධනය වීමෙහි සහාය ලබමින් ලං.වි.ම. ද ආසන්න වශයෙන් රුපියල් බිලියන 27.2ක් ශුද්ධ පදනම මත නැවත පියවීම සිදු කර ඇත. මීට අමතරව, 2024 වසර තුළ දී මාර්ග සංවර්ධන අධිකාරිය සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ද ශුද්ධ පදනම මත ණය නැවත පියවීම සිදු කර ඇත. එසේම, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම තුළින් ඇතැම් රජය සතු වාණිජ ව්‍යාපාර ලබාගත් විදේශ මුදලින් නාමනය කරන ලද ණයවලට සමාන රුපියල් වටිනාකම අඩු වී ඇත.

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ යෑම මධ්‍යයේ ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සංකෝචනය වීම හේතුවෙන් 2024 වසර තුළ දී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 14.9කින් සංකෝචනය විය. 2023 වසරේ දී දක්නට ලද ප්‍රවණතාව අඩණ්ඩව පවත්වාගෙන යමින් 2024 වසර තුළ දී මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 602.7කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.[19] මේ සඳහා මහ බැංකුව සතු රජයේ භාණ්ඩාගාර බිල්පත් තොගය කල් පිරීම සහ සහභාගීත්ව ආයතන විසින් මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම මත රඳා පැවතීම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම් පත් මත ආයෝජනය

19 මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර තොගයේ වෙළඳපොළ වටිනාකම ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය වෙනස්වීම 2024 නොවැම්බර් මාසය තුළ බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමට හේතු විය.

1.15 රූප සටහන: බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස



(අ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් හිතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොමිලයේවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර, එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සහ වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර, රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

කිරීම ඉහළ යෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 587.8කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, රජයේ සුරැකුම්පත් මත ආයෝජනය පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී අඩු අගයක් විය. අඩු ඵලදා අනුපාතික හේතුවෙන් එම ආයෝජනවල ආකර්ශණීය බව අඩු වීම මේ සඳහා හේතු විය හැකිය. මේ අතර, 2024 වසරේ දී මූල්‍ය සමීක්ෂණයට (M_4)[20] අනුව රජය වෙත ලබා දුන් ශුද්ධ ණය අඩු වීම රුපියල් බිලියන 37.6ක් විය. මේ යටතේ, බලපත්‍රලාභී විශේෂිත බැංකු රජයේ සුරැකුම්පත් මත ආයෝජනය කිරීම ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 56.3කින් ඉහළ ගිය අතර, මුදල් සමාගම් විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වසර තුළ දී රුපියල් බිලියන 79.0කින් සංකෝචනය විය.

1.3.4 මුදල් සමස්ත

2024 වසරේ දී සංචිත මුදල් පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 අප්‍රේල් මාසයේ දී උත්සව සමයේ ඉල්ලුම හේතුවෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් පසුව බැංකු පද්ධතියට ව්‍යවහාර මුදල් නැවත ලැබීමත් සමඟ 2024 මැයි මස අවසානය වන විට සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ක්‍රමයෙන් අඩු විය. කෙසේ වෙතත්, ඉන්පසුව අඩු උද්ධමන පරිසරයක් මධ්‍යයේ සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි. මැතිවරණ ආශ්‍රිත වියදම් මධ්‍යයේ මුදල් සඳහා ඇති ඉල්ලුම වැඩි වීම සහ වසර අවසාන උත්සව සමයේ ඉල්ලුම ද සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. මීට අමතරව, ව්‍යවහාර මුදල් පදනම් වූ ගනුදෙනු වෙත ක්‍රමයෙන් යොමු වීම ද දක්නට ලැබුණු අතර, බදු ගෙවීම පැහැර හැරීමේ අරමුණු මේ සඳහා හේතු විය හැකිය. ඒ අනුව, 2024 වසරේ දී සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 172.2කින් ඉහළ ගියේය. මේ අතර, මහ බැංකුවේ නිත්‍ය පහසුකම් වෙත බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ප්‍රවේශ වීම සීමා කිරීම සඳහා මහ බැංකුව ගත් නියාමන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලැබූ අතිරික්ත සංචිත හේතුවෙන් 2024 පළමු කාර්තුවේ දී සංචිත මුදල්වල සැලකිය යුතු විචලන දක්නට ලැබුණි. 2024 අප්‍රේල් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි එම නියාමන සීමා ඉවත් කිරීමත් සමඟ සංචිත මුදල්වල දක්නට ලැබුණු එවැනි විචලන ක්‍රමයෙන් අඩු විය. බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් ඉහළ යෑම හේතුවෙන් වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යන සංචිත තැන්පතු ඉහළ යෑම ද සංචිත මුදල් ප්‍රසාරණයට සහාය විය. ඒ අනුව, 2024 වසර අවසානය වන විට සංචිත මුදල් 15.8%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 1,539.3ක් දක්වා ඉහළ ගියේය.

මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වත්කම් අංශයෙන් සැලකූ විට, 2024 වසර තුළ සංචිත මුදල් ප්‍රසාරණය වීම සඳහා ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම මුළුමනින්ම හේතු විය. මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අබණ්ඩව ඉහළ ගිය අතර, 2021 ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2024 ඔක්තෝබර් මාසයේ දී ධන අගයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 1,059.5කින් ඉහළ ගියේය. විදේශීය වත්කම් වැඩිවීමේ සහ විදේශීය වගකීම් අඩුවීමේ ඒකාබද්ධ බලපෑම මේ සඳහා හේතු විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීම් හරහා විදේශ සංචිත ඉහළ යෑම විදේශීය වත්කම්වල වැඩිදියුණුවීම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති විදේශ විනිමය හුවමාරු පහසුකම නැවත පියවීම ඇතුළු විදේශ ණය සේවාකරණය හේතුවෙන් විදේශීය වගකීම් ක්‍රමයෙන් අඩු විය. මේ අතර, රජයට ලබා දුන් ශුද්ධ ණය සංකෝචනය වීම, විශේෂයෙන් මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) අඩු වීම මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් සංකෝචනය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, මහ බැංකුව විසින් සපයන ලද ද්‍රවශීලතා ආධාරක පහසුකම සම්පූර්ණයෙන් පියවීම හේතුවෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සපයන ලද ණය හිමිකම් පහළ යෑම ද වසර තුළ

20 මූල්‍ය සමීක්ෂණය මුදල් සැපයුම පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර, එමඟින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ මුදල් සමාගම් ද ඇතුළුව සියලුම තැන්පතු ලබා ගන්නා ආයතන ආවරණය කරනු ලබයි.

1

1.8 සංඛ්‍යා සටහන: මුදල් සමස්තවල ප්‍රවණතා

රුපියල් බිලියන

අයිතමය	2020 අවසානයට	2021 අවසානයට	2022 අවසානයට	2023 අවසානයට	2024 අවසානයට (අ)
1. සංචිත මුදල්	**964**	**1,306**	**1,349**	**1,329**	**1,539**
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %)	3.4	35.4	3.3	-1.5	**15.8**
මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්	527	-387	-1,614	-837	**222**
මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්	438	1,693	2,963	2,166	**1,317**
2. පටු මුදල් සැපයුම (M_1)	**1,177**	**1,460**	**1,454**	**1,658**	**1,926**
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %)	36.0	24.0	-0.4	14.1	**16.1**
3. පුළුල් මුදල් සැපයුම (M_{2b})	**9,406**	**10,647**	**12,290**	**13,189**	**14,322**
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %)	23.4	13.2	15.4	7.3	**8.6**
3.1 ශුද්ධ විදේශීය වත්කම්	**-209**	**-982**	**-1,767**	**-456**	**573**
මුදල් අධිකාරීන් (ආ)	527	-387	-1,614	-837	**222**
බලපත්‍රලාභී වාණිජ බැංකු	-736	-595	-153	381	**351**
3.2 ශුද්ධ දේශීය වත්කම්	**9,615**	**11,629**	**14,056**	**13,645**	**13,749**
දේශීය ණය	11,721	14,002	16,632	16,421	**17,083**
රජයට ලබා දුන් ශුද්ධ ණය	4,548	5,832	7,471	8,285(ඈ)	**8,270**
මහ බැංකුව	869	2,094	3,432	2,376	**1,774**
බලපත්‍රලාභී වාණිජ බැංකු	3,679	3,738	4,039	5,909	**6,497**
රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය	1,002	1,188	1,750	770(ඈ)	**657**
පෞද්ගලික අංශයට ලබා දුන් ණය	6,171	6,981	7,411	7,366	**8,156**
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %)	6.5	13.1	6.2	-0.6	**10.7**
අනෙකුත් අයිතම (ශුද්ධ)	-2,106	-2,373	-2,576	-2,776	**-3,334**
4. පුළුල් මුදල් සැපයුම (M_4)	**11,462**	**12,985**	**14,840**	**15,829**	**17,261**
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %)	21.4	13.3	14.3	6.7	**9.0**
4.1 ශුද්ධ විදේශීය වත්කම්	**-217**	**-999**	**-1,767**	**-456**	**552**
මුදල් අධිකාරීන් (ආ)	527	-387	-1,614	-837	**222**
බලපත්‍රලාභී වාණිජ බැංකු	-736	-595	-153	381	**351**
බලපත්‍රලාභී විශේෂිත බැංකු	-8	-17	0	0	**-21**
4.2 ශුද්ධ දේශීය වත්කම්	**11,679**	**13,984**	**16,607**	**16,285**	**16,709**
රජයට ලබා දුන් ශුද්ධ ණය	5,366	6,769	8,469	9,507(ඈ)	**9,470**
මහ බැංකුව	869	2,094	3,432	2,376	**1,774**
බලපත්‍රලාභී වාණිජ බැංකු	3,679	3,738	4,039	5,909	**6,497**
බලපත්‍රලාභී විශේෂිත බැංකු	742	845	881	1,022	**1,078**
බලපත්‍රලාභී මුදල් සමාගම්	75	92	116	200	**121**
රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු මගින්)	1,002	1,188	1,750	770(ඈ)	**657**
පෞද්ගලික අංශයට ලබා දුන් ණය	8,285	9,339	9,917	9,815	**10,910**
(වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %)	6.3	12.7	6.2	-1.0	**11.2**
බලපත්‍රලාභී වාණිජ බැංකු	6,171	6,981	7,411	7,366	**8,156**
බලපත්‍රලාභී විශේෂිත බැංකු	936	1,094	1,159	1,126	**1,154**
බලපත්‍රලාභී මුදල් සමාගම්	1,177	1,264	1,347	1,323	**1,600**
අනෙකුත් අයිතම (ශුද්ධ)	-2,973	-3,312	-3,529	-3,807	**-4,327**
විශේෂ සටහන්:					
මුදල් ගුණකය (M_{2b})	9.75	8.15	9.11	9.93	**9.30**
සංසරණ ප්‍රවේගය (M_{2b} සාමාන්‍ය) (ඈ)	1.84	1.73	2.04	2.17(ඉ)	**2.18**

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.
(ඈ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා බැංකු හෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම් අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.ගි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද) මත පදනම් වේ.
(ඉ) සංශෝධිත


මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශුද්ධ දේශීය වත්කම් අඩුවීමට දායක විය. ඒ අනුව, 2024 වසරේ දී මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 848.9කින් සංකෝචනය විය.

මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම 2024 වසරේ දී පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මහ බැංකුව මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු ද ඇතුළත් බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 1,029.0කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යෑම දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් නාමනය කරන ලද වත්කම් රුපියල්වලින් ගණනය කිරීමේ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම නිසා වූ සංකෝචනාත්මක බලපෑම මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය වත්කම් අඩු වීම හේතුවෙන් එම බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් 2024 වසරේ දී සංකෝචනය විය. කෙසේ වෙතත්, වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය වගකීම් අඩු වීම

1

1.16 රූප සටහන: පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා තුඩු දුන් සාධක



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

මගින් මෙම සංකෝචනය යම්තාක් දුරකට සමනය විය. මෙම ප්‍රවණතාවලට අනුකූලව, M_{2b}හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2023 වසරේ දී පැවති 7.3%ට සාපේක්ෂව 2024 වසරේ දී 8.6%ක් දක්වා ඉහළ ගියේය. M_{2b}හි ප්‍රවණතාව හා අනුකූලව, මූල්‍ය සමීක්ෂණය මගින් මනිනු ලබන M_4 පුළුල් මුදල් සැපයුමේ වර්ධනය ද සමාන වේගයකින් ඉහළ ගියේය. මේ අතර, M_{2b} සහ සංචිත මුදල් අතර අනුපාතය මගින් පෙන්නුම් කරනු ලබන මුදල් ගුණාකය, සංචිත මුදල් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම හේතුවෙන්, 2023 වසරේ දී පැවති 9.93 සිට 2024 වසරේ දී 9.30 දක්වා අඩු විය.

1.4 විදේශීය අංශයේ ප්‍රවණතා

1.4.1 ගෙවුම් තුලනය

ජංගම ගිණුම

2024 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය සිය ධනාත්මක ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් විදේශීය ජංගම ගිණුම සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළේය. අපනයන ආදායම් වර්ධනය වීමට වඩා ආනයන වියදම් වැඩි වශයෙන් වර්ධනය වීම හේතුවෙන් 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. එහෙත්, ක්‍රය ශක්තිය අඩු වීම නිසා ආනයන සඳහා ඉල්ලුම සීමිත වීම සහ වාහන ආනයන සඳහා ඇති සීමා පැවතීම හේතුවෙන් ආනයන අධික ලෙස ඉහළ යාම වැළකුණි. සේවා වෙළඳාමේ, විශේෂයෙන් ම සංචාරක අංශයේ කැපී පෙනෙන වර්ධනය හමුවේ සහ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය වැඩිවීම මගින් වෙළඳ ගිණුමේ හිඟය පියවුණි. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ආසන්න වශයෙන් එකම මට්ටමක පැවතුණි. ඒ අනුව, ජංගම ගිණුමේ අතිරික්තය, 2023 වසරේ දී වූ ඒ.ජ. ඩොලර් බිලියන 1.4ට (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 1.7%ට) සාපේක්ෂව, 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 1.2ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 1.2%ක්) විය.

වෙළඳ භාණ්ඩ ගිණුම

වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී පුළුල් වූ නමුත් මෑත වසරවල වාර්තා කළ සාමාන්‍ය අගයන්ට වඩා අඩු මට්ටමක පැවතුණි. 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලය තුළ වාර්තා වූ ඇමරිකානු ඩොලර් බිලියන 9ක පමණ වාර්ෂික වෙළඳ හිඟයේ සාමාන්‍යයට සාපේක්ෂව 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 6.1ක මධ්‍යස්ථ වෙළඳ හිඟයක් වාර්තා කළේය. අපනයන ආදායම 2024 වසරේ වැඩි කාලයක් තුළ පෙර වසරට සාපේක්ෂව ධනාත්මක වර්ධනයක් වාර්තා කළ අතර ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම මෙයට උපකාරී විය. මේ අතර, ඉහළ ආර්ථික ක්‍රියාකාරකම්, ආනයන සීමා ලිහිල් වීම, ලිහිල් මුදල් තත්ත්වයන් සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල මට්ටම් හිතකර ලෙස වෙනස්වීම් හේතුවෙන් 2024 වසරේ දී ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, වෙළඳ හිඟය පෙර වසරේ වාර්තා වූ 5.9%ක සිට 2024 වසරේ දී 6.1%ක් දක්වා පුළුල් විය.

මෙවැනි වර්ධනයන් මධ්‍යයේ වුවද, අපනයන මිල ගණන් හා ආනයන මිල ගණන් අතර අනුපාතය අනුව මනිනු ලබන ශ්‍රී ලංකාවේ වෙළඳ මිල අනුපාතය 2024 වසරේ දී සුළු වශයෙන් වර්ධනය වූ අතර ඒ සඳහා අපනයන මිල ගණන් පහත වැටීමට වඩා තරමක් වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ වැටීම හේතු විය. 2024 වසරේ දී අපනයන ආදායම් සහ ආනයන වියදම් යන දෙඅංශයේ ම ඉහළ යෑමට හේතුව ලෙස ආනයන මෙන්ම අපනයන ප්‍රමාණයන් ඉහළ යෑම දැක්විය හැක. මේ අතර, වැඩිදියුණු වූ දේශීය හා ගෝලීය තත්ත්වයන්ගේ සහාය ඇතිව අපනයන සහ ආනයන යන දෙඅංශය ම ප්‍රසාරණය වීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, අපනයන ආදායම සහ ආනයන වියදම ඇතුළත් සමස්ත වෙළඳ අගය, 2024 වසරේ දී 10.1%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය. කෙසේවුවද, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ විවෘතභාවය පහළ ගිය අතර, 1990 දශකයේ පැවති මට්ටමට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි.

අපනයන ක්‍රියාකාරිත්වය

වෙළඳ භාණ්ඩ අපනයන අංශය 2024 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වර්ධනය තුළින් රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ අභියෝගාත්මක බාහිර පරිසර තත්ත්වයන් මධ්‍යයේ ගොඩනැගුණු ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු විය. 2024 වසරේ දී

1

1.9 සංඛ්‍යා සටහන: ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

අයිතමය	2023 (අ)	2024 (ආ)
ජංගම ගිණුම (ශුද්ධ)	**1,439**	**1,206**
ලැබීම්	23,776	**26,877**
ගෙවීම්	22,337	**25,671**
වෙළඳ ශේෂය	**-4,900**	**-6,069**
අපනයන	11,911	**12,772**
කෘෂිකාර්මික	2,567	**2,774**
කාර්මික	9,278	**9,947**
ඛනිජ	38	**25**
වෙනත්	28	**26**
ආනයන	16,811	**18,841**
පාරිභෝගික	3,044	**3,466**
අන්තර්	11,007	**11,915**
ආයෝජන	2,745	**3,448**
වෙනත්	16	**13**
සේවා (ශුද්ධ)	**3,053**	**3,435**
ලැබීම්	5,416	**6,910**
එයින්;		
ප්‍රවාහන	1,550	**1,794**
සංචාරක	2,068	**3,169**
පරිගණක සේවා	795	**848**
ඉදිකිරීම්	355	**212**
ගෙවීම්	2,363	**3,475**
එයින්;		
ප්‍රවාහන	732	**1,017**
සංචාරක	503	**755**
පරිගණක සේවා	198	**194**
ඉදිකිරීම්	111	**127**
ප්‍රාථමික ආදායම් (ශුද්ධ)	**-2,548**	**-2,599**
ලැබීම්	460	**609**
සේවක වැටුප්	53	**146**
ආයෝජන ආදායම්	407	**463**
සෘජු ආයෝජන	8	**73**
අනෙකුත් ආයෝජන	349	**271**
සංචිත වත්කම්	49	**119**
ගෙවීම්	3,007	**3,208**
සේවක වැටුප්	30	**20**
ආයෝජන ආදායම්	2,977	**3,188**
සෘජු ආයෝජන	916	**942**
විවිධ ආයෝජන	854	**877**
අනෙකුත් ආයෝජන	1,207	**1,369**
ද්විතියික ආදායම් (ශුද්ධ)	**5,834**	**6,439**
ලැබීම්	5,989	**6,585**
එයින්;		
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	5,970	**6,575**
ගෙවීම්	155	**146**
ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**37**	**12**
ලැබීම්	40	**20**
ගෙවීම්	3	**8**
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**1,476**	**1,217**
ද.දේ.නි.යෙහි % ලෙස		
වෙළඳ ශේෂය	-5.9	**-6.1**
භාණ්ඩ හා සේවා ශේෂය	-2.2	**-2.7**
ජංගම ගිණුමේ ශේෂය	1.7	**1.2**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියන 12.8ක් ලෙස වාර්තා වූ අතර, 2023 වසරට සාපේක්ෂව එය 7.2%ක

1.10 සංඛ්‍යා සටහන: වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය

කාණ්ඩය	2023 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	2024 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වාර්ෂික වෙනස්වීම %
අපනයන	**11,910.7**	**12,772.0**	**7.2**
කාර්මික	9,277.7	**9,946.9**	**7.2**
කෘෂිකාර්මික	2,566.5	**2,774.5**	**8.1**
ඛනිජ	38.5	**24.5**	**-36.2**
වර්ග නොකළ	28.0	**26.1**	**-6.6**
ආනයන	**16,811.1**	**18,841.4**	**12.1**
පාරිභෝගික	3,043.9	**3,465.7**	**13.9**
ආහාර හා පාන වර්ග	1,693.0	**1,914.3**	**13.1**
ආහාර නොවන පාරිභෝගික	1,350.9	**1,551.4**	**14.8**
අන්තර්	11,006.6	**11,914.5**	**8.2**
ආයෝජන	2,744.6	**3,448.2**	**25.6**
වර්ග නොකළ	16.0	**13.0**	**-18.8**
වෙළඳ ශේෂය	**-4,900.4**	**-6,069.4**	
මුළු වෙළඳාම	**28,721.8**	**31,613.4**	**10.1**

මූලාශ්‍රයන්: ශ්‍රී ලංකා රේගුව
බනිජ තෙල් අපනයනකරුවන් සහ ආනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව


වර්ධනයකි. කෙසේ වෙතත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, අපනයන ආදායම 2023 වසරේ දී වාර්තා වූ 14.2%ක සිට 2024 වසරේ දී 12.9%ක් දක්වා පහළ ගිය ද එය 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලය තුළ වාර්තා වූ 12.4%ක සාමාන්‍යයට වඩා ඉහළ අගයකි.

කාර්මික අපනයනවල ඉහළ යෑම අපනයන ආදායම වර්ධනයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී 97.2%ක වැඩිවීමක් සමඟ ඉතිහාසයේ පළමු වරට ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනය එ.ජ. ඩොලර් බිලියනයක මට්ටම ඉක්මවා ගියේය. නැව් සහ ගුවන් යානා ඉන්ධන සැපයුම් පරිමාවන් ඉහළ යෑම අපනයන ආදායම වැඩිවීමට ප්‍රධාන හේතුව වූ අතර, එමගින් අගය එකතු කිරීම අඩු වුවද, අපනයනවල සමස්ත වැඩිවීමට ප්‍රධාන දායකත්වයක් ලබා දුන් අංශයක් බවට පත් විය. ඛනිජ තෙල් අපනයන මෙසේ අධික ලෙස ඉහළ යෑමට රතු මුහුදු ආශ්‍රිත නැව් ගමනාගමනයට ඇති වූ බාධා යම්තාක් දුරකට හේතු වූ අතර, නැව් සඳහා ඉන්ධන සැපයුම් සේවා සහ බලශක්ති ආශ්‍රිත නිෂ්පාදිත සඳහා ගෝලීය ඉල්ලුම ශක්තිමත්ව පවතින බව සහ ප්‍රමාණවත් අගය එකතු කිරීමක් සහතික කිරීම සඳහා රට තුළ පිරිපහදු ධාරිතාව ශක්තිමත් කිරීමට ඇති අපේක්ෂාවන් සැලකිමේ දී, මෙම අංශය තවදුරටත් දියුණු කිරීම තුළින් වාසි ලබා ගැනීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව පෙන්නුම් කරයි. තවද, රෙදිපිළි සහ ඇඟලුම් අපනයන (ප්‍රධාන වශයෙන් ඇඟලුම්) සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි. 2024 වසරේ දී ආහාර, පාන වර්ග සහ දුම්කොළ අපනයන ආදායම තවදුරටත් ඉහළ යෑම සඳහා අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයනය ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රබර් ආශ්‍රිත නිෂ්පාදිත අපනයනය ද ඉහළ ගිය

1

1.3 විශේෂාංග රූප සටහන්

මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත



2024 වසරේ දී මාස දෙකක හැර බොහෝ මාසවල දී ජංගම ගිණුමේ ශේෂය ධන අගයක පැවතීම හේතුවෙන් ජංගම ගිණුමේ වාර්ෂික අතිරික්තයක් වාර්තා විය. සංචාරකයන්ට වීසා පහසුකම් ලබා දීම ආශ්‍රිතව මතු වූ බාධා හේතුවෙන් සංචාරක ව්‍යාපාරයට බලපෑම් එල්ල වීම සහ සංචාරකයන් සාමාන්‍යයෙන් අඩුවෙන් පැමිණෙන කාල වකවානුවක් වීම නිසා 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා ගිණුමේ අතිරික්තය අසාමාන්‍ය ලෙස අඩු විය. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, ප්‍රාථමික ආදායම් ගිණුමේ පොළී ගෙවීම් ලෙස සහ සේවා ගිණුමේ රජයේ වියදම් ලෙස සැලකිය යුතු ගෙවීම් සිදු වූ අතර, ඒ දෙක ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ විය. 2025 වසරේ මුල් මාස දෙක තුළ දී ද ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා වූ අතර, සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ශක්තිමත් වර්ධනය මේ සඳහා හේතු විය.

අතර ඒ සඳහා අත්වැසුම් අපනයන ප්‍රධාන වශයෙන් හේතුවිය. කෙසේ වෙතත්, 2024 වසරේ දී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ මෙන්ම යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයන ආදායමේ පහළ යෑමක් වාර්තා කළේය.


2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී කෘෂිකාර්මික අපනයන ආදායමෙහි ද වැඩිවීමක් පෙන්නුම් කළේය. කෘෂිකාර්මික අපනයන අතරින්, තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ කුළුබඩු අපනයන සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. තේ අපනයන ආදායම ඉහළ යෑම, අපනයන පරිමා සහ මිල ගණන් යන දෙඅංශයේ ම ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් වූ අතර, එමගින් ශ්‍රී ලංකාවේ තේ සඳහා ඇති නොවෙනස් ගෝලීය ඉල්ලුම ඉස්මතු කරයි. කෙසේ වුවද, තේ අපනයන පරිමාව 2024 වසරේ දී පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියද, එය 2015 වසර සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලය තුළ වාර්තා වූ වාර්ෂික සාමාන්‍යයට වඩා සැලකිය යුතු පහළ අගයක් විය. ප්‍රධාන වශයෙන් දිසිඳි පොල් සහ පොල් කෙඳි අපනයන හේතුවෙන්, 2024 වසරේ දී පොල් මද නිෂ්පාදිත සහ පොල් මද නොවන නිෂ්පාදිත යන දෙඅංශයේ ම අපනයන ආදායම ඉහළ ගිය අතර, කාර්මික භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රාථමික සහ අගය එකතු කිරීමක් සහිත නිෂ්පාදිත යන දෙඅංශයේ ම ශක්තිමත් ක්‍රියාකාරිත්වය තුළින් පොල් අපනයන ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කිරීම, පොල් නිෂ්පාදනය ඉලක්කගත අපනයන ප්‍රවර්ධන ක්‍රියාමාර්ගයකට සමගාමීව පුළුල් කිරීමෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදිත මැදි කාලීනව ප්‍රමුඛ අපනයනයක් බවට පත්කිරීමට ඇති හැකියාව පෙන්නුම් කරයි. මේ අතර, මුහුදු ආහාර සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනය මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. බනිජ අපනයන පහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවති අතර ඇතැම් බනිජ අගය එකතු කළ නිෂ්පාදිත අපනයන ලෙස කාර්මික අපනයන යටතේ වර්ගීකරණය වී ඇත.

ආනයන ක්‍රියාකාරිත්වය

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ ආනයන සීමාවන් බොහොමයක් ලිහිල් කිරීම පිළිබිඹු කරමින් 2024 වසරේ දී ශ්‍රී ලංකාව වෙළඳ භාණ්ඩ ආනයන වියදම්වල සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය. 2024 වසරේ දී සමස්ත වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඒ.ජ. ඩොලර් බිලියන 18.8ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 12.1%ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලපරිච්ඡේදයේ දී පැවති ඒ.ජ. ඩොලර් බිලියන 20.3ක පමණ වූ වාර්ෂික ආනයන වියදමේ සාමාන්‍යයට සාපේක්ෂව 2024 වසරේ ආනයන වියදම සැලකිය යුතු පහළ අගයක් විය. ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත් වීමත් සමඟ, ප්‍රධාන වශයෙන් 2023 වසරේ ජූනි මාසයේ සිට ආනයන සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම හේතුවෙන් ආනයන සඳහා ඉල්ලුම, විශේෂයෙන් ම පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ආනයන සඳහා ඇති ඉල්ලුම, ඉහළ ගියේය. අවසාන කාණ්ඩය වශයෙන් මෝටර් රථ ආනයනය සඳහා වූ ආනයන සීමාවන් ලිහිල් කළ අතර එය අදියර තුනක් යටතේ ක්‍රමානුකූලව සිදු කරන ලදී.

1

1.17 රූප සටහන: අපනයන සංයුතිය



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඒ අනුව පළමුවන අදියර යටතේ පොදු මගී ප්‍රවාහන හා විශේෂ කාර්යයන් සඳහා වන වාහන, දෙවන අදියර යටතේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාහන සහ තුන්වන අදියර යටතේ පුද්ගලික පරිහරණය සඳහා වන වාහන ආනයනය ලිහිල් කිරීම සිදු කරන ලදී. පළමු අදියර 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරන ලද අතර, දෙවන සහ තුන්වන අදියර 2025 වසරේ ජනවාරි මාසය අවසානයේ දී ක්‍රියාත්මක කරන ලදී. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2023 වසරේ දී 20.1%ක්ව පැවති ආනයන වියදම, 2024 වසරේ දී 19.0%ක් දක්වා පහළ ගිය අතර, 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ 22.4%ක සාමාන්‍යයට වඩා තවදුරටත් පහළ මට්ටමක පැවතුණි.


2024 වසරේ දී ආනයන වියදම් ඉහළ යෑමට ප්‍රධාන ආනයන කාණ්ඩ සියල්ලෙහි ම ඉහළ ඉල්ලුම හේතු විය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී පාරිභෝගික භාණ්ඩ ආනයනයේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර, ප්‍රධාන වශයෙන් තෙල් හා මේදය, එළවළු වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය මෙන්ම වසර අවසානයේ දී ඇති වූ දේශීය සැපයුම් හිඟයන් පියවා ගැනීම සඳහා සහල් ආනයනය කිරීම ද හේතු විය. එසේම, 2023 වසරේ දී ආනයන සීමාවන් ලිහිල් කිරීම ආරම්භ කිරීමත් සමඟ, ආහාර නොවන කාණ්ඩයේ පාරිභෝගික භාණ්ඩ, විශේෂයෙන් ම ගෘහ උපකරණ, ඇඟලුම් හා උපාංග සහ විදුලි සංදේශ උපකරණ සඳහා වන වියදම ඉහළ ගියේය. 2024 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයනය වියදම ද ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන වර්ධනයට සහාය දක්වමින් රෙදිපිළි සහ රෙදිපිළි උපාංග ආනයනය ඉහළ යෑම සහ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් යෙදවුම් වන රසායනික නිෂ්පාදිත, මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත මෙන්ම රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, ආනයන භාණ්ඩ පැසෙහි විශාලතම අයිතමය වන ඉන්ධන ආනයන වියදම පහළ ගිය අතර බොරතෙල් සහ ගල් අඟුරු ආනයන මිල සහ ආනයන ප්‍රමාණය පහළ යෑම මීට හේතු විය. ආනයනික බනිජ තෙල් නිෂ්පාදිත මත සම්පූර්ණයෙන් ම රඳා පවතින බනිජ තෙල් අපනයන ඉහළ ගිය ද, බලශක්ති සංයුතිය තුළ ජල විදුලියෙහි පැවති ඉහළ දායකත්වය හේතුවෙන් ඉන්ධන භාවිතයෙන් විදුලිබල උත්පාදනය සඳහා වූ ඉල්ලුම පහළ යෑම ද, ඉන්ධන ආනයන වියදම පහළ යෑමට හේතු විය. ආනයන සීමාවන් ලිහිල් කිරීම් උපකාරී වීමෙන් ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහි ම, එනම් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (මූලිකව ඉංජිනේරු උපකරණ), ගොඩනැගිලි ද්‍රව්‍ය (මූලිකව යකඩ හා වානේ සහ පිඟන් මැටි නිෂ්පාදිත) සහ ප්‍රවාහන උපකරණ (වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා රථ වාහන වැනි) සහ ඒවායේ උප කාණ්ඩ බොහෝමයක ආනයන වියදම ඉහළ යෑමෙන් 2024 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදමෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

වෙළඳ මිල අනුපාතය

අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපණය කරනු ලබන වෙළඳ මිල අනුපාතය, 2024 වසරේ දී ඉහළ ගියේය. බනිජ අපනයන හැර අනෙකුත් සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩ සඳහා පරිමා දර්ශක ඉහළ ගිය අතර, සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ සඳහා ද පරිමා දර්ශක ඉහළ ගිය අතර, එමගින්, 2024 වසරේ දී අපනයන ආදායම සහ ආනයන වියදම ඉහළ යෑම සඳහා ඉහළ පරිමාවන් හේතු වූ බව පෙන්නුම්

1

1.18 රූප සටහන: ආනයන සංයුතිය



(අ) පරිප්පු, එෑණු, අර්තාපල්, රතිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කරයි. කාර්මික අපනයන මිල දර්ශක අඩු වීම, අපනයන මිල දර්ශකය පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වූ අතර, අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් පහළ යෑම සමස්ත ආනයන මිල දර්ශකයේ පහළ යෑමට දායක විය. මේ අනුව, අපනයන මිල දර්ශක සහ ආනයන මිල දර්ශක, පිළිවෙළින්, 3.7%කින් සහ 4.9%කින් පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළඳ මිල අනුපාතය 2023 වසරේ පැවති දර්ශකාංක 85.6කට සාපේක්ෂව 2024 වසරේ දී දර්ශකාංක 86.7ක් දක්වා 1.3%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ මිල අනුපාතය ඉහළ ගිය ද, එය 2010 පාදක වර්ෂයට සාපේක්ෂව පිරිහීමක් වාර්තා කරමින් 2021 වසරේ සිට දර්ශකාංක 100යේ මට්ටමට වඩා අඩුවෙන් පැවති අතර, එයින් පෙන්නුම් කරනුයේ අපනයන ඒකකයකින් මිලදී ගත හැකි ආනයන ප්‍රමාණය කාලයත් සමඟ අඩු වී ඇති බවයි.

වෙළඳ දිශාව

ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළඳ අංශය 2024 වසරේ දී පෙර වසරට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ ද්වීපාර්ශ්වික වෙළඳාම වැඩිදියුණු වීම ඇතුළු සාධක රාශියක් මේ සඳහා දායක විය. වෙළඳ සීමාවන් ලිහිල් කිරීම සහ ආර්ථික තත්ත්වයන් ස්ථායී වීම මධ්‍යයේ අපනයන සහ ආනයන යන දෙඅංශය ම යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් සමස්ත වෙළඳාම ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ වෙළඳ හවුල්කරුවන් සලකා බැලීමේ දී, ප්‍රධාන වෙළඳ හවුල්කරු ලෙස ඉන්දියාව අඛණ්ඩව පැවති අතර, ඉන් අනතුරුව චීනය සහ ඇමරිකා එක්සත් ජනපදයත් පසු වූ අතර, 2024 වසරේ දී මෙම ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් තිදෙනා සාමූහිකව ශ්‍රී ලංකාවේ සමස්ත ගනුදෙනු ප්‍රමාණයට ආසන්න වශයෙන් 40%කින් පමණ දායක විය. 2024 වසරේ දී ඉන්දියාව සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4.8කට ආසන්න වූ අතර, ඒ සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදි සහ සහල් ඇතුළුව ඉන්දියාවෙන් සිදුකළ ආනයන ශක්තිමත් වීම දායක විය. චීනය සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ද 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.6ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ඉහළම වෙළඳ හිඟය චීනය සමඟ වාර්තා කළ අතර, එය 2023 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 2.8ක සිට 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. චීනය සමඟ වෙළඳ හිඟය පුළුල් වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉංජිනේරු උපකරණ

1.11 සංඛ්‍යා සටහන: වෙළඳ මිල අනුපාතයෙහි සාරාංශය (2010=100) (අ)(ආ)

භාණ්ඩය	වාර්ෂික වෙනස්වීම 2023/2024 (%)		
	වටිනාකම් දර්ශකය	පරිමා දර්ශකය	ඒකක වටිනාකම් දර්ශකය
මුළු අපනයන	**7.2**	**11.3**	**-3.7**
කෘෂිකාර්මික අපනයන	8.1	3.2	4.7
කාර්මික අපනයන	7.2	12.8	-5.0
ඛනිජ අපනයන	-36.2	-35.2	-1.6
මුළු ආනයන	**12.1**	**17.9**	**-4.9**
පාරිභෝගික භාණ්ඩ	13.9	12.1	1.5
අන්තර් භාණ්ඩ	8.2	17.5	-7.9
ආයෝජන භාණ්ඩ	25.6	21.8	3.1
වෙළඳ මිල අනුපාතය			**1.3**

(අ) තාවකාලික
(ආ) ඒ. ජ. ඩොලර් වටිනාකම් අනුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

සහ ඉදිකිරීම් ද්‍රව්‍ය (යකඩ සහ වානේ) ආනයන ඉහළ යෑම වන අතර, චීනය වෙත සිදු කළ ශ්‍රී ලංකාවේ අපනයන තවදුරටත් සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 3.4ක සමස්ත වෙළඳාමක් සමඟ ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වෙළඳ හවුල්කරුවෙකු ලෙස එක්සත් ජනපදය තවදුරටත් රැඳී සිටියේය. චීනය මෙන් නොව ඇමරිකා එක්සත් ජනපදය සමඟ ශ්‍රී ලංකාව වෙළඳ අතිරික්තයක් පවත්වාගෙන යන අතර, මේ සඳහා ඇඟලුම් අපනයන විශාල වශයෙන් හේතු විය.

ශ්‍රී ලංකාවේ සිව්වන ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම නායිලන්තය සමඟ (ශ්‍රී ලංකා නායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම - SLTFTA) අත්සන් කළ අතර, තවත් නිදහස් වෙළඳ ගිවිසුම් කිහිපයක් පිළිබඳ සාකච්ඡා 2024 වසර තුළ අඛණ්ඩව පැවතුණි. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම 2024 වසරේ පෙබරවාරි මාසයේ දී අත්සන් තබන ලද අතර, එය භාණ්ඩ හා සේවා වෙළඳාම මෙන්ම ආයෝජන, රේගු ක්‍රියාපටිපාටි, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආදිය ආවරණය වන පුළුල් නිදහස් වෙළඳ ගිවිසුමකි. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම 2025 වසරේ ජනවාරි 01 වන දින සිට බලාත්මක විය. ඉන්දියාව සමඟ ආර්ථික


1.12 සංඛ්‍යා සටහන: ශ්‍රී ලංකාව වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන

වෙළඳ ගිවිසුම	2023	2024 (අ)		
	වටිනාකම (ඒ.ජ. ඩොලර් මිලියන)	වටිනාකම (ඒ.ජ. ඩොලර් මිලියන)	වර්ධනය (%)	දායකත්වය (%)
වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රම	3,803.5	**3,985.7**	**4.8**	**80.2**
එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව)	2,094.5	**2,108.1**	**0.6**	**42.4**
ඇමෙරිකා එක්සත් ජනපදය (ආ)	663.4	**741.6**	**11.8**	**14.9**
එක්සත් රාජධානිය	562.4	**601.9**	**7.0**	**12.1**
රුසියානු සමූහාණ්ඩුව (ඇ)	127.9	**152.7**	**19.4**	**3.1**
ඕස්ට්‍රේලියාව	93.3	**108.8**	**16.6**	**2.2**
කැනඩාව	72.9	**89.9**	**23.3**	**1.8**
ජපානය	68.3	**71.1**	**4.1**	**1.4**
තුර්කිය	62.6	**54.5**	**-13.0**	**1.1**
වෙනත් ජී.එස්.පී. ක්‍රම	58.2	**57.2**	**-1.7**	**1.2**
ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)	536.4	**490.3**	**-8.6**	**9.9**
ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඈ)	213.9	**209.9**	**-1.9**	**4.2**
ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP)	79.1	**70.1**	**-11.4**	**1.4**
පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)	46.1	**46.2**	**0.3**	**0.9**
දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA)	93.2	**169.0**	**81.3**	**3.4**
සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA)	1.1	**1.3**	**22.0**	**0.0**
වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන	4,773.4	**4,972.5**	**4.2**	**100.0**
ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස	40.1	**38.9**		

(අ) තාවකාලික
(ආ) එක්සත් ජනපදය මඟින් ලබා දුන් ජී. එස්.පී සහනය 2020 වසරේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ බැවින් ජී.එස්.පී.සහනය ලැබීමට සුදුසු අපනයන පෙන්නුම් කරයි.
(ඇ) රුසියාව, බෙලාරුස් සහ කසකස්ථානය ඇතුළත් වේ.
(ඈ) පෙර මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
වාණිජ දෙපාර්තමේන්තුව

1.19 රූප සටහන: ද්විපාර්ශ්වීය වෙළඳ ශේෂයන්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර 13 වන සහ 14 වන සාකච්ඡා වට පිළිවෙළින් 2024 වසරේ ජනවාරි සහ 2024 වසරේ ජූලි මාසවල දී අවසන් විය. මේ අතර, බංග්ලාදේශය සහ ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සාකච්ඡා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡාවල ප්‍රගතිය මන්දගාමී විය. එපමණක් නොව, දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ ඉන්දියාව වෙත සිදුකළ අපනයන ඉහළ ගිය ද, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ සිදුකළ අපනයන පහත වැටුණි. පකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ සිදුකළ වෙළඳාම අඩු මට්ටමක පැවති අතර, ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) සහ ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) වැනි අනෙකුත් කලාපීය වෙළඳ ගිවිසුම් යටතේ කාර්යසාධනය 2024 වසරේ දී පහත වැටුණි. මේ අතර, බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයේ (BIMSTEC) ප්‍රඥප්තිය 2024 වසරේ මැයි මාසයේ දී බලාත්මක විය. සාමාජික රටවල් අතර තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කරන අතර ම, එහි ප්‍රවේශය සහ බලපෑම පුළුල් කිරීමට මෙම ප්‍රඥප්තිය උපකාරී වනු ඇත. තවද, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් විසින් පිරිනමනු ලබන වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමවලින් (ජී.එස්.පී - GSP) ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබුවේය. යුරෝපා සංගමයේ ජී.එස්.පී යෝජනා ක්‍රමයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී යුරෝපීය කොමිසම විසින් යුරෝපා සංගමයේ ජී.එස්.පී යෝජනා ක්‍රමයේ වලංගු කාලය 2024-2027 කාලය දක්වා දීර්ඝ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ දී ශ්‍රී ලංකාව යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී+) යටතේ අඛණ්ඩව ප්‍රතිලාභ ලබා ගනිමින් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. එපමණක් නොව, නව ජී.එස්.පී යෝජනා ක්‍රමයක කොන්දේසි පිළිබඳව යුරෝපා සංගමයේ රටවල් අතර

2024 වසර තුළ සාකච්ඡා අඛණ්ඩව පැවතුණි. මේ අතර, යුරෝපා සංගමය විසින් 2023 වසරේ ජුනි මාසයේ දී වනාන්තර විනාශයෙන් තොර නිෂ්පාදන පිළිබඳ රෙගුලාසි (Regulation on Deforestation-Free Products) සම්මත කරන ලදී. යුරෝපා සංගමයේ ජී.එස්.පී+ යෝජනා ක්‍රමයේ සහනවල ප්‍රතිලාභියෙකු ලෙස, යුරෝපා සංගමයේ වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාව සිදු කරන රබර් අපනයන සඳහා මෙම රෙගුලාසි බලපැවැත්වෙන අතර, විශාල/මධ්‍යම ප්‍රමාණයේ ක්‍රියාකරුවන් 2025 වසරේ දෙසැම්බර් මස 30 වන දින වන විට සහ ක්ෂුද්‍ර/කුඩා ප්‍රමාණයේ ක්‍රියාකරුවන් 2026 වසරේ ජුනි මස 30 දින වන විට මෙම රෙගුලාසිවලට අනුකූල විය යුතුය. ඊට අමතරව, 2023 වසරේ ජුනි මාසයේ දී බලාත්මක වූ චික්සත් රාජධානියේ නව ජී.එස්.පී යෝජනා ක්‍රමය, එනම් "සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය" (DCTS) හි වැඩි දියුණු කළ වරණීය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබීය. 2020 වසරේ දෙසැම්බර් මාසයේ දී කල් ඉකුත් වූ චික්සත් ජනපද ජී.එස්.පී යෝජනා ක්‍රමය, චික්සත් ජනපද රජය මගින් තවමත් නැවත ස්ථාපිත කර නොමැති නමුත්, චික්සත් ජනපද නව රජය මගින් ඉදිරියේ දී ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු නොකරන්නේ නම් මෙම ජී.එස්.පී යෝජනා ක්‍රමය සාමාන්‍ය ක්‍රමවේදයන්ට අනුව අතීතයට බලපාන පදනමක් යටතේ ප්‍රතිස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, අනෙකුත් ජී.එස්.පී. යෝජනා ක්‍රම යටතේ අපනයන 2024 වසර තුළ මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ මුළු වෙළඳාම වර්ධනය වූ නමුත් මුළු අපනයනවල කොටසක් ලෙස වරණීය වෙළඳාම යටතේ අපනයන 2024 වසරේ දී පහත වැටුණු අතර, එමගින් වරණීය වෙළඳ ගිවිසුම් භාවිතා නොකර සිදු කළ අපනයනවල වැඩිවීමක් පෙන්නුම් කරයි.

සේවා ගිණුම

2024 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2024 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය, 2023 වසරේ දී පැවති ඒ.ජ. ඩොලර් බිලියන 3.1ට සාපේක්ෂව, ඒ.ජ. ඩොලර් බිලියන 3.4ක් දක්වා වර්ධනය විය. සංචාරක, මුහුදු ප්‍රවාහනය, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශ ඇතුළු ප්‍රධාන සේවා අංශ වෙත වූ ඉහළ ලැබීම් මෙම වර්ධනයට හේතු විය. 2023 වසරේ දී වාර්තා වූ මිලියන 1.49ක සංචාරක පැමිණීම් හා සසඳන විට, 2024 වසරේ දී සංචාරක පැමිණීම් මිලියන 2.05ක් වාර්තා කරමින් සංචාරක අංශය තවදුරටත් එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ අනුව, 2023 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 2.1ක් වූ සංචාරක ඉපැයීම්, 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 3.2ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 53.2%ක වාර්ෂික වර්ධනයකි. සංචාරකයින් මිලියන 2.3ක් මගින් ඒ.ජ. ඩොලර් බිලියන 4.4ක ආදායමක් උපයා ගනිමින් මෙතෙක් වාර්තා වූ ඉහළම සංචාරක පැමිණීම් ගණන 2018 වසරේ දී වාර්තා විය. මේ අතර, සංචාරක කර්මාන්තය හැර අනෙකුත් සේවාවන් ද ජංගම ගිණුමේ අතිරික්තයට සැලකිය යුතු ලෙස දායක විය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ (ITRS) දත්තවලට අනුව, 2024 වසරේ දී සංචාරක ඉපැයීම් හැර සේවා

1.20 රූප සටහන: සේවා අංශයේ ලැබීම් සහ ගෙවීම්



සටහන: තද පැහැති ස්ථම්භ 2024 වසරේ අගයන් නිරූපණය කරන අතර ලා පැහැති ස්ථම්භ 2023 වසරේ අගයන් නිරූපණය කරයි.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

අංශයට ලැබුණු මුළු ලැබීම් ඒ.ජ. ඩොලර් බිලියන 3.7ක් වූ අතර, එය 2023 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 3.3ක් විය. සේවා අංශයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ප්‍රවාහනය සහ පරිගණක හා තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවාය. 2024 වසරේ දී වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා, තාක්ෂණික සහ වෙළඳාම ආශ්‍රිත සේවා ද, සේවා අංශයේ ලැබීම් ඉහළ යෑමට දායක විය. තවද, සේවා අංශයේ මුළු ගෙවීම්, 2023 වසරේ දී වාර්තා වූ ඒ.ජ. ඩොලර් බිලියන 2.4ට සාපේක්ෂව, 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 3.5ක් විය. සේවා අංශයෙන් වාර්තා වූ ගෙවීම් සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ විදේශ සංචාර, ප්‍රවාහන සේවා, අනෙකුත් ව්‍යාපාරික සේවාවන්ට අදාළ ගෙවීම් සහ රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළ නීතිමය හා වෘත්තීය ගාස්තු ලෙස කරන ලද ගෙවීම්ය.

ප්‍රාථමික ආදායම් ගිණුම

2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව පැවතුණි. ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම්වලින් සැලකිය යුතු කොටසක් ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස රැස් වූ හිඟ මුදල් ඇතුළුව රජයේ ණය සඳහා වූ පොළී ගෙවීම් මෙන්ම, ජා.මූ. අරමුදල හා ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇති කරගත් විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකමට අදාළව මහ බැංකුවේ ණය වගකීම් වෙනුවෙන් කළ පොළී ගෙවීම් ද ඊට ඇතුළත් විය. විදේශීය ආයෝජකයින් වෙත ලාභ බෙදාහැරීමේ වැඩිවීම පිළිබිඹු කරමින් සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ගෙවන ලද ලාභාංශ ඉහළ යෑම 2024 වසරේ දී දක්නට ලැබුණු එක් ප්‍රධාන ප්‍රවණතාවක් විය. කෙසේ වෙතත්, ප්‍රතිආයෝජිත ඉපැයීම්වලට අදාළ ගෙවීම් පහත වැටුණි. මෙය මූල්‍ය ගිණුමේ ලැබීමක් ලෙස වාර්තා වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන අඩු විය. 2024 වසරේ මුල් කාර්තු තුනේ උපචිත පොලිය සහ 2024 වසරේ අවසාන කාර්තුවේ පොළී ගෙවීම් ද සහිතව ණය සුරැකුම්පත්වලට අදාළ පොළී ගෙවීම් 2023 වසරට සාපේක්ෂව වැඩි වී ඇත. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වන විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ, ඉදිරියේ දී ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම් සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී විදේශීය ණය සඳහා රජයේ පොළී ගෙවීම්වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණු අතර, රජය විසින් ගෙවිය යුතු බහුපාර්ශ්වික ණය ප්‍රමාණය වැඩිවීම සහ දැනට ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ පවතින ණය ද ඇතුළුව ද්විපාර්ශ්වික ණය සඳහා වන උපචිත පොලිය වැඩිවීම මෙයට හේතු විය. මේ අතර, දළ නිල සංචිත සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් 2024 වසරේ දී මහ බැංකුව විසින් සංචිත වත්කම්වල සිදුකළ ආයෝජන මඟින් ලද ඉපැයීම් වැඩි විය. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී බැංකු අංශයේ පොලී ආදායම සුළු වශයෙන් අඩු විය. ඒ අනුව, 2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ඒ.ජ. ඩොලර් බිලියන 2.6ක් විය.

ද්විතීයික ආදායම් ගිණුම

2024 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල පැවති අඛණ්ඩ වර්ධනය හේතු විය. වසර තුළ දී විධිමත් බැංකු ක්‍රම හරහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ යෑමට දායක වෙමින්, ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් විදේශ රැකියා සොයා අඛණ්ඩව විදේශගත වීම මෙම ධනාත්මක ප්‍රවණතාවයට බොහෝ දුරට සහාය විය. විදේශ රැකියා සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළ ම පිටත්වීම් සංඛ්‍යාව 2024 වසරේ දී වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 6.0ක් වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 6.6ක් දක්වා 10.1%කින් වර්ධනය විය. මෙම ප්‍රේෂණ වැඩිවීම ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය තියුණු ලෙස වැඩිවීමට දායක වූ අතර, එය 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 6.4ක් ලෙස වාර්තා විය.

ප්‍රාග්ධන ගිණුම

2024 වසරේ දී ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය අඩු විය. රජයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී රජය සහ පෞද්ගලික අංශය යන දෙඅංශය ම වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම අඩු විය. ඒ අනුව, 2023 වසරේ දී ඒ.ජ. ඩොලර් මිලියන 37ක අතිරික්තයට සාපේක්ෂව, 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් මිලියන 12ක සුළු අතිරික්තයක් ප්‍රාග්ධන ගිණුම වාර්තා කළේය.

මූල්‍ය ගිණුම

2024 වසරේ දී, ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම තුළ වගකීම්වල ශුද්ධ වෙනස්වීම් සහ මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් යන දෙක ම වැඩි වුව ද, එය මන්දගාමී වේගයකින් සිදු විය. 2023 වසරේ ඒ.ජ. ඩොලර් බිලියන 2.2ට සාපේක්ෂව වගකීම්වල ශුද්ධ වෙනස්වීම්, ඒ.ජ ඩොලර් බිලියන 1.0කින් වැඩි විය. වසර තුළ මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් අතරට ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළින් ලැබුණු තුන්වැනි වාරිකය මෙන්ම, ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු වාරික ද ඇතුළත් විය.

1

විශේෂ සටහන 1
විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත වැඩිදියුණු කිරීම: සේවා වෙළඳාම පිළිබඳ ප්‍රධාන කරුණු


හැඳින්වීම

මෑත වසරවල දී වෙළඳ භාණ්ඩ අපනයනයේ ඉහළ යෑම අභිබවා යමින්, ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ තීරණාත්මක අංගයක් වන සේවා වෙළඳාම සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ. විදේශ විනිමය ඉපැයීම් සඳහා ප්‍රධාන දායකත්වයක් සපයන සේවා අපනයනවල වර්ධනය සඳහා, සංචාරක, පරිගණක සහ තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, සහ වරාය හා ගුවන්තොටුපළ සේවා වැනි අංශ හේතු විය. කෙසේ වෙතත්, දේශසීමා හරහා භෞතිකව සිදු කෙරෙන නිෂ්පාදිත භාණ්ඩ වෙළඳාම මෙන් නොව, දේශසීමා හරහා සිදු කරන සේවා වෙළඳාම පිළිබඳ දත්ත නිරවද්‍යතාවයකින් යුතුව ග්‍රහණය කර ගැනීම වඩා අභියෝගාත්මක යැයි සාමාන්‍යයෙන් සැලකේ. වෙළඳ භාණ්ඩ පිළිබඳ සංඛ්‍යාන දත්ත ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රේගුව හරහා වාර්තා කරනු ලැබුව ද, සේවා වෙළඳාම පිළිබඳ සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීම සඳහා බැංකු පද්ධතිය හරහා සවිස්තරාත්මක හා ඒ ඒ ගනුදෙනු මට්ටමේ වාර්තාකරණයක් අවශ්‍ය වන අතර, ඒ හේතුවෙන් දත්ත රැස් කිරීමේ ක්‍රියාවලි වඩාත් සංකීර්ණ වේ.

2008 ජාතික ගිණුම් පද්ධති (System of National Accounts - SNA 2008),[1] සංඛ්‍යාදත්ත රාමුවෙහි අර්ථ දක්වා ඇති පරිදි, සේවා අංශයේ අන්තර්ජාතික ගනුදෙනුවලට විවිධාකාරයේ ස්පර්ශ කළ නොහැකි නිෂ්පාදන සහ ක්‍රියාකාරකම් රාශියක් අයත් වන අතර, මෙම සේවා 'වෙනස්කම් ඇති කරන සේවා (change effecting services)' සහ 'ආන්තික සේවා (margin services)' වශයෙන් පුළුල් ලෙස ආකාර දෙකකට වර්ග කර ඇත. වෙනස්කම් ඇති කරන සේවා ඉල්ලුම අනුව නිෂ්පාදනය කරනු ලබන අතර, එම සේවා පාරිභෝගිකයාගේ තත්ත්වය සෘජුවම වෙනස් කරයි. මෙම සේවා ඒවායේ නිෂ්පාදනයෙන් වෙන් කළ නොහැකි ය. උදාහරණයක් ලෙස, ශ්‍රී ලාංකික මෘදුකාංග නිපදවන සමාගමක් විසින් මෘදුකාංගයක් ලබා දීම හා සම්බන්ධ සේවාව අවසාන නිමැවුමෙන් වෙන් කර වෙනම අලෙවි කළ නොහැක. අනෙක් අතට, ආන්තික සේවා යනු භාණ්ඩ බෙදා හැරීමේ දී අතරමැදියන් විසින් සිදු කරන අඟය එක් කිරීම් වන අතර, ශ්‍රී ලංකා බහාලුම් පර්යන්ත මඟින් වෙළඳ භාණ්ඩ ආනයන සහ අපනයන සඳහා සපයනු ලබන ප්‍රවාහන සේවා ආදිය මෙම කාණ්ඩයට අයත් වේ. ගෝලීය වශයෙන්, සේවා අංශයේ අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා වඩාත් ම පුළුල් ක්‍රමය වන්නේ බැංකු පද්ධතිය හරහා සිදු වන නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර ගෙවීම් ප්‍රවාහ යොදා ගැනීමය. කෙසේ වෙතත්, එවැනි දියුණු සහ සංකීර්ණ පද්ධතියක් නොමැති විට, ගෙවුම් තුලනයේ සේවා අංශයේ සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීම, හඳුනාගත් සමාගම් සම්බන්ධ කරගෙන සිදු කරන සෘජු සමීක්ෂණ මත පදනම් වනු ඇත. කෙසේ වෙතත්, සේවා අංශයේ සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීමේ දී සෘජු සමීක්ෂණ ක්‍රමවේදයේ ඵලදායීතාවය විවාදාත්මක වන්නේ, එවැනි

1 ජාතික ගිණුම් පද්ධතිය යනු ආර්ථික මූලධර්ම මත පදනම් වූ දැඩි ගිණුම්කරණ සම්මුතීන්ට අනුකූලව දළ දේශීය නිෂ්පාදිතය වැනි රටක ආර්ථික ක්‍රියාකාරකම් මැනීම සඳහා ජාත්‍යන්තරව එකඟ වූ රාමුවකි.

වි.ස. 1.1 රූප සටහන: වෙළඳ භාණ්ඩ සහ සේවා අපනයන පිළිබඳ සංඛ්‍යාන දත්ත



මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව

1

සේවා සපයන්නන් හඳුනා ගැනීමේ දුෂ්කරතා, අඩු සමීක්ෂණ ප්‍රතිචාර අනුපාත, ගෙවුම් තුලනය සම්පාදනය කිරීම සඳහා ඇති සීමිත මානව සම්පත් සහ විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය සහ ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය අතරතුර සමාගම් සමඟ සම්බන්ධ වීමේ දී පැවති දැඩි ගැටලුකාරී බව ඇතුළු බොහෝ අභියෝග හේතුවෙනි. විදේශීය අංශයේ සංඛ්‍යාන දත්තවල නිරවද්‍යතාවය සහ සවිස්තරාත්මකභාවය වැඩි දියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 වසරේ දී ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (International Transactions Reporting System – ITRS) නිර්මාණය කිරීම ආරම්භ කළ අතර, එමඟින් බැංකු පද්ධතිය තුළ වාර්තා වන විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් දත්ත මත පදනම්ව දේශසීමා හරහා සිදුවන ගනුදෙනු චෙක්රැස් කර වර්ගීකරණය කරනු ලැබේ. කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය විසින් ඇති කරන ලද බාධා මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී බැංකු අතර මාර්ගගතව සිදු වූ ඉතා ඉහළ සහයෝගීතාවක් තුළින් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධති ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. වසර හතරක් මුළුල්ලේ වැඩිදියුණු කිරීමෙන් පසුව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය හරහා දත්ත රැස් කිරීම 2023 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ විය. මෙම දත්ත මත පදනම්ව, 2024 වසරේ ජනවාරි මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව මාසිකව සේවා අංශයේ සංඛ්‍යාන දත්ත නිකුත් කිරීම ආරම්භ කළේය.[1]

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වූ ශ්‍රී ලංකාවේ සේවා අංශයේ වෙළඳාම පිළිබඳ විශේෂ කරුණු


ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින්, මීට පෙර කාර්තුමය ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන නිකුත් කිරීමත් සමඟ කාර්තුමය වශයෙන් පමණක් ලබා ගත හැකි වූ සේවා වෙළෙඳාම පිළිබඳ සංඛ්‍යාන දත්ත මාසිකව වාර්තා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය. මීට අමතරව, නව කාණ්ඩ යටතේ වාර්තා කෙරෙන දත්ත සමඟ වඩාත් සවිස්තරාත්මක වර්ගීකරණයක් හඳුන්වා දෙන ලද අතර, පවතින කාණ්ඩවල දත්තවල නිරවද්‍යතාවය වැඩිදියුණු කරමින් ඒ හරහා වඩා හොඳ ආංශික විශ්ලේෂණයක් සඳහා හැකියාව ලැබුණි.

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර සහ පසු සේවා අංශයේ දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම් හේතුවෙන් ගෙවුම් තුලන සංඛ්‍යාන දත්ත මත ඇති වූ බලපෑම වි.ස. 1.2 රූප සටහනෙහි දක්වා ඇත. 2023 සහ 2024 වසරවල දී සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර සේවා අංශයේ අනෙකුත් සියලුම දත්ත ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මත පදනම් විය. එබැවින්, 2022 වසරෙන් පසු සේවා අංශයේ දත්ත රැස් කිරීම, නියැදි සමීක්ෂණ දත්ත අනුව සිදු කරන සංඛ්‍යානමය අනුමාන මත රඳා පවතින නියැදි පදනම් කරගත් ප්‍රවේශයක සිට, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය යටතේ සංගණන මත පදනම් වූ ක්‍රමවේදයක් බවට පත් වී ඇත. කෙසේ වෙතත්, සෘජු සමීක්ෂණ නතර කළ බැවින් 2023 වසරේ සිට ක්‍රමවේද දෙක අතිපිහිත වන කාලපරිච්ඡේදයක් නොතිබිණි.

සංචාරක සේවා ආශ්‍රිත ගෙවීම්වලින් කොටසක් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වන අතර, සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඇස්තමේන්තුවක් මත පදනම් වන බැවින්, සංසන්දනාත්මක අරමුණු සඳහා සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් මෙම සැසඳීමේ දී නොසලකා හැර ඇත. වි.ස. 1.2 රූප සටහනෙහි

1 මාසික සේවා අංශයේ සංඛ්‍යාන දත්ත පහත සබැඳියෙන් ලබා ගත හැකිය:
https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/external-sector → සේවා අංශය

වි.ස. 1.2 රූප සටහන: සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර සේවා ශිණුම පිළිබඳ සංඛ්‍යාන දත්ත



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1


දක්වා ඇති පරිදි, සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර අනෙකුත් සේවා අපනයන යටතේ වාර්තා වී ඇති දළ ලැබීම්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර සහ පසු කාලපරිච්ඡේද තුළ සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරයි. 2023 සහ 2024 වසරවල දී දළ ලැබීම් 2022 වසරට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම වැඩිවීමට සංඛ්‍යාන දත්ත සම්පාදනයේ වැඩිදියුණු කිරීම් පමණක් නොව, ආර්ථිකය අබණ්ඩව යථා තත්ත්වයට පත් වීම ද හේතු විය. කෙසේ වෙතත්, 2022 වසරට සාපේක්ෂව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව දළ ලැබීම් සහ ගෙවීම් ඉහළ ප්‍රමාණයක් වාර්තා වුවත්, 2023 සහ 2024 වසර සඳහා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් වාර්තා කරන ලද ශුද්ධ ලැබීම් 2022 වසරේ ශුද්ධ ලැබීම් ඇස්තමේන්තු සමඟ බොහෝ දුරකට අනුකූල වන බැවින්, දළ ලැබීම්වල වාර්තා වූ මෙම වෙනස ජංගම ගිණුම් ඇස්තමේන්තු කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා නොමැත.

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වූ සේවා අංශය පිළිබඳ විශේෂ කරුණු කිහිපයක් පහත විස්තර කෙරේ.

i. පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා


ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා පිළිබඳ සංඛ්‍යාන දත්ත ඇස්තමේන්තු කරන ලද්දේ සීමිත සමීක්ෂණ ප්‍රතිචාර සංඛ්‍යාවක් හරහා ලැබුණු තොරතුරු සහ නියැදි සමීක්ෂණ දත්ත අනුව සිදු කරන සංඛ්‍යානමය අනුමාන පදනම් කරගෙනය. සමීක්ෂණ පදනම් කරගත් ඇස්තමේන්තුවලට අනුව, පරිගණක සහ තොරතුරු

වි.ස. 1.3 රූප සටහන: පරිගණක සහ අනෙකුත් ව්‍යාපාර සේවා වෙත වූ ලැබීම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

වි.ස. 1.4 රූප සටහන: ඉදිකිරීම් සහ රක්ෂණ සේවා (ලැබීම්)



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා සඳහා වූ ලැබීම් වාර්ෂිකව ඒ.ජ. ඩොලර් බිලියනයක් පමණ විය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත අනුව, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා සඳහා වූ ලැබීම් ආසන්න වශයෙන් ඒ.ජ. ඩොලර් මිලියන 800ක් පමණ වෙතැයි වාර්තා වේ. මෙම ලැබීම්, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා වෙත වූ විදේශ විනිමය ලැබීම් වේ. කෙසේ වෙතත්, පෙර වාර්තා වී නොමැති, වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා සහ තාක්ෂණික සේවා වැනි නැගී එන සේවා උප අංශ කිහිපයක ලැබීම් ගෙවුම් තුලනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති බව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මගින් හෙළි විය. ඒ අනුව, මෙම කාණ්ඩ දැන් වෙන වෙනම හඳුනාගෙන වාර්තා කෙරෙන අතර, එමගින් සේවා අංශයට අදාළ ලැබීම් සහ ගෙවීම් වර්ගීකරණය වැඩිදියුණු වී ඇත. වි.ස. 1.3 රූප සටහනෙහි දැක්වෙන පරිදි, පරිගණක සහ තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා සහ අනෙකුත් ව්‍යාපාරික සේවාවන්ගේ ඒකාබද්ධ අගය පෙර ඇස්තමේන්තුවලට ආසන්න වශයෙන් සමාන වන අතර, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය හේතුවෙන් සේවා අංශයේ වෙළඳ ගනුදෙනු වඩාත් නිවැරදි සහ සවිස්තරාත්මක වර්ගීකරණයක් යටතේ ලබා දීමට හැකි වී ඇති බව පෙන්නුම් කරයි.

ii. ඉදිකිරීම් සහ රක්ෂණ සේවා

මූලිකවම අඩු ප්‍රතිචාර මට්ටමක් පැවතීම හේතුවෙන්, සමීක්ෂණ මත පදනම් වූ ඇස්තමේන්තු මගින් ඉදිකිරීම් සහ රක්ෂණ සේවා වැනි ඇතැම් සේවා අංශවල ඉපැයීම් සැබෑ ප්‍රමාණයට වඩා අඩුවෙන් වාර්තා වී ඇති බව අනාවරණය විය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය තුළින් ලද දත්තවලට අනුව, විශේෂයෙන්ම ඉදිකිරීම් සේවා සඳහා වූ ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින අතර, ඉදිරි වසරවල දී මෙම සේවා අංශ වර්ධනය වීම සඳහා දැවැන්ත විභවයක් පවතින බව මෙම දත්ත මගින් පිළිබිඹු

1

වි.ස. 1.5 රූප සටහන: ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් විසින් විදේශ අධ්‍යාපනය සඳහා දරන වියදම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙරේ (වි.ස. 1.4 රූප සටහන). දේශීය ඉදිකිරීම් කර්මාන්තය නැවත යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම හමුවේ ශ්‍රී ලාංකික ඉදිකිරීම් සමාගම් විසින් විදේශයන්හි පවතින අවස්ථා සොයා යෑම සඳහා මෑත කාලීනව දක්වන ලද උද්‍යෝගය ද මේ සඳහා යම් මට්ටමකට හේතු විය.

iii. ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් විසින් විදේශ අධ්‍යාපනය සඳහා දරන වියදම්

මෑත වසරවල දී විදේශ අධ්‍යාපනයට අදාළව දේශසීමා හරහා සිදුවන ගෙවීම්, ප්‍රතිපත්ති සාකච්ඡාවල ප්‍රධාන මාතෘකාවක් වී ඇත. කෙසේ වුවත්, එවැනි ගෙවීම් පිළිබඳව වන විශ්වසනීය දත්ත ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රතිපත්ති සාකච්ඡා සඳහා බාධා ඇති විය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීමෙන් පසු, අධ්‍යාපන සේවා සඳහා දේශසීමා හරහා සිදුවන ගෙවීම් මාසිකව වාර්තා කරනු ලබන අතර, එමඟින් වැඩි විනිවිදභාවයක් සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති තීරණ ගැනීම ප්‍රවර්ධනය කෙරේ (වි.ස. 1.5 රූප සටහන). කෙසේ වුවත්, එවැනි සේවාවන් සඳහා බැංකු නොවන මාර්ග භාවිතා කරමින් සිදුකරනු ලබන ගෙවීම් හේතුවෙන් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මඟින් වාර්තා කරනු ලබන අගයයන් අසම්පූර්ණ විය හැකි බව සැලකිල්ලට ගත යුතුය.

සේවා අංශයේ සංඛ්‍යාන දත්තවල ප්‍රයෝජනවත් බව

ඉහත උදාහරණවලින් ඉස්මතු කර ඇති පරිදි, ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සේවා අංශය පිළිබඳ නිවැරදි දත්ත අත්‍යවශ්‍ය වේ. 2025 වසරේ ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද මාසික ජංගම ගිණුම් දත්තවලට සේවා අංශයේ සංඛ්‍යාන දත්ත දැන් ඇතුළත් කර ඇත. ජංගම ගිණුම් සංඛ්‍යාන දත්ත ප්‍රකාශයට පත් කරන වාර ගණන සහ ඒවායේ නිරවද්‍යතාවය වැඩි කිරීම, මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හැඩගැස්වීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයින්ට වටිනා තොරතුරු ලබා දෙයි. මීට අමතරව, සේවා අංශයේ දත්ත ඇතුළුව ජංගම ගිණුම් මාසිකව යාවත්කාලීන කිරීම්, අනාගතයේ දී විදේශීය අංශයේ සිදු විය හැකි වෙනස්වීම් පිළිබඳ පෙර ඇඟවීම් සපයයි. මෙම දත්ත අනාගතයේ දී සිදුවිය හැකි ගෙවුම් තුලන අභියෝග පුරෝකථනය කිරීම සඳහා ප්‍රධාන සංඥාවක් ලෙස යොදා ගත හැකිය.

ඉදිරි දැක්ම

විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා බැංකු අංශය ඇතුළු ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධති ව්‍යාපෘතියට සම්බන්ධ පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, සේවා අංශයේ සංඛ්‍යාන දත්තවල ආවරණය සහ ගුණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, සේවා අංශයේ ප්‍රධාන කර්මාන්ත සහ ඒ ආශ්‍රිත වාණිජ සංගම් මඟින් සිදු කරන ඇස්තමේන්තු සහ නිල දත්ත අතර පවතින වෙනස්කම් අවම කිරීමට, එම ආයතන සමඟ සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. මීට අමතරව, නැගී එන සේවා අංශවල වර්ධන විභවය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ඒවා කෙරෙහි අවධානය යොමු කරමින්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම්ව ගැඹුරු ආංශික ප්‍රතිපත්ති අධ්‍යයනයන් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සැලසුම් කරයි. එවැනි විශ්ලේෂණයක් මඟින් දැනුම්වත්ව සිදු කෙරෙන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වටිනා තොරතුරු ලබා දෙනු ඇති අතර, නැගී එන සේවා අංශය වර්ධනය කිරීම සහ එහි විභවය උපරිම කිරීම පිණිස උපාය මාර්ග සැකසීම සඳහා එයින් සහාය ලැබෙනු ඇත.

මූලාශ්‍ර

1. United Nations, European Commission, International Monetary Fund, Organisation for Economic Co-operation and Development and World Bank (2009) *System of National Accounts 2008*, New York: United Nations.

2. Wijayawardhana A (2024) 'Capturing Services Sector Cross Border Transactions: The Central Bank of Sri Lanka's Long Endeavour to Establish an International Transactions Reporting System', Information Series Note, Central Bank of Sri Lanka.

1

ඍජු ආයෝජන

ඍජු ආයෝජන ව්‍යවසායයන් වෙත ලැබුණු විදේශීය ණය ද ඇතුළුව විදේශීය ඍජු ආයෝජන ලැබීම් 2024 වසර තුළ අඩු මට්ටමක පැවතුණි. හිමිකම් කොටස් ආයෝජන සහ ඍජු ආයෝජන ව්‍යාපාර වෙත ලැබුණු අන්තර් සමාගම් ණයවල වැඩිවීමක් දක්නට ලැබුණ ද, ඍජු ආයෝජන ව්‍යාපාරවලට ලැබුණු ප්‍රතිආයෝජිත ඉපැයීම් සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත සම්බන්ධයක් නොමැති පාර්ශ්වයන්ගෙන් ලැබුණු විදේශීය ණය ලැබීම් ද 2024 වසරේ දී වැඩි වීමක් වාර්තා කළේය. ඒ අනුව, විදේශීය ණය ද ඇතුළත් විදේශීය ඍජු ආයෝජන, 2023 වසරේ දී වාර්තා වූ ඇ.ජ. ඩොලර් මිලියන 759ට සාපේක්ෂව, 2024 වසරේ දී ඇ.ජ. ඩොලර් මිලියන 846ක් විය. විදේශීය ණය හැර විදේශීය ඍජු ආයෝජන, පෙර වසරේ ඇ.ජ. ඩොලර් මිලියන 713ට සාපේක්ෂව, 2024 වසරේ දී ඇ.ජ. ඩොලර් මිලියන 761ක් විය. විදේශීය ඍජු ආයෝජන ප්‍රධාන වශයෙන් යොමු වූයේ විවිධාංගීකරණය වූ ව්‍යාපාර, දුරකථන සහ විදුලි සංදේශ ජාල, හෝටල් හා අවන්හල්, සහ වරාය බහාලුම් පර්යන්ත වැනි අංශ වෙතය. පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ ඍජු ආයෝජන සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, සිය මව් සමාගම කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ඉවත් වීම නිසා, කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කර ඇති නමුත්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ ප්‍රධාන සමාගමක කොටස් හිමිකාරිත්වය වෙනස්වීම හා සම්බන්ධව සැලකිය යුතු ලැබීමක් වාර්තා විය.

විවිධ ආයෝජන

2024 වසරේ දී, විවිධ ආයෝජනවලට අයත් වගකීම්වල ශුද්ධ වෙනස්වීම් මෙන්ම මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් ද වැඩි විය. කොළඹ කොටස් වෙළඳපොළෙහි හිමිකම් කොටස් සහ ආයෝජන අරමුදල් කොටස් ආකාරයෙන් පැවති විවිධ ආයෝජනවල සුළු ශුද්ධ ලැබීමක් වාර්තා වූ අතර, රාජ්‍ය සුරැකුම්පත්වල විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එසේම, කොළඹ කොටස් වෙළඳපොළ සහ එහි ලැයිස්තුගත කර ඇති සමාගම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, සමහර සමාගම් හිමිකම් නිකුතු සාර්ථකව සම්පූර්ණ කළ අතර, විදේශීය ආයෝජකයින්ගෙන් ද ඇතුළුව නව හිමිකම් කොටස් සමඟ ඔවුන්ගේ ශේෂ පත්‍ර ශක්තිමත් කළේය. මේ අතර, වසර තුළ රාජ්‍ය සුරැකුම්පත්වල අනේවාසික ආයෝජන සැලකිය යුතු ලෙස අඩු විය. විවිධ ආයෝජන යටතේ ණය සුරැකුම්පත්වල ගනුදෙනු සලකා බැලූ විට, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීම සහ උපචිත පොලිය සඳහා නිකුත්කරන ලද බැඳුම්කරයේ පළමු වාරිකය ආපසු ගෙවීම හේතුවෙන් රජය විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල වගකීම් අඩු විය.

1.13 සංඛ්‍යා සටහන: මූල්‍ය ගිණුම

ඇ.ජ. ඩොලර් මිලියන

අයිතමය	2023 (අ)	2024 (ආ)
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**1,483**	**892**
මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	3,655	1,910
වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	2,172	1,018
ඍජු ආයෝජන: වත්කම්	**51**	**110**
හිමිකම්	47	106
ණය උපකරණ	5	4
ඍජු ආයෝජන: වගකීම්	**713**	**761**
හිමිකම්	497	499
ණය උපකරණ	216	262
විවිධ ආයෝජන: වත්කම්	**173**	**180**
ණය සුරැකුම්පත්	173	180
විවිධ ආයෝජන: වගකීම්	**931**	**301**
හිමිකම්	8	2
ණය සුරැකුම්පත්	923	299
රජය	910	286
කෙටිකාලීන (භාණ්ඩාගාර බිල්පත්)	132	-217
දිගුකාලීන	778	504
භාණ්ඩාගාර බැඳුම්කර	78	39
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-27	-
ස්වෛරීත්ව බැඳුම්කර	727	465
අනෙකුත් අංශ	13	13
දිගුකාලීන	13	13
මූල්‍ය වියුන්පන්න	-	-
අනෙකුත් ආයෝජන: වත්කම්	**972**	**-3**
මුදල් සහ තැන්පතු	114	-73
වෙළඳ ණය සහ අත්තිකාරම්	136	111
අනෙකුත් ලැබිය යුතු ගිණුම්	721	-42
අනෙකුත් ආයෝජන: වගකීම්	**528**	**-44**
මුදල් සහ තැන්පතු	-134	-868
ණය	751	993
වෙළඳ ණය සහ අත්තිකාරම්	-260	-170
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	171	-
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)	-	-
සංචිත වත්කම්	**2,458**	**1,622**
ශුද්ධ වැරදීම් නා අත්නැරීම්	**6**	**-325**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම්

2024 වසරේ දී අනෙකුත් ආයෝජනවලට අයත් වගකීම්වල ශුද්ධ වෙනස්වීම් සහ මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් යන දෙවර්ගය ම ඉහළ ගියේය. ලං.බ.නී.සං. විසින් ඉරාන ණය පහසුකම ඇතුළුව එහි පවතින වෙළඳ ණය වගකීම් අඛණ්ඩව අඩු කිරීම හේතුවෙන් වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල අඩුවීමක් වාර්තා විය. තවද, ලං.බ.නී.සං. වසර තුළ දී නව වෙළඳ ණය පහසුකම්වලට ඇතුළත් නොවීය. මේ අතර, බැංකු පද්ධතියේ විදේශීය ණය වගකීම් 2024 වසරේ දී සුළු ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය. පෞද්ගලික අංශය විසින් ණය ගැනීම් සීමා වූ අතර, එමගින් වසර තුළ දී එම අංශයෙන් සැලකිය යුතු ශුද්ධ ගෙවීමක් සිදුවිය. මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දළ නිල සංචිත වැඩිවීමයි. මහ බැංකුව විසින් දේශීය

1

1.4 විශේෂාංග රූප සටහන්
අර්බුදයට පෙර ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සහ අර්බුදයෙන් පසු මූල්‍ය ගිණුමේ හැසිරීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

අර්බුදයට පෙර පැවති ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය පිළිබඳ සුවිශේෂී කරුණු කිහිපයක් හෙළි වේ. 2015-2019 කාලපරිච්ඡේදය තුළ දී නිරීක්ෂණය වූ පරිදි, 2023 වසරට පෙර වසරවල දී ශ්‍රී ලංකාවේ අඛණ්ඩව පැවති ජංගම ගිණුම් හිඟයන් බොහෝ දුරට මූල්‍යනය කර ඇත්තේ අනෙකුත් ආයෝජන (ප්‍රධාන වශයෙන් ශුද්ධ විදේශ ණය), විවිධ ආයෝජන සහ සෘජු ආයෝජන මගිනි. කෙසේ වෙතත්, 2020 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුළ, විවිධ ආයෝජනවල ශුද්ධ ගෙවීමක් සහ සෘජු ආයෝජනවල සැලකිය යුතු ලෙස අඩු වීමක් වාර්තා විය. 2020 වසරේ සිට 2022 වසර දක්වා සංචිත භාවිතා කරමින් මෙය ගෙවීමට සිදු විය. කෙසේ වෙතත්, අර්බුදයෙන් පසු, විදේශීය අංශයේ ස්ථාවරත්වයත් සමඟ, ජංගම ගිණුම 2023 සහ 2024 වසරවල දී අතිරික්තයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංචිත සැලකිය යුතු ලෙස වැඩි විය. තවද, 2022 සහ 2023 වසරවල දී බැංකු අංශයට විදේශීය වත්කම් ගොඩනගා ගැනීමට හැකි විය.

විදේශ විනිමය වෙළඳපොළෙන් සිදු කළ විදේශ විනිමය මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලද ණය ලැබීම් දළ නිල සංචිත වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, 2024 වසරේ දී බැංකු අංශයේ මුදල් හා තැන්පතුවලට අදාළ වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම්වල අඩුවීමක් දක්නට ලැබුණු අතර, වෙළඳ ණය සහ අත්තිකාරම්වල ශුද්ධ වැඩිවීමක් වාර්තා විය.

1.4.2 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, සංචිත වත්කම් සහ සමස්ත ශේෂය

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

2024 වසරේ දී ශ්‍රී ලංකාවේ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, පෙර වසරට සාපේක්ෂව ඉහළ ශුද්ධ වගකීම් තත්ත්වයක් පිළිබිඹු කළේය. 2024 වසර අවසානය වන විට මුළු විදේශීය වගකීම් සහ මුළු විදේශීය වත්කම් යන දෙක ම වැඩි වූ නමුත්, වත්කම්වල සිදු වූ වැඩිවීම ඉක්මවා යමින් වගකීම් ඉහළ ගියේය. 2016 වසරේ දී ලබාගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ සිදු කළ ගෙවීම් සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම ක්‍රමයෙන් පියවීම හේතුවෙන්, වසර තුළ දී මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය වගකීම් අඩු විය. ශුද්ධ විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඩු මට්ටමක පැවතුණ ද, වසර අවසානය වන විට සමහර පොදු ලැයිස්තුගත සමාගම්වල වෙළඳපොළ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන්, සෘජු ආයෝජන වගකීම්වල වැඩිවීමක් වාර්තා විය. තවද, 2023 වසර අවසානය වන විට පැවති ණය සුරැකුම්පත්වල සැලකිය යුතු ලෙස අඩු වී තිබූ වෙළඳපොළ මිල ගණන් හා සසඳන විට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු රජය විසින් නිකුත් කරන ලද නව ණය සුරැකුම්පත්වල ඉහළ වෙළඳපොළ මිල ගණන් හේතුවෙන් විවිධ ආයෝජන වගකීම්වල සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. අලුතින් නිකුත් කරන ලද බැඳුම්කරවල මුහුණත වටිනාකම, පෙර නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකමට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු වීමක් තිබියදීත් මෙම තත්ත්වය ඇති විය. මීට අමතරව, රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සඳහා අදාළ උපචිත පොලිය ඉහළ යෑමත් සමඟ ප්‍රධාන වශයෙන් ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් රජයට ලැබෙන විදේශීය ණය ලැබීම් පිළිබිඹු කරමින් විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසර අවසානයේ දී රටෙහි මුළු විදේශීය වගකීම්, 2023 වසර අවසානයේ දී වූ ඒ.ජ. ඩොලර් බිලියන 63.4ක සිට ඒ.ජ. ඩොලර් බිලියන 68.0ක් දක්වා ඉහළ ගියේය.

සංචිත වත්කම් සහ බැංකු අංශයේ විදේශීය වත්කම් යන දෙකෙහි ම වැඩි වීමත් සමඟ 2024 වසර තුළ දී ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් තත්ත්වය ද ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, රටෙහි මුළු විදේශීය වත්කම්, 2023 වසර අවසානයේ දී වූ ඒ.ජ. ඩොලර් බිලියන 12.5ක සිට, 2024 වසර අවසානයේ දී ඒ.ජ. ඩොලර් බිලියන 14.5ක් දක්වා

1

1.14 සංඛ්‍යා සටහන: අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (සාරාංශය) (අ)

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

අයිතමය	2023 (ආ)		2024 (ඇ)	
	වත්කම්	වගකීම්	වත්කම්	වගකීම්
සෘජු ආයෝජන	**1,589**	**14,833**	**1,699**	**16,556**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	1,539	8,668	**1,645**	**10,130**
ණය උපකරණ	50	6,164	**54**	**6,427**
විවිධ ආයෝජන	**174**	**7,744**	**353**	**10,457**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	-	484	-	**762**
ණය සුරකුම්පත්	174	7,260	**353**	**9,694**
අනෙකුත් ආයෝජන	**6,370**	**40,832**	**6,367**	**41,012**
මුදල් සහ තැන්පතු	1,770	7,941	**1,697**	**7,051**
ණය	-	30,847	-	**32,133**
වෙළඳ ණය සහ අත්තිකාරම්	1,629	760	**1,741**	**590**
අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම්	2,971	-	**2,930**	-
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)		1,285		**1,239**
සංචිත වත්කම්	**4,392**		**6,122**	
මුළු වත්කම් / වගකීම්	**12,525**	**63,410**	**14,542**	**68,025**
ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය		**-50,885**		**-53,484**
විශේෂිත අයිතමයන්				
පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය	12,525	63,410	**14,542**	**68,025**
කෙටිකාලීන	9,280	5,811	**9,075**	**5,915**
දිගුකාලීන	3,244	57,599	**5,467**	**62,110**

(අ) අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි සවිස්තරාත්මක සංරචක සඳහා සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය වගුව 12 පරිශීලනය කරන්න
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ ගියේය. විදේශීය වත්කම්වල ඉහළ යෑම ඉක්මවා මුළු වගකීම් ඉහළ ගිය අතර, එමගින් ඉහළ ශුද්ධ වගකීම් තත්ත්වයක් ඇති විය. ඒ අනුව, රටෙහි ශුද්ධ වගකීම් තත්ත්වය, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 50.9ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 53.5ක් දක්වා වැඩි විය.

සංචිත වත්කම් තත්ත්වය

ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 4.4ක සිට, 2024 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය. මෙම වැඩිවීම සඳහා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මෙතෙක් සිදු කරන ලද ඉහළ ම ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්, දැනට ක්‍රියාත්මක වන ජා.මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ වන තෙවන වාරිකය ලැබීම සහ ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් ලැබූ මූල්‍ය සහයෝගය හේතු විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් සෘජුව ම විදේශ විනිමය අවශෝෂණය කිරීම හරහා දළ නිල සංචිත ගොඩ නැංවීම හේතුවෙන්, ජා.මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ 2024 වසර සඳහා වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක ඉක්මවා යාමට මහ බැංකුවට හැකි විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව එක් වරක් පමණක් ගෙවිය යුතුව තිබූ ගාස්තු සහ පොලී ගෙවීම් හේතුවෙන්, 2024 වසරේ නොවැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.5ක් වූ දළ නිල සංචිත, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා පහළ ගියේය. මීට අමතරව, විදේශීය වත්කම්වල වැඩිවීම විදේශීය වගකීම්වල වැඩිවීම ඉක්මවා යාම හේතුවෙන්, 2024 වසරේ දී බැංකු අංශයේ ශුද්ධ විදේශීය වත්කම් තත්ත්වය වර්ධනය විය. බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 5.0ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.1ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය සංචිත, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 9.4ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 11.2ක් දක්වා සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය.

1.15 සංඛ්‍යා සටහන: දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

අයිතමය	2020	2021	2022	2023	2024 (අ)
1. රජයේ විදේශීය වත්කම්	155	177	39	875	**368**
2. මහ බැංකුවේ විදේශීය වත්කම්	5,510	2,962	1,858	3,517	**5,754**
3. දළ නිල සංචිත (1+2)	**5,664**	**3,139**	**1,898**	**4,392**	**6,122**
4. තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම්	2,856	2,983	3,976	4,981	**5,108**
5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ)	**8,521**	**6,122**	**5,874**	**9,373**	**11,230**
6. සංචිතවලට අදාළ වගකීම් (ඇ)	2,121	3,562	5,127	4,796	**3,635**
7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)	**3,543**	**-423**	**-3,229**	**-404**	**2,487**
8. සමස්ත ශේෂය (ඇ)	**-2,328**	**-3,967**	**-2,806**	**2,826**	**2,890**
9. දළ නිල සංචිත මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන	4.2	1.8	1.2	3.1	**3.9**
10. මුළු විදේශීය වත්කම් මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන	6.4	3.6	3.9	6.7	**7.2**

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදු කරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස්වීම


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


1

1.5 විශේෂාංග රූප සටහන්
ශ්‍රී ලංකාවේ සංචිත ප්‍රමාණාත්මකතා දර්ශක වර්ධනය වීම

ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත 2021 සහ 2022 වසරවල දී තියුණු ලෙස අඩුවීමෙන් පසු ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර, කෙටිකාලීන ණය අඩු වී ඇත. කෙටිකාලීන වගකීම්වල ප්‍රතිශතයක් ලෙස දළ නිල සංචිත අනුපාතය ඉහළ යාමට මෙය බලපා ඇති අතර, එයින් අදහස් වන්නේ කෙටි කාලීනව තම මූල්‍ය වගකීම් සපුරාලීමට රට වඩා හොඳින් සූදානම් බවයි.

මේ අතර, දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ප්‍රමාණය අනුව ප්‍රකාශ කෙරෙන ආනයන ආවරණය ද ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර, එය විදේශීය අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරයි. මෙම සංචිත ප්‍රමාණාත්මකතා දර්ශකවල වර්ධනයන් මගින් පෙන්නුම් කරන්නේ බාහිර ස්වාරක්ෂක ශක්තිමත් වීම සහ රටෙහි සාර්ව ආර්ථික ස්ථාවරත්වය හා ණය ලබා ගැනීමට ඇති යෝග්‍යතාව මෙන්ම ආයෝජකයින්ගේ විශ්වාසයෙහි සිදු වූ වර්ධනයයි.





සමස්ත ශේෂය

ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස්වීම් නිරූපණය කරන ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2024 වසර අවසානයේ දී ඉහළ අතිරික්තයක් වාර්තා කළේය. 2023 වසර අවසානයේ දී ඒ.ජ. ඩොලර් බිලියන 4.4ක් වූ දළ නිල සංචිත, 2024 වසර අවසානය වන විට ඒ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ගිවිසුම් කාලය තවත් වසර තුනකින් දීර්ඝ කරන ලද සහ භාවිතා කිරීමේ කොන්දේසි අදාල වන, චීන මහජන බැංකුව සමඟ ඇති කරගත් විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ. මේ අතර, සංචිතවලට අදාළ වගකීම් අඩු වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසර තුළ දී ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකමට අදාළ ආපසු ගෙවීම් සහ 2016 වසරේ දී ජා.මූ. අරමුදලෙන් ලබාගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ ගෙවීම්ය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසර අවසානය වන විට ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය පෙර වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර, එමගින් සමස්ත ශේෂය 2023 වසරේ දී පැවති ඒ.ජ. ඩොලර් බිලියන 2.8ක අතිරික්තයට සාපේක්ෂව ඒ.ජ. ඩොලර් බිලියන 2.9ක පමණ අතිරික්තයක් වාර්තා විය.


1.4.3 විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

විදේශීය ණය

විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියෙන් අනතුරුව, 2024 වසරේ දී මුහුණත වටිනාකමට අනුව ශ්‍රී ලංකාවේ විදේශීය ණය අඩු විය. 2023 වසරේ දී විදේශීය ණයෙහි වෙළඳපොළ වටිනාකම සහ මුහුණත වටිනාකම අතර විශාල වෙනසක් දක්නට ලැබුණි. කෙසේ වුවත්, ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව මෙම වෙනස සැලකිය යුතු ලෙස අඩු විය. විදේශීය ණයවල වෙළඳපොළ වටිනාකම සහ මුහුණත වටිනාකම අතර වෙනස 2023 වසරේ දී ඒ.ජ. ඩොලර් මිලියන 5,374ක් වූ අතර, එය 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් මිලියන 62ක් දක්වා අඩු වී ඇත. ඒ අනුව, 2023 වසර අවසානයේ දී ඒ.ජ. ඩොලර් බිලියන 59.6ක් වූ මුහුණත වටිනාකමට අනුව ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය, 2024 වසර අවසානය වන විට ඒ.ජ. ඩොලර් බිලියන 57.2ක් විය. මුළු විදේශීය ණයවල මෙම

1

1.6 විශේෂාංග රූප සටහන්
ආර්ථික අර්බුදයෙන් පසු ජාත්‍යන්තර සංචිත නැවත යථා තත්ත්වයට පත් වීම



ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය කැපී පෙනෙන ලෙස නැවත යථා තත්ත්වයට පත් වීමක් වාර්තා කළේය. 2021 වසරේ සිට චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත් වූ රටෙහි දළ නිල සංචිත තත්ත්වය, 2022 වසරේ දී අවම මට්ටමකට පත් වූ අතර, ඒ හේතුවෙන් රජය විසින් ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමක් ප්‍රකාශයට පත් කරන ලදී. සංචිත ආශ්‍රිත වගකීම් ද සැලකිල්ලට ගනු ලබන රටෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය 2022 වසරේ දී සෘණ තත්ත්වයක පැවති අතර, එය ඉතිහාසයේ වූ අවම මට්ටම වේ. කෙසේ වුවත්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන නිර්ණායක සැපිරිය යුතු මට්ටම ද ඉක්මවමින් වත්කම් ඉහළ නංවා ගැනීමට මහ බැංකුවට හැකි වූ අතර, සෘජු මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ආශ්‍රිත බහුපාර්ශ්වික අරමුදල් ද මෙම ක්‍රියාවලියට සහාය විය. ඉන්දියානු සංචිත බැංකුව සමඟ පවතින විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම සම්බන්ධ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම හමුවේ සංචිත ආශ්‍රිත වගකීම් ද අඩු විය. එබැවින්, අර්බුදයෙන් පසුව සංචිතවලට අදාළ V-හැඩැති නැවත යථා තත්ත්වයට පත් වීම, දළ නිල සංචිතවල සැලකිය යුතු වැඩි වීමෙහි මෙන්ම මහ බැංකුවේ වගකීම්වල අඛණ්ඩ අඩු වීමෙහි ද ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

අඩු වීම, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ රජය සතු ද්විපාර්ශ්වික ණයවල විශාල කොටසක් ප්‍රතිව්‍යුහගත කිරීමේ සෘජු ප්‍රතිඵලයකි. මෙම පසුබිම තුළ, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම, 2023 වසර අවසානයේ දී වූ ඒ.ජ. ඩොලර් බිලියන 10.8ක සිට 2024 වසර අවසානයේ දී ඒ.ජ. ඩොලර් බිලියන 9.3ක් දක්වා අඩු විය. සමස්තයක් ලෙස, 2023 වසර අවසානයේ දී ඒ.ජ. ඩොලර් බිලියන 38.4ක් වූ මුහුණත වටිනාකමට අනුව රජයේ විදේශීය ණය ප්‍රමාණය, 2024 වසර අවසානයේ දී ආසන්න වශයෙන් ඒ.ජ. ඩොලර් බිලියන 37.6ක් විය. මෙය, රජය විසින් අලුතින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීම සහ ජා.මූ. අරමුදලෙන්[21] හා අනෙකුත් බහු පාර්ශ්වික ණය ලබාදෙන ආයතන සමඟ ඇති නොපියවා ඉතිරිව ඇති ණය තත්ත්වයෙහි සිදු වූ ඉහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. සමස්තයක් ලෙස, 2023 වසර අවසානයේ දී රටේ විදේශීය ණය (මුහුණත වටිනාකමට අනුව) ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 71.2%ක් වූ අතර, එය 2024 වසර අවසානයේ දී 57.8%ක් දක්වා පහත වැටුණි.

මේ අතර, වෙළඳපොළ වටිනාකම අනුව රජයේ විදේශීය ණය 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ඉහළ ගියේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ගනුදෙනු කළ හැකි ණය උපකරණ සඳහා වෙළඳපොළ වටිනාකම අනුව ප්‍රකාශයට පත් කෙරෙන රජයේ නොපියවා ඉතිරිව ඇති ණය තත්ත්වය, 2023 වසර අවසානයේ දී ඒ.ජ. ඩොලර් බිලියන 33.1ක් වූ අතර, එය 2024 වසර අවසානය වන විට ඒ.ජ. ඩොලර් බිලියන 37.6ක් වීම සඳහා මූලිකව ම හේතු වූයේ 2023 වසරට සාපේක්ෂව නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල[22] වෙළඳපොළ වටිනාකම ඉහළ යෑමයි. ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම ක්‍රමයෙන් ආපසු ගෙවීම සහ 2016 වසරේ දී ලබා ගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනට අදාළ ආපසු ගෙවීම් හේතුවෙන් මහ බැංකුවේ විදේශීය ණය සැලකිය යුතු ලෙස පහත වැටුණි. නොපියවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ විදේශීය ණය සුළු වශයෙන් වැඩි විය.

21 දැනට පවතින ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මූලිකව ම අයවැයට සහාය වීමේ අරමුණින් ලබා ගත් බැවින් එය ශ්‍රී ලංකා රජයේ වගකීමක් ලෙස සැලකේ. මින් පෙර පැවති ජා.මූ. අරමුදලේ පහසුකම් මූලිකව ම ගෙවුම් තුලනයට සහාය වීම සඳහා ලබා ගත් බැවින් ඒවා මහ බැංකුවේ වගකීම් ලෙස සැලකේ.

22 නොගෙවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල උපචිත පොලිය, අදාළ කාලපරිච්ඡේදය අවසානයේ දී පැවති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරි වූ වගකීම්වලට වෙළඳපොළ වටිනාකම සහ මුහුණත වටිනාකම යන ආකාර දෙකට ම අනුව ඇතුළත් කර ඇත.

1

1.16 සංඛ්‍යා සටහන: නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

අයිතමය	2023 (අ)	2024 (අ)
වෙළඳපොළ වටිනාකම මත පදනම්ව		
රජය	**33,117**	**37,599**
භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (පොත් අගය මත පදනම්ව)	334	**223**
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (උපචිත පොලිය ඇතුළුව වෙළඳපොළ මිල මත පදනම්ව)	6,794	**9,315**
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (උපචිත පොලිය ඇතුළුව)	25,988	**28,061**
මහ බැංකුව	**6,081**	**4,874**
මුදල් සහ තැන්පතු (කොටිකාලීන)	0.3	**0.1**
විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම්	1,285	**1,239**
ඉන්දියානු සංචිත බැංකුවේ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම	2,471	**1,563**
චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම	1,420	**1,406**
ජා.මු. අරමුදලේ ණය	904	**667**
තැන්පතු නාර ගන්නා ආයතන	**4,933**	**4,980**
මුදල් සහ තැන්පතු (ඇ)	4,050	**4,082**
ණය	883	**897**
අනෙකුත් අංශ (ඈ)	**3,963**	**3,254**
වෙළඳ ණය සහ අත්තිකාරම් (ඉ)	760	**590**
ණය සුරැකුම්පත් (උපචිත පොලිය ඇතුළුව වෙළඳපොළ මිල මත පදනම්ව)	132	**156**
පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ණය	3,071	**2,508**
සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඊ)	**6,164**	**6,427**
දළ විදේශීය ණය තත්ත්වය - වෙළඳපොළ වටිනාකම අනුව	**54,257**	**57,133**
දළ විදේශීය ණය තත්ත්වය - වෙළඳපොළ වටිනාකම අනුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස	**64.8**	**57.7**
මුහුණත වටිනාකම මත පදනම්ව		
රජය	**38,428**	**37,610**
භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (මුහුණත වටිනාකම මත පදනම්ව)	363	**234**
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (උපචිත පොලිය ඇතුළුව මුහුණත වටිනාකම මත පදනම්ව)	12,078	**9,315**
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (උපචිත පොලිය ඇතුළුව)	25,988	**28,061**
මහ බැංකුව	**6,081**	**4,874**
මුදල් සහ තැන්පතු (කොටිකාලීන)	0.3	**0.1**
විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම්	1,285	**1,239**
ඉන්දියානු සංචිත බැංකුවේ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම	2,471	**1,563**
චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම	1,420	**1,406**
ජා.මු. අරමුදලේ ණය	904	**667**
තැන්පතු නාර ගන්නා ආයතන	**4,933**	**4,980**
මුදල් සහ තැන්පතු (ඇ)	4,050	**4,082**
ණය	883	**897**
අනෙකුත් අංශ (ඈ)	**4,024**	**3,304**
වෙළඳ ණය සහ අත්තිකාරම් (ඉ)	760	**590**
ණය සුරැකුම්පත් (උපචිත පොලිය ඇතුළුව මුහුණත වටිනාකම මත පදනම්ව)	194	**207**
පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ණය	3,071	**2,508**
සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඊ)	**6,164**	**6,427**
දළ විදේශීය ණය තත්ත්වය - මුහුණත වටිනාකම අනුව	**59,631**	**57,195**
දළ විදේශීය ණය තත්ත්වය - මුහුණත වටිනාකම අනුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස	**71.2**	**57.8**
විශේෂිත අයිතමයන්		
නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම	**12,550**	**10,585**
අනේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය	10,800	**9,315**
නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය (උ)	1,750	**1,270**

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(ඈ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඉ) ලංකා බහිප තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(ඊ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.
(උ) 2019 දෙසැම්බර් සිට විදේශීය ණය සංඛ්‍යානවල ඇතුළත් නොවේ.

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

ණය ආපසු ගෙවීම අත්හිටුවා තිබූ රජයේ ණය බොහොමයක් 2024 අග භාගය වන විට ණය ආපසු ගෙවීම නැවත ආරම්භ කිරීමත් සමඟ, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් වැඩි විය. 2023 වසරේ දී වූ ඒ.ජ. ඩොලර් බිලියන 2.8ක් වූ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2024 වසරේ දී ඒ.ජ. ඩොලර් බිලියන 4.2ක් දක්වා ඉහළ ගියේය. රජයේ විදේශීය ණය ආපසු ගෙවීම් පෙර පැවති මට්ටම්වල ම පැවතුණ ද, 2024 වසරේ මෙම ඉහළ යෑමට මහ බැංකුව සහ පෞද්ගලික අංශය විසින් සිදු කළ ඉහළ ණය සේවාකරණය මූලිකව

1

1.17 සංඛ්‍යා සටහන: විදේශීය ණය සේවාකරණ ගෙවීම්

ඇ.ජ. ඩොලර් මිලියන

අයිතමය	2023 (අ)	2024 (ආ)
1. ණය සේවාකරණ ගෙවීම්	**2,751**	**4,152**
1.1 ණය ආපසු ගෙවීම්	**2,125**	**3,020**
රජය	1,043	**693**
ව්‍යාපෘති ණය	1,041	**589**
ණය සුරැකුම්පත්	2	**104**
මහ බැංකුව	522	**1,110**
ජා.මූ. අරමුදල	172	**210**
ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්	350	**900**
පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන	560	**1,217**
විදේශීය ණය	560	**1,217**
1.2 පොළී ගෙවීම්	**627**	**1,132**
රජය	405	**749**
ව්‍යාපෘති ණය	377	**532**
ණය සුරැකුම්පත්	28	**217**
මහ බැංකුව	118	**276**
ජා.මූ. අරමුදල	57	**83**
ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්	60	**192**
පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන	92	**107**
විදේශීය ණය	92	**107**
ඍජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය	12	-
2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්	**17,327**	**19,682**
3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා සංගම සංක්‍රාම	**23,776**	**26,877**
4. ණය සේවාකරණ අනුපාතය		
4.1 ඉහත 2හි % වශයෙන්		
සමස්ත අනුපාතය	15.9	**21.1**
ජා.මූ අරමුදලේ ගනුදෙනු හැර	14.6	**19.6**
4.2 ඉහත 3හි % වශයෙන්		
සමස්ත අනුපාතය	11.6	**15.4**
ජා.මූ අරමුදලේ ගනුදෙනු හැර	10.6	**14.4**
5. රජයේ ණය සේවාකරණ ගෙවීම්		
5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (අෑ)	1,448	**1,443**
5.2 ඉහත 1හි % වශයෙන්	52.6	**34.7**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(අෑ) ජා.මූ. අරමුදලේ ගනුදෙනු හැර

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව


ම හේතු විය. ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළ ගෙවීම් ආරම්භ කිරීම රජයේ විදේශීය ණය ආපසු ගෙවීමට අදාළ ප්‍රධාන ප්‍රවණතාවයක් විය. මෙයට උපචිත පොලිය සඳහා නිකුත්කරන ලද බැඳුම්කරයේ පළමුවන වාරිකය ආපසු ගෙවීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළ පොළී ගෙවීම් ඇතුළත් වේ. 2023 වසරට සාපේක්ෂව රජයේ විදේශීය ණය සේවාකරණය සමාන මට්ටමක පැවතුණ ද, පොළී ගෙවීම්වල සැලකිය යුතු වැඩිවීමක් සහ ණය ආපසු ගෙවීම්වල අඩුවීමක් වාර්තා විය. එනමුත්, 2024 වසරේ දී මහ බැංකුවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී පෞද්ගලික අංශයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්වල කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා වූ අතර, එය රටෙහි විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑමට දායක විය.

1.4.4 විනිමය අනුපාතිකයේ හැසිරීම

2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය. අඛණ්ඩව වසර දෙකක් පුරාවට සිදු වූ අතිප්‍රමාණය වීමට හේතු වූයේ, එම වසරවල ජංගම ගිණුමේ අතිරික්තයන් වාර්තා වීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත අඛණ්ඩව ශුද්ධ විදේශ විනිමය ලැබීමත් සමඟ විදේශ විනිමය ද්‍රවශීලතාවය වැඩි වීමයි. මෙම ලැබීම් ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ඉපැයීම්, සේවා අංශයේ අනෙකුත් සේවා ආශ්‍රිත ලැබීම් සහ වෙළඳ භාණ්ඩ අපනයනවලින් සමන්විත වේ. මේ අතර, වෙළඳ භාණ්ඩ ආනයන, සේවා අංශයේ ගෙවීම් සහ ජංගම ගිණුමේ අනෙකුත් ගෙවීම් අඩු මට්ටමක පැවතුණි. රටේ නිල සංචිත ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත (වෙළඳ දිනය මත පදනම්ව) ඇ.ජ. ඩොලර් මිලියන 2,846ක් මිල දී ගන්නා ලදී. මෙය, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම විය. මහ බැංකුව විසින් මිලදී ගැනීම් සිදු නොකළේ නම් රුපියල තවදුරටත් අතිප්‍රමාණය වීමට ඉඩ තිබුණි.

සමස්තයක් වශයෙන් 2024 වසරේ දී අතිප්‍රමාණය වුවද, වසරේ ඇතැම් කාලපරිච්ඡේදවල දී ශ්‍රී ලංකා රුපියලෙහි විචලනයන් දක්නට ලැබුණි. සමස්තයක් ලෙස වසර අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල, ඇ.ජ. ඩොලරයට සාපේක්ෂව 10.7%ක වාර්ෂික අතිප්‍රමාණය වීමක් වාර්තා කරමින් රු. 292.58ක අගයක පැවතුණි. 2024 වසරේ දී ඇ.ජ. ඩොලරයට සාපේක්ෂව අනෙකුත් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් අවප්‍රමාණය වුවද, ශ්‍රී ලංකා රුපියල එම මුදල්වලට සාපේක්ෂව අඛණ්ඩව අතිප්‍රමාණය විය. ඒ අනුව, 2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල යුරෝ (17.8%), ස්ටර්ලින් පවුම (12.3%), ජපන් යෙන් (22.5%), චීන යුවාන් (13.9%), ඉන්දියානු රුපියල (13.9%) හා ඕස්ට්‍රේලියානු ඩොලරයට (21.7%)ට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මහ බැංකුව වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතික

1.21 රූප සටහන: දෛනික විනිමය අනුපාතිකයේ වෙනස්වීම්



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

1.18 සංඛ්‍යා සටහන: විනිමය අනුපාතික වෙනස්වීම්

මුදල් වර්ගය	විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය						පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම (අ)			
	වර්ෂය අග අනුපාතිකය			වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය			වර්ෂය අග		වාර්ෂික සාමාන්‍යය	
	2022	2023	2024	2022	2023	2024	2023	2024	2023	2024
යුරෝ	386.93	358.75	**304.56**	339.04	354.11	**327.05**	7.86	**17.79**	-4.26	**8.28**
ඉන්දියානු රුපියල්	4.39	3.90	**3.42**	4.11	3.97	**3.61**	12.57	**13.94**	3.63	**9.82**
ජපන් යෙන්	2.74	2.29	**1.87**	2.44	2.34	**2.00**	19.53	**22.51**	4.54	**17.01**
බ්‍රිතාන්‍ය පවුම්	437.35	412.61	**367.38**	396.89	407.07	**386.25**	5.99	**12.31**	-2.50	**5.39**
එක්සත් ජනපද ඩොලර්	363.11	323.92	**292.58**	324.55	327.53	**302.12**	12.10	**10.71**	-0.91	**8.41**
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)	483.24	434.60	**381.57**	431.91	436.88	**401.07**	11.19	**13.90**	-1.14	**8.93**

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිපත්තියක් අඛණ්ඩව අනුගමනය කළ අතර, දිනයක් තුළ දී අධික විචලනයක් ඇති වූ අවස්ථාවල දී පමණක් දේශීය විදේශ විනිමය වෙළඳපොළට විදේශ විනිමය විකිණීම තුළින් මැදිහත් වීම් සිදු කළේය. නිල සංචිත ගොඩනගා ගැනීමේ අරමුණ සහිතව විදේශ විනිමය මිල දී ගැනීම සඳහා මැදිහත්වීම් නිතිපතා සිදු විය.


නාමික සහ මූර්ත සවිල විනිමය අනුපාතික

2024 වසර තුළ දී නාමික සවිල විනිමය අනුපාතිකය සහ මූර්ත සවිල විනිමය අනුපාතිකය ඉහළ යමින් අතිප්‍රමාණය වීමක් පිළිබිඹු කළේය. තෝරාගත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ නාමික අතිප්‍රමාණය වීම සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු

1.7 විශේෂාංග රූප සටහන්
නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ වන විනිමය අනුපාතික ප්‍රවණතා


පසුගිය වසර දෙක තුළ දී වාර්තා වූ ශ්‍රී ලංකා රුපියලෙහි අතිප්‍රමාණය වීම, සීමිත විදේශ විනිමය ගෙවීම් මධ්‍යයේ වාර්තා වූ විදේශීය ජංගම ගිණුමේ අතිරික්තය මගින් පිළිබිඹු වන වැඩි දියුණු වූ ආර්ථික මූලිකාංගවල ඒකාබද්ධ ප්‍රතිඵලයකි. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වී වාර්තාගත මට්ටමක විදේශ විනිමය ප්‍රමාණයක් මිල දී නොගත්තේ නම් මෙම අතිප්‍රමාණය වීම වඩාත් තීව්‍ර වීමට ඉඩ තිබුණි. මුදලේ අගය අතිප්‍රමාණය වීමක් යනු මනා ආර්ථික ක්‍රියාකාරිත්වයක පිළිබිඹුවක් බවට ඇති පොදු මතය මිත්‍යාවකි. යම් මුදලක් අවප්‍රමාණය වීම මෙන්ම අතිප්‍රමාණය වීමෙහි ද එයට ම ආවේණික වූ වාසි මෙන්ම අවාසි ද ඇති අතර, දිගින් දිගටම අතිප්‍රමාණය වීම රටෙහි විදේශීය තරගකාරිත්වයට අහිතකර විය හැක. එම නිසා, මහ බැංකු පනතෙන් නියම කර ඇති නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය යටතේ, විනිමය අනුපාතිකයේ හැසිරීම බොහෝ දුරට විදේශ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් මත තීරණය වේ. ආර්ථිකයේ මූලිකාංග මගින් එවැනි ප්‍රවණතා මෙහෙයවන්නේ නම් මිස, මෙම ක්‍රමවේදය යටතේ විනිමය අනුපාතිකය අඛණ්ඩව අවප්‍රමාණය වීම හෝ අතිප්‍රමාණය වීමට ඇති ඉඩ ප්‍රස්ථාව අඩුය.

විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම / අවප්‍රමාණය වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීම



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

1.19 සංඛ්‍යා සටහන: නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

සඵල විනිමය අනුපාතික දර්ශක (අ) (ආ) (2017=100)	වර්ෂය අග දර්ශකය			වාර්ෂික සාමාන්‍ය දර්ශකය			පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම			
							වර්ෂය අග දර්ශකය		වාර්ෂික සාමාන්‍ය දර්ශකය	
	2022	2023	2024	2022	2023	2024	2023	2024	2023	2024
නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	47.32	53.66	**61.63**	53.99	53.30	**58.56**	13.39	**14.86**	-1.28	**9.87**
මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	79.74	70.24	**76.98**	77.49	71.73	**74.77**	-11.91	**9.59**	-7.44	**4.25**

(අ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැළපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ආ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළ යාම/පහළ යාම මගින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1.22 රූප සටහන: සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) - මුදල් වර්ග 24 පැස අනුව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන් ඉහළ ගියේය. ඒ අනුව, 2024 වසර තුළ දී මුදල් වර්ග 5කින් සහ 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන්, පිළිවෙළින්, 14.6% කින් සහ 14.9%කින් ඉහළ ගියේය. පැස තුළ වූ විනිමය අනුපාතිකයන්හි නාමික වෙනස්වීම් සහ අදාළ රටවල්වල උද්ධමන වෙනස සැලකිල්ලට ගනු ලබන මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් ද ඉහළ ගියේය. ඒ අනුව, මුදල් වර්ග 5කින් සහ 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන්, පිළිවෙළින්, 8.9%කින් සහ 9.6%කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පදනම් වර්ෂයට සාපේක්ෂව විදේශීය තරඟකාරීත්වයේ පහළ යෑමක් පිළිබිඹු කරමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පදනම් වර්ෂයේ (2017=100) මට්ටමට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි.

1.5 රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

1.5.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

ආදායම් වැඩිදියුණු කිරීම සහ වියදම් තාර්කීකරණය සඳහා වන දැඩි ක්‍රියාමාර්ග ඒලෙස ම පවත්වාගෙන යෑම, 2024 වසර තුළ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් කැපී පෙනෙන අයුරින් වර්ධනය වීමට හේතු විය. ඒ අනුව, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කිරීම මගින් ගණනය කෙරෙන ප්‍රාථමික ශේෂය, තවදුරටත් වර්ධනය වෙමින් 2023 වසරේ දී වාර්තා කරන ලද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 0.6%ක (රුපියල් බිලියන 173ක) අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ දී ද.දේ.නි.යෙන් 2.2%ක (රුපියල් බිලියන 650ක) කැපී පෙනෙන අතිරික්තයක් වාර්තා කළේය. එය ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2024 වසර සඳහා ඉලක්කකර තිබූ රුපියල් බිලියන 300ක ප්‍රාථමික ශේෂ ඉලක්කය අභිබවා යෑමකි. අභියෝගාත්මක සමාජ දේශපාලන වාතාවරණයක් මධ්‍යයේ අඛණ්ඩව වසර දෙකක් ප්‍රාථමික අතිරික්තයන් වාර්තා කිරීම ප්‍රශංසනාත්මක තත්ත්වයකි. රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ ඉතා වෙහෙස වී ළඟා කර ගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා ධනාත්මක ප්‍රාථමික ශේෂයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. මේ අතර, 2023 වසරේ දී ද.දේ.නි.යෙන් 6.0%ක් (රුපියල් බිලියන 1,651ක්) වූ ජංගම ගිණුමේ හිඟය 2024 වසරේ දී ද.දේ.නි.යෙන් 4.4%ක් (රුපියල් බිලියන 1,309ක්) දක්වා අඩු වී ඇති අතර 2023 වසරේ දී ද.දේ.නි.යෙන් 8.3%ක් (රුපියල් බිලියන 2,282ක්) සහ 2024 සඳහා කරන ලද අයවැය ඇස්තමේන්තුවෙහි ද.දේ.නි.යෙන් 9.1%ක් (රුපියල් බිලියන 2,851ක්) වූ හිඟයට සාපේක්ෂව, සමස්ත අයවැය හිඟය 2024 වසරේ දී ද.දේ.නි.යෙන් 6.8%ක් (රුපියල් බිලියන 2,040ක්) දක්වා අඩු විය.[23]

1.5.2 රජයේ ආදායම, වියදම සහ ශුද්ධ ණය

රජයේ ආදායම

ආදායම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සමඟ 2024 වසරේ දී රජයේ ආදායම පෙර වසරට සාපේක්ෂව නාමික වශයෙන් සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, නාමික වශයෙන් රජයේ ආදායම 32.2%ක වාර්ෂික වර්ධනයක් 2024 වසරේ දී වාර්තා කළේය. 2023 සහ 2024 වසර දෙක තුළ දී අඛණ්ඩව ප්‍රතිශතාංක 2කට වඩා වැඩි වාර්ෂික වර්ධනයක් සහිත ව, 2024 වසරේ දී රජයේ ආදායම

23 බැංකු නැවත ප්‍රාග්ධනීකරණය සඳහා රුපියල් බිලියන 450ක ප්‍රතිපාදන, 2024 සඳහා වන අයවැය හිඟ ඇස්තමේන්තුව තුළ ඇතුළත් වේ.

1

1.20 සංඛ්‍යා සටහන: රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2023	2024 (අ)	2023/2024 නිරපේක්ෂ වෙනස	2023/2024 (%) වෙනස
රුපියල් බිලියන				
මූළු ආදායම සහ ප්‍රදාන	**3,074.3**	**4,090.8**	**1,016.5**	**33.1**
මූළු ආදායම	3,048.8	**4,030.8**	982.0	32.2
බදු ආදායම	2,720.6	**3,704.6**	984.0	36.2
බදු නොවන ආදායම	328.3	**326.3**	-2.0	-0.6
ප්‍රදාන	25.5	**60.0**	34.5	135.2
වියදම් සහ ශුද්ධ ණය දීම්	**5,356.6**	**6,130.7**	**774.1**	**14.5**
පුනරාවර්තන	4,699.7	**5,339.9**	640.3	13.6
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	656.9	**790.8**	133.9	20.4
එයින් රාජ්‍ය ආයෝජන	932.7	**817.1**	-115.7	-12.4
වර්තන ගිණුමේ ශේෂය	**-1,650.9**	**-1,309.1**		
ප්‍රාථමික ශේෂය	**173.3**	**649.6**		
සමස්ත අයවැය ශේෂය	**-2,282.3**	**-2,039.9**		
මූල්‍යනය	**2,282.3**	**2,039.9**	**-242.3**	**-10.6**
විදේශීය මූල්‍යනය	494.7	**333.2**	-161.4	-32.6
දේශීය මූල්‍යනය	1,787.6	**1,706.7**	-80.9	-4.5
ද.දේ.නි.යෙහි (%) ලෙස (අ) (ඇ)				
මූළු ආදායම සහ ප්‍රදාන	11.2	**13.7**		
මූළු ආදායම	11.1	**13.5**		
බදු ආදායම	9.9	**12.4**		
බදු නොවන ආදායම	1.2	**1.1**		
ප්‍රදාන	0.1	**0.2**		
වියදම් සහ ශුද්ධ ණය දීම්	19.5	**20.5**		
පුනරාවර්තන	17.1	**17.9**		
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	2.4	**2.6**		
එයින් රාජ්‍ය ආයෝජන	3.4	**2.7**		
වර්තන ගිණුමේ ශේෂය	-6.0	**-4.4**		
ප්‍රාථමික ශේෂය	0.6	**2.2**		
සමස්ත අයවැය ශේෂය	-8.3	**-6.8**		
මූල්‍යනය	8.3	**6.8**		
විදේශීය මූල්‍යනය	1.8	**1.1**		
දේශීය මූල්‍යනය	6.5	**5.7**		

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු 18 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.

මූලාශ්‍ර: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 13.5%ක් දක්වා වැඩි විය. ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද (VAT), නිෂ්පාදන /සුරා බදු (Excise duty), ආනයන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) සහ සමාජ ආරක්ෂණ දායක බද්ද (SSCL) යන බදුවලින් එකතු වූ බදු ආදායම් වැඩි වීම, 2024 වසරේ දී රජයේ ආදායමේ මෙම සැලකිය යුතු වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසරේ දී පුද්ගලික ආදායම් බදු සහ සංස්ථාපිත ආදායම් බදු සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම්හි පූර්ණ බලපෑම සහ ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම 2024 වසරේ දී ආදායම් බදු ආදායම ඉහළ යෑමට හේතු විය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ආදායම් පරිපාලනය වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග 2024 වසරේ බදු ආදායම් ඉහළ නැංවීමට හේතු විය. එවැනි ප්‍රධාන ක්‍රියාමාර්ග අතරට ඉහළ වත්කම් සහිත පුද්ගල අංශය (High Wealth Individual Unit) සහ ආදායම් බදු අත්තිකාරම් අධීක්ෂණ ඒකකය (Advance Income Tax Monitoring Unit) පිහිටුවීම මෙන්ම බදු අනුකූලතාව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් බදු ලියාපදිංචිය අනිවාර්ය කිරීම යනාදිය ඇතුළත් වේ. මීට අමතරව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන ඇතුළු සියලු මූල්‍ය ආයතන, සහ කොළඹ කොටස් හුවමාරුව යන ආයතන මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ බදු පදනම පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමට බැඳී සිටී. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන කාණ්ඩ දෙකෙහි ම, 2023 වසරේ 879,778ක් වූ ලියාපදිංචි ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 2024 වසරේ 1,485,777ක් දක්වා ඉහළ යාම මගින් මෙම ප්‍රයත්න වල බලපෑම පිළිබිඹු වේ. ඒ අනුව, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ආදායම් බදු එක්රැස් කිරීම 12.6%කින් (රුපියල් බිලියන 114.8කින්) ඉහළ ගොස් ඇත. මේ අතර, එකතු කළ අගය මත බදු සඳහා පැවති බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම, එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රුපියල් මිලියන 80 සිට රුපියල් මිලියන 60ක් දක්වා අඩු කිරීම, එකතු කළ අගය මත බදු අනුපාතය 18%ක් දක්වා ඉහළ නැංවීම සමඟ ආනයන සීමා ලිහිල් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම 2024 වසරේ දී එකතු කළ අගය මත බදු ආදායමේ කැපී පෙනෙන වර්ධනයට දායක විය. මේ හේතුවෙන්, එකතු කළ අගය මත බදු ආදායම පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී, 88.6%ක වර්ධනයක් (රුපියල් බිලියන 615.2කින්) වාර්තා කරන ලදී. එකතු කළ අගය මත බදු එක්රැස් කිරීම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් දියත් කළ එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (VAT Compliance Improvement Project) ආරම්භ කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දරන ලද ප්‍රයත්නය මගින් මෙම ප්‍රතිසංස්කරණ තවදුරටත් ශක්තිමත් විය.

මේ අතර, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී නිෂ්පාදන/සුරා බදුවලින් ලද ආදායම 27.4%ක (රුපියල් බිලියන 128.9ක) වර්ධනයක් වාර්තා කළේය. 2023 වසරේ ජූනි මාසයේ සිට හඳුන්වා දුන් වාර්ෂික උද්ධමන ගැළපුම් දර්ශක මත පදනම්ව මෙම වසර ආරම්භයේ දී මද්‍යසාර මත නිෂ්පාදන/සුරා බද්ද 14%කින් ඉහළ නැංවීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2024 වසර තුළ සියලු වර්ගවල ශුද්ධ බනිජ තෙල් නිෂ්පාදන ආනයනය ඉහළ යාම හේතුවෙන් බනිජ තෙල් මත නිෂ්පාදන බදු එක්රැස් කිරීම ඉහළ යාම ද මෙම වැඩි වීමට දායක විය. ආනයන බදු (CID) සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදුවලින් ඇතුළුව 2024 වසරේ දී ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධව එකතු වූ බදු ආදායම, පිළිවෙලින්, 5.7%කින් සහ 124.4%කින් වර්ධනය විය. ආනයන පරිමාව ඉහළ යාම, සීනි සහ අර්තාපල් සඳහා පැවති විශේෂ

1

1.23 රූප සටහන: රාජ්‍ය ආදායමේ සංයුතිය - 2024



මූලාශ්‍රය: මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


වෙළඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ නැංවීම සහ 2023 වසරේ මාර්තු මාසයේ සිදු කළ ආනයන බදු ඉහළ නැංවීමේ සංශෝධනයෙහි බලපෑම මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මේ අතර, ආනයන ඉහළ යාම සහ තෝරා ගත් ආනයනික භාණ්ඩ ආනයනය මත සෙස් බදු (CESS) අනුපාත ඉහළ යාම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, එය 41.9%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, තීරු බදු නොවන බදු වර්ග ක්‍රමයෙන් ඉවත් කිරීමට 2023 වසර තුළ දී ගත් ප්‍රතිපත්තිමය තීරණයෙහි බලපෑම හේතුවෙන් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලද ආදායම 3.1% කින් පහළ ගියේය. තවද, 2022 වසරේ අග භාගයේ දී, ආදායම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග යටතේ හඳුන්වා දුන් නව බද්ද වන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී 16.0%ක වර්ධනයක් වාර්තා කළේය. 2024 වසරේ ජනවාරි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා වුවත්, 2024 වසරේ බදු ආදායම් එකතුව 2024 ජාතික අයවැයේ ආදායම් ඇස්තමේන්තුවට (රුපියල් බිලියන 3,820) වඩා රුපියල් බිලියන 115කින් (3%කින්) අඩු වී ඇත. කෙසේ වෙතත්, 2024 වසරේ මධ්‍යම රජයේ බදු ආදායම ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ පැවති රුපියල් බිලියන 3,700ක් වූ බදු ආදායම් ඉලක්කය ඉක්මවා ගියේය. 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් බදු ප්‍රතිසංස්කරණවලින් පසුව සෘජු හා වක්‍ර බදු අනුපාතය 2023 වසරේ දී 33:67 අනුපාතයක් ලෙස සෘජු බදු වෙත නැඹුරු වී තිබුණ ද, 2024 වසරේ දී හඳුන්වා දුන් එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ සමඟ, එම අනුපාතය 28:72ක් ලෙස වාර්තා කරමින් නැවත වරක් වක්‍ර බදු දෙසට නැඹුරු විය. බදු පදනම සහ බදු අනුකූලතාව පුළුල් කිරීම සඳහා දැනට සලකා බලනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම අනුපාතය ඉදිරි කාල වකවානුව තුළ දී ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතර, ප්‍රධාන වශයෙන් රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ පැවරුම් අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී බදු නොවන ආදායම නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද සුළු වශයෙන් අඩු විය. කෙසේ වෙතත්, 2024 වසර තුළ දී පොලී ආදායම්, දඩ මුදල්, ගාස්තු හා අයකිරීම් සහ සමාජ ආරක්ෂණ දායකත්ව අරමුදල් වැනි ප්‍රභවයන්ගෙන් රජය ලද බදු නොවන ආදායමෙහි වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය හේතුවෙන් මෙම අඩු වීමෙහි බලපෑම අවම කෙරිණි.

වියදම් සහ ශුද්ධ ණය දීම්

2024 වසරේ ඇස්තමේන්තුගත අයවැය වියදමට සාපේක්ෂව සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. 2024 වසරේ සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් අයවැය ඇස්තමේන්තුවෙන් 88% ක් පමණක් වූ අතර, පෙර වසරට සාපේක්ෂව නාමික වශයෙන් සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් 14.5%කින් ඉහළ ගියේය. මේ අතර, 2024 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වියදම් 20.5%ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. 2024 වසරේ සමස්ත පුනරාවර්තන වියදමෙන් 50.4%ක් ලෙස 2024 වසරේ දී ද පොලී වියදම ඉහළ මට්ටමක පැවතුණි. මෙය පසුගිය වසරේ වාර්තා වූ 52.3%ක අගයට සාපේක්ෂව සුළු වැඩිදියුණු වීමකි. 2024 වසරේ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි පැවති අඩු පොලී අනුපාතවලට සමගාමීව 2024 වසරේ දේශීය පොලී වියදම 1.8%කින් (රුපියල් බිලියන 43.1කින්) සුළු වශයෙන් අඩු වූ අතර, විදේශීය පොලී වියදම රුපියල් බිලියන 277.0කින් ඉහළ ගියේය. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණයෙන් ම පාහේ අවසන් කිරීම හේතුවෙන් වසරේ අවසාන භාගයේ දී විදේශීය පොලී ගෙවීම්වල වැඩිවීමක් වාර්තා විය. මේ අතර, ආර්ථික දුෂ්කරතා පවතින අවස්ථාවල දී ආර්ථිකයේ අවදානමට ලක්විය හැකි කොටස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, විශ්‍රාම වැටුප් ගෙවීම්, සමාජ ආරක්ෂණ ජාල සහ නොමිලේ ඖෂධ ලබාදීම සඳහා

1.24 රූප සටහන: රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2024




මූලාශ්‍රය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

1


1.8 විශේෂාංග රූප සටහන්
රාජ්‍ය ආදායම, වියදම සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

රාජ්‍ය ආදායම




මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

රාජ්‍ය වියදම




මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද.දේ.නි.යෙහි % ලෙස)



මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මධ්‍යම රජයේ නොපියවූ ණය*



මූලයන්: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

*2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 1.21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පාද සටහන බලන්න

අඛණ්ඩව පැවති අයවැය හිඟයන් ඇතුළුව දශක ගණනාවක් තිස්සේ පැවති රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතාවයන් 2022 දී තීරණාත්මක ස්ථානයකට ළඟා විය. රාජ්‍ය මූල්‍ය අංශයේ අඛණ්ඩව පැවති ගැටලුකාරී තත්ත්වයන්, නොගැලපෙන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික බිඳවැටීම හේතුවෙන් මෙම අර්බුදය ඇති විය. ඊට ප්‍රතිචාර වශයෙන්, 2022 මැද භාගයේ සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන (IMF-EFF) යටතේ, ආදායම් මත පාදක වූ රාජ්‍ය මූල්‍ය ගැළපීම් කෙරෙහි අවධානය යොමුකරමින් රජය රාජ්‍ය මූලය ඒකාග්‍රතා ක්‍රියාවලිය දියත් කළේය. මෙම ක්‍රියාමාර්ග, රාජ්‍ය ආදායම් ශක්තිමත් ලෙස වර්ධනය වීම, වියදම් පාලනය කර ගැනීම, සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වීම මගින් පෙන්නුම් කරන සැලකිය යුතු පරිවර්තනයකට තුඩු දී ඇත.

2024 වන විට, අඛණ්ඩව දෙවන වසරටත් ධනාත්මක ප්‍රාථමික ශේෂයක් රාජ්‍ය මූල්‍ය අංශය අත්කර ගත්තේය.

මෙම ප්‍රවණතාව, ප්‍රතිපත්තිමය වෙනස්කම් නොමැතිව පවත්වා ගැනීම ඉතා වැදගත් වන අතර, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සහ ණය අඩු කර ගැනීම සඳහා ගනු ලබන උත්සාහයන්ගෙන් සිදුවන ඕනෑම අනපේක්ෂිත වෙනස්වීමකින්, ඉතා අපහසුවෙන් උපයාගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය අඩපණ විය හැක.

දරන ලද වියදම් ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ දී රජය විසින් ලබා දෙන සහනාධාර සහ පැවරුම් 22.8% කින් (රුපියල් බිලියන 228.6කින්) ඉහළ ගියේය. 2024 වසරේ දී, අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා රුපියල් බිලියන 186.4ක් වැය කර ඇති අතර, එය සමස්ත සහනාධාර සහ පැවරුම් වියදමෙන් 15.1% ක් විය. තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 1,717,262ක් වෙත කරනු ලැබූ මුදල් පැවරුම් සහ වැඩිහිටි, ආබාධිත

ප්‍රජාව සහ වකුගඩු රෝගීන් සඳහා කරන ලද ගෙවීම් මෙයට ඇතුළත් විය. 2024 වසර තුළ දී ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හේතුවෙන්, 2024 වසරේ දී වැටුප් හා වේතන සඳහා වන වියදම පසුගිය වසරට සාපේක්ෂව 13.5%කින් (රුපියල් බිලියන 126.6කින්) ඉහළ ගියේය. 2024 වසරේ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 20.4% ක වාර්ෂික ඉහළ යෑමක් වාර්තා කළ ද, පසුගිය වසරට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් 15.0%කින් (රුපියල් බිලියන 137.0) පහළ ගියේය. 2024 වසරේ යම් අපේක්ෂිත විදේශ මූල්‍යනයන් නොලැබීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් අයවැය ප්‍රතිපාදනවලින් 61.6%කට පමණක් සීමා වූ අතර, එය අයවැය ඇස්තමේන්තුවෙහි ප්‍රාග්ධන වියදම් වන රුපියල් බිලියන 1,260ට වඩා සැලකිය යුතු ලෙස අඩු අගයකි. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම් 2.6%ක් පමණක් විය. රාජ්‍ය මූල්‍ය අංශයේ වියදම් කිරීමේ හැකියාව සීමාසහිත වීම හේතුවෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වියදම් කිරීම අඛණ්ඩව අඩු වීම රටේ ආර්ථික වර්ධන හැකියාවට සහ සමාජ සංවර්ධනයට දිගුකාලීන අහිතකර බලපෑම් ඇති කිරීමට හැකියාව පවතී.

1.5.3 අයවැය හිඟය මූල්‍යනය

විදේශීය මූල්‍යන මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීම සඳහා පවතින සීමා හේතුවෙන්, 2024 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි. සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනය ප්‍රධාන වශයෙන් රජයේ සුරුකුම්පත් මගින් සිදු කෙරිණි. ඒ අනුව, භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2023 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 2,058.6ක[24] සිට 2024 වසරේ දී රුපියල් බිලියන 266.1ක් දක්වා කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළේය. ඒ අතරම, භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2023 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 692.3ක[24] සිට 2024 වසරේ දී රුපියල් බිලියන 1,544.3ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ආසියානු සංවර්ධන බැංකුව, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව, ජපාන රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙතින් හිමි වූ අරමුදල් ඇතුළුව ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ණයහිමියන්ගෙන් ණය වශයෙන් ලැබුණු රුපියල් බිලියන 465.4ට (ආසන්න වශයෙන් ඒ. ජ. ඩො. බිලියන 1.5ට) අමතරව, අයවැයට සහාය ලබා දීම සඳහා ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ රුපියල් බිලියන 101.5ක් (ආසන්න වශයෙන් ඒ. ජ. ඩො. මිලියන 336ක්), විදේශ මූල්‍යනය සඳහා රජයට හිමි විය. මෙම අරමුදල් රජයේ ආර්ථික ස්ථායීකරණ වැඩසටහනට සහාය වීම, සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීමට සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා ලබා දී ඇත.

24 2023 සඳහා රජයේ සුරුකුම්පත්වලට අදාළ සංඛ්‍යාලේඛන තුළ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියට අදාළ ගනුදෙනුවල බලපෑම ඉවත් කර සලකා බලා ඇත.

1.5.4 මධ්‍යම රජයේ ණය[25]

ප්‍රධාන වශයෙන් නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ශක්තිමත් වර්ධනය සහ ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඉහළ යෑමෙන් විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණය මත ඇති වූ බලපෑම හේතුවෙන්, මධ්‍යම රජයේ නොපියවූ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2023 වසර අවසානයට පැවැති 104.7% සිට 2024 අවසානය වන විට 96.1%ක් දක්වා පහත වැටුණි. ඒ අනුව, දේශීය ණය සහ විදේශ ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2023 අවසානය වන විට, පිළිවෙළින්, 62.2%ක් සහ 42.5%ක් වූ අතර 2024 අවසානය වන විට, පිළිවෙළින්, 61.2%ක් සහ 34.9%ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, වසර තුළ දේශීය ණය වැඩිවීම විදේශ ණය පහත වැටීම සමඟ ගැළපුම් ගත වීම නිසා නාමික වශයෙන්, සමස්තයක් ලෙස මුළු ණය නොවෙනස්ව 2024 අවසානයට රුපියල් ට්‍රිලියන 28.7ක ප්‍රමාණයක පැවතිණි. විදේශ මූල්‍යනය සඳහා ඇති සීමිත ප්‍රවේශය මධ්‍යයේ රජය තම අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය වෙළඳපොළ මත යැපීම ඉහළ යාම මුළු දේශීය ණයෙහි නාමික වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. දේශපාලනික සහ රාජ්‍ය මූල්‍ය අංශවල අවිනිශ්චිතතාවන් පහව යාමත් සමඟ, දිගු කාලීන රාජ්‍ය සුරුකුම්පත් ආයෝජනය වෙත වෙළඳපොළේ ඇති ප්‍රවණතාවය ඉහළ ගියේය. 2024 වසර තුළ වෙළඳපොළ පොලී අනුපාත පහත වැටීමත් සමඟ දිගු කාලීන කල්පිරීම් සහිත උපකරණ හරහා ණය ගැනීමට රජය දැක්වූ කැමැත්තට මෙය අනුකූල විය. කල්පිරීම් දීර්ඝ වීම හේතුවෙන්, මුළු දේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස මැදි කාලීන සහ දිගු කාලීන දේශීය ණය කොටස 2023 දෙසැම්බර් අවසානයේ පැවති 74.2%ට සාපේක්ෂව 2024 වසර අවසන් වන විට 78.9%ක් දක්වා වැඩි විය. ප්‍රධාන විදේශ මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම 2023 අවසානයට සාපේක්ෂව 2024 අවසානය වන විට නාමික වශයෙන් විදේශ ණය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු මධ්‍යම රජයේ ණයෙහි නොපියවූ විදේශ ණය කොටස, 2023 වසර අවසානයේ පැවති 40.6% සිට 2024 වසර අවසානය වන විට 36.3% ක් දක්වා අඩු වෙමින් වඩාත් සමබර ණය සංයුතියකට මාරුවීමක් සහ බාහිර අවදානම අඩු කිරීමක් පිළිබිඹු කරයි.

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට සම්පූර්ණ කරමින්, ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන ලද නත්වයෙන් මිදීම හේතුවෙන්, 2024 වර්ෂය, ශ්‍රී ලංකාවට වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. වසර දෙකකට ආසන්න කාලයක් තුළ සිදු කළ සාකච්ඡා අවසන් කරමින්

25 බැංකුවල ඇති රජය සතු තැන්පතු ගැළපුම් කළ පසු ශේෂය රජයේ ණය සංඛ්‍යාලේඛන ලෙස ඉදිරිපත් කර ඇති අතර, මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අතුරු ප්‍රතිපත්තියට අනුව 2022 අප්‍රේල් 12 වන දිනෙන් පසු කල් ඉකුත් වූ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් මධ්‍යම රජයේ ණය ඇස්තමේන්තුවෙහි ඇතුළත් නොවේ. මෙම ණය සේවා ගෙවීම් අතුරු ප්‍රතිපත්තියට අනුව ප්‍රාග්ධනීකරණය කර ඇති බවට සැලකෙන බලපෑමට ලක් වූ ණය සඳහා කල් ඉකුත් වූ පොලී ගෙවීම්වලින් සමන්විත වේ.

1

1.21 සංඛ්‍යා සටහන: මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී) (අ) (ආ)

ශීර්ෂය	2023	2024 (අෑ)
රුපියල් බිලියන		
දේශීය ණය (අෘ)	**17,051.9**	**18,309.7**
කල්පිරීමේ කාලය අනුව		
කෙටි කාලීන (ඉ)	3,616.2	**3,220.1**
මැදි හා දිගු කාලීන (ඊ)(උ)	13,435.6	**15,089.6**
ආයතන අනුව		
බැංකු	9,102.8	**9,411.2**
බැංකු නොවන	7,506.3	**8,158.5**
ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන් කිරීම් (උෘ)(ඒ)	442.7	**739.9**
විදේශීය ණය (ඒ)(ඔ)(ඕ)	**11,644.1**	**10,429.0**
බහුපාර්ශ්වීය	3,817.0	**3,773.5**
ද්විපාර්ශ්වීය සහ වාණිජ ණය	7,827.1	**6,655.6**
ව්‍යවහාර මුදල් අනුව		
වි.ඇ.හි.	1,737.1	**1,651.1**
ඒ.ජ. ඩොලර්	7,943.9	**7,133.4**
ජපාන යෙන්	819.4	**678.6**
යුරෝ	396.6	**334.2**
වෙනත්	747.1	**631.7**
මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය	**28,695.9**	**28,738.7**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ක)		
මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය	**104.7**	**96.1**
දේශීය ණය	62.2	**61.2**
විදේශීය ණය	42.5	**34.9**

මූලයන්: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (මුදල් අමාත්‍යාංශය) යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමඟ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන මඟින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනය, ණය සංඛ්‍යාලේඛන සඳහා නිල මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ. දත්ත අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබෙන දත්ත මත පදනම්ව මෙම ණය දත්ත සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇත.

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, හේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, ණය සංඛ්‍යාලේඛන ශුද්ධ පදනම මත (හැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.

(ආ) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණ පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.

(ඇ) තාවකාලික

(අෑ) 2023 සිට දේශීය ණය සංඛ්‍යාලේඛන සැකසීමේ ක්‍රමය වෙනස් කර ඇති අතර, එය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් සනාථ කරන ලද දත්ත මත පදනම්ව සිදු කෙරේ.

(ඉ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බිල්පත් වටිනාකම් ඇතුළත් නොවේ.

(ඊ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම් ඇතුළත් නොවේ.

(උ) 2023 වසරේ සිට මධ්‍යම රජයේ නොපියවූ ණය යටතට අවශෝෂණය කරන ලද ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවැති භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබාගත් නොපියවූ ණය ඇතුළත් වන අතර, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2024 කාර්තුව සඳහා වන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනය අනුව 2024 වසර අවසානයේ දත්ත තුළ සංවර්ධන ව්‍යාපෘති ණය ලෙස වර්ගීකරණය කර ඇති රුපියල් මිලියන 16,267ක නොපියවූ ණය ශේෂය ද ඇතුළත් වේ.

(උෘ) පරම අයිතිකරු සොයා ගැනීමට අපහසු ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ කළ ආයෝජනයන් සඳහා වෙන් කරන ලද සුරැකුම්පත් ඇතුළත් වේ.

(ඒ) විවට වෙළඳ කටයුතු යටතේ සිදු කරන ලද ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලට අදාළ ආයෝජන, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් යටතේ වෙන් කර ඇත.

(ඒෘ) මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් පවත්වාගෙන යන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය වාර්තාකරණ හා කළමනාකරණ පද්ධතියෙන් පිළිවෙළින් 2024 වසරේ පෙබරවාරි 26 සහ 2025 වසරේ පෙබරවාරි 27 දින ලබා ගත් දත්ත මත පදනම්ව 2023 සහ 2024 වසරවලට අදාළ විදේශීය ණය දත්ත සහ විදේශීය ණය වර්ගීකරණය සකස් කර ඇත.

(ඔ) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය කිහිපයකට අදාළ නොපියවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.

(ඕ) 2024 වසරට අදාළවන දත්ත විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම පිළිබිඹු කරයි.

(ක) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු 18 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) භාවිත කර ඇති අතර, 2023 වසරට අදාළ දත්ත 2025 මාර්තු 18 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) මත පදනම්ව සංශෝධනය කර ඇත.

ශ්‍රී ලංකාව නිල ණයහිමියන්ගේ කමිටුව (Official Creditor Committee) සමඟ අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කිරීම සහ චීනයේ අපනයන-ආනයන බැංකුව සමඟ ණය සඳහා කටයුතු කරන ක්‍රියාමාර්ග පිළිබඳ ගිවිසුමක් අවසන් කිරීමත් සමඟ මෙම ක්‍රියාවලියේ ප්‍රධාන සන්ධිස්ථානයක් 2024 වසරේ ජූනි මාසයේ දී සටහන් විය. එතැන් සිට, ණය සේවාකරණ ගෙවීම් ආරම්භ කිරීම සඳහා රටවල් අනුව ගිවිසුම් සම්පූර්ණ කිරීම සඳහා ද්විපාර්ශ්වික පදනමක් මත සාකච්ඡා පවත්වන ලදී. නිල ණයහිමියන් සමඟ ඇති කරගත් ගිවිසුමට කල්පිරීම දීර්ඝ කිරීම්, 2028 වසර දක්වා ප්‍රාග්ධන සහන කාලයන්, අඩු කළ පොලී අනුපාත සහ 2043 වසරේ දී අවසන් වන ආපසු ගෙවීමේ පහසුකම් සහිත ණය ආපසු ගෙවීම ක්‍රමයෙන් වැඩිවන ආකාරයේ ව්‍යුහයක් සහිත ණය ගෙවීමේ සහන පියවර ඇතුළත් වේ. 2024 දෙසැම්බර් මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හුවමාරුව සාර්ථකව නිම කිරීම සහ චීන සංවර්ධන බැංකුවේ වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම සමඟ බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ තවදුරටත් ප්‍රගතියක් ඇති විය. ඒ. ජ. ඩො. බිලියන 3.0ක මූලික ණය තොග අඩු කිරීමක් ඇතුළුව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ශ්‍රී ලංකාවට සැලකිය යුතු මූල්‍ය සහනයක්[26] ලැබුණු අතර, මෙම මූලික ණය තොග අඩු කිරීම, ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරවල[27] කොන්දේසි අනුව, ජා.මූ. අරමුදල මඟින් නිර්ණය කර ඇති මූලික මට්ටමට සාපේක්ෂව ආර්ථික පසුබෑමක දී ඒ. ජ. ඩො. බිලියන 4.3ක් දක්වා ඉහළ යා හැකි අතර ආර්ථික අධි ක්‍රියාකාරීත්වයක දී ඒ. ජ. ඩො. බිලියන 1.8ක් දක්වා අඩු විය හැකිය. ඊට අමතරව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ශ්‍රී ලංකාවට, සිවි අවුරුදු ජා.මූ. අරමුදලේ වැඩසටහන් කාලය තුළ ණය සේවාකරණ ගෙවීම් ඒ. ජ. ඩො. බිලියන 9.6කින් අඩු කිරීමටත්, ශ්‍රී ලංකාවේ බැඳුම්කරවල කූපන් අනුපාතය 4.3%ක් දක්වා 33%කින් අඩු කිරීමටත්, සාමාන්‍ය කල්පිරීමේ කාලය ආසන්න වශයෙන් වසර හයකින් දීර්ඝ කිරීමටත් හේතු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ළඟා කර ගැනීමෙහිලා ශ්‍රී ලංකාවේ ප්‍රගතිය සැලකිල්ලට ගැනීමෙන් පසුව, ප්‍රමුඛ ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2024 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවන ලදී.

---

26 2025 ජනවාරි 02 දිනැති, මුදල් අමාත්‍යාංශයෙහි ලේකම් විසින් ඉදිරිපත් කරන ලද "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම: මූල්‍ය හා ණය තිරසාරභාවය සහතික කිරීම සඳහා අවශ්‍යතාවය, සමස්ත ප්‍රතිඵලය සහ අනාගත ප්‍රතිපත්ති මඟ පෙන්වීම" (Sri Lanka's Public Debt Restructuring : The Need, Overall Outcome and Future Policy Direction to Ensure Fiscal and Debt Sustainability) යන ඉදිරිපත් කිරීම අනුව.

27 ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරයක් යනු නිකුත් කරන්නාගේ ආර්ථික ක්‍රියාකාරිත්වය සමඟ බැඳී ඇති ණය උපකරණයකි. මේ පිළිබඳ වැඩි විස්තර 2024 වසරේ ඔක්තෝබර් 4 දිනැති "ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම - නිතර අසනු ලබන ප්‍රශ්න" (International Sovereign Bonds Restructuring - Frequently Asked Questions) පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ මාධ්‍ය නිවේදනයෙන් ලබා ගත හැකිය.

ඒ අනුව, ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම RD සිට CCC+ දක්වා ඉහළ නැංවූ අතර, මූඩීස් ශ්‍රේණිගත කිරීමේ ආයතනය ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම Caa1 සිට Ca දක්වා ඉහළ නැංවීය. මෙම ධනාත්මක වර්ධනයන් සහ ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන (IMF-EFF) යටතේ සිදු කෙරෙන ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා රජයේ අඛණ්ඩ කැපවීමත් සමඟ, ශ්‍රී ලංකාව එම වැඩසටහනේ දක්වා ඇති ණය තිරසාරභාවය පිළිබඳ ඉලක්ක කරා ළඟා වෙමින් සිටී.

1

2 පරිච්ඡේදය

මූල්‍ය පද්ධතියේ තත්ත්වයන්

සාරාංශය

2024 වසර තුළ දී මූල්‍ය අංශයේ සමස්ත කාර්යසාධනය අඛණ්ඩව වැඩිදියුණු වූ අතර, ඇතැම් අභියෝග නවදුරටත් දක්නට ලැබුණි. බැංකු අංශය විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුකූලත්වය දක්වන ලද අතර, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක නියාමන සීමාවන්ට ඉහළින් රඳවා ගනිමින් ස්ථායීතාව පවත්වා ගන්නා ලදී. මෙම වර්ධනයන් මධ්‍යයේ, ආයෝජන සහ ණය හා ලැබිය යුතු දෑ වල ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී බැංකු අංශයේ මුළු වත්කම් වර්ධනය විය. බැංකු අංශයේ වගකීම් පිළිබඳව සලකා බැලීමේ දී, එම අංශය සඳහා විශාලනම අරමුදල් ප්‍රභවය වන තැන්පතු, 2024 වසර තුළ දී අඛණ්ඩ ප්‍රසාරණයක් වාර්තා කළේය. අක්‍රීය ණය අනුපාතය[1] අනුව, බැංකු අංශයේ ණයවල ගුණාත්මකභාවය මෙම වසර තුළ දී වර්ධනය වුව ද, එම අනුපාතය නවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, ශුද්ධ පොලී ආදායම වැඩි වීම සහ ජාත්‍යන්තර ස්වෛරීන්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන්, මෙම වසර තුළ බැංකු අංශයේ ලාභදායීතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. මුදල් සමාගම් අංශය ද, සමාලෝචනයට භාජනය වන කාලපරිච්ඡේදය තුළ දී, ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක සමඟ ශක්තිමත්ව පැවතුණි. 2024 වසර තුළ දී, ප්‍රධාන වශයෙන් මුදල් සමාගම් අංශයේ ණය සහ අත්තිකාරම් කළඹෙහි සිදු වූ සැලකිය යුතු ප්‍රසාරණය හේතුවෙන් එම අංශයේ වත්කම් පදනම වර්ධනය වූ අතර, රජයේ සුරැකුම්පත්වල ආයෝජන සැලකිය යුතු ලෙස පහත වැටුණි. නවද, 2024 වසර තුළ දී ඉහළ ගිය ලාභදායීතාව මධ්‍යයේ මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය ද සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. මේ අතර, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණය යන උප අංශ දෙකෙහිම දළ ලියාභළ වාරිකවල වැඩි වීමක් 2024 වසර තුළ දී වාර්තා විය. මූල්‍ය වෙළඳපොළ පිළිබඳ සැලකීමේ දී, කොටස් වෙළඳපොළෙහි ද්විතීයික වෙළඳපොළ තුළ ශුද්ධ විදේශීය ගලායෑමක් වාර්තා වුව ද, දර්ශක සහ පිරිවැටුම යන දෙආකාරයෙන්ම එහි කාර්යසාධනයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. මේ අතර, 2024 වසර තුළ දී බැංකු අංශයේ ද්‍රවශීලතාවයෙහි අසමමිතික ව්‍යාප්තියක් නිරීක්ෂණය වුව ද, දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් වර්ධනය විය. වරින් වර ඉහළ ගිය ද, රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ අතර, ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික ද වසර තුළ දී පහත වැටුණි. රටේ මූල්‍ය යටිතල පහසුකම් නවදුරටත් සුමටව ක්‍රියාත්මක වෙමින් මූල්‍ය අංශයේ ස්ථාවරත්වයට පහසුකම් සලසන ලදී. ගෙවීම් යටිතල පහසුකම් සලකා බලන කල, ඩිජිටල් ගෙවීම් ක්‍රම අනුගමනය කිරීම අඛණ්ඩව ඉහළ ගිය අතර, ජාතික ගෙවීම් යටිතල පහසුකම්, ජාත්‍යන්තර ගෙවීම් ජාල සමඟ ඒකාබද්ධ කිරීම ද 2024 වසර තුළ දී අඛණ්ඩව සිදු විය. නවද, මහ බැංකුව විසින් මූල්‍ය අංශයේ ස්ථාවරත්වයට පහසුකම් සැලසීම ඉලක්ක කරගනිමින් අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම, මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය වැඩිදියුණු කිරීම මෙන්ම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම, සහ තැන්පතු රක්ෂණ හා මූල්‍ය ආයතන නිරාකරණය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

1 තෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය මගින් පිළිබිඹු වන පරිදි

2

2.1 සංඛ්‍යා සටහන: මූල්‍ය අංශයේ සමස්ත වත්කම් (අ)

	2023 (ආ)		2024 (ඇ)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)
බැංකු අංශය	**24,599.9**	**73.9**	**26,051.8**	**72.7**
මහ බැංකුව	4,205.4	12.6	**3,876.1**	**10.8**
බලපත්‍රලාභී වාණිජ බැංකු	18,110.1	54.4	**19,815.0**	**55.3**
බලපත්‍රලාභී විශේෂිත බැංකු	2,284.4	6.9	**2,360.7**	**6.6**
තැන්පතු බාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	**1,930.2**	**5.8**	**2,195.1**	**6.1**
මුදල් සමාගම්	1,695.5	5.1	**1,930.7**	**5.4**
සමූපකාර ග්‍රාමීය බැංකු (අෑ)	222.1	0.7	**248.3**	**0.7**
බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්	11.7	...	**14.8**	...
සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති	0.9	...	**1.3**	...
විශේෂිත මූල්‍ය ආයතන	**717.1**	**2.2**	**908.7**	**2.5**
විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්	1.2	...	**1.3**	...
ප්‍රාථමික අලෙවිකරුවන්	270.9	0.8	**297.2**	**0.8**
කොටස් තැරැව්කරුවන්	24.3	0.1	**44.9**	**0.1**
ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම්	411.6	1.2	**554.2**	**1.5**
වෙළඳපොළ අතරමැදියන් (ඉ)	9.1	...	**11.1**	...
ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතන	**6,028.3**	**18.1**	**6,678.7**	**18.6**
රක්ෂණ සමාගම්	1,133.1	3.4	**1,223.0**	**3.4**
සේවක අර්ථසාධක අරමුදල	3,927.7	11.8	**4,420.2**	**12.3**
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	524.5	1.6	**591.3**	**1.7**
අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල	347.2	1.0	**339.2**	**0.9**
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	95.8	0.3	**105.0**	**0.3**
එකතුව	**33,275.5**	**100.0**	**35,834.3**	**100.0**

(අ) දත්ත නොමැතිවීම හේතුවෙන් ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම් මෙම සංඛ්‍යා සටහනට ඇතුළත් කර නොමැත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(අෑ) දත්ත නොමැතිකම හේතුවෙන් 2024 වසර අවසානයේ සමූපකාර ග්‍රාමීය බැංකුවල වත්කම් පදනම ලෙස එම වසරේ තුන්වන කාර්තුවේ වත්කම් පදනම යොදාගෙන ඇත.
(ඉ) වෙළඳපොළ අතරමැදියන් ලෙස ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී බැංකු, මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් හැර.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
කම්කරු දෙපාර්තමේන්තුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
ණය තොරතුරු සංගමය
ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

2.1 බැංකු අංශය

ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය අවම නියාමන මට්ටම්වලට වඩා ඉහළින් පවත්වා ගන්නා අතරතුර, විචක්ෂණශීලී අවශ්‍යතාවලට අනුකූල වෙමින් බැංකු අංශය තම ස්ථාවරත්වය අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. බැංකු අංශය, 2024 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් 61.9%කට හිමිකම් කියමින් මූල්‍ය අංශයේ ප්‍රමුඛත්වය ගන්නා ලදී. 2024 වසර අවසන් වන විට, බැංකු අංශය බලපත්‍රලාභී බැංකු 30කින්, එනම් විදේශ බැංකු ශාඛා 11ක් ද ඇතුළුව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු හයකින් සමන්විත විය. බැංකු ජාලය වර්ධනය කිරීම සහ බැංකු සේවා වැඩිදියුණු කිරීම මගින් බැංකු අංශය මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම අඛණ්ඩව කරගෙන යන ලදී. 2024 වසර තුළ දී, බැංකු ශාඛා 13ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 368ක් ස්ථාපිත කරන ලද අතර, බැංකු ශාඛා 10ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 24ක් වසා දමන ලදී. ඒ අනුව, 2024 වසර අවසානය වන විට සමස්ත බැංකු ශාඛා/ඒකක සංඛ්‍යාව සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව පිළිවෙළින් 7,613ක් සහ 7,286ක් දක්වා ඉහළ ගොස් ඇත.

2024 වසර තුළ බැංකු අංශය එහි වත්කම් පදනම අනුව අඛණ්ඩව ප්‍රසාරණය වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ආයෝජන වැඩි වීම හේතු විය. මෙම අංශයේ මුළු වත්කම් පදනම 2024 වසර තුළ දී රුපියල් බිලියන 1,781.3කින් වැඩි වී වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 22.2ක් ලෙස වාර්තා වූ අතර, 2023 වසර අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 5.0%ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ 8.7%ක වර්ධනයක් වාර්තා කරන ලදී. වත්කම් ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් දායක වූ ආයෝජන, 2024 වසර තුළ රුපියල් බිලියන 1,783.8කින් වැඩි වූ අතර, 2023 වසර අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 23.1%ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී 24.4%ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2023 වසරේ ජූනි මාසයේ සිට වරින් වර ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාත අඩුකිරීම් හරහා මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ වෙළඳපොළ ද්‍රවශීලතාවය සැලකිය යුතු ලෙස ඉහළ යෑම, ණය වර්ධනයේ පහත වැටීමේ ප්‍රවණතාවය ආපසු හැරවීමට සහ වත්කම්වල ගුණාත්මකභාවයේ පිරිහීම පාලනය කිරීමට හේතු විය. ඒ අනුව, ණය සහ ලැබිය යුතු දෑ, 2023 අවසානයේ පැවති වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2.6%ක සංකෝචනයේ සිට, 2024 අවසානයේ දී 4.1%ක වර්ධනයක් දක්වා වැඩි විය.

2024 වසර අවසානයේ දී බැංකු අංශයේ සමස්ත වගකීම්වලින් හා හිමිකම්වලින් 81.0%ක් නියෝජනය කරන ලද නැන්පතු, බැංකු අංශයේ අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, හිමිකම් සහ ණය ගැනීම් සමස්ත

2.2 සංඛ්‍යා සටහන: බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය

වර්ගීකරණය	2023 අවසානයට (අ)	2024 අවසානයට (ආ)
බලපත්‍රලාභී වාණිජ බැංකු		
i.මූළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව	**24**	**24**
දේශීය බැංකු	13	**13**
විදේශීය බැංකු	11	**11**
ii.මූළු බලපත්‍රලාභී වාණිජ බැංකු ඒකක සංඛ්‍යාව	**6,816**	**6,907**
ශාඛා (ඇ)	2,934	**2,936**
දේශීය බැංකු	2,889	**2,895**
විදේශීය බැංකු	45	**41**
ශිෂ්‍ය ඉතුරුම් ඒකක	3,882	**3,971**
iii.ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	**6,439**	**6,782**
බලපත්‍රලාභී විශේෂිත බැංකු		
i.මූළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව	**6**	**6**
ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු	1	**1**
නිවාස ණය ආයතන	2	**2**
අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	3	**3**
ii.මූළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ඒකක සංඛ්‍යාව	**705**	**706**
ශාඛා (ඇ)	705	**706**
ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු	267	**268**
නිවාස ණය ආයතන	64	**64**
අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	374	**374**
iii.ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	**503**	**504**
මූළු බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සංඛ්‍යාව	**7,521**	**7,613**
මූළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව	**6,942**	**7,286**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර සියලුම බැංකු ඒකක

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වගකීම්වලින් හා හිමිකම්වලින් පිළිවෙළින් 9.2%ක් සහ 5.8%ක් නියෝජනය කරන ලදී. 2024 වසර තුළ සමස්ත තැන්පතු රුපියල් බිලියන 1,338.9කින් වර්ධනය වූ අතර, කාලීන තැන්පතු වැඩි වීම එයින් 82.9%කට දායක විය. 2024 වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින්, කාලීන තැන්පතු 67.6%ක් වූ අතර, ඉතුරුම් තැන්පතු සහ ඉල්ලුම් තැන්පතු පිළිවෙළින් 25.1%ක් සහ 6.2%ක් විය. ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය, 2023 වසරේ සිට 2024 වසර දක්වා 32.3%ක සිට 31.2%ක් දක්වා සුළු වශයෙන් පහළ යන ලදී. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2023 වසරේ දී 25.3%ක සංකෝචනයක් වාර්තා කරමින්

2.3 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

අයිතමය	2023 (අ)		2024 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2023	2024
වත්කම්						
ණය සහ ලැබිය යුතු දෑ	11,020.8	54.0	**11,473.7**	**51.7**	-2.6	**4.1**
ආයෝජන	7,299.9	35.8	**9,083.7**	**41.0**	23.1	**24.4**
වෙනත් (ඇ)	2,073.7	10.2	**1,618.2**	**7.3**	-4.5	**-22.0**
වගකීම්						
තැන්පතු	16,630.5	81.5	**17,969.4**	**81.0**	8.7	**8.1**
ණය ගැනුම්	1,397.4	6.9	**1,280.0**	**5.8**	-25.3	**-8.4**
ප්‍රාග්ධන අරමුදල්	1,765.5	8.7	**2,043.2**	**9.2**	10.5	**15.7**
වෙනත්	601.0	2.9	**883.1**	**4.0**	-7.3	**46.9**
මූළු වත්කම්/වගකීම්	20,394.4	100.0	22,175.7	100.0	5.0	8.7

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2.4 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ තැන්පතු සංයුතිය

අයිතමය	2023 (අ)		2024 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2023	2024
ඉල්ලුම් තැන්පතු	1,082.5	6.5	**1,109.6**	**6.2**	1.7	**2.5**
ඉතුරුම් තැන්පතු	4,292.5	25.8	**4,502.6**	**25.1**	15.8	**4.9**
ස්ථාවර තැන්පතු	11,045.8	66.4	**12,155.9**	**67.6**	6.3	**10.1**
වෙනත් තැන්පතු	209.7	1.3	**201.2**	**1.1**	58.1	**-4.1**
මූළු තැන්පතු	16,630.5	100.0	17,969.4	100.0	8.7	8.1


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් බිලියන 474.2කින් පහත වැටීමට සාපේක්ෂව, 2024 වසරේ දී 8.4%ක සංකෝචනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 117.4කින් පහළ යන ලදී. මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් 2024 වසරේ දී විදේශ මුදල් ණය ගැනීම් ඒ. ජ. ඩොලර් මිලියන 281.8කින් අඩු වෙමින් 27.0%ක සංකෝචනයක් වාර්තා කිරීම අතරතුර, රුපියල් ණය ගැනීම් ද 0.2%කින් සංකෝචනය වී, එනම් රුපියල් බිලියන 2.3කින් පහත වැටීම හේතු විය.

බැංකු අංශයේ ශේෂ පත්‍රයෙන් බාහිර නිරාවරණ, 2023 වසරේ දී 10.7%ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 496.0කින් වැඩි වීමට සාපේක්ෂව, 2024 වසරේ දී 3.8%ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 196.6 කින් ඉහළ යන ලදී. 2024 වසර තුළ දී භාවිත නොකළ ණය සීමා, ශේෂ පත්‍රයෙන් බාහිර විදේශ විනිමය විකුණුම්, ප්‍රතිග්‍රහණ, ලේඛිත ණය සහ ශේෂ පත්‍රයෙන් බාහිර විදේශ විනිමය මිලදී ගැනීම් පිළිවෙළින් රුපියල් බිලියන 107.0, රුපියල් බිලියන 83.9, රුපියල් බිලියන 43.2, රුපියල් බිලියන 30.5 සහ රුපියල් බිලියන 8.0ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ඇපකර හා බැඳුම්කර රුපියල් බිලියන 84.3ක පහළ යෑමක් වාර්තා කරන ලදී.

2.1 රූප සටහන: බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම (2024 අවසානයට)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2

නෙවන අදියර යටතේ පවතින ණය අනුපාතය[2] මඟින් නිරූපණය කෙරෙන බැංකු අංශයේ අක්‍රීය ණය අනුපාතය, 2023 වසර අවසානයට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී අඩු වීමක් පෙන්නුම් කළ නමුත් තවදුරටත් ඉහළ මට්ටමක පැවතුණි. වසර තුළ ණය ගුණාත්මකභාවයේ වර්ධනයක් පෙන්නුම් කරමින්, අක්‍රීය ණය අනුපාතය, 2023 වසර අවසානයේ පැවති 12.8%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී 12.3% දක්වා සුළු වශයෙන් පහළ ගියේය. ණය ගුණාත්මකභාවය වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 අවසානයේ සමස්ත ණය ප්‍රමාණයේ වර්ධනය සහ අක්‍රීය ණය ප්‍රමාණයේ සුළු සංකෝචනයයි. මෙයින් පෙන්නුම් කරන්නේ වැඩිදියුණු වූ සාර්ව ආර්ථික තත්ත්වයන් ණය සැපයුම සහ ආපසු ගෙවීම් කෙරෙහි ඇති කරන ධනාත්මක බලපෑමයි. තවද, අක්‍රීය ණය සඳහා වෙන්කිරීම්වල[2] 10.1%ක වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සිදු වූ වර්ධනය මඟින්, 2023 වසර අවසානයේ 49.0%ක් වූ අක්‍රීය ණය සඳහා වන වෙන්කිරීම් ආවරණ අනුපාතය, 2024 වසර අවසානයේ දී 54.1% දක්වා වැඩිදියුණු විය.

ද්‍රවශීලතා ආවරණ අනුපාත (Liquidity Coverage Ratios) සහ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (Net Stable Funding Ratio) මඟින් පෙන්නුම් කෙරෙන පරිදි බැංකු අංශයේ ද්‍රවශීලතාවය 2024 වසරේ දී වර්ධනය විය. රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2023 වසර අවසානයේ පැවති 340.9% සිට 2024 වසර අවසානයේ දී 349.9% දක්වා ඉහළ ගිය අතර, එමඟින් බැංකුවලට ඔවුන්ගේ රුපියල් ද්‍රවශීලතා අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් තරම් රුපියල්වලින් නාමනය කරන ලද උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (High Quality Liquid Assets) තිබූ බව පිළිබිඹු විය. රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය වැඩිදියුණු වීමට රුපියල්වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත්වල හිමිකාරිත්වය වැඩි වීම හේතුවෙන් සිදු වූ උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම්වල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් උපකාරී විය. මේ අතර, බැංකු අංශයේ සමස්ත ද්‍රවශීලතාවයේ දර්ශකයක් වන සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය ද, 2023 වසර අවසානයේ පැවති 288.4%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ 313.8% දක්වා වැඩිදියුණු විය. මීට අමතරව, බැංකුවලට ප්‍රමාණවත් ලෙස ස්ථායී අරමුදල් මූලාශ්‍ර පවත්වා ගැනීමට නියම කරන ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය, 2024 වසර අවසානයේ දී අවම නියාමන අවශ්‍යතාවය වන 100.0%ට වඩා ඉහළ අගයක් වන 164.8%ක පැවතුණි.

ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී ආදායම වැඩි වීම සහ ජාත්‍යන්තර ස්වෛරීන්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවෙන් පෙර දී කර තිබූ ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන් වසර තුළ දී ලාභදායීතාව සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. 2024 වසර තුළ බැංකු

2.5 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ ලාභදායීත්වය


අයිතමය	2023 (අ)		2024 (ආ)	
	වටිනාකම (රුපියල් බිලියන)	වත්කම්වල සමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස (%)	වටිනාකම (රුපියල් බිලියන)	වත්කම්වල සමාන්‍යයේ ප්‍රතිශතයක් ලෙස (%)
ශුද්ධ පොලී ආදායම	**714.6**	**3.7**	**916.0**	**4.3**
පොලී ආදායම	2,610.2	13.4	2,252.0	10.5
පොලී වියදම	1,895.6	9.7	1,336.0	6.2
පොලී නොවන ආදායම	**207.4**	**1.1**	**183.8**	**0.9**
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	132.2	0.7	147.0	0.7
පොලී නොවන වියදම	**373.4**	**1.9**	**447.3**	**2.1**
සේවක පිරිවැය	189.9	1.0	244.4	1.1
ණය සහ වෙනත් අලාභ සඳහා වෙන්කිරීම්	171.6	0.9	-66.5	-0.3
බදු පෙර ලාභය (එහතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැඟීමේ බදු, මූල්‍ය සේවා මත අහෙතුත් බදු සහ සංස්ථාපිත බදු අඩු කිරීමට පෙර)	**377.0**	**1.9**	**719.0**	**3.4**
එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැඟීමේ බදු සහ මූල්‍ය සේවා මත අහෙතුත් බදු	85.9	0.4	155.9	0.7
සංස්ථාපිත බදු	98.5	0.5	253.4	1.2
බදු පසු ලාභය	**192.6**	**1.0**	**309.7**	**1.4**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


2 භාවිත නොකළ ණය සීමා ඇතුළුව

2.2 රූප සටහන: බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2.3 රූප සටහන: බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2

විශේෂ සටහන 2
බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මෑතකාලීනව සිදු කරන ලද ප්‍රතිසංස්කරණ

1. පසුබිම

බැංකු, මූල්‍ය පද්ධතියේ අත්‍යාවශ්‍යම අංගයක් වන අතර රටේ ආර්ථික වර්ධනය හා සංවර්ධනය පවත්වා ගැනීම සඳහා අතරමැදියෙකු ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2024 වසර අග වන විට ශ්‍රී ලංකාවේ බැංකු අංශය රුපියල් ට්‍රිලියන 22 කට වැඩි වත්කම් සහිතව බලපත්‍රලාභී බැංකු 30 කින් සමන්විත විය. මෑතකාලීන අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඇති වූ අභියෝගවලට ප්‍රතිචාර දැක්වීමක් ලෙස සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා වන පියවරයන්ට අමතරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා වූ මෙම උපායමාර්ගවල අරමුණ වූයේ ඇති විය හැකි අර්බුදයක් වැළැක්වීම සහ සමස්ත ආර්ථිකය වෙත බලපාන අවදානම් සහ සම්බන්ධිත බලපෑම් අවම කිරීමයි. ඒ අනුව, අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්ගෙන් නිර්මාණය වූ අභියෝග මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාවේ බැංකු අංශය මනා ඔරොත්තු දීමේ හැකියාවකින් යුක්ත විය.

2. 2022 සිට මේ දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග

අර්බුද වලට පෙර සූදානම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

අවදානම් කළමනාකරණය සඳහා වැදගත් පෙර සූදානමක් ලෙස, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට අහිතකර බලපෑම් ඇති වීම වැළැක්වීම සඳහා, තාවකාලික ද්‍රවශීලතා අර්බුදයක් ඇති බැංකු වලට හදිසි ණය සහ අත්තිකාරම් ලබා දීම පිළිබඳ පවත්නා රාමුව ශක්තිමත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්බුද කළමනාකරණ රාමුව යටතේ කඩිනම් ප්‍රමුඛතාවයක් ලෙස මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කරමින් බලපත්‍රලාභී බැංකුවල නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම හඳුනාගන්නා ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රධාන වශයෙන් බැංකු සඳහා නිරාකරණ ක්‍රියාමාර්ග සහ තැන්පත්කරුවන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කරන ලදී. තවද, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාල සඳහා වන පියවරයන් ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය ස්ථායිතා අරමුදල ස්ථාපිත කිරීමට සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ආයතනික විධිවිධාන සහ මූල්‍ය ධාරිතාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී. මීට අමතරව, අර්බුදවලට පෙර සූදානම කෙරෙහි අවධානය යොමු කිරීම සහ මූල්‍ය අර්බුදවල බලපෑම් අවම කිරීම යනාදිය සඳහා මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය අතර ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ අරමුණින් යුතුව බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවන ලදී.



2

බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම

ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා රෙගුලාසි නිකුත් කිරීම සහ අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කිරීම ඇතුළු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ නෛතික රාමුව ශක්තිමත් කිරීමේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් බැංකු අංශය ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී සිදුකරන ලද වැදගත් මූලපිරීමක් ලෙස 2024 ජූනි 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම දැක්විය හැක. නව බැංකු පනත මගින් බලපත්‍ර අවශ්‍යතා, අවසාන අර්ථලාභී හිමිකාරිත්වය පිළිබඳ තොරතුරු ඇතුළුව කොටස් හිමිකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක, ආයතනික යහපාලන අවශ්‍යතා, බැංකු හිමිකාරිත්වය, අත්පත් කර ගැනීම්, එක් කිරීම සහ ඒකාබද්ධ කිරීම්, සමානුපාතිකත්වය, විශාල ගනුදෙනු නිරාවරණයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, අක්වෙරළ බැංකු ව්‍යාපාර, විදේශීය බැංකු පාලිත සමාගම් බවට පත් කිරීම, ගිණුම් සහ විගණනය පිළිබඳ අවශ්‍යතා යනාදිය සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කර ඇත.

නියාමන රාමුව ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු වෙත නව රෙගුලාසි/ මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කරන ලදී. ඒ අනුව, විශාල ආයතනික ණය ගනුදෙනුකරුවන්ට මෙන්ම රාජ්‍ය ව්‍යවසායන්ට ණය ලබා දීම මගින් බැංකු අංශයට සිදුවිය හැකි ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම් පිළිබඳ විධානයන් නිකුත් කරන ලදී. ගෝලීය ප්‍රශස්ත භාවිතයන්ට අනුකූලව, දැඩි විචක්ෂණශීලී සීමාවන් සහ ණය ගනුදෙනුකරුවන්ගේ අන්තර් සම්බන්ධය තීරණය කිරීම සඳහා ශක්තිමත් නිර්ණායක මෙම සංශෝධිත නියාමන වලට ඇතුළත් වේ. මෙම පසුබිම තුළ, විශාල ආයතන සහ රාජ්‍ය ව්‍යවසායන් ඔවුන්ගේ අරමුදල් ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සහ ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කළ යුතු වේ.

තවද, බලපත්‍රලාභී බැංකු සඳහා ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව තීරණය කරමින් හා ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින් බැංකු පනත් නිර්ණායක් නිකුත් කරන ලදී. ඊට අමතරව, බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර පිළිබඳ වන බැංකු පනත් විධානය සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නම් කිරීමේ බැංකු (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර කටයුතු) නියෝගය යනාදී රෙගුලාසි කිහිපයක් නිකුත් කරන ලදී. තවද, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂකවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යථායෝග්‍යතාවය ඇගයීම පිළිබඳ බැංකු පනත් නිර්ණය සහ විධානය ද නිකුත් කරන ලදී. තවදුරටත්, බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් නිශ්චිතව දක්වමින් එවැනි සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සම්බන්ධයෙන් අනුමත සුරැකුම් සහ අදාළ සීමාවන් නිශ්චය කරමින් රෙගුලාසි නිකුත් කරන ලදී.

වත්කම් වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනය සහ බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීමේ උපාය මාර්ගය සකස් කිරීම

බැංකු අංශය විසින් අඛණ්ඩව මුහුණ දෙන සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ, ශක්තිමත් හා ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද බලපත්‍රලාභී බැංකු පවත්වා ගැනීම අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශාල බැංකු නවයක් සඳහා වත්කම් වල ගුණාත්මක බව පිළිබඳ සමාලෝචනය සම්පූර්ණ කරන ලද අතර, එම බැංකු ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය සමඟ එක්ව පෞද්ගලික මූලාශ්‍රවලින් ප්‍රාග්ධන හිඟය පියවා ගැනීමට නොහැකි වූ බැංකු වලට අදාළව රජයේ ප්‍රතිප්‍රාග්ධනීකරණය සඳහා අදාළ ප්‍රමාණය, කාල සීමාවන්, උපකරණ සහ නියමයන් සහ කොන්දේසි ද ඇතුළත් කරමින් බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණය කිරීමේ උපාය මාර්ගය සකස් කරන ලදී. ඒ සඳහා 2024 අයවැයෙන් රුපියල් බිලියන 450ක අයවැය ප්‍රතිපාදන වෙන් කරන ලදී. කෙසේ නමුත්, එම අරමුදල් භාවිතා කිරීමේ අවශ්‍යතාවයක් 2024 දී මතු නොවීය. මෙම ක්‍රියාවලියේම කොටසක් ලෙස, බැංකු නවයක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රතිප්‍රාග්ධනකරණ සැලසුම් ඉදිරිපත් කරන ලද අතර එම සැලසුම් තක්සේරු කිරීම ද අවසන් කරන ලදී. තවද, මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රගතිය ද අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.

ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම

වර්තමාන වෙළඳපොළ වර්ධනයන්, ගෝලීය ප්‍රශස්ත භාවිතයන් සහ යාවත්කාලීන වන නියාමන අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ එහි භාවිතයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. මෙම විධාන මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය දියුණු කිරීම, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ නිපුණතාවය සහ වෘත්තීමය අවංකභාවය අවධාරණය කිරීම, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීම ඇතුළු අවදානම් අධීක්ෂණ හා පාලන උපක්‍රමයන් වැඩි දියුණු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම යනාදිය සඳහා මූලික වශයෙන් අවධානය යොමු කර ඇත.

බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සහ සහන සැලසීමේ ක්‍රියාමාර්ග

අහිතකර සාර්ව ආර්ථික තත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරවල තිරසාර ආර්ථික පුනර්ජීවනයට පහසුකම් සැලසීම සහ බලපත්‍රලාභී බැංකුවල වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2024 මාර්තු මාසයේදී ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. මෙම ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකකවල අරමුණ වන්නේ, අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් එනම් ආදායම, මුදල් ප්‍රවාහ හෝ විකුණුම්වල අඩුවීම, මෙහෙයුම් අඩුවීම හෝ අඩාල වීම හෝ තාවකාලිකව ව්‍යාපාර වසා දැමීම හේතුවෙන් මූල්‍ය සහ මෙහෙයුම් අභියෝගවලට මුහුණ දෙන හෝ ඉදිරියේදී දුෂ්කරතාවන්ට මුහුණ දිය හැකි, බලපත්‍රලාභී බැංකුවල ක්‍රියාකාරී සහ අක්‍රිය ණය ගැනුම්කරුවන් හඳුනාගෙන ඔවුන්ට සහාය වීමයි. ණය පහසුකම්වලට අදාළ පරාටේ බලතල අත්හිටුවීම අවසන් වීමත් සමඟ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීන අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට අදාළව ලබා දිය හැකි සහන දක්වමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආර්ථික අංශවලට අදාළ සහාය ලබා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

3. 2025 වසරේදී සහ ඉන් ඔබ්බට කිරීමට නියමිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සහ බැංකු පද්ධතියේ සුරක්ෂිතතාව සහ ශක්තිමත්භාවය තහවුරු කිරීමේ අරමුණින්, 2025 සහ ඉන් ඔබ්බට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

බැංකු ප්‍රතිප්‍රාග්ධනීකරණ උපාය මාර්ගය යටතේ විශාල බැංකු නවයක් විසින් සකස් කරන ලද ප්‍රතිප්‍රාග්ධනීකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම අර්ධ වාර්ෂිකව නිරීක්ෂණය කරනු ලබන අතර, සියලුම බැංකු සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණ සිදු කෙරේ. තවද, මූල්‍ය පද්ධතිය ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහිත ශක්තිමත් සහ ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු බැංකුවලින් සමන්විත බව සහතික කිරීම සඳහා, බලපත්‍රලාභී බැංකු සඳහා වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීම සඳහා වන රාමුවක් ස්ථාපිත කර, එක් එක් සිද්ධිය සලකා බලා ඒ අනුව ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ. අර්බුද කළමනාකරණය සහ නිරාකරණ ක්‍රියාමාර්ග වැඩිදියුණු කරීම තුළින් මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව ද ශක්තිමත් කරනු ලබන අතර, මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධීකරණය කිරීම සහ ඒ සඳහා සහාය වීම අඛණ්ඩව සිදු කිරීමට මහ බැංකුව කටයුතු කරනු ඇත.

විශාල ගනුදෙණු නිරාවරණයන්, ආයතනික යහපාලනය, ද්‍රවශීලතා අනුපාත, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර යනාදිය ආවරණය වන පරිදි බැංකු (සංශෝධන) පනතට අනුකූලව නිකුත් කරන ලද විධාන ක්‍රියාත්මක කිරීම ද 2025 දී නිරීක්ෂණය කෙරේ. මීට අමතරව, නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම තහවුරු කිරීම සඳහා වෙළඳපොළ වර්ධනයන් සහ ගෝලීය ප්‍රශස්ත භාවිතයන්ට අනුකූලව පවතින රෙගුලාසි සමාලෝචනය කෙරේ. තවද, සුපරීක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් අවදානම් පදනම් කරගත් අධීක්ෂණයෙහි ඵලදායීතාවය වැඩි කෙරෙන අතර බැංකුවල අඛණ්ඩ අධීක්ෂණය තීව්‍ර කරනු ලැබේ. මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව, අවදානම් මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ බැංකු පරීක්ෂණ පැවැත්වීම තවදුරටත් ශක්තිමත් කිරීමට මහ බැංකුව කටයුතු කරනු ඇත.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, බැංකු අංශය ශක්තිමත් මූල්‍ය තත්ත්වයකින් හා ශක්තිමත් විචක්ෂණශීලී අනුපාතවලින් යුතුව රටේ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාවක් ඇතිව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අංශයේ පොලී ආදායම 13.7%කින් පහළ ගිය නමුත්, පොලී වියදම් 29.5%කින් අඩු වීම හේතුවෙන් ශුද්ධ පොලී ආදායම 28.2%කින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2023 වසර අවසානයේ 3.7%ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2024 වසර අවසානයේ දී 4.3% දක්වා වැඩි විය. 2024 වසර තුළ දී ප්‍රධාන වශයෙන් සේවක පිරිවැය රුපියල් බිලියන 54.5කින් වැඩි වීම හේතුවෙන් පොලී නොවන වියදම් රුපියල් බිලියන 73.9කින් වැඩි වූ අතර, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා සබැඳි ණය හානිකරණ වෙන්කිරීම් ආපසු හැරවීම හේතුවෙන්, ණය හානිකරණ හා අනෙකුත් අලාභ වෙන්කිරීම් රුපියල් බිලියන 238.1කින් අඩු විය. 2024 මූල්‍ය වර්ෂය සඳහා බැංකු අංශය විසින් එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, මූල්‍ය සේවා සඳහා වන අනෙකුත් බදු සහ සංස්ථාපිත බදු ඇතුළුව මුළු බදු ලෙස රුපියල් බිලියන 409.3ක් ගෙවන ලද අතර, එය 2023 මූල්‍ය වර්ෂය සඳහා රුපියල් බිලියන 184.4ක් විය. නියාමන වාර්තාකරණයට අනුව, 2024 වසර සඳහා වන සංස්ථාපිත බදු පෙර ලාභය රුපියල් බිලියන 563.1ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 272.0ක ඉහළ යෑමකි. 2024 වසර තුළ දී බැංකු අංශයෙහි බදු පසු ලාභය රුපියල් බිලියන 309.7ක් වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 60.8%ක වර්ධනයකි. මෙය, වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) අනුපාතය 2023 වසර අවසානයේ දී වාර්තා වූ 1.5% සිට 2024 වසර අවසානය වන විට 2.6% දක්වා වැඩි වීම මගින් මෙන්ම හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) අනුපාතය 2023 වසරේ දී පැවති 11.5% සිට 2024 වසරේ දී 15.6% දක්වා

2

2.6 සංඛ්‍යා සටහන: බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය

අයිතමය	රුපියල් බිලියන		සංයුතිය (%)	
	2023 (අ)	2024 (ආ)	2023 (අ)	2024 (ආ)
ප්‍රථම ස්ථරය : ප්‍රාග්ධන	**1,395.1**	**1,455.5**	**100.0**	**100.0**
කොටස් ප්‍රාග්ධනය	385.8	**416.1**	27.7	**28.6**
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල්	87.7	**88.7**	6.3	**6.1**
නොබෙදූ ලාභ	720.0	**710.5**	51.6	**48.8**
පොදු හා අනෙකුත් සංචිත	332.3	**330.4**	23.8	**22.7**
වෙනත්	93.1	**70.8**	6.7	**4.9**
නියාමක ගැලපීම්	-223.8	**-161.0**	-16.0	**-11.0**
දෙවන ස්ථරය : ප්‍රාග්ධන	**291.9**	**345.4**	**100.0**	**100.0**
ප්‍රත්‍යාගණන සංචිත	44.1	**52.6**	15.1	**15.2**
උපකාරක ණය	147.9	**196.8**	50.7	**57.0**
පොදු වෙන්කිරීම් සහ වෙනත්	100.5	**97.4**	34.4	**28.2**
නියාමක ගැලපීම්	-0.6	**-1.5**	-0.2	**-0.4**
සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම	**1,687.0**	**1,800.9**		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩි වීම මගින් ද පිළිබිඹු විය. තවද, ප්‍රධාන වශයෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශයේ කාර්යක්ෂමතාවය 2023 වසර අවසානයේ දී පැවති 40.5% සිට 2024 වසර අවසානයේ දී 40.7% දක්වා සුළු වශයෙන් පිරිහීමට ලක්විය.

2024 වසර තුළ දී, බැංකු අංශය සමස්තයක් වශයෙන් ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල විය. අභියෝගාත්මක ව්‍යාපාරික තත්ත්වයන් මගින් පැන නැගිය හැකි අවදානම් හේතුවෙන් සිදුවිය හැකි අලාභ අවශෝෂණය කර ගැනීමට සහ බැංකු අංශයේ ශක්තිමත්භාවය වර්ධනය කරගැනීම උදෙසා, උසස් තත්ත්වයේ ප්‍රාග්ධනය ඒක්රැස් කිරීමට බැංකු දිරිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු විසින් 2024 වසර තුළ දී කොටස් ප්‍රාග්ධනය රුපියල් බිලියන 30.3කින් වැඩි කිරීම හරහා පළමු ස්ථර ප්‍රාග්ධනය ඉහළ නංවාගෙන ඇත. වසර තුළ දී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය 6.8%ක වර්ධනයක් වාර්තා කළ අතර, එම වර්ධනයෙන් 53.0%ක වැඩි වීමට පළමු ස්ථර ප්‍රාග්ධනය දායකත්වය දැක්වීය. තවද, විගණනය කරන ලද ලාභ රඳවා තබා ගැනීමත් සමඟ වසර අවසාන ප්‍රාග්ධන අගයන් තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇත. මේ අතර, 2024 වසර අවසානයේ සමස්ත ප්‍රාග්ධන අනුපාතය 18.4%ක් ලෙස පැවති අතර, පළමු ස්ථර ප්‍රාග්ධන අනුපාතය 2023 වසර අවසානයේ පැවති 15.2%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ 14.9% දක්වා සුළු වශයෙන් අඩු විය.

2.2 බැංකු නොවන මූල්‍ය ආයතන අංශය


මුදල් සමාගම්

මුදල් සමාගම් අංශය 2024 වසර තුළ දී සැලකිය යුතු ප්‍රසාරණයක් වාර්තා කළ අතර, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය අවම නියාමන අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් පවත්වා ගනිමින් ශක්තිමත්ව පැවතුණි. මෙම අංශය ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ ණය ගැනීම් අනුව වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, අක්‍රීය ණය හෙවත් තෙවන අදියර යටතේ වර්ගීකරණය කරන ලද ණය අඩුවීමෙන් පිළිබිඹු වන පරිදි මෙම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු විය. 2024 වසර අවසානය වන විට, මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් 5.4%ක් නියෝජනය කළ මෙම අංශය, මුදල් සමාගම් 32කින්[3] සමන්විත විය. මුදල් සමාගම්වල ශාඛා 1,908ක් තිබූ අතර, ඉන් ශාඛා 1,265ක් බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබීමෙන් මෙම සමාගම් බොහෝ අංශවල මූල්‍ය අවශ්‍යතා සපුරාලමින් මූල්‍ය අන්තර්ගතභාවය සඳහා පහසුකම් සපයන ලද බව තහවුරු වේ. මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව වඩාත් ශක්තිමත් මුදල් සමාගම් අංශයක් ඇති කිරීමේ අරමුණින් මුදල් සමාගම් අංශයේ ඒකාබද්ධ කිරීම සඳහා වූ සැලැස්මේ දෙවන අදියර සඳහා සංශෝධිත රාමුව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී හඳුන්වාදුන් අතර, මෙම සංශෝධිත රාමුව වසර තුනක ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් සහිතව 2025 මාර්තු 31 දින සිට ක්‍රියාත්මක වේ[4].

මෙම අංශයේ වත්කම් පදනම 2023 වසර අවසානයේ දී පැවති 5.7%ක වර්ධනයට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට 13.9%කින්, එනම් රුපියල් බිලියන 235.2කින් වර්ධනය වී රුපියල් බිලියන 1,930.7ක් දක්වා ඉහළ ගියේය. වත්කම් පදනමෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ණය සහ අත්තිකාරම් කළඹෙහි සිදු වූ සැලකිය යුතු ප්‍රසාරණයයි. ශුද්ධ ණය සහ අත්තිකාරම් මුදල් සමාගම් අංශයේ මුළු වත්කම්වලින් 74.1%කට හිමිකම් කීවේය. 2024 වසර තුළ මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ රුපියල් බිලියන 1,430.2ක් දක්වා

3 ETI ෆිනෑන්ස් ලිමිටඩ් හැර (කොළඹ වාණිජ මහාධිකරණය 2023 දෙසැම්බර් 15 වන දින අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ETI ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය ඈවර කිරීම සඳහා නියෝග කළේය).
4 ඒකාබද්ධකරණ සැලැස්ම ක්‍රියාත්මක වීමත් සමඟ, 2024 වසර අවසානය වන විට විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ මෙහෙයුම් කටයුතුවල නිරත වූයේ එක් සමාගමක් පමණි.

2.4 රූප සටහන: මුදල් සමාගම් අංශයේ සමස්ත ණය සහ අත්තිකාරම් (ශුද්ධ) - ණය කාණ්ඩ අනුව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රුපියල් බිලියන 265.4කින් ඉහළ ගිය අතර, එය 2023 වසරේ දී 2.6%ක සංකෝචනය වීමකට සාපේක්ෂව 2024 වසර අවසානයේ 22.8%ක වර්ධනයක් පෙන්නුම් කළේය. 2023 වසර අවසානය දී මුළු ණය සහ අත්තිකාරම්වලින් 66.2%ක් ලෙස වාර්තා වූ මූල්‍ය කල්බදු හා වාහන ණය, 2024 වසර අවසානය වන විට මුළු ණය සහ අත්තිකාරම්වලින් 64.0%ක් ලෙස වාර්තා කරමින් මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹෙහි ප්‍රමුඛස්ථානය ලබාගත් අතර, 2023 වසර අවසානයේ දී මුළු ණය සහ අත්තිකාරම්වලින් 18.7%ක් ලෙස වාර්තා වූ රන් සුරුකුම් මත ණය දීම්, 2024 වසර අවසානය වන විට මුළු ණය සහ අත්තිකාරම්වලින් 19.8%ක් ලෙස වාර්තා වී ඇත. මූල්‍ය කල්බදු හා වාහන ණය සහ රන් සුරුකුම් මත ණය දීම් 2024 වසර අවසානයේ දී පිළිවෙළින් 18.7%ක් සහ 30.4%ක වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් රජයේ සුරුකුම්පත්වල ආයෝජන අඩු වීම හේතු කොටගෙන, ක්‍රමක්ෂය කළ පිරිවැය මත මනිනු ලබන ණය ගැනීම් සහ අනෙකුත් මූල්‍ය උපකරණ මගින් පිළිබිඹු වන මූල්‍ය වත්කම්, 2023 වසරේ දී පැවති 71.1%ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ දී 39.9%කින් සංකෝචනය විය.

දළ අක්‍රීය ණය අනුපාතය 2023 වසර අවසානයේ පෙන්නුම් කළ 18.0%ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී 11.3% දක්වා පහළ යාමෙන් පිළිබිඹු වන පරිදි, මුදල් සමාගම් අංශයේ ණයවල ගුණාත්මකභාවය ඉහළ ගොස් ඇත. මේ අතර, මෙම අංශයේ අක්‍රීය ණය සඳහා වන හානිකරණ ආවරණ අනුපාතය 2023 වසර අවසානයේ වාර්තා වූ 32.6%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී 41.9%ක් ලෙස වාර්තා විය. ඒ අනුව, 2023 වසර අවසානය වන විට 12.1%ක් ලෙස වාර්තා වූ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය 2024 වසර අවසානය වන විට 6.6%ක් ලෙස යහපත් මට්ටමකට අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

මුදල් සමාගම් අංශයේ ද්‍රවශීලතාවය, 2024 වසර තුළ දී අවම නියාමන මට්ටමට වඩා ඉහළ අගයක පවත්වා ගැනීමට හැකි විය. 2024 වසර අවසානයේ දී අවම ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය වූ රුපියල් බිලියන 115.8ට එරෙහිව එම වසරේ දී මෙම අංශය සතුව පැවති සමස්ත නියාමන ද්‍රවශීල වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 220.9ක් වූ අතර, 2023 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 151.5ක ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව 2024 වසර අවසානයේ රුපියල් බිලියන 105.1ක ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කරන ලදී. 2024 වසර අවසන් වන විට මුදල් සමාගම් අංශයේ මුළු වගකීම්වලින් 54.7%ක් වූ පාරිභෝගික තැන්පතු තවදුරටත් වගකීම්වලින් ප්‍රමුඛත්වය ගත් අතර, හිමිකම් සහ ණය ගැනීම් මුළු වගකීම්වලින් පිළිවෙළින් 24.3%ක් සහ 15.8%ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී තැන්පතු රුපියල් බිලියන 1,056.4ක් දක්වා 13.0%කින්, එනම් රුපියල් බිලියන 121.4කින් වර්ධනය විය. මේ අතර, 2024 වසර තුළ දී ණය ගැනීම් රුපියල් බිලියන 305.4ක් දක්වා 15.3%කින්, එනම් රුපියල් බිලියන 40.5කින් වර්ධනය විය.

ප්‍රධාන වශයෙන් ශුද්ධ පොලී ආදායම ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ බදු පසු ලාභය, 2023 වසරේ පැවති රුපියල් බිලියන 49.4 සිට 2024 වසරේ දී රුපියල් බිලියන 59.7 දක්වා 20.9%කින් ඉහළ ගියේය. 2024 වසර තුළ රුපියල් බිලියන 191.8ක් ලෙස වාර්තා වූ ශුද්ධ පොලී ආදායම ප්‍රධාන වශයෙන් මෙම අංශයේ ඉහළ ලාභදායීත්වයට දායක වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 24.3%ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. තවද, පොලී නොවන ආදායම 2024 වසර තුළ දී රුපියල් බිලියන 33.8ක් වූ අතර, 2023 වසරට සාපේක්ෂව 1.4%ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. 2023 වසරේ දී පිළිවෙළින් 5.2%ක් සහ 12.7%ක් වූ වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත, 2024 වසරේ දී පිළිවෙළින් 6.1% සහ 13.5% දක්වා ඉහළ යාමෙන් ලාභදායීත්වයේ වැඩි වීම පිළිබිඹු විය. 2023 වසරේ දී 52.8%ක් ව පැවති කාර්යක්ෂමතා අනුපාතය 2024 වසරේ දී 50.8% දක්වා පහත වැටීමෙන් පිළිබිඹු වන පරිදි මෙම අංශයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු විය.

මුදල් සමාගම් අංශයේ ප්‍රාග්ධන පදනම 2023 වසර අවසානයේ දී රුපියල් බිලියන 329.1 සිට 2024 වසර අවසානයේ රුපියල් බිලියන 357.4 දක්වා රුපියල් බිලියන 28.3කින් වර්ධනය වූ අතර එය වසර තුළ 8.6%ක වර්ධනයක් වාර්තා කළේය. මුදල් සමාගම් දෙකක්[5] හැර අනෙකුත් සියලුම සමාගම් අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල විය. මෙම අංශයේ මූලික ප්‍රාග්ධන සහ සමස්ත ප්‍රාග්ධන අනුපාත 2023 වසර අවසානය වන විට පිළිවෙළින් 21.1%ක් සහ 22.3%ක් ලෙස වාර්තා වීමට සාපේක්ෂව, 2024 වසර අවසානය වන විට පිළිවෙළින් 20.4%ක් සහ 21.2%ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණු නමුත් අවම නියාමන අවශ්‍යතාවයට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2024 වසර අවසානය වන විට රජයේ සුරුකුම්පත් වෙළඳපොළෙහි සක්‍රීය ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස ලියාපදිංචි වූ බලපත්‍රලාභී වාණිජ බැංකු පහක්[6] සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් පහක්[7] කටයුතු කළහ. ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත වත්කම් 2023 වසර

5 2024 වසර අවසානය වන විට එම සමාගම්, මුදල් සමාගම් අංශයේ වත්කම්වලින් 0.7%ක් නියෝජනය කළේය. අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතා සහ/හෝ ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවලට අනුකූල නොවූ මුදල් සමාගම්වල තැන්පතු මත උපරිම සීමා, ණයදීම් මත උපරිම සීමා, නව තැන්පතු භාර ගැනීම අත්හිටුවීම, සහ නව ණය ලබාදීම මත උපරිම සීමා වැනි නියාමන සීමාකිරීම් පනවා ඇත.

6 පෘන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් හැර (රජයේ සුරුකුම්පත් ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගී වීම 2017 අගෝස්තු 15 දින සිට අත්හිටුවන ලදී).

7 එන්ටුස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. (2017 ජූලි 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරුකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවීමට එන්ටුස්ට් සිකියුරිටීස් පී.එල්.සී. වෙත නියෝග කර ඇත. අනාරක්ෂිත ආයෝජකයෙකු විසින් මෙම සමාගම ස්වේච්ඡාවෙන් ණයහිමියන්ගේ ගණන් බේරා වසා දැමීම සඳහා වන ඉල්ලීමක් කරන ලද අතර අධිකරණය මගින් 2022 ජූනි 17 දින ගණන් බේරා වසා දැමීම සඳහා වන නියෝගය ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ගණන් බේරා වසා දැමීම සඳහා ගොනු කල නඩුව වෙනත් හිතිමය ක්‍රියාමාර්ග හේතුවෙන් තවමත් විභාග වෙමින් පවතී) සහ පර්පෙචුවල් ට්‍රෙෂර්ස් සමාගම (2017 ජූලි 06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අත්හිටුවා ඇති අතර, මෙම අත්හිටුවීම 2025 ජනවාරි 05 දින සිට බලපවැත්වෙන පරිදි තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී) යන ආයතන හැර.

2

තුළ දී පැවති රුපියල් බිලියන 270.9ට සාපේක්ෂව 2024 වසර තුළ දී රුපියල් බිලියන 297.2ක් දක්වා 9.7%කින් වර්ධනය වී ඇත. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කර ඇති සමස්ත ආයෝජන කළඹ 2024 වසර අවසන් වන විට රුපියල් බිලියන 277.9ක් වූ අතර, එය 2023 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 262.9ට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 5.7%ක වර්ධනයක් වාර්තා කළේය.

2024 වසර තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් රුපියල් බිලියන 9.7ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර, එය 2023 වසර තුළ දී වාර්තා කළ බදු පසු ලාභය වන රුපියල් බිලියන 30.4 සිට සැලකිය යුතු පහත වැටීමක් පෙන්නුම් කරයි. ලාභදායීතාවයේ මෙම අඩු වීම සඳහා ප්‍රධාන වශයෙන් පොලී ආදායම සහ ප්‍රාග්ධන ලාභ අඩු වීම මෙන්ම ලාභය සහ අලාභය හරහා සාධාරණ වටිනාකම මත මනිනු ලබන වෙළඳාම සඳහා තබා ඇති මූල්‍ය වත්කම්වල නැවත තක්සේරු පාඩු ඉහළ යෑම ද බලපාන ලදී. තවද, ප්‍රාථමික අලෙවිකාර සමාගම්හි වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත 2023 වසරේ දී පිළිවෙළින් 31.9% සහ 113.9% සිට 2024 වසරේ දී පිළිවෙළින් 7.9% සහ 30.9% දක්වා අඩු විය.

ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල කොටස් හිමිකම 2.3%ක් තරම් වූ සුළු අගයකින් අඩු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ලාභයේ පහත වැටීම හේතු විය. ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය 2023 වසර අවසානයේ දී වාර්තා වූ 22.3% සිට 2024 වසර අවසානයේ දී 18.7%ක් දක්වා පහළ යෑමක් වාර්තා කළ ද, එහි අවම අවශ්‍යතාව වන 10.0%ට වඩා වැඩි අගයක පැවතුණි.

භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ප්‍රාථමික වෙන්දේසිය සඳහා ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සහභාගීත්වය 2024 වසර තුළ දී මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පිළිබිඹු කරන ලදී. 2024 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු (වටිනාකම අනුව) 25.4%කින් රුපියල් බිලියන 18,639.9ක් දක්වා පහත වැටුණු අතර, එයින් 72.9%ක් ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු විය. 2023 වසර සමඟ සැසඳීමේ දී 2024 වසර තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල එකවර මිලදී ගැනුම් 28.8%කින් පහළ ගිය අතර, එකවර විකුණුම් 11.3%කින් අඩු විය.

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

සමාගම් හතරකින් සමන්විත වන බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් අංශය 27.0%ක වර්ධනයක් සමඟින් 2024 වසර අවසානයේ දී වාර්තා කළ මුළු වත්කම් පදනම රුපියල් බිලියන 14.8ක් විය. ක්ෂුද්‍ර මූල්‍ය ණය හා අත්තිකාරම්, සමස්ත වත්කම් ප්‍රමාණයෙන් විශාලතම දායකත්වය දැක්වූ අතර, එය 2023 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 7.6ට සාපේක්ෂව 49.9%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2024 වසර අවසානයේ දී රුපියල් බිලියන 11.4ක් ලෙස වාර්තා විය. මෙම අංශයේ සමස්ත තැන්පතු පදනම, 2023 වසරේ පැවති රුපියල් මිලියන 828.9ක අගයෙහි සිට 2024 වසරේ දී රුපියල් මිලියන 1,124.4ක් දක්වා 35.7%කින් වර්ධනය විය. 2024 වසර අවසානයේ දී මෙම අංශයේ මූලික ප්‍රාග්ධන මට්ටම රුපියල් බිලියන 3.3ක් ලෙස සටහන් වූ අතර, සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් මූලික ප්‍රාග්ධනය සඳහා වන අවම විචක්ෂණශීලී රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය.

ණය භාර

වත්කම් පදනමේ සැලකිය යුතු වැඩි වීමක් සමඟ ණය භාර අංශය 2024 වසර තුළ දී ද අබාධිතව වර්ධනය විය. ක්‍රියාත්මකව පවතින ණය භාර සංඛ්‍යාව 2023 වසර අවසානයේ වාර්තා වූ 84 සිට 2024 වසර අවසාන වන විට 90 දක්වා ඉහළ ගිය අතර, ණය භාර කළමනාකරණ සමාගම් සංඛ්‍යාව 2023 වසර අවසානයට සාපේක්ෂව 2024 වසර අවසානයේ දී 16ක් ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත්, නිකුත් කරන ලද ණය සංඛ්‍යාව 2023 වසර අවසානයේ වාර්තා වූ මිලියන 13,371ට සාපේක්ෂව 2024 වසර අවසානයේ මිලියන 30,260 දක්වා 126.3%කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. තවද, 2023 වසර අවසානයේ 93,450ක් වශයෙන් වාර්තා වූ සමස්ත ණය හිමියන් සංඛ්‍යාව 2024 වසර අවසානයේ දී 114,898ක් දක්වා වර්ධනය විය. 2023 වසර අවසානයේ රුපියල් බිලියන 406.5ක් ලෙස පැවති ණය භාරයන්හි මුළු වත්කම්, 2024 වසර අවසානයේ රුපියල් බිලියන 547.4ක් දක්වා 34.7%කින් වර්ධනය විය. ණය භාර අරමුදල් ප්‍රධාන වශයෙන් මුදල් වෙළඳපොළ අරමුදල් සහ ආදායම් අරමුදල්වලින් සමන්විත වූ අතර, එමගින් 2024 වසර අවසානය වන විට ණය භාර අංශයේ 83.9%ක් ණය‍ාබද්ධව නියෝජනය විය. මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ණය භාර මඟින් රාජ්‍ය සුරැකුම්පත්වල සිදුකරන ලද ආයෝජන 2023 වසර අවසානයේ වාර්තා වූ 77.2% සිට 2024 වසර අවසානයේ දී 67.8% දක්වා පහළ ගියේය. මීට අමතරව, ණය භාර වත්කම්වල ප්‍රතිශතයක් ලෙස කොටස් ආයෝජනය 2023 වසර අවසානයේ පැවති 4.5%ට සාපේක්ෂව 2024 වසර අවසානයේ 5.7%ක් දක්වා ඉහළ ගියේය.

රක්ෂණ අංශය[8]

දිගු කාලීන සහ සාමාන්‍ය යන උප අංශවලින් සමන්විත රක්ෂණ අංශයේ සමස්ත වත්කම් ප්‍රසාරණය වූ නමුත්, 2024 වසර තුළ දී එම අංශය මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය.

8 මෙම පරිච්ඡේදය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ (NITF) ප්‍රතිරක්ෂණ ව්‍යාපාරය සලකා බලා නොමැත.

2024 වසර අවසන් වන විට රක්ෂණ අංශයේ මෙහෙයුම් කටයුතුවල නිරත වන සමාගම් අතරින් 15ක් දිගු කාලීන රක්ෂණ සමාගම් ලෙස ද, සමාගම් 14ක් සාමාන්‍ය රක්ෂණ සමාගම් ලෙස ද ක්‍රියාත්මක විය. මීට අමතරව, 2024 වසර අවසන් වන විට රක්ෂණ තැරැව්කාර සමාගම් 81ක් ක්‍රියාත්මක විය.

2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකයෙහි (Gross Written Premium) වර්ධනය වීමක් වාර්තා විය. වසර තුළ දී, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශවල දළ ලියාහළ වාරික වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පිළිවෙළින් 20.4%කින් සහ 11.7%කින් වර්ධනය විය. මේ අතර, 2024 වසර අවසානය වන විට දිගු කාලීන උප අංශයේ වත්කම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.7%කින් වර්ධනය වූ අතර, සාමාන්‍ය රක්ෂණයේ වත්කම් 5.3%කින් පහත වැටුණි. කෙසේ වෙතත්, දිගු කාලීන රක්ෂණ උප අංශයේ ඉහළ වත්කම් පදනම හේතුවෙන්, 2024 වසර තුළ සමස්ත රක්ෂණ අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 7.9%කින් වර්ධනය විය.

දිගු කාලීන රක්ෂණ උප අංශයේ බදු පෙර ලාභය 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී 6.2%කින් වර්ධනය වූ අතර, මෙම කාලසීමාව තුළ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ බදු පෙර ලාභය 2.4%කින් පහළ ගියේය. 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන උප අංශ දෙකෙහිම වත්කම් මත ප්‍රතිලාභ අනුපාත පිරිහී ඇත. තවද, 2024 වසර අවසානයේ දී දිගු කාලීන සහ සාමාන්‍ය යන රක්ෂණ උප අංශවල ගෙවන ලද හිමිකම් ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව පිළිවෙළින් 9.4%කින් සහ 2.2%කින් වැඩි විය.

2024 වසර තුළ දී, සාමාන්‍ය රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන තත්ත්වය වැඩිදියුණු වූ අතර, දිගු කාලීන රක්ෂණ උප අංශයේ ප්‍රාග්ධන තත්ත්වයෙහි පහත වැටීමක් දක්නට ලැබුණ ද, එය අවම අවශ්‍යතාවයන්ට වඩා ඉහළින් පැවතුණි. ඒ අනුව, සාමාන්‍ය රක්ෂණය සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පෙර වසර අවසානයේ පැවති 252.0% සිට 2024 වසර අවසානයේ දී 322.0% දක්වා ඉහළ ගියේය. දිගු කාලීන රක්ෂණය සඳහා වන ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වසරකට පෙර පැවති 358.3% සිට 2024 වසර අවසානයේ 338.1% දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ උප අංශවල ප්‍රාග්ධනයට මුළු වත්කම් අනුපාතය 2023 වසර අවසානයේ වාර්තා වූ පිළිවෙළින් 0.22 සහ 0.51ට සාපේක්ෂව 2024 වසර අවසානයේ පිළිවෙළින් 0.19 සහ 0.44 දක්වා අඩු විය.

සේවක අර්ථසාධක අරමුදල

2024 වසර අවසානයේ දී විශ්‍රාම අරමුදල් අංශයේ සමස්ත වත්කම්වලින් 81.0%කට හිමිකම් කියමින් සේවක අර්ථසාධක අරමුදල නවවදුරටත් එම අංශයෙහි ප්‍රධානත්වය දැරුවේය. සේවක අර්ථසාධක අරමුදලෙහි ශුද්ධ වටිනාකම

2.7 සංඛ්‍යා සටහන: සේවක අර්ථසාධක අරමුදලෙහි කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය

අයිතමය	2020	2021	2022	2023	2024 (අ)
අරමුදලේ ශුද්ධ වටිනාකම (රුපියල් බිලියන)	2,824.3	3,166.1	3,459.9	3,886.7	**4,375.7**
සාමාජිකයන් වෙත වූ මුළු වගකීම් (රුපියල් බිලියන)	2,767.8	3,066.9	3,380.6	3,817.9	**4,289.5**
මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන)	150.7	165.7	194.6	210.6	**234.4**
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන)	109.7	118.2	163.0	215.9	**188.1**
ශුද්ධ දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන)	41.0	47.5	31.6	-5.3	**46.3**
සාමාජික ශේෂ මත පොලී අනුපාතිකය (%)	9.00	9.00	9.00	13.00	**11.00**
මුළු සාමාජික ගිණුම් ගණන (මිලියන)	19.8	20.3	20.4	21.5	**21.5**
දායක මුදල් ගෙවීමින් පවතින සාමාජික ගිණුම් ගණන (මිලියන)	2.6	2.5	2.7	2.6	**2.6**

(අ) තාවකාලික

මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2023 වසර අවසානයේ දී වාර්තා කළ රුපියල් බිලියන 3,886.7ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 4,375.7 දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.6%කින් සැලකිය යුතු ලෙස වැඩි විය. 2024 වසර තුළ දී, අරමුදල ආයෝජන කිරීම තුළින් උපයන ලද ආදායම සහ ශුද්ධ දායක මුදල් ලැබීම් මෙම වර්ධනය සඳහා හේතු විය. ඊට සමගාමීව, මෙම කාලය තුළ සාමාජිකයන් වෙත වූ මුළු වගකීම ද 12.4%කින් වැඩි විය. මේ අතර, 2024 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් රුපියල් බිලියන 234.4ක් දක්වා 11.3%කින් ඉහළ ගිය අතර, සාමාජිකයින්ට සහ ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන් හට ගෙවන ලද සමස්ත ප්‍රතිලාභ ප්‍රමාණය රුපියල් බිලියන 188.1 දක්වා 12.9% කින් අඩු විය. 2023 වසරේ දී රුපියල් බිලියන 5.3ක ඍණ අගයක් ලෙස වාර්තා වූ අරමුදලෙහි ශුද්ධ දායක මුදල් ලැබීමට සාපේක්ෂව එම අගය 2024 වසරේ දී රුපියල් බිලියන 46.3ක ධන අගයක් ලෙස වාර්තා විය.

2024 වසර තුළ අරමුදලේ සමස්ත ආයෝජන ආදායම රුපියල් බිලියන 513.8ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 481.1 හා සැසඳීමේ දී 6.8%ක කැපී පෙනෙන වර්ධනයකි. පොලී ආදායම, අරමුදලෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවති අතර, එය 2023 වසරේ දී උපයන ලද රුපියල් බිලියන 442.4ට සාපේක්ෂව 2024 වසරේ දී රුපියල් බිලියන 455.1 දක්වා 2.9%කින් වර්ධනය විය. 2023 වසරේ දී රුපියල් බිලියන 3.0ක් වූ ලාභාංශ ආදායම 2024 වසරේ දී රුපියල් බිලියන 5.5ක් දක්වා 82.9%කින් ඉහළ ගියේය. 2023 වසරේ දී රුපියල් බිලියන 23.8ක් ලෙස වාර්තා වූ සාධාරණ අගයට (fair value) ඇති ලැයිස්තුගත කොටස් ආයෝජනවල ශුද්ධ ලාභයට සාපේක්ෂව, 2024 වසර සඳහා එම ලාභය රුපියල් බිලියන 49.2ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී අරමුදලෙහි දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අනුපාතය 0.6%ක මට්ටමක පවත්වා ගෙන යන ලදී. එසේ වුව ද, ආයෝජන ආදායම වැඩි වීම හේතුවෙන් 2024 වසරේ දී අරමුදලේ බදු වියදම ද රුපියල් බිලියන 64.1ක් දක්වා ඉහළ ගියේය. මුදල් හා කම්කරු විෂයන් භාර අමාත්‍යවරුන්ගේ

2

එකඟත්වය ලැබීමට යටත්ව, 2024 වසර සඳහා සාමාජික ශේෂයන් මත 11.00%ක පොලී අනුපාතයක් මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇත.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

2024 වසර අවසානයේ දී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ වත්කම් පදනම රුපියල් බිලියන 591.3ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 12.7%කින් වර්ධනය විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල විසින් කරන ලද ආයෝජන රුපියල් බිලියන 581.1ක් දක්වා 12.8%කින් ඉහළ ගියේය. මෙම ආයෝජනවලින් 94.7%ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අතර, එය 2024 වසර අවසන් වන විට රුපියල් බිලියන 550.5ක් දක්වා 14.7%කින් වර්ධනය විය. මෙම අරමුදල, 2024 වසරේ දී එහි සාමාජික ශේෂයන් සඳහා 11.9%ක ආයෝජන මත ප්‍රතිලාභ උපයා ගැනීමට සමත් විය. අරමුදලේ සාමාජික ගිණුම් මිලියන 16.3න් 2024 අවසානය වන විට ගිණුම් මිලියන 2.3ක් සක්‍රීයව පැවතුණි. අරමුදලට දායක වන සේවා යෝජකයන්ගේ සංඛ්‍යාව 2023 වසර අවසානයේ 74,927ක් වූ අතර, එය 2024 වසර අවසන් වන විට 80,008ක් දක්වා වර්ධනය විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලහි මුළු සාමාජික ශේෂය 11.9%කින් වැඩි වී 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 564.3ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී අරමුදලේ මුළු දායකත්ව මුදල් රුපියල් බිලියන 42.0ක් දක්වා 12.9%කින් වර්ධනය වූ අතර, සාමාජිකයින්ට ගෙවන ලද මුළු විශ්‍රාම ප්‍රතිලාභ රුපියල් බිලියන 33.4ක් දක්වා 12.7%කින් අඩු විය.

අනෙකුත් විශ්‍රාම අරමුදල්

විශ්‍රාම අරමුදල් අංශයෙන් 1.9%ක් නියෝජනය කරනු ලබන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, 2024 වසර අවසානයේ දී වත්කම් සහ ආයෝජන පදනම අනුව ප්‍රසාරණයක් පෙන්නුම් කළේය. අරමුදලේ මුළු වත්කම්, 2024 වසර අවසානයේ දී රුපියල් බිලියන 105.0ක් දක්වා 9.6%කින් වර්ධනය විය. 2023 වසර අවසානයේ වාර්තා වූ 272,630ක් වූ අරමුදලේ ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී එම සංඛ්‍යාව 272,575ක් විය. මේ අතර, 2024 වසර අවසානයේ දී, මෙම අරමුදලේ මුළු ආයෝජන රුපියල් බිලියන 113.4ක් දක්වා 10.7%ක වර්ධනයක් වාර්තා කළේය. 2024 වසර අවසන් වන විට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල එහි මුළු ආයෝජනවලින් 41.7%ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ අතර, අනෙකුත් ආයෝජන එහි මුළු ආයෝජනවලින් 58.3%ක් ලෙස වාර්තා විය. 2024 වසර තුළ දී අරමුදලේ සාමාජික ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය 10.00%ක් විය.

අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් 2024 වසර අවසානය වන විට විශ්‍රාම අරමුදල් අංශයෙන් 6.2%ක් නියෝජනය කළේය. මෙම අරමුදල් මගින් ආවරණය වන ඇස්තමේන්තුගත සාමාජිකයින් සංඛ්‍යාව 2024 වසර අවසන් වන විට 108,651ක් විය. මීට අමතරව, 2024 වසර අවසානය වන විට අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 339.2ක් දක්වා වැඩි වූ අතර, එම කාලය අවසානයේ අරමුදලේ මුළු ආයෝජන ප්‍රමාණය ද රුපියල් බිලියන 263.9ක් දක්වා වර්ධනය විය.

2.3 මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය


දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා

2024 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාවය වර්ධනය විය. ඇතැම් දේශීය පුද්ගලික බැංකු වරින් වර ද්‍රවශීලතා හිඟයන් අත්දැකීමත්, රාජ්‍ය බැංකු සහ බොහෝ විදේශීය බැංකු සැලකිය යුතු ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කිරීමත් සමඟ, 2024 වසරේ දී ද බැංකු පද්ධතිය තුළ ද්‍රවශීලතාවයෙහි අසමමිතික ව්‍යාප්තියක් නිරීක්ෂණය විය. ද්‍රවශීලතාවයේ මෙම අසමමිතික ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන, විවට වෙළඳපොළ කටයුතු හරහා දේශීය මුදල් වෙළඳපොළට මහ බැංකුව අඛණ්ඩව මැදිහත්වීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, විශේෂයෙන්ම 2024 වසරේ අග භාගයේ දී වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීමත් සමඟ, මහ බැංකුව සිය වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ක්‍රමානුකූලව සීමා කරන ලද අතර අවශ්‍යතාව අනුව පමණක් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දීම, පදනම් අංක 50කින් පමණ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කිරීම සහ මනා ලෙස හසුරුවන ලද විවට වෙළඳපොළ කටයුතු හේතුවෙන්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 8.55%ක මට්ටමේ සිට, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට අනුරූපව 8.00%ක් දක්වා ළඟා විය. එමෙන්ම, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයට සමාන හැසිරීමක් බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයේ ද පෙන්නුම් කරන ලද අතර, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එය 8.11%ක් ලෙස වාර්තා විය.

දේශීය විදේශ විනිමය වෙළඳපොළ

මහ බැංකුව විසින් වසර පුරා විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදුකරන ලද කාලෝචිත මැදිහත්වීම්, වෙළඳපොළ තුළ ඇති විය හැකි අධික විචලන සැලකිය යුතු ප්‍රමාණයකින් අවම කිරීමට සමත් විය. මෙම උපායමාර්ගය හේතුවෙන් විනිමය අනුපාතිකයේ අවම විචලනයන් පමණක් සහිතව දළ නිල විදේශ සංචිත ගොඩනැගීමට මහ බැංකුවට හැකි විය. 2024 වසර තුළ දී, මහ බැංකුව ඒ. ජ. ඩොලර් මිලියන 3,028.6ක් අවශෝෂණය කර ගත් අතර, වෙළඳපොළට ඒ. ජ. ඩොලර් මිලියන 183.0ක් සපයන ලදී.

2.5 රූප සටහන: 2024 වසරේ විවිට වෙළඳපොළ කටයුතු, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සහ මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම



*ද්‍රවශීලතාව සැපයීමට අදාළ සාධක සෘණ අගයන් ලෙස දක්වා ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ මුල් භාගයේ දී මහ බැංකුව විසින් විදේශ විනිමය අනුපාතිකයේ දෛනික විචලනය අඩු කිරීමට සහ එමගින් ශ්‍රී ලංකා රුපියල දැඩි ලෙස අතිප්‍රමාණය වීමේ පීඩනය අඩු කිරීම සඳහා වෙළඳපොළ වෙතින් විශාල ලෙස විදේශ විනිමය මිලදී ගැනීම් සිදු කරන ලදී. 2024 වසර අවසානය වන විට, වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම් ඒ. ජ. ඩොලර් මිලියන 2,845.6ක් ලෙස වාර්තා වූ අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්කය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉක්මවා යමින්, මහ බැංකුව මෙතෙක් සිදු කළ විශාලතම වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම ලෙස සනිටුහන් විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතාවය ස්ථාවරව පැවතුණි. තවද, 2023 වසරේ දී වාර්තා වූ ඒ. ජ. ඩොලර් බිලියන 15.0ට සාපේක්ෂව 2024 වසරේ දී දේශීය විදේශ විනිමය අන්තර් බැංකු වෙළෙඳපොළෙහි වෙළඳ පරිමාවන් ඒ. ජ. ඩොලර් බිලියන 16.3ක් දක්වා 9.0%කින් වර්ධනය විය.

රජයේ සුරැකුම්පත් වෙළඳපොළ

ඇතැම් කාලපරිච්ඡේදවල දක්නට ලැබුණු කඩින් කඩ ඉහළ යෑම් හැරුණු විට, 2024 වසර තුළ දී භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාථමික වෙළඳපොළෙහි ඵලදා අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, පහළ ගිය උද්ධමන අපේක්ෂා, පුළුල් රාජ්‍ය මූල්‍ය විනය සමඟ ක්‍රියාත්මක කළ මුදල් ස්වාරක්ෂකයක් පවත්වා ගැනීම වැනි ක්‍රියාමාර්ග සහ අවදානම් අධිමිල (risk premia) ක්‍රමයෙන් අඩු වීම, ඵලදා අනුපාතිකවල සැලකිය යුතු පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය. තවද, දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන්ගේ වර්ධනය වීම සහ රාජ්‍ය සුරැකුම්පත් සඳහා පැවති තිරසර ඉල්ලුම ද, ඵලදා අනුපාතිකවල පහළ යෑමේ ප්‍රවණතාවයට දායක විය. 2024 ජූලි සිට 2024 සැප්තැම්බර් දක්වා කෙටි කාලය තුළ ඵලදා අනුපාතිකවල යම් ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, පැවැති දේශපාලන අවිනිශ්චිතතා ජනාධිපතිවරණයෙන් පසුව අඩු වීමත් සමඟ රාජ්‍ය සුරැකුම්පත් සඳහා ඉල්ලුම තවදුරටත් තීව්‍ර වූ අතර, එය ද ඵලදා අනුපාතික පහළ යෑමට දායක විය. ඒ අනුව, 2024 වසර තුළ දී, දින-91, දින-182 සහ දින-364 භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රාථමික වෙළඳපොළෙහි ඵලදා අනුපාතික පිළිවෙළින් පදනම් අංක 589, 539 සහ 397කින් පහළ යන ලදී.

ප්‍රාථමික වෙළඳපොළෙහි මෙම ප්‍රවණතාවන්ට සමගාමීව, 2024 වසර තුළ සියලු කල්පිරීම්වලට අදාළව ද්විතීයික වෙළඳපොළෙහි රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ද පහළ ගියේය. මීට අමතරව, වසර තුළ දී ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය සාමාන්‍ය හැඩැති වක්‍රයක් බවට පත් විය. කෙසේ වෙතත්, කෙටි කාලීන කල්පිරීම්වල ඵලදා අනුපාතික දිගු කාලීන ඵලදා අනුපාතිකවලට වඩා වැඩි වශයෙන් පහළ යෑම, ඉහළ පදනම් වාරික (term premia) සඳහා හේතු විය. දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය මගින් පිළිබිඹු වන ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී රුපියල් බිලියන 25.7 සිට රුපියල් බිලියන 27.0ක් දක්වා සුළු වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, මාසික පිරිවැටුම් අනුපාතය[9] මගින් පිළිබිඹු වන වෙළඳපොළ

9 යම් මාසයකට අදාළව වාර්ෂික පදනම මත ගණනය කළ ද්විතීයික වෙළඳපොළ පිරිවැටුම, එම මාසය අවසානය වන විට නොපියවා ඇති රජයේ සුරැකුම්පත්වල අගයෙන් බෙදීමෙන් පිරිවැටුම් අනුපාතය ගණනය කරනු ලබයි.

2


ද්‍රවශීලතාවය, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී පහළ ගියේය. 2024 අගෝස්තු සිට ඔක්තෝම්බර් දක්වා කාලය තුළ දී පැවති පහළ වෙළඳපොළ පිරිවැටුම හේතුවෙන්, 2023 වසරේ දී 41.5ක් ලෙස පැවති සාමාන්‍ය පිරිවැටුම් අනුපාතය 2024 වසරේ දී 37.2ක් දක්වා අඩු වීම, මෙම වෙළඳපොළ ද්‍රවශීලතාවයේ පහළ යෑමට හේතු විය.

2024 වසරේ සැප්තැම්බර් මාසය දක්වා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා විදේශීය ආයෝජකයන්ගේ ඉල්ලුම අඩු මට්ටමක පැවතුණු නමුත්, වසර අවසානය වන විට එම ඉල්ලුමේ ඉහළ යෑමක් වාර්තා විය. ඒ අනුව, 2023 වසරේ වාර්තා වූ ඒ. ජ. ඩොලර් මිලියන 210.0ක ශුද්ධ විදේශ ගලාවීමට සාපේක්ෂව 2024 වසර තුළ ඒ. ජ. ඩොලර් මිලියන 178.9ක ශුද්ධ විදේශ ගලායෑමක් වාර්තා විය. කෙසේ වෙතත්, 2024 අවසාන කාර්තුවේ දී ඒ. ජ. ඩොලර් මිලියන 77.4ක ශුද්ධ විදේශ ගලාවීමක් වාර්තා විය.

කොටස් වෙළඳපොළ


කොටස් වෙළඳපොළ, 2024 වසර තුළ දී ඉහළ කාර්යසාධනයක් ළඟා කරගනිමින් මිල දර්ශකවල වාර්නාගත වර්ධනයක් සමඟ වෙළඳපොළ පිරිවැටුමේ සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. කොළඹ කොටස් වෙළඳපොළෙහි සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 (S&P SL20) දර්ශකය, 2024 වසරේ දෙසැම්බර් 31 වන දින වන විට පිළිවෙළින් 49.7%කින් සහ 58.5%කින් වර්ධනය විය. 2024 වසර තුළ දී, කොටස් වෙළඳපොළෙහි සමස්ත උපනතීන් සඳහා ප්‍රධාන ලැයිස්තුගත සමාගම්වල ඉහළ දායකත්වය ඉස්මතු කරමින්, සමස්ත කොටස් මිල දර්ශකයේ හැසිරීම එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකයේ හැසිරීම සමඟ සමීප අනුගතවීමක් පෙන්නුම් කරන ලදී. වෙළඳපොළ මිල දර්ශක 2024 සිව්වන කාර්තුව

2.6 රූප සටහන: මිල දර්ශකවල විචලනයන් සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය



මූලය: කොළඹ කොටස් හුවමාරුව

2.7 රූප සටහන: කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය සහභාගිත්වය (ද්විතීයික වෙළඳපොළ)



මූලය: කොළඹ කොටස් හුවමාරුව

තුළ දී කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගත් අතර, දේශීය ආයෝජකයන්ගේ ඉහළ සහභාගීත්වය ඊට ප්‍රධාන දායකත්වයක් සපයන ලදී. ඒ අනුව, 2024 වසරේ තෙවන කාර්තුව දක්වා වාර්තා කළ 11.3%ක සහ 12.6%ක වර්ධනයන්ට සාපේක්ෂව, 2024 සිව්වන කාර්තුව තුළ දී, සමස්ත කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය පිළිවෙළින් 34.5%ක සහ 40.8%ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2024 වසර අවසානයේ දී කොටස් වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 5,695.6ක් ලෙස පැවතුණු අතර, එය 2023 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 4,248.9ක අගයට සාපේක්ෂව 34.1%ක ඉහළ යෑමකි. මේ අතර, 2024 වසර තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ රුපියල් මිලියන 2,240.2ක සාමාන්‍ය දෛනික පිරිවැටුමක් වාර්තා කළ අතර, එය 2023 වසර තුළ දී වාර්තා වූ රුපියල් මිලියන 1,696.2ක අගයට සාපේක්ෂව සැලකිය යුතු වැඩි වීමකි. කෙසේ වෙතත්, සාමාන්‍ය දෛනික ගනුදෙනු ප්‍රමාණය, 2023 වසරේ වාර්තා වූ ගනුදෙනු 14,972ට සාපේක්ෂව 2024 වසරේ දී ගනුදෙනු 14,684ක් දක්වා සුළු අඩු වීමක් පෙන්නුම් කළ අතර, 2024 වසරේ තෙවන කාර්තුවේ දී ආයෝජකයන්ගේ වෙළඳපොළ සහභාගිත්වය පහළ යෑම ඊට මූලික වශයෙන් හේතු විය.

කොළඹ කොටස් වෙළඳපොළ, මිල දර්ශකවලට සහ පිරිවැටුමට අදාළව කැපී පෙනෙන කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, ද්විතීයික වෙළඳපොළෙහි ශුද්ධ විදේශ ගලා යෑමක් වාර්තා විය. ඒ අනුව, 2023 වසර තුළ දී ද්විතීයික කොටස් වෙළඳපොළෙහි වාර්තා වූ රුපියල් බිලියන 4.3ක්, එනම් ආසන්න වශයෙන් ඒ. ජ. ඩොලර් මිලියන 13.3ක් වූ ශුද්ධ විදේශ ගලාවීමට සාපේක්ෂව, 2024 වසර තුළ දී රුපියල් බිලියන 9.9ක්, එනම් ආසන්න වශයෙන් ඒ. ජ. ඩොලර් මිලියන 32.6ක් වූ ශුද්ධ විදේශ ගලායෑම් වාර්තා විය. කෙසේ වෙතත්, රුපියල් බිලියන 20.3ක්, එනම් ආසන්න වශයෙන් ඒ. ජ. ඩොලර් මිලියන 65.5ක් වූ ප්‍රාථමික

කොටස් වෙළඳපොළෙහි ඉහළ විදේශ ගලාඒම්වල දායකත්වයෙන්, සමස්ත කොටස් වෙළඳපොළ ශුද්ධ විදේශ ගලා ඒමක් වාර්තා කරන ලදී.

කොළඹ කොටස් වෙළඳපොළෙහි අනාගත වර්ධන විභවය පිළිබඳ අයෝජකයන් තුළ පවතින ධනාත්මක අපේක්ෂාවන් පිළිබිඹු කරමින්, 2024 වසර තුළ මිල පොත් අගය (Price to Book Value) ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව, 2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ 0.9ක් ලෙස පැවති මිල පොත් අගය, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට 1.2ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2023 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පැවති 11.1ක අගයට සාපේක්ෂව, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට මිල ඉපැයීම් අනුපාතය (Price Earnings Ratio) 8.9ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2023 වසරේ දී නව කොටස් මූලික මහජන නිකුතු දෙකක් මගින් රැස් කරගත් රුපියල් බිලියන 0.8ට සාපේක්ෂව, 2024 වසර තුළ දී කොටස් වෙළඳපොළ නව කොටස් මූලික මහජන නිකුතු හතරක් සිදු කරමින් රුපියල් බිලියන 2.8ක් රැස් කරන ලදී.

සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

2024 වසරේ දී වාණිජ පත්‍ර (Commercial Papers) නිකුත් කිරීම 2023 වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, එමගින් වසර තුළ ශක්තිමත් කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී. 2024 වසර තුළ දී වාණිජ පත්‍ර නිකුත් කිරීම මගින් රුපියල් බිලියන 3.1ක් රැස් කරගත් අතර, 2023 වසරේ දී එම අගය රුපියල් බිලියන 1.3ක් විය. තවද, 2023 වසරේ දී වාර්තා වූ 17.00% සිට 26.50% දක්වා වූ පරාසයට සාපේක්ෂව, වාණිජ පත්‍රවල පොලී අනුපාතික 2024 වසර තුළ දී 12.00% සිට 13.75% දක්වා වූ පරාසයක විචලනය විය.

සාර්වමූල්‍ය තත්ත්වයන්ගේ යහපත් ප්‍රවණතා සමඟ හටගත් ආයෝජක ආකර්ෂණය වැඩි වීම හේතුවෙන්, 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී සාංගමික ණයකර වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කරන ලදී. 2023 වසරේ දී බැංකු පහක් විසින් කොළඹ කොටස් වෙළඳපොළ තුළ සාංගමික ණයකරවල මූලික නිකුතු 15ක් මගින් රුපියල් බිලියන 34.6ක් රැස් කරන ලදී. ඊට සාපේක්ෂව, 2024 වසර තුළ දී සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරමින්, සමාගම් නවයක් විසින් සාංගමික ණයකරවල මූලික නිකුතු 28ක් මගින් රුපියල් බිලියන 94.8ක් රැස් කරන ලදී. ස්ථාවර පොලී අනුපාතික සහිත ණයකර 2024 වසර තුළ දී නිකුත් කරන ලද අතර, පසුගිය වසරේ පැවති 13.50% සිට 29.50% දක්වා වූ පරාසයට සාපේක්ෂව, 2024 වසරේ දී එම පොලී අනුපාතික 12.00% සිට 15.25% දක්වා වූ පරාසයක පැවතුණි.

2.4 මූල්‍ය අන්තර්ගතභාවය

2024 වසරේ දී, රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඒ අනුව, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය (2021 - 2024) මත පදනම්ව, ඩිජිටල් මූල්‍යකරණ සහ ගෙවීම්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍යකරණ, පාරිභෝගික ආරක්ෂණය සහ මූල්‍ය සාක්ෂරතාවය යන කරුණු කෙරෙහි අවධානය යොමු කළ මහ බැංකුව, මූල්‍ය සාක්ෂරතාවය සහ අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය. තවද, මහ බැංකුව, එහි ප්‍රාදේශීය කාර්යාල සමඟ එක්ව 2024 වසරේ දී දීපව්‍යාප්ත මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් 400කට අධික ප්‍රමාණයක් පැවැත්වීය. 2024 වසරේ මැයි මාසයේ දී "මූල්‍ය පිරිපුන් බවින් යුත් ශ්‍රී ලංකාවක්" බිහි කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය එළි දැක්වීම ද සිදු විය. මෙම මාර්ගෝපදේශය යටතේ, රටපුරා මූල්‍ය සාක්ෂරතා පුහුණුකරුවන්ගේ ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා "මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සහතිකලත් පුහුණුකරු" නමින් නව වැඩසටහනක් හඳුන්වා දීමට නියමිත අතර "මූල්‍ය සාක්ෂරතා මාසය" 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත. මීට අමතරව, පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට මූල්‍ය කළමනාකරණය, ණය බර අඩු කිරීම, ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම, තිරසර මූල්‍ය හැසිරීම් අනුගමනය කිරීම සහ එමගින් මූල්‍ය අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට සහාය වීම යන අරමුණු ඇතිව ණය උපදේශන මධ්‍යස්ථානය නැවත ස්ථාපිත කිරීමට මහ බැංකුව කටයුතු කළේය.


2.5 මූල්‍ය යටිතල පහසුකම්

ගෙවීම් සහ පියවීම් පද්ධති

2024 වසර තුළ දී, රට තුළ පවතින ගෙවීම් සහ පියවීම් පද්ධති අඛණ්ඩව සුමට හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වූ අතර, වැඩි පිරිසක් ඩිජිටල් ගනුදෙනු වෙත යොමු වීම ද නිරීක්ෂණය කරන ලදී. තවද, චෙක්පත් වැනි සාම්ප්‍රදායික ගෙවීම් උපකරණවලට සාපේක්ෂව, විශාල සහ කුඩා වටිනාකම්වලින් යුත් ඩිජිටල් ගෙවීම් ක්‍රමවේද සඳහා මහජනතාවගේ අනුගතවීම අඛණ්ඩව වර්ධනය විය. මෙම වර්ධනයට ඩිජිටල් ගෙවීම් ක්‍රම මගින් ලබා දෙන පහසුව සහ ආරක්ෂාව හේතු වන ලදී. ඩිජිටල් ගෙවීම් ක්‍රම භාවිත කිරීම පිළිබඳ මහජන විශ්වාසය තවදුරටත් ඉහළ නැංවීම සඳහා, ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ උපදේශන කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය 2024 වසර තුළ දී පියවර කිහිපයක් ක්‍රියාත්මක කළ අතර, 2025 වසරේ මාර්තු 31 දින සිට බලපැවැත්වෙන පරිදි ජංගම ගෙවීම් යෙදුමකට ජංගම ගිණුමක් හෝ ඉතිරි කිරීමේ ගිණුමක් සම්බන්ධ කිරීමේ දී ජංගම දුරකථන අංකය සත්‍යාපනය කිරීම අනිවාර්ය කිරීම ඉන් එක් ප්‍රධාන පියවරක් විය.

2

2.8 රූප සටහන: කුඩා වටිනාකම් සහිත ගනුදෙනු



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

රටෙහි ක්ෂණික ගෙවීම් පද්ධතිය[10] වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch – CEFTS) හරහා විශාල වශයෙන් ඩිජිටල් ගනුදෙනු වෙත යොමු වීමක් 2024 වසර තුළ දී දක්නට ලැබුණි. මෙම යාන්ත්‍රණය හරහා සිදු කරන ලද කුඩා වටිනාකම් සහිත ඩිජිටල් ගෙවීම්වල වටිනාකම, සියලු අන්තර් බැංකු කුඩා වටිනාකම් සහිත ගෙවීම්වල වටිනාකමෙන් 50%ක් වූ අතර, එමගින් කුඩා වටිනාකම් සහිත ගෙවීම් සඳහා ක්ෂණික ගෙවීම් පද්ධතිය මත පදනම් වූ ගෙවීම් ක්‍රමවේද භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මහජනතාවට රාජ්‍ය ආයතන සඳහා ආදායම් බදු, රේගු බදු ආදිය ගෙවීමට හැකියාව ලබා දෙන ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LankaPay Online Payment Platform - LPOPP), QR කේත භාවිතයෙන් වෙළඳුන්ට ගෙවීම් සඳහා පහසුකම් සපයන LANKAQR සහ ජංගම ගෙවීම් යෙදුමකට ඕනෑම මූල්‍ය ආයතනයක ඇති ගනුදෙනුකරුවන්ගේ ජංගම හෝ ඉතිරි කිරීමේ ගිණුම් සම්බන්ධ කිරීමෙන් ගෙවීම් සිදු කිරීමට ඉඩ සලසන ජස්ට්පේ (JustPay) යනාදී ගෙවීම් ක්‍රම සඳහා ක්ෂණික ගෙවීම් පද්ධතිය හරහා පහසුකම් සැලසේ.

2024 වසර තුළ දී, ISO 20022 ප්‍රමිතියට අනුකූල වන නව තත්කාලීන දළ පියවීම් (Real Time Gross Settlement - RTGS) පද්ධතිය වන LankaRTGS හරහා වැඩි මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් සහ ඉහළ අවදානම් කළමනාකරණ හැකියාවන් හඳුන්වා දෙන ලදී. තවද, ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම යන දෙකෙහිම සිදු වූ පිළිවෙළින් 10.1%ක සහ 25.7%ක වාර්ෂික වර්ධනයෙන් පිළිබිඹු වන පරිදි, ගනුදෙනුකරුවන්ගේ විශාල වටිනාකම්න් යුතු ගෙවීම් සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතියේ භාවිතය තවදුරටත් ඉහළ යන ලදී.

වසර තුළ දී ජාතික ගෙවීම් යටිතල පහසුකම්, ජාත්‍යන්තර ගෙවීම් ජාල සමඟ ඒකාබද්ධ කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය යටතේ (LankaPay/UnionPay) සම-සන්නාමගත කාඩ්පතක් නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් වන යුනියන්පේ ඉන්ටර්නැෂනල් (UnionPay International) සමඟ සම්බන්ධ වීමට මහ බැංකුව විසින් සුළු පරිමාණ ගෙවීම් ජාල ක්‍රියාකරු වන ලංකාපේ පුද්ගලික සමාගම වෙත අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ලංකාපේ පුද්ගලික සමාගම හරහා දේශීය ගනුදෙනු සඳහා පහසුකම් සලසන ජාතික ගෙවීම් කාඩ්පත්, ජේ.සී.බී. ඉන්ටර්නැෂනල් හෝ යුනියන්පේ ඉන්ටර්නැෂනල් සමඟ සම-සන්නාමගත කළ හැකි වේ. ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය මගින් රටෙහි ගෙවීම් යටිතල පහසුකම් සඳහා වැඩි ස්වාධීනත්වයක් ගෙන දීමට සහ දේශීය ගෙවීම් සිදු කිරීමේ දී සේවා ගාස්තු ලෙස විදේශ විනිමය රටින් පිටතට ගලා යෑම අඩු කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, NEPALPAY සහ WeChat Pay වැනි ජංගම යෙදුම්වලට LANKAQR සමඟ සම්බන්ධ වීමට ද මහ බැංකුවේ අනුමැතිය හිමි විය. ඉන්දියාවේ Unified Payments Interface (UPI) සහ චීනයේ යුනියන්පේ ඉන්ටර්නැෂනල් සමඟ LANKAQR ඒකාබද්ධ කිරීම හරහා දැනටමත් ලබාගෙන ඇති ප්‍රවේශය මෙම නව සම්බන්ධතා මගින් පුළුල් කෙරෙන අතර, මෙම ඒකාබද්ධ ජාලවලට සම්බන්ධ ජංගම යෙදුම් භාවිතා කරන සංචාරකයින්ට ශ්‍රී ලංකාවේ දී තම ජංගම යෙදුම් භාවිතා කරමින් LANKAQR හරහා ගනුදෙනු බාධාවකින් තොරව සිදු කිරීමට පහසුකම් සපයයි. මීට අමතරව, අන්තර්ජාල වංචාවලින් පැන නගින අවදානම් සහ අලාභයන් අවම කිරීම සඳහා, ඩිජිටල් ගනුදෙනු සිදු කිරීමේ ආරක්ෂිත ක්‍රම පිළිබඳව මහජන දැනුම්වත්භාවය ඉහළ නැංවීමට මහ බැංකුව ගෙවීම් ක්ෂේත්‍රයේ අනෙකුත් හවුල්කරුවන් සමඟ ක්‍රියාකාරීව කටයුතු කළේය.

10 වේගවත් ගෙවීම් ලෙස ද හැඳින්වෙන ක්ෂණික ගෙවීම් පද්ධතිය, ගනුදෙනුකරුවන් අතර තත්කාලීනව අරමුදල් මාරු කිරීම කරනු ලබයි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

මූල්‍ය අංශයේ සුපිළිපන්භාවය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම (AML/CFT) පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව, 2024 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය, වාර්තා වී ඇති සැක කටයුතු ගනුදෙනු වාර්තා විශ්ලේෂණය කිරීම, නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් සමඟ මූල්‍ය බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීම සහ මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ රෙගුලාසිවලට මූල්‍ය සහ නම් කරන ලද මූල්‍ය නොවන ආයතනික අනුගත වීම සහතික කිරීම සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය මුදල් විශුද්ධිකරණයට එරෙහිව සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ රෙගුලාසිවලට අනුකූල නොවීම මත මූල්‍ය ආයතන හයකට සහ නම් කරන ලද මූල්‍ය නොවන ආයතනික ව්‍යාපාරයක් සඳහා රුපියල් මිලියන 8.75ක දඩ මුදල් පැනවීය. තවද, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව, ඊට අදාළ ජාතික සම්බන්ධීකරණ අංශය වන මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණ කමිටුව (National Coordinating Committee) මගින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබීය. මහ බැංකු අධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් මෙම ජාතික සම්බන්ධීකරණ කමිටුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිපත්තිමය මග පෙන්වීමක් සැපයීම සහ පාර්ශ්වකරුවන් අතර ජාතික මට්ටමේ සම්බන්ධීකරණය සඳහා පහසුකම් සලසයි. ඊට අමතරව, සමාලෝචනයට භාජනය වන වසර තුළ, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2005 අංක 25 දරන ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනත සහ 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යන පනත් සඳහා වූ සංශෝධන අවසන් කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය අඛණ්ඩව කටයුතු සිදු කරන ලදී. එමෙන්ම, අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත, 2007 අංක 07 දරන සමාගම් පනත සඳහා වූ සංශෝධන කෙටුම්පත, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචිය හා අධීක්ෂණය කිරීමේ) පනත සඳහා වූ සංශෝධන සහ සූදු නියාමන අධිකාරී පනත් කෙටුම්පත ඇතුළු නව අණ පනත් සමාලෝචනය කර සංශෝධන කිරීම සඳහා පැවති නීති කෙටුම්පත් කමිටුවලට ද මූල්‍ය බුද්ධි ඒකකය ක්‍රියාකාරීව සහභාගී විය. ඊට අමතරව, නිශ්චල දේපළ මිලට ගැනීම සහ විකිණීමට අදාළ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන කාර්ය සාධක බලකායට ද මූල්‍ය බුද්ධි ඒකකය දායක විය.

මූල්‍ය අංශයට අදාළ නීති ප්‍රතිසංස්කරණ

මහ බැංකුව, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නීතිමය ප්‍රතිසංස්කරණවල අඛණ්ඩව නිරත විය. 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම අරමුණු කරගනිමින් 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත නීතිගත කරන ලද අතර, එය 2024 ජූනි 15 දින සිට බලාත්මක විය. තවද, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත කෙටුම්පත් කිරීම සඳහා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත අවශ්‍ය සහාය ලබා දෙන ලද අතර, ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත සහ මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පිළිබඳ පනත යන පනත් කෙටුම්පත් කිරීමේ දී ද ඊට අවශ්‍ය සහාය ලබා දීමට කටයුතු කරන ලදී. තවද, 2024 වසරේ දී මහ බැංකුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත, 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යන පනත්වලට අදාළව සංශෝධන කෙටුම්පත් කිරීම ආරම්භ කරන ලදී.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

2024 වසර තුළ දී මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් ප්‍රධාන ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි, 2024 වසරේ අගෝස්තු 09 වන දින සිට පූර්ණ වශයෙන් බලාත්මක විය. මීට සමගාමීව, අවදානම් මත පදනම් වූ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණයට අදාළව, පූර්ණ විෂය පථයම ආවරණය වන පළමු වතැන් පරීක්ෂණය 2024 වසරේ දෙවැනි කාර්තුවේ දී සිදු කරන ලදී. තවද, ඉහළ ණය අනුපාත, අධික ගාස්තු හා අයකිරීම් සහ මූල්‍ය සේවා සපයන්නන් විසින් පනවන ලද කොමිස් වැනි ක්ෂේත්‍රයන් ඉලක්ක කොටගෙන, සීමිත විෂයපථයක් ආවරණය වන වතැන් පරීක්ෂණ කිහිපයක් 2024 වසරේ තෙවන කාර්තුවේ දී සිදු කරන ලදී. එමෙන්ම, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය පාරිභෝගිකයන් හා මූල්‍ය සේවා සපයන්නන් සඳහා ඔවුන්ගේ අයිතිවාසිකම්, වගකීම් සහ යහපත් පරිචයන් පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවන් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී. සමස්තයක් ලෙස, මෙම ක්‍රියාමාර්ග මගින් විනිවිදභාවය

2

වැඩිදියුණු වීම, පාරිභෝගිකයන්ගේ අභිලාෂයන් ආරක්ෂා කිරීම සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ඵලදායීව ක්‍රියාත්මක කිරීම මෙන්ම, මූල්‍ය අංශය තුළ මූල්‍ය පාරිභෝගිකයා කේන්ද්‍ර කොටගත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සිදු විය.

තැන්පතු රක්ෂණ සහ නිරාකරණ අධිකාරිය

මහ බැංකුව විසින් බැංකු සහ මුදල් සමාගම් සඳහා වන නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය වැදගත් පියවර ගන්නා ලදී. 2023 වසර අග භාගයේ දී 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීමෙන් අනතුරුව, නිරාකරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම, බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ ප්‍රේරක සහ නිරාකරණ සැලසුම්කරණ ක්‍රියාවලියට සහාය වීමට සම්මත දත්ත ආකෘති නිර්මාණය කිරීම ඇතුළු නිරාකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම කෙරෙහි මහ බැංකුවේ අවධානය යොමු විය. මීට අමතරව, නිරාකරණ ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම සහ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා රජයේ මූලික ප්‍රතිපාදන සහිතව මූල්‍ය ස්ථායීතා අරමුදලක් ද පිහිටුවන ලදී.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි පරිපාලක ලෙස, බැංකු (විශේෂ විධිවිධාන) පනතෙහි විධිවිධාන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව කටයුතු කළේය. මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මූල්‍ය පසුගාමී අරමුදල් සැකසුම (Fiscal back stop funding arrangement) පිහිටුවීම වෙනුවෙන් මහ බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹුණි. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය හා ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා, ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියක් සමඟ මහ බැංකුව සම්බන්ධ විය. මෙම ව්‍යාපෘතිය යටතේ, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුදල් අමාත්‍යාංශය[11] සහ මහ බැංකුව ණය ගිවිසුම් කිහිපයකට එළඹුණි. 2024 වසරේ දෙසැම්බර් මාසය වන විට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ඒ. ජ. ඩොලර් මිලියන 100ක මුදලක් මුදාහරින ලද අතර, එය ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට අයත් ඒ. ජ. ඩොලර්වලින් නාමනය කරන ලද ආරක්ෂිත සංවෘත ගිණුමක (Ring-Fenced) පවත්වා ගෙන යනු ලැබේ. මීට සමගාමීව, මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි විසර්ජක කොන්දේසි ලෙස පවතින ප්‍රතිපත්ති පාදක වැඩිදියුණු කිරීම් සහ ආයතනික ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම් කිහිපයක, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නිරත වී සිටියි. 2024 වසර අවසන් වන විට, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි හිමිකම් වශයෙන්, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදල ලෙස රුපියල් බිලියන 136.9ක් සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් සංචිත ලෙස රුපියල් බිලියන 11.8ක් පැවතුණි.

නවද, බලපත්‍ර අවලංගු කළ මුදල් සමාගම් සඳහා වන්දි ගෙවීම් සම්බන්ධ කටයුතුවල ද මහ බැංකුව නිරත විය. බලපත්‍ර අවලංගු කරන ලද සහ අත්හිටුවන ලද මුදල් සමාගම් තුනක තැන්පත්කරුවන් සඳහා 2024 වසර තුළ දී රක්ෂණ වන්දි ගෙවීම් මහ බැංකුව සාර්ථකව නිම කර ඇති අතර තවත් එක් සමාගමක් සඳහා රක්ෂණ වන්දි ගෙවීම් තවදුරටත් සිදුකරමින් පවතී. මෙම ගෙවීම්වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට ක්‍රියාත්මක කරනු ලබන තැන්පත්කරුවන්ගේ දත්ත රැස් කිරීමේ පද්ධතිය මේ වන විට සියලුම මුදල් සමාගම් තුළ සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර, එය බලපත්‍රලාභී බැංකු වෙත ක්‍රමානුකූලව ක්‍රියාත්මක කරමින් පවතී. මෙම පද්ධතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම පිළිබඳ උපදෙස් ලබා දී ඇත.

2.6 තිරසර මූල්‍ය

තිරසර මූල්‍ය පෙරදැක්ම ක්‍රියාත්මක කිරීම තුළින් තිරසර මූල්‍යකරණ කාර්යයන් අඛණ්ඩව සිදු කිරීමට 2024 වසර තුළ දී මහ බැංකුව සමත් විය. මෙම තිරසර මූල්‍ය පෙර දැක්ම 2019 වසරේ දී දියත් කර මේ වන විට වසර පහක් ගතවී ඇති බැවින්, ඉදිරි වසර පහක කාලය සඳහා තිරසර මූල්‍ය පෙරදැක්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා මහ බැංකුව 2024 වසරේ මැයි මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව (International Finance Corporation) සමඟ ගිවිසුමකට එළඹුණි. මෙම ගිවිසුම යටතේ, තිරසරභාවය හා බැඳුනු සමාජීය අංශ කෙරෙහි අවධානය යොමු කෙරෙන, මූල්‍ය අංශය සඳහා වන තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0හි සමාලෝචන ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින අතර, 2025 වසරේ පළමු භාගයේ දී දියත් කිරීමට අපේක්ෂා කෙරේ. මහ බැංකුව, තිරසර මූල්‍යකරණය සහ දේශගුණික විපර්යාස ආශ්‍රිත මූල්‍ය අවදානම් පිළිබඳ දැනුම ඉහළ නංවා ගැනීමේ අරමුණින්, වසර තුළ දී දැනුම හුවමාරු හා කුසලතා වර්ධන වැඩසටහන් රාශියකට සම්පත්දායකයෙක් සහ සහභාගිවන්නෙක් යන දෙආකාරයෙන්ම සම්බන්ධ විය. තිරසර බැංකු සහ මූල්‍ය ජාලය (Sustainable Banking and Finance Network), තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර වේදිකාව (International Platform for Sustainable Finance) සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානය (Alliance for Financial Inclusion) යන ත්‍රිත්වයෙහි ම සාමාජිකත්වය දරන මහ බැංකුව, 2024 වසරේ දී තිරසර

11 ගිවිසුම් අත්සන් තබන අවස්ථාවේ මෙම අමාත්‍යාංශය, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ලෙස පැවතුණි.

බැංකු සහ මූල්‍ය ජාලයේ ගෝලීය ප්‍රගති සංක්ෂිප්තය, තිරසර මූල්‍ය සඳහා වන ජාත්‍යන්තර වේදිකාවේ නිත්‍ය රැස්වීම් සහ මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සන්ධානයේ හරිත මූල්‍ය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් යනාදියට සහභාගී වෙමින් ජාත්‍යන්තර සහයෝගීතාවය අබණ්ඩව පවත්වා ගෙන ගියේය. තවද, මහ බැංකුව 2024 වසරේ දී ශ්‍රී ලංකාව තුළ තිරසර මූල්‍යකරණය ප්‍රවලිත කිරීමේ අරමුණින් මූල්‍ය ක්ෂේත්‍රය සමඟ අබණ්ඩව සාකච්ඡා පැවැත්වූ අතර, විශේෂයෙන් ආයතනික අංශයේ වාණිජ මණ්ඩල සහ රාජ්‍ය ප්‍රතිපත්ති සඳහා වූ චින්තන පර්ශද සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදී.

2

2

3 පරිච්ඡේදය

මහ බැංකුවේ ප්‍රතිපත්ති පිළිබඳ සමාලෝචනය

සාරාංශය

මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීම සහ එමඟින් ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම කෙරෙහි 2024 වසරේ දී මහ බැංකු ප්‍රතිපත්ති මඟින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලදී. ඉල්ලුම සහ සැපයුම් අංශවල පැවති පීඩන අඩුවීම, බාහිර අංශයේ කාර්ය සාධනය වැඩිදියුණු වීම සහ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා මධ්‍යයේ, 2024 වසරේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික තුන් වරක් අඩු කිරීමත් සමඟින් මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය නවවැදුරටත් ලිහිල් කළේය. ලිහිල් වූ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ලිහිල් මුදල් තත්ත්වයන්ට අනුකූලව, 2024 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික නවවැදුරටත් පහත වැටුණු අතර, එමඟින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සාපේක්ෂ අඩු පොලී අනුපාතික යටතේ ණය ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසුණු බැවින් පුද්ගලික අංශයේ ණය ප්‍රසාරණය වේගවත් වීමට සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමට සහාය ලැබුණි. වසර තුළ දී උද්ධමනය අඩු මට්ටමක පැවති අතර, බලශක්ති මිල ගණන් කිහිප වරක් අඩු කිරීම හේතුවෙන් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට අවධමනකාරී තත්ත්වයක් ඇති විය. ඒ අනුව, කාර්තුමය මතුපිට උද්ධමනය 2024 වසරේ අවසාන කාර්තු තුන තුළ දී මුදල් ප්‍රතිපත්ති රාමු ඉවිසුමෙහි සඳහන් කර ඇති ආන්තිකයට වඩා පහළින් පැවති බැවින්, උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම සහ එය නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරමින් ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළ අතර, එමඟින් පාර්ලිමේන්තුව සහ මහජනතාව වෙත මහ බැංකුවේ වගවීම සහතික කෙරුණි. කෙසේ වෙතත්, 2025 වසරේ දී උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මිල ගණන් අබණ්ඩව පහත වැටීම ආර්ථික ක්‍රියාකාරකම් අධෛර්යමත් කරන බැවින්, උද්ධමනය දිගු කාලීනව අඩු සහ ස්ථාවර මට්ටමක පැවතීම ගෘහ ඒකක සහ ව්‍යාපාරවලට හිතකර වේ. මහ බැංකුවේ උද්ධමන ඉලක්කකරණ රාමුවේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, මුදල් ප්‍රතිපත්ති වෙළඳපොළ වෙත දැනුම් දීම වඩා ශක්තිමත් කිරීමේ සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකින් තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට මාරු විය. මුදල් ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් බැංකුවේ විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම සඳහා 2024 වසර තුළ දී මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති වාර්තා දෙකක් සහ මුදල් මෙහෙයුම් වාර්තාවක් ප්‍රකාශයට පත් කරන ලදී. මේ අතර, මහ බැංකුව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය අබණ්ඩව ක්‍රියාත්මක කළේය. විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන අවම කිරීම සහ රටේ බාහිර ස්ථාරක්ෂක වර්ධනය කිරීම සඳහා පමණක් මහ බැංකුවේ විදේශ විනිමය වෙළඳපොළ මැදිහත්වීම් සීමා විය. 2020 - 2022 කාලය තුළ දී අර්බුද කළමනාකරණ උපාය මාර්ගයේ අංගයක් ලෙස මහ බැංකුව සහ රජය විසින් පනවන ලද ආනයන සීමා කිරීම්, විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ පියවර වැනි විදේශීය අංශයට අදාළ පරිපාලන ක්‍රියාමාර්ග, වර්ධනය වූ විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්ව සහ සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවති විදේශීය අංශය සැලකිල්ලට ගනිමින්, 2024 වසරේ දී නවවැදුරටත් ක්‍රමානුකූලව ඉවත් කරන ලදී. මූල්‍ය අංශය සම්බන්ධයෙන් ගත් කල, බලපත්‍රලාභී බැංකු පාලනය සඳහා වන නීතිමය රාමුව ශක්තිමත් කරමින්, 2024 වසරේ අප්‍රේල් මාසයේ දී 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කරන ලදී. බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන යන දෙඅංශය ම සඳහා අවදානම් කළමනාකරණය සහ ආයතනික යහපාලනය සම්බන්ධයෙන් නියාමන පියවර මාලාවක් මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලදී. අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම අපේක්ෂාවෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ සැලැස්මෙහි දෙවන අදියරය 2024 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. මේ අතර, අර්බුදයට ලක් වූ ව්‍යාපාරවලට යළි නැඟී සිටීමට සහනයක් සැපයීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම පිණිස මහ බැංකුව බලපත්‍රලාභී බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කළේය. ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා, රටේ සාර්ව විවක්ෂණ අධිකාරිය ලෙස, මහ බැංකුව සාර්ව විවක්ෂණ ප්‍රතිපත්ති රාමුව ප්‍රකාශයට පත් කළේය. බලපත්‍රලාභී බැංකු සම්බන්ධයෙන් නිරාකරණ සැලසුම් සහ රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව 2024 වසර තුළ දී කැපී පෙනෙන ප්‍රයත්න දැරුවේය. සමාජයේ සියලුම කොටස්වල මූල්‍ය සාක්ෂරතාවය සහ හැකියාවන්

වර්ධනය කිරීමේ අරමුණින්, 2024 වසරේ මැයි මාසයේ දී මහ බැංකුව විසින් ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය දියත් කරන ලදී. තවද, ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීමට සහ එවැනි ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව වැඩි දියුණු කිරීමට මහ බැංකුව නොයෙකුත් පියවර ගත් අතර, ඵලදායීතාව වැඩි කිරීම සඳහා ආර්ථිකයේ ඩිජිටල්කරණ ප්‍රයත්නවලට මෙයින් දායකත්වය ලැබුණි. මෙයට අමතරව, 2024 වසරේ අගෝස්තු වන විට මහ බැංකුව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි සම්පූර්ණයෙන් ම බලාත්මක කළ අතර, එමඟින් රට තුළ මූල්‍ය සේවාවන්හි විනිවිදභාවය, සාධාරණත්වය සහ වගවීම තහවුරු කිරීම සඳහා වන රාමුව ශක්තිමත් කරන ලදී. 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීමත් සමඟ මහ බැංකුව විසින් සිදු කරනු ලබන රාජ්‍ය ණය කළමනාකරණ කාර්යයන් මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද නව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලයට ක්‍රමයෙන් පැවරීම මේ වන විට සිදු කෙරේ. මූල්‍ය අංශයේ විශ්වසනීය බව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය ජාත්‍යන්තර මුදල් විශුද්ධිකරණය වැළක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රමිතීන්ට අනුකූලව අබණ්ඩව ක්‍රියාත්මක විය.

3

3.1 මුදල් ප්‍රතිපත්ති රාමුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යෑම මහ බැංකුවේ මූලික අරමුණ වන අතර නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය එහි මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස දක්වයි. මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකු පනත මඟින් මුදල් ප්‍රතිපත්තිය සැකසීමට සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මහ බැංකුවට පැවරී ඇත. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි මහ බැංකුව විසින් සපුරා ගැනීමට අවශ්‍ය උද්ධමන ඉලක්කය පිළිබඳව මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා එකඟතාවයකට එළඹ ඇත. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මහ බැංකුව විසින් කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක ඉලක්කගත අගයක පවත්වා ගැනීම අවශ්‍ය වේ. උද්ධමන ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත දිශානතිය ඔස්සේ මෙහෙයවීමට මහ බැංකුව සිය ප්‍රතිපත්ති උපකරණ භාවිතා කරයි.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රියාත්මක කරන ලද වැඩිදියුණු කිරීමක් ලෙස, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුව එහි ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත ප්‍රවිෂ්ට විය. ඒ අනුව, මූල්‍ය වෙළඳපොළ සහ සමස්ත ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්තිය නිවේදනය කිරීමේ සහ සම්ප්‍රේෂණය කිරීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුවේ ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දෙන ලදී.[1] නව ක්‍රමවේදය යටතේ ද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස අබණ්ඩව පවතී. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට අවතීර්ණ වීමත් සමඟ, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රකාශිත එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමට මහ බැංකුව අදහස් කරයි. මෙම වෙනස් කිරීමත් සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ. කෙසේ වෙතත්, ඒවා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් සඳහා අදාළ වන පොලී අනුපාතික ලෙස අබණ්ඩව පවතිනු ඇති අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් අනුපාතික සඳහා පහළ සහ ඉහළ සීමා ලෙස ක්‍රියා කරයි. මේ අතර, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය කලින් තීරණය කළ ආන්තිකයකින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ වී ඇති අතර, දැනට එය පදනම් අංක ±50ක් ලෙස නිර්ණය කර ඇත. ඒ අනුව, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමත් සමඟ, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස නිර්ණය කරන ලද අතර, මුදල් වෙළඳපොළ මෙහෙයුම් කටයුතු ඉහත වෙනස් කිරීමට පහසුකම් සලසන ලෙස වෙනස් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ ක්‍රමයෙන් අනුකූල වූ අතර අනතුරුව එක්දින ප්‍රතිපත්ති අනුපාතිකයෙහි හෝ ඊට ආසන්නයේ පැවතුණි.

මහ බැංකු අරමුණු ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වය වැඩිදියුණු කිරීමට පහසුකම් සපයන අතර ම, මහ බැංකුව විසින් ඉහළ විනිවිදභාවයක් සහ මහජන වගවීමක් පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි අවශ්‍යතාවයකි. මිල ස්ථායීතාව සම්බන්ධයෙන්, මහ බැංකුව උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වුවහොත්,[2] ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය

1 පහත සබැඳිය තුළින් https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/statistics/otherpub/concept_note_on_opr_e.pdf තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය පිළිබඳ විස්තරාත්මක සටහන වෙත ප්‍රවේශ විය හැකිය.

2 කාර්තුමය සාමාන්‍ය (වාර්ෂික ලක්ෂ්‍යමය) මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම්ව) අබණ්ඩව කාර්තු දෙකක් සඳහා ඉලක්කගත අනුපාතිකයෙන් ප්‍රතිශතාංක ±2 ආන්තිකයකින් අපගමනය වීම

යුතුය. උද්ධමන ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වීමට හේතු, මහ බැංකුව විසින් ගනු ලබන ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ උද්ධමන ඉලක්කය සපුරා ගනු ලබන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් වාර්තාවේ දක්වා තිබිය යුතුය.[3] තවද, උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා, උද්ධමනයට බලපාන සාධක, උද්ධමනය සඳහා මැදි කාලීන පුරෝකථන සහ එවැනි පුරෝකථන සඳහා ඇති මූලික අවදානම්, සමඟ ම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පැහැදිලි කරන ද්විවාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි අවශ්‍යතාවයකි. මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා, මහ බැංකුව සෑම වසරක ම පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කරයි. තවද, මහ බැංකුවේ කාර්යයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා අධිපතිවරයා, පාලක මණ්ඩල සහ මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් සහ නියෝජ්‍ය අධිපතිවරු පාර්ලිමේන්තුවට හෝ එහි කමිටුවලට කැඳවිය හැකිය. මෙම අවශ්‍යතාවය සපුරාලීමේ දී, එවැනි කමිටුවල ඉල්ලීම පරිදි පාර්ලිමේන්තු කමිටුවලට නිලධාරීන් සහභාගී වීමට අමතරව, 2024 වසරේ සැප්තැම්බර් සහ 2025 වසරේ ජනවාරි මාසවල දී මහ බැංකුවේ කාර්යයන් පිළිබඳව පාර්ලිමේන්තුව සහ/හෝ එහි කමිටු දැනුම්වත් කිරීම සඳහා පාලක මණ්ඩල හා මුදල් ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් සහ මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ඉඩ ප්‍රස්ථා ලබා ගන්නා ලදී. එපමණක් නොව, රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීමේ අරමුණෙන් ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ සම්බන්ධීකරණ සභාව පිහිටුවා ඇත. මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා, ඉදිරි දැක්ම සහ අවදානම් පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීමට මෙන්ම මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීමට සම්බන්ධීකරණ සභාව කාර්තුමය වශයෙන් රැස්වේ.

3.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ක්‍රියාමාර්ග

2023 වසර අවසාන භාගයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස ලිහිල් කිරීම අනුව යමින් 2024 වසර තුළ දී ද මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කරන ලදී. ආර්ථික කටයුතු සාපේක්ෂව පහළ මට්ටමක පැවතීම මධ්‍යයේ උද්ධමනය අඩු වීම, උද්ධමන අපේක්ෂා මනාව පාලනය වීම, දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම මගින් 2024 වසර තුළ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් ලැබුණි. 2023 වසර අවසාන භාගයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් සැලකිය යුතු ලෙස අඩු කිරීම සහ ඉහළ මට්ටමක පැවති වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු කිරීමට අවශ්‍ය පුළුල් මාර්ගෝපදේශ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කිරීම හේතුවෙන් සමස්ත පොලී අනුපාතික ව්‍යුහය පහළ ගියේය. එහෙත්, පොලී අනුපාතික, විශේෂයෙන් වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ යෑමේ වේගයේ යම් මන්දගාමී වීමක් පෙන්නුම් කෙරිණි. අඩු උද්ධමන පරිසරය සහ උද්ධමන ඉදිරි දැක්මට අනුකූලව වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් පහළ යෑම සඳහා ඇති අවකාශය සලකා බැලීමෙන් අනතුරුව, මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික 2024 මාර්තු මාසයේ දී පදනම් අංක 50කින් අඩු කළ අතර, 2024 ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් තවදුරටත් අඩු කළේය. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් ණය ගැනීමේ පිරිවැය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එමගින් පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය ශීඝ්‍රයෙන් ප්‍රසාරණය වීමට සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය සැලසිණි. ඉන් අනතුරුව, වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම මන්දගාමී වීම, උද්ධමන ඉදිරි දැක්ම සහ උද්ධමන අපේක්ෂා අඩු මට්ටමක පැවතීම හේතුවෙන් 2024 නොවැම්බර් මාසයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සුපරීක්ෂාකාරී ලෙස තවදුරටත් ලිහිල් කිරීමට මහ බැංකුව කටයුතු කළේය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමු වීම පිළිබිඹු කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමත් සමඟ මුදල් ප්‍රතිපත්තිය පදනම් අංක 50කින් පමණ ලිහිල් කිරීමක්[4] සිදු විය. ඒ අනුව, 2024 වසර අවසානය වන විට පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති චක්‍රය තුළ ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ සමස්ත අඩු කිරීම පදනම් අංක 775ක් පමණ විය.

2024 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළ සමස්ත ද්‍රවශීලතාව අතිරික්ත මට්ටම්වල පැවතුණ ද එහි අසමමිතික ව්‍යාප්තිය හේතුවෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අරමුදල් සැපයීම සඳහා මහ බැංකුව විවෘත වෙළඳපොළ කටයුතු අඛණ්ඩව සිදු කළේය. බලපත්‍රලාභී වාණිජ බැංකු නිත්‍ය පහසුකම් සඳහා වැඩි වශයෙන් යොමු වීම වැළැක්වීම පිණිස 2023 ජනවාරි සිට නිත්‍ය පහසුකම් භාවිතා කිරීම මත පනවන ලද සීමා 2024 වසරේ මුල් කාලයේ දී ඉවත් කරන ලදී. මෙය වැඩිදියුණු වූ වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව සහ වෙළඳපොළ ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් සිදු කරන ලදී. ඒ අනුව, 2024 පෙබරවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය ණය පහසුකම භාවිතය සඳහා පනවා තිබූ සීමාව ඉවත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම සඳහා වූ සීමාව මාසයක් තුළ පස් වතාවක සිට දස වතාවක් දක්වා ලිහිල් කරන ලද අතර, පසුව 2024 අප්‍රේල් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි එම සීමාව ඉවත් කරන

3 උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනයේ අපගමනයන් සම්බන්ධයෙන්, මහ බැංකු පනතෙහි 26(5) වගන්තිය යටතේ අවශ්‍ය වාර්තා වෙත මහ බැංකු වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවිෂ්ට විය හැකිය.

4 ප්‍රතිපත්ති වෙනස් කිරීමට පෙර වාර්තා වූ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අතර වෙනස මගින් ගණනය කර ඇත.

3

විශේෂ සටහන 3
තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම

හැඳින්වීම

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩිදියුණු කිරීම්වල තවත් අංගයක් ලෙස, 2024 නොවැම්බර් 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව මෙතෙක් පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ සිට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමු විය.[1] ඒ අනුව, මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම්දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එහි ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) හඳුන්වා දුන්නේය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම තුළින් මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සරල කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අරමුණු කෙරේ.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක අවශ්‍යතාවය

ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ව්‍යවහාර මුදල් මණ්ඩල ක්‍රමයේ සිට, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ විධිමත් ලෙස පිළිගෙන ඇති වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව වන, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය දක්වා ඉදිරියට පැමිණ ඇත. මෙම පනත මගින් දේශීය මිල ස්ථායිතාව පවත්වා ගැනීම මහ බැංකුවේ ප්‍රධාන අරමුණ ලෙස පිළිගෙන ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි සාර්ථකත්වය බොහෝ දුරට රඳා පවතින්නේ ප්‍රතිපත්ති වෙනස්කම් ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම සහ උද්ධමන අපේක්ෂාවන් මනාව පාලනය වීම මතය. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට පැහැදිලි ලෙස දැනුම්දීම මෙම කාරණා ද්විත්වය කෙරෙහි බලපානු ලබයි. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් සහිත ප්‍රතිපත්ති උපකරණයක් මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා වඩාත් සුදුසු වේ.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හඳුන්වාදීමට පෙර මහ බැංකුව විසින් ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික සහිත කොරිඩෝ ක්‍රමයක් යටතේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් සිදු කරන ලදී. එහි ඉහළ සීමාව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) සහ පහළ සීමාව නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) විය. මෙම කොරිඩෝව මගින් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස සලකනු ලබන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)[2] මෙහෙයවන ලදී. කෙසේ වෙතත්, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළට ගලායාමේ විනිවිදභාවය අඩුවීම සහ සංකීර්ණත්වය වැනි දුර්වලතා ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණි. ප්‍රතිපත්ති පොලී අනුපාතික දෙකක් භාවිතා කරමින් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ප්‍රකාශයට පත් කිරීම සහ අන්තර් බැංකු මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකය, එනම් බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පොලී අනුපාතික කොරිඩෝව තුළ විචලනය වීම වෙළඳපොළ සහභාගිවන්නන් අතර යම් අවිනිශ්චිතතාවයක් ඇති කරන ලදී. තවද, පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ස්ථානගත කළ යුත්තේ කොතැනද යන්න සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්කම් මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් ලෙස සැලකිය හැකිද යන්න පිළිබඳ පැහැදිලි භාවයක් නොතිබුණි. මෙම විනිවිදභාවය අඩුකම හේතුවෙන් වෙළඳපොළ සහභාගිවන්නන්ට මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති අභිප්‍රායන් නිවැරදිව අර්ථ නිරූපණය කිරීම ඇතැම්විට සංකීර්ණ වන්නට ඇත.

තවද, මූල්‍ය ආයතනයන්හි තැන්පතු සහ ණය පොලී අනුපාතික නියම කිරීම සඳහා ප්‍රධාන පදනම් දර්ශකයක් ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික භාවිතා කිරීම හේතුවෙන්, ප්‍රතිපත්ති පොලී අනුපාතික කිහිපයක් පැවතීම මූල්‍ය උපකරණ මිලකරණයේ සංකීර්ණතාවයන්ට හේතු වන්නට ඇත. ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ පැවති මෙම සංකීර්ණතා හේතුවෙන් ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්වලට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතිකවල වෙනස් වීම මන්දගාමී වීමට හැකියාව පැවති අතර, එමගින් මුදල් ප්‍රතිපත්තිය හරහා ආර්ථිකයට සිදුකළ හැකි බලපෑමේ ප්‍රමාණය අඩු විය.

ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ දැනුම්දීම සහ සන්නිවේදනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සලකා බලමින්, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව කරා යොමුවීම සඳහා වන ඉදිරි දැක්ම අනුව, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා කටයුතු ආරම්භ කිරීමට මහ බැංකුව පියවර ගත්තේය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය කරා යොමුවීමේ මූලික පියවර ලෙස මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික මගින් නිර්මාණය වූ පොලී අනුපාතික කොරිඩෝවේ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කළේය. තවද, ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණය හරහා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමක පවත්වා ගෙන ගිය අතර, එමගින් මහ බැංකුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් කරා පහසුවෙන් යොමු වීමට සහාය ලැබුණි. ඉන් අනතුරුව, ජාත්‍යන්තර වශයෙන් ප්‍රශස්ත භාවිතයන් අනුව යමින්, ප්‍රතිපත්ති මට්ටමේ සාකච්ඡා සහ පාර්ශ්වකරුවන් සමඟ සිදු කරන ලද සාකච්ඡාවලින් පසුව, මහ බැංකුව 2024 නොවැම්බර් මාසයේ දී තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හඳුන්වා දුන්නේය.

---

1 මෙම ප්‍රතිපත්ති වෙනස්කම් පිළිබඳ වැඩි විස්තර සඳහා "ශ්‍රී ලංකා මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දෙමින් තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරයි" යන මාධ්‍ය නිවේදනය සහ https://www.cbsl.gov.lk/sites/default/files/concept_note_on_opr_e.pdf හි තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ විස්තරාත්මක සටහන බලන්න

2 බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය යනු සලකා බලන දිනයකදී බලපත්‍රලාභී වාණිජ බැංකු අතර එක්දින පදනම් මත සුරැකුම් රහිතව සිදු කරනු ලබන අන්තර් බැංකු ඒක්ෂණ මුදල් ගනුදෙනු මත බර තබන ලද පොලී අනුපාතිකයයි.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක ප්‍රතිලාභ

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම මගින් ප්‍රතිලාභ ගණනාවක් අත්වන අතර, එමඟින් මුදල් ප්‍රතිපත්තියේ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස ඉහළ නංවනු ලබයි. මූල්‍ය වෙළඳපොළවලට පැහැදිලි සහ ස්ථාවර සංඥා ලබා දීමෙන්, ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ අවිනිශ්චිතභාවය අඩු කෙරෙන අතර, වෙළඳපොළ සහභාගිවන්නන්ට වැඩි විශ්වාසයකින් යුතුව දැනුම්වත් තීරණ ගැනීමට පහසුකම් සපයයි. මෙම වැඩිදියුණු වූ විනිවිදභාවය මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය ශක්තිමත් කරන අතර, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් කෙටි කාලීන පොලී අනුපාතික වෙතට සහ එමඟින් ආර්ථිකය වෙත ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම සහතික කරයි.

තවද, පදනම් පොලී අනුපාතිකය ලෙස ක්‍රියා කරන තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකයක් තිබීම මගින් මූල්‍ය ආයතනවලට තම මූල්‍ය උපකරණ වඩාත් නිරවද්‍යතාවයකින් මිල කළ හැකි අතර, වෙළඳපොළ පොලී අනුපාතිකවල විෂමතා නිර්මාණය වීම අවම කරයි. මෙමඟින්, මූල්‍ය පද්ධතිය තුළ අරමුදල් ගලා යෑම වැඩි කිරීම, වඩා හොඳ ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැපයීම, සහ පුරෝකථනය කළ හැකි පොලී අනුපාතික පරිසරයක් නිර්මාණය වීම සිදු වන අතර එය ආයෝජක විශ්වාසය වර්ධනය සඳහා වැදගත් වේ.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ මෙහෙයුම් ක්‍රියාවලිය


තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයේ මෙහෙයුම් රාමුව, කෙටි කාලීන පොලී අනුපාතික මනාව පාලනය කිරීම හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම සඳහා නිර්මාණය කර ඇත. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රකාශිත එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මට්ටමේ හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමට මහ බැංකුව ඉලක්ක කරයි. තවද, මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් අවශ්‍ය පරිදි එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වරින් වර සමාලෝචනය කර වෙනස් කරනු ඇත.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයට යොමුවීමෙන් පසුව, ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය යටතේ මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකන ලද නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලැබේ. කෙසේ වෙතත්, මහ බැංකුව සමඟ එක්දින ගනුදෙනු සඳහා සහභාගීවන ආයතන සඳහා නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතික ලෙස, පිළිවෙළින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තව දුරටත් පවතිනු ඇත.[3] මෙයට අමතරව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, මහ බැංකුව විසින් තීරණය කරන ලද ආන්තිකයන් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා සම්බන්ධ කර ඇති අතර මෙම අනුපාතික අන්තර් බැංකු ඒක්ෂණ මුදල් ගනුදෙනු මෙන්ම එක්දින සහ කෙටි කාලීන විවට වෙළඳපොළ කටයුතු සඳහා පහළ සහ ඉහළ සීමාවන් නිර්ණය කරයි.

ඒ අනුව, එක්දින සහ කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි ලංසු තැබීම සඳහා ඉහළ සීමාව ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයත්, එම ලංසු සඳහා අදාළ පහළ සීමාව ලෙස නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයත් සලකනු ලබයි. වෙළඳපොළෙන් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමේ ක්‍රමවේදයක් ලෙස මහ බැංකුව ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි පවත්වයි. සහභාගීත්ව ආයතන අතර අතිරික්ත ද්‍රවශීලතාවයක් පවතින විට, ඔවුන්ට විකල්ප දෙකක් පවතී. ඒ අනුව, ඔවුන්ට තම අතිරික්ත අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ මහ බැංකුවේ තැන්පත් කිරීමට හෝ ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිවලට සහභාගී වීම තෝරා ගත හැකිය. සහභාගී වන ආයතන සඳහා ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි ආකර්ෂණීයව පවත්වා ගැනීම සඳහා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකයට සමාන මට්ටමේ අවම ලංසු අනුපාතිකයක් ද, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමාන මට්ටමේ උපරිම ලංසු අනුපාතිකයක්ද ස්ථාපිත කර ඇත. සහභාගීත්ව ආයතනවලට සෑම විටම ඔවුන්ගේ අතිරික්ත අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පත් කිරීමේ විකල්පය ඇති බැවින්, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, එක්දින සහ කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසි පැවැත්වීම සඳහා පවතින ඵලදායී අවම අනුපාතිකය වේ.

3 නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යනු නිත්‍ය තැන්පතු පහසුකම් යටතේ එක්දින පදනම මත සහභාගීත්ව ආයතන විසින් මහ බැංකුවේ අතිරික්ත අරමුදල් තැන්පත් කිරීම මත ගෙවීම් කරනු ලබන අනුපාතිකය වන අතර, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යනු නිත්‍ය ණය පහසුකම යටතේ සහභාගීත්ව ආයතන, මහ බැංකුවෙන් එක්දින පදනම මත අරමුදල් ණයට ලබා ගත හැකි අනුපාතිකයයි.

වි.ස. 3.1 රූප සටහන: තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ව්‍යුහය



මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකුව


3

මේ අතර, එක් දින සහ කෙටි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි සඳහා ඉහළ සීමාව ලෙස නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයත් එහි පහළ සීමාව ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයත් පවතී. වෙළඳපොළට ද්‍රවශීලතාවය සැපයීම සඳහා මහ බැංකුව ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලබයි. සහභාගීත්ව ආයතන ද්‍රවශීලතා හිඟයකට මුහුණ දෙන විට, ඔවුන්ට ද විකල්ප දෙකක් තිබේ. ඔවුන්ට නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ මහ බැංකුවෙන් අරමුදල් ණයට ලබා ගැනීමට හෝ සුදුසු සුරැකුම්පත් ඇපයට තබා ප්‍රකාශිත ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලට සහභාගී වී ද්‍රවශීලතාව ලබා ගත හැකිය. ප්‍රතිවිකුණුම් වෙන්දේසිවල තරඟකාරිත්වය පවත්වා ගැනීම සඳහා, මහ බැංකුව එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සමාන මට්ටමේ අවම ලංසු අනුපාතිකයක් නියම කරන අතර, උපරිම ලංසු අනුපාතිකය නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට සමාන කර ඇත. සහභාගීත්ව ආයතනවලට නිත්‍ය ණය පහසුකම වෙතින් ණය ලබාගැනීමේ විකල්පය ඇති බැවින්, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින සහ කෙටි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම සඳහා පවතින ඵලදායී උපරිම අනුපාතිකය වේ.

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමෙන් පසු මුදල් වෙළඳපොළ ක්‍රියාකාරිත්වය

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය හඳුන්වාදීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂා කළ පරිදි ක්‍රමයෙන් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය කරා ළඟා වූ අතර, 2024 දෙසැම්බර් දෙවන සතියේ සිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ආසන්නයේ පැවතුණි. එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දක්වා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ සිදු වූ මෙම වේගවත් ගැළපීම සඳහා අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් වැඩිවීම බොහෝ දුරට සහාය විය. තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය කරා සුමට ගමන් කිරීමක් පෙන්නුම් කරමින්, වර්තමානයේදී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මට්ටමේ හෝ ඒ ආසන්නයේ පවතී. තවද, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමය වෙත වෙළඳපොළ ඉතා ඉක්මනින් හැඩගැසීම පිළිබිඹු කරමින්, කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතිකවල ගැළපීම් දැනටමත් අනෙකුත්

වි.ස. 3.2 රූප සටහන: එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ නිත්‍ය පහසුකම් අනුපාතික



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳපොළ පදනම් පොලී අනුපාතික වෙත සම්ප්‍රේෂණය වී ඇත.

තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් කරා යොමුවීම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමේ සැලකිය යුතු පියවරක් සනිටුහන් කරයි. මෙමගින් මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම අපේක්ෂා කෙරෙන අතර, වෙළඳපොළ පුරෝකථන හැකියාව වැඩිදියුණු කරනු ලබයි. මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්වල පැහැදිලි බව ඉහළ යෑමත් සමඟ ද්‍රවශීලතා කළමනාකරණය ද විධිමත් වීම හරහා මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය ද ශක්තිමත් වනු ඇත. මෙම වෙනස්වීම මගින් මහ බැංකුවේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල විශ්වසනීයත්වය ද වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, එය වෙළඳපොළ සහ ආර්ථිකය වෙත මුදල් ප්‍රතිපත්ති දැනුම්දීමේ සහ සම්ප්‍රේෂණයේ කාර්යක්ෂමතාව සහතික කරනු ඇත. සමස්තයක් වශයෙන්, මුදල් ප්‍රතිපත්ති ඵලදායීතාවය වැඩිදියුණු වීම, ස්ථාවර ආර්ථිකයක් ඇති කිරීමට, ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු කිරීමට මෙන්ම අවසාන වශයෙන් ආර්ථිකයේ මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වේ.

ලදී. දේශීය මුදල් වෙළඳපොළ සමස්ත ද්‍රවශීලතාව 2024 වසර තුළ දී ක්‍රමයෙන් වැඩි වී සැලකිය යුතු අතිරික්ත මට්ටම් දක්වා ඉහළ ගිය ද සහභාගීත්ව ආයතන අතර අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය මගින් වෙළඳපොළ පොලී අනුපාතික අඩුවීමේ ක්‍රියාවලියට ඇති කරන බලපෑම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් ද්‍රවශීලතා සැපයීමේ කටයුතු (ප්‍රතිවිකුණුම් වෙන්දේසි) අඛණ්ඩව සිදු කරන ලදී. ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු වීමත් සමඟ විදේශීය බැංකු විසින් මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් සඳහා පැවති ප්‍රතිපාර්ශ්වීය සීමා ලිහිල් කිරීමේ සහාය ලබමින් 2024 වසරේ අග භාගය වන විට දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු වූ අතර ම ද්‍රවශීලතා අතිරික්තය ඉහළ ගියේය. ද්‍රවශීලතාව ඉහළ යෑම සහ අසමමිතික ද්‍රවශීලතා ව්‍යාප්තිය අවම වීමත් සමඟ එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීම හරහා ද්‍රවශීලතා සැපයීම සීමා කිරීම ඇතුළු විවට වෙළඳපොළ කටයුතු ක්‍රමයෙන් අඩු කිරීමට මහ බැංකුවට ඉඩ සැලසුණි.

උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වූ, අවධමනකාරී පරිසරයක් තුළ, පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා කළමනාකරණය කිරීම සහ නම ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කිරීම වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව සැලසුම් කිහිපයක් වසර පුරාම ක්‍රියාත්මක කළේය. සාම්ප්‍රදායික ප්‍රතිපත්ති මෙවලම් අබණ්ඩව භාවිතා කරන අතර ම, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණයේ ප්‍රධාන පාර්ශ්වකරුවන් වන කුටුම්බ සහ ව්‍යාපාරවල හැසිරීම කෙරෙහි මග පෙන්වීම සඳහා වැඩි අවධානය යොමු විය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති තීරණ, ඒවා ගැනීමට බලපෑ හේතු, සහ විශේෂයෙන් ම, උද්ධමන පුරෝකථන ඇතුළත්, ආර්ථික ඉදිරි දැක්ම පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කළේය. විශේෂයෙන් ම, වසරේ අග භාගයේ දී දක්නට ලැබුණු අවධමනකාරී තත්ත්ව, ඉල්ලුම නොමැතිකම හෝ ආර්ථික ක්‍රියාකාරකම් නිසා නොව සැපයුම මත පදනම් වූ තාවකාලික සාධක නිසා ඇති වූ බැවින්, අපේක්ෂා කළමනාකරණය කිරීමේ දී මෙම ප්‍රයත්න ඉතා වැදගත් විය. මාධ්‍ය නිවේදන සහ අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සජීවී මාධ්‍ය හමු මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපාය මාර්ගයේ කේන්ද්‍රීය ස්ථානයක් හිමිකර ගත් අතර, මුදල් ප්‍රතිපත්ති තීරණ පිළිබඳ තථ්‍ය කාලීන අවබෝධයක් ලබා දුන්නේය. මුදල් ප්‍රතිපත්තිය සහ සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳ විවේචනාත්මක හා බුද්ධිමය සාකච්ඡා බොහොමයක් සහිතව මාධ්‍ය සහභාගීත්වය අබණ්ඩව වැඩිදියුණු විය. මීට අමතරව, විශාල පිරිසකට භාවිතය පහසු වන පරිදි, ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා ජාතික භාෂාවලින් නිර්මාණය කරන ලද තනි පිටුවක පළ කරන ලද කෙටි විස්තර සහ කෙටි වීඩියෝ කොටස් ඇතුළු සරල සන්නිවේදන ආකෘති සහ සමාජ මාධ්‍ය භාවිතය ඉහළ නැංවීය. ඉලක්කගත දැනුම්වත් කිරීමේ වැඩසටහන්, අභ්‍යන්තරව හා බාහිරව නිතර පවත්වනු ලැබූ මංගත සම්මන්ත්‍රණ සහ සිසුන්, ගුරුවරුන් සහ රජයේ නිලධාරීන් ඉලක්ක කරගත් දැනුම්වත් කිරීමේ වැඩසටහන් හරහා පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුකූලව, අවශ්‍ය පරිදි වාර්තා ප්‍රකාශයට පත් කිරීම හරහා විනිවිදභාවය සහ වගවීම නහවුරු කිරීමට මහ බැංකුව කැපවී සිටියි. 2024 වසරේ පෙබරවාරි සහ අගෝස්තු මාසවල ප්‍රකාශයට පත් කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තා මගින් පෙර මුදල් ප්‍රතිපත්ති තීරණ සහ අදාළ විශ්ලේෂණ ලේඛනගත කිරීම පමණක් නොව, උද්ධමන පුරෝකථන සහ පුරෝකථනවලට ඇති අවදානම් වැනි ඉදිරි දැක්මක් සහිත අවබෝධයක් ද ලබා දුන්නේය. විවේචනාත්මක සංවාද සහ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා, මහ බැංකුව විසින් මාධ්‍යවේදීන්, ශාස්ත්‍රඥයින් සහ විවිධ අංශවල විශේෂඥයින් සම්බන්ධ කර ගනිමින්, සංවාදාත්මක අදහස් හුවමාරු කිරීම් සහිත, තාක්ෂණික සාකච්ඡා සැසි පවත්වන ලදී.

ඒ ආකාරයට, මෙම ක්‍රියාමාර්ග උද්ධමන අපේක්ෂා ථලදායී ලෙස කළමනාකරණය කිරීමට බාධාවක් විය හැකි, තොරතුරුවල අසමමිතිකබව අඩු කිරීම අරමුණු කර ගෙන ඇත. ඒ හා සමානව, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීමට පෙර පාර්ශ්වකරුවන් බහුවිධ ආකාරයෙන් දැනුම්වත් කරන ලදී. ඒ අනුව, මූල්‍ය ආයතන සහ මහජනතාව ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් මෙම වෙනස් කිරීම පිළිබඳව හොඳින් දැනුම්වත් කිරීම සහතික කිරීම සඳහා මහ බැංකුව බහුවිධ සන්නිවේදන උපාය මාර්ගයක් ක්‍රියාත්මක කළේය. සහභාගීවන ආයතන සමඟ පූර්ව දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීම, නව ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට පෙර මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, වෙනස් කිරීම පැහැදිලි කරන විස්තරාත්මක සටහනක් ප්‍රකාශයට පත් කිරීම, සහ විවිධ පාර්ශ්වකරුවන් සඳහා මෙම වෙනස් වීම අදාළ වන ආකාරය පැහැදිලි කෙරෙන පරිදි භාෂා තුනෙන්ම පුවත්පත් ලිපි පළ කිරීම මෙම ප්‍රයත්නවලට ඇතුළත් විය. 2024 වසරේ දෙවන සහ තුන්වන කාර්තුවල මෙන්ම 2024 වසරේ තුන්වන සහ සිව්වන කාර්තුවල, අබණ්ඩව කාර්තු දෙකක් සඳහා කාර්තුමය උද්ධමනය එහි ඉලක්කයට වඩා ප්‍රතිශතාංක දෙකකින් පහළ යෑමෙන් පසුව, ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි 26(5) වගන්තියට අනුකූලව, මහ බැංකුව ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළේය.[5] විශේෂයෙන් ආයතනික ස්වාධීනත්වය ඉහළ යෑම මධ්‍යයේ, මෙම වාර්තා සැපයීමෙන් පසුව රජය සමඟ පැවති සාකච්ඡා සහ විචාරණ මහජන වගවීම සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුවේ කැපවීම ශක්තිමත් කළේය. සමස්ත මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපාය මාර්ගයේ කොටසක් ලෙස, 2024 වසරේ දී අර්ධ වාර්ෂික වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම ද මහ බැංකුව ආරම්භ කළේය. විවට වෙළඳපොළ කටයුතු, ද්‍රවශීලතා කළමනාකරණය, කෙටි කාලීන පොලී අනුපාතික සහ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා ඇතුළු මුදල් මෙහෙයුම් පිළිබඳ තොරතුරු මෙම ප්‍රකාශනය මගින් සපයනු ලබයි.

විදේශ විනිමය වෙළඳපොළ ශක්තිමත් කිරීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ විදේශීය අංශයේ ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී මහ බැංකුව ප්‍රධාන මූලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කළේය. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගැනීමට මහ බැංකුව වසර පුරා අබණ්ඩව කටයුතු කළ අතර, අධික විචලනයන් අවම කිරීමට සහ වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම හරහා සංචිත ගොඩනගා ගැනීමට පමණක් විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් විය. ආර්ථික කම්පනවලට ප්‍රතිචාර වශයෙන් සිදුවන ස්වයංක්‍රීය ගැළපීම මගින්

5 මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමේ දක්වා ඇති උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනයේ අපගමනය පිළිබඳ පළමු වාර්තාවට (අදාළ කාලය: 2024 වසරේ දෙවන සහ තුන්වන කාර්තුව) https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/monetary_policy/report_on_deviation_of_inflation_target_Q2_and_Q3_2024_s.pdf ඔස්සේ ප්‍රවේශ විය හැකිය. පසුව සඳහන් කළ වාර්තාව ද ඉදිරි කාල සීමාව තුළ ලබා ගත හැකි වනු ඇත.

3

විශේෂ සටහන 4
මුදල් ප්‍රතිපත්තිමය වගවීම සහ උද්ධමන ඉලක්ක

හැඳින්වීම

මහ බැංකුවක් විසින් සිය මුදල් ප්‍රතිපත්ති තීරණ පැහැදිලි කිරීම සහ සාධාරණීකරණය කිරීම මෙන්ම එම තීරණ මගින් පාර්ශ්වකරුවන්හට ඇති කරන බලපෑම පැහැදිලි කිරීම මුදල් ප්‍රතිපත්තිමය වගවීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම සාධාරණීකරණය වැදගත් වන්නේ එමගින් මහ බැංකුව විනිවිදභාවයෙන් යුතුව සහ විශ්වාසදායීව එහි ස්වාධීනත්වය පවත්වා ගැනීම තහවුරු කරන බැවිනි. මහ බැංකුවෙහි වගවීම මගින් එහි තීරණ දේශපාලනික හෝ බාහිර බලපෑම්වලින් තොරව ආර්ථිකය පිළිබඳ තර්කානුකූල හේතු මගින් මෙහෙයවනු ලබන බව සනාථ කරමින්, ජනතාව, ව්‍යාපාර සහ ආයෝජකයින් අතර විශ්වාසය ශක්තිමත් කෙරේ. මෙම විශ්වාසය උද්ධමන අපේක්ෂා මනාව පාලනය කර තබා ගැනීමට සහ උද්ධමනය ස්ථායීව තබා ගැනීමට උපකාරී වේ. එමගින් ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි විශ්වාසය ශක්තිමත් වේ. අනෙක් අතට, උද්ධමනකාරී අවදානම්වලට සහ ආර්ථික අස්ථාවරත්වයට හේතු වෙමින් දුර්වල වගවීමේ රාමුවක් මගින් විශ්වාසය අඩු විය හැකිය.

ඵලදායී වගවීමේ පියවර අතර පැහැදිලි අධීක්ෂණය, විනිවිදභාවය සහ කාර්යසාධන ඇගයීම ඇතුළත් වේ. ප්‍රතිඵල කෙරෙහි බලපාන බාහිර සාධක සමඟ, ආර්ථිකයේ ඉදිරි දැක්ම සහ මුදල් ප්‍රතිපත්ති තීරණ සඳහා හේතු පිළිබඳ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට මහ බැංකුවලට නිරන්තරයෙන් අවශ්‍ය වේ. මහ බැංකුවල ඉහළ වගවීම හේතුවෙන් ඒවායේ පරිපාලන විධිවිධාන, ප්‍රතිපත්ති, මෙහෙයුම් සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ අන්තර්ක්‍රියා වැඩිදියුණු වේ. මේ සම්බන්ධයෙන් වූ පර්යේෂණවලින් පෙනී යන්නේ වගවීම සහ විනිවිදභාවයෙන් යුතු මහ බැංකු ඇති රටවල සාමාන්‍යයෙන් අඩු සහ ස්ථායී උද්ධමන අනුපාතික සහිතව වඩා හොඳ ආර්ථික කාර්යසාධනයක් පවත්වාගෙන ඇති බවයි (Mishkin, 1997). කෙසේ වෙතත්, අතිශයින් විමර්ශනශීලී වීමද ඇතැම් විට තීරණ ගැනීම මන්දගාමී වීමට හෝ අධික ලෙස ප්‍රවේශම් සහගත හැසිරීමකට හේතු විය හැකි අතර, එමගින් ආර්ථික අර්බුදවල දී මහ බැංකුවකට තීරණාත්මක නමුත් අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා බාධා ඇති කරයි (Goodhart, 2010).

මහ බැංකු ස්වාධීනත්වය සහ ඉහළ වගවීම එකිනෙක අතර සහජයෙන් ම බැඳී පවතී (Adrian and Khan, 2019). නිවැරදි මුදල් ප්‍රතිපත්තියක් සඳහා පදනම සපයන්නා වූ විනිවිදභාවය සහ වගවීම මහ බැංකුවේ ස්වාධීනත්වය සඳහා පූර්ව අවශ්‍යතා වේ. මහ බැංකු විසින් වාර්තා ප්‍රකාශයට පත් කිරීම හෝ නීතිමය ආයතන වෙත පැහැදිලි කිරීම් හරහා රජයට, මහජනතාවට සහ අනෙකුත් ප්‍රතිපත්ති සම්පාදකයින්ට තම තීරණ පිළිබඳ තොරතුරු නිතිපතා සැපයීම තුළින් විනිවිදභාවය ඇතිවනු ඇත.

උද්ධමන ඉලක්ක මග හැරීම්වල දී මහ බැංකු වගවීමේ වැදගත්කම

උද්ධමන ඉලක්කකරණය යනු මහ බැංකුවකට නිශ්චිත කාල සීමාවක් තුළ ළඟා කර ගත යුතු නිශ්චිත උද්ධමන ඉලක්කයක් ලබා දෙනු ලබන මුදල් ප්‍රතිපත්ති රාමුවකි. ප්‍රධාන වශයෙන් ම, සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික සකස් කිරීම හරහා, මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් මහ බැංකු උද්ධමනය ඉලක්කගත මට්ටමක තබා ගැනීමට උත්සාහ කරන අතර, එමගින් අවිනිශ්චිතතා අඩු කර ආර්ථික උච්චාවචනයන් අවම කෙරේ. කෙසේ වෙතත්, මහ බැංකුවලට සෑම විටම එකඟ වූ ඉලක්කගත මට්ටම් තුළ උද්ධමනය පවත්වා ගැනීමට නොහැකි වේ. මෙය පරිපාලිත මිල සංශෝධන සහ දේශීය සාධකවලින් හෝ ගෝලීය වශයෙන් පැන නගින සැපයුම් අංශයෙහි අවහිරතා ඇතුළු විවිධ හේතු නිසා සිදු විය හැකිය. විශේෂයෙන් ම, උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වන විට, මහජන විශ්වාසය වැඩි කිරීම සහ උද්ධමනය එහි ඉලක්කගත මට්ටමට නැවත ගෙන ඒම සඳහා ශක්තිමත් වගවීමක් අත්‍යවශ්‍ය වේ. මහ බැංකු විසින් අපගමනයට හේතු පැහැදිලි කළ යුතු මෙන්ම, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතු අතර, සිය ප්‍රතිපත්ති තීරණවල විනිවිදභාවය පවත්වා ගත යුතුය. මහ බැංකුවලට තම කාර්යභාරයන් ඵලදායී ලෙස ඉටු කරමින් වෙනස්කම්වලට ඉක්මනින් හා කාර්යක්ෂමව අනුවර්තනය වීමට ඇති හැකියාව සහතික කරමින්, මෙම ක්‍රියාවන්ට මග පෙන්වීම සඳහා නීතිමය රාමු බොහෝ විට ක්‍රියාත්මක වේ (Adrian and Khan, 2019).

උද්ධමනය ඉලක්කගත මට්ටම්වලින් අපගමනය වීමට හේතු තේරුම් ගැනීම මහ බැංකු සහ රජයන්ට ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා වඩා හොඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට උපකාරී වේ. වෙනත් රටවල පෙර අත්දැකීම් සලකා බැලීමේ දී, තෙල් මිල ඉහළ යෑම, සැපයුම් දාම අවහිරතා සහ ගෝලීය අවිනිශ්චිතතා වැනි බාහිර කම්පන උද්ධමනය එහි ඉලක්කයෙන් අපගමනය වීම සඳහා වන පොදු හේතු සාධක වන නමුත්, එය දේශීය සාධක නිසා ද සිදුවිය හැකිය. උදාහරණයක් ලෙස, කැනඩා මහ බැංකුව 2008 වසරේ දී උද්ධමනය ඉහළ යෑමට ප්‍රධාන හේතුව ලෙස වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම සඳහන් කර ඇති අතර උද්ධමනය පාලනය කෙරෙහි ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑම් පිළිබඳව සඳහන් කර ඇත (Bank of Canada, 2008). ඒ හා සමානව, නවසීලන්ත සංචිත බැංකුව භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී අය කරනු ලබන බදු ඉහළ යෑම ඇතුළු සැපයුම් අංශයෙහි සාධක මගින් 2011 වසරේ දී උද්ධමනය ඉහළ යෑමට හේතු පැහැදිලි කළ අතර, භූමිකම්පාවකින් පසුව එය උද්ධමනය කෙරෙහි කෙසේ බලපානු ඇත්දැයි අපේක්ෂා කළ ආකාරය තවදුරටත් පැහැදිලි කළේය (Reserve Bank of New Zealand, 2011). චෙක් ජාතික බැංකුව වැනි ඇතැම් මහ බැංකු, සැලකිය යුතු ආර්ථික කම්පනවලට මුහුණ දෙන විට ඔවුන්ගේ විධිවිධානයන්ගෙන් තාවකාලිකව විතැන් වීමට පවා ඉඩ හරී (Rusnok, 2018). එපමණක් නොව, බොහෝ විට, සංවර්ධිත

ආර්ථිකයන්ට වඩා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි විශාල හා නිරන්තර සැපයුම් කම්පන ඇති වේ. එබැවින්, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අදාළ ඉලක්කවලින් උද්ධමනය අපගමනය වීම් සඳහා සැපයුමට අදාළ සාධක බහුල වශයෙන් හේතු විය හැකිය.

උද්ධමනය ඉලක්කයට නැවත පැමිණීමේ වේගය ආර්ථික තත්ත්වය සහ ගනු ලබන ප්‍රතිපත්තිමය පියවරවල ඵලදායීතාවය මත රඳා පවතී. උදාහරණයක් ලෙස, පොලී අනුපාතිකවල වෙනස්කම් උද්ධමනයට බලපෑම් කිරීමට සාමාන්‍යයෙන් මාස 18ත් 24ත් අතර කාලයක් ගත වන බව පර්යේෂකයන් සොයාගෙන ඇත. රටක ආර්ථික හා මූල්‍ය වෙළඳපොළ තත්ත්වය අනුව මෙම කාලය මෙයට වඩා දිගු හෝ කෙටි විය හැකිය. විශේෂයෙන් සැපයුම් අංශයෙහි සාධක මගින් උද්ධමනය මෙහෙයවනු ලබන විට, ද්‍රවශීලතා කළමනාකරණය සහ ඉදිරි ප්‍රතිපත්ති මග පෙන්වීම වැනි අතිරේක මෙවලම් භාවිතා කිරීමට ද මහ බැංකු සූදානම් විය යුතුය. සැපයුම් අංශයෙහි සාධක විශේෂයෙන් සැලකූ විට ඇතැම් රජයේ ප්‍රතිපත්ති ද උද්ධමන කළමනාකරණයට සහාය වේ. බදු පැනවීම සහ පරිපාලන මිල ගණන් වැනි කෙටි කාලීන ප්‍රතිපත්ති මෙන්ම කාලගුණය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා වන දිගු කාලීන ප්‍රතිපත්ති ආහාර හා බලශක්ති උද්ධමනයේ තාවකාලික විචලනයන් පාලනය කිරීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කෙසේ වෙතත්, සැපයුම් අංශයේ ගැටලු සාමාන්‍යයෙන් තාවකාලික වන අතර කාලයත් සමඟ ස්වභාවයෙන්ම නිවැරදි වන බව ද සැලකිල්ලට ගත යුතුය. අනෙක් අතට, උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම අඛණ්ඩව පවතින්නේ නම්, එවැනි අපගමන සඳහා හේතු කුමක් වුවත්, උද්ධමන අපේක්ෂා නැවත පාලනය කර ගැනීමට සහ හැකි ඉක්මනින් උද්ධමනය ඉලක්කගත මට්ටම් කරා ගෙන වීමට මහ බැංකු කටයුතු කළ යුතුය. ඒ අනුව, විවිධ ආර්ථික පාර්ශ්වකරුවන් ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමේ දී මහ බැංකු සන්නිවේදනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත යටතේ මුදල් ප්‍රතිපත්ති වගවීම සම්බන්ධව පවතින විධිවිධාන

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් මහ බැංකුව සඳහා ඉහළ මුදල් ප්‍රතිපත්තිමය වගවීමක් මෙන්ම මෙහෙයුම් ස්වාධීනත්වයක් ද සපයයි. මහ බැංකු පනතෙහි 26 වන වගන්තියේ සඳහන් පරිදි මහ බැංකුව විසින් සපුරා ගත යුතු උද්ධමන ඉලක්කය පිළිබඳ මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමක් අත්සන් කළ යුතුය. මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ කාර්තුමය සාමාන්‍ය උද්ධමනය අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා 5%ක උද්ධමන ඉලක්කයට ආසන්න ආන්තිකයක් (ප්‍රතිශතාංක ± 2) තුළ පවත්වා ගැනීමට මහ බැංකුව අපොහොසත් වුවහොත්, ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. මෙම වාර්තාව මහජනතාවට ද ලබා ගත හැකි විය යුතු අතර, අපගමනයට හේතු පැහැදිලි කිරීම, මහ බැංකුව විසින් ගත යුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ උද්ධමනය ඉලක්කගත පරාසයට නැවත ගෙන වීම සඳහා ගත වන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් එහි ඇතුළත් විය යුතුය. තවද, මහ බැංකු පනතෙහි 27 වන වගන්තියට අනුව, උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා, උද්ධමනය සඳහා හේතු වූ සාධක සහ උද්ධමනය සඳහා මැදි කාලීන පුරෝකථන සහ එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් පැහැදිලි කරමින්, මහ බැංකුව විසින් මාස හයකට වරක් වාර්තාවක් ප්‍රකාශයට පත් කළ යුතුය. ඊට අමතරව, මහ බැංකු පනතෙහි 80 වන වගන්තිය යටතේ, මහ බැංකුව අවම වශයෙන් සෑම මාස හයකට වරක්වත් සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම පිළිබඳව මහජනතාව දැනුම්වත් කළ යුතුය. ඉහත 27 වන සහ 80 වන වගන්තිවල අවශ්‍යතා සපුරාලීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව, මිල ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම් ස්වාධීනත්වය මහ බැංකුවට ලබා දෙන අතර ම, සිය ක්‍රියාවන් සහ මිල ස්ථායීතා අරමුණ සාක්ෂාත් කර ගැනීම පිළිබඳ වගවිය යුතු බැවින්, මහ බැංකු පනත ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ වෙතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

මෑත කාලීනව උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම සහ වගවීමේ පියවර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම්

2024 වසරේ දෙවන, තෙවන සහ සිව්වන කාර්තුවල දී ශ්‍රී ලංකාවේ උද්ධමනය, ප්‍රධාන වශයෙන් විදුලිය සහ ඉන්ධන මිල අඩු කිරීම මෙන්ම ආහාර උද්ධමනය පහළ යෑම වැනි සැපයුම් අංශයෙහි සාධක හේතුවෙන් උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක දෙකකට වඩා පහළින් පැවතුණි. තවද, ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම ද උද්ධමනය පහළ යෑමට දායක විය. ඒ අනුව, මහ බැංකු පනතේ අවශ්‍යතාවය පරිදි, උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීම පිළිබඳ වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත්, ඒ සඳහා මහජනතාවට ප්‍රවේශය ලබා දීමටත් මහ බැංකුව කටයුතු කරන ලදී. 2024 වසරේ දෙවන සහ තෙවන කාර්තු සඳහා අදාළ වන වීම පළමු වාර්තාව මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇති අතර, 2024 වසරේ තෙවන සහ සිව්වන කාර්තු සඳහා අදාළ වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර එය ඉදිරි කාලය තුළ මහජනතාවට ද ලබාගත හැකිවනු ඇත. තවද, ඉහත සඳහන් කළ සාධක ම හේතු වීමෙන් 2025 වසරේ පළමු කාර්තුව තුළ උද්ධමනය, එහි ඉලක්කයට වඩා ප්‍රතිශතාංක දෙකකට වඩා අඩු මට්ටමක පැවති බැවින්, මහ බැංකුව විසින් 2024 වසරේ සිව්වන කාර්තුවට සහ 2025 වසරේ පළමු කාර්තුවට ද අදාළ වන ඒ හා සමාන වාර්තාවක් ඉදිරිපත් කෙරෙනු ඇත. 2025 වසරේ මාර්තු මාසයේ සිට අවධමනකාරී තත්ත්වය ලිහිල් වීමට පටන් ගෙන ඇති බව නිරීක්ෂණය කරන අතර ම, පුරෝකථනයන්ට එළඹීමේ දී භාවිතා කරන ලද දත්ත, උපකල්පන සහ විනිශ්චයන් මගින් නිරූපණය වන ආර්ථික තත්ත්වයන්හි සැලකිය යුතු අපගමනයන් සිදුනොවේ නම්,

3

නවතම පුරෝකථනයන්ට අනුව, පවතින අවධමනය තාවකාලික වනු ඇති බවත්, 2025 වසරේ තෙවන කාර්තුව වන විට උද්ධමනය ඉලක්කයේ සිට ප්‍රතිශතාංක ± 2 තුළට නැවත පැමිණෙනු ඇති බවත් මහ බැංකුව අපේක්ෂා කරයි.

උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම සහ වගවීමේ පියවර සම්බන්ධයෙන් ගෝලීය අත්දැකීම්

උද්ධමන ඉලක්ක කඩවීම් සම්බන්ධයෙන් වන වගවීමේ පියවර පිළිබඳ උදාහරණ ලොව පුරා විවිධ මහ බැංකු අතර නිරීක්ෂණය කළ හැකිය. 1998 විංගලන්ත මහ බැංකු පනතේ නියම කර ඇති පරිදි, විංගලන්ත මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති කමිටුව සඳහා වන කාර්යභාරය අනුව, උද්ධමන ඉලක්කයේ සිට ඉහළට හෝ පහළට 1%කට වඩා උද්ධමනය වෙනස් වුවහොත්, අධිපතිවරයා විසින් භාණ්ඩාගාරයේ චාන්සලර්වරයා වෙත ලිපියක් යැවිය යුතුය. 2022 වසරේ දී රුසියානු-යුක්රේන ගැටුම සහ බලශක්ති මිල ඉහළ යෑම හේතුවෙන් එක්සත් රාජධානියේ උද්ධමනය 10% ඉක්මවා ගිය අතර, ඒ හේතුවෙන් අධිපතිවරයා සහ චාන්සලර්වරයා අතර සන්නිවේදන කිහිපයක් සිදු විය. ඒ හා සමානව, 2021 නවසීලන්ත සංචිත බැංකු පනත මගින් මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශන නිතිපතා ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වන අතර, මුදල් ප්‍රතිපත්ති කමිටු ප්‍රඥප්තියේ දක්වා ඇති පරිදි, උද්ධමන අපගමනයන් සඳහා හේතු පැහැදිලි කිරීම අවශ්‍ය වේ. 2022 වසරේ දී උද්ධමනය 7%ක් ඉක්මවා සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළ විට, නවසීලන්ත සංචිත බැංකුව විසින් උද්ධමන ප්‍රවණතා, ඉලක්කයෙන් අපගමනය වීම් සහ ප්‍රතිපත්ති ප්‍රතිචාර එහි මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශනවල පැහැදිලි කරන ලදී. 1934 ඉන්දියානු සංචිත බැංකු පනතට (2016 වසරේ සංශෝධිත) අනුව, උද්ධමනය අඛණ්ඩව කාර්තු තුනක් ඉලක්කගත පරාසයෙන් පිටත පැවතුනහොත්, මහ බැංකුව විසින් රජයට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ගෝලීය උද්ධමනය ඉහළ යෑමත් සමඟ 2022 වසරේ දී ඉන්දියාවේ උද්ධමනය, උද්ධමන ඉලක්කය ඉක්මවා ගියේය. මේ හේතුවෙන් ඉන්දීය සංචිත බැංකුව හේතු පැහැදිලි කරමින් සහ නිවැරදි කිරීමේ පියවර ගෙන හැර දක්වමින් රජයට වාර්තාවක් ඉදිරිපත් කළේය. උද්ධමන කඩවීම් සඳහා හේතු දැක්වීම නීත්‍යානුකූලව අවශ්‍ය නොවූවත්, ෆෙඩරල් සංචිත බැංකුව එහි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳව කොංග්‍රසයට නිතිපතා වාර්තා කරයි. මෙවන් වගවීමේ පියවර විනිවිදභාවය සහතික කිරීම සඳහා පමණක් නොව, උද්ධමනය පාලනය කිරීමට මහ බැංකු මගින් ගනු ලබන ප්‍රයත්න කෙරෙහි විශ්වාසය ද ඉහළ නංවයි.

සමාප්ති සටහන්

මිල ස්ථායීතාව පවත්වා ගැනීම සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී වගවීම අත්‍යවශ්‍ය වේ. උද්ධමනය සඳහා පැහැදිලි ඉලක්ක ස්ථාපිත කිරීම, අපගමන පිළිබඳ පැහැදිලි කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම මගින්, මහ බැංකුවලට සිය විශ්වසනීයත්වය ඉහළ නැංවීම හරහා මිල ස්ථායීතාව පවත්වා ගැනීමටත්, ආර්ථික වර්ධනයට සහාය වීමටත් හැකිය. බාහිර කම්පන හෝ අභ්‍යන්තර වැරදි ප්‍රතිපත්ති යන කවරක් සමඟ කටයුතු කිරීමට සිදු වූවත්, මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සහතික කිරීම සඳහා මහ බැංකු විනිවිදභාවයෙන් හා ප්‍රතිචාරශීලීව කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාවේ මැදි කාලීන උද්ධමන අපේක්ෂා 5%ක ඉලක්කය සමඟ බොහෝ දුරට අනුකූල වන අතර, එය මුදල් ප්‍රතිපත්ති සම්පාදනය කෙරෙහි ආර්ථික පාර්ශ්වකරුවන් අතර ඇති විශ්වාසය පිළිබිඹු කරයි. අර්ධ වාර්ෂික මුදල් ප්‍රතිපත්ති වාර්තා ප්‍රකාශයට පත් කිරීම වැනි සන්නිවේදන උපාය මාර්ග සහ මහ බැංකු පනතෙහි ඇති වගවීමේ ක්‍රියාමාර්ග එවැනි මහජන විශ්වාසයක් ඇති කිරීම සඳහා බෙහෙවින් සහාය වී ඇත.

මූලාශ්‍ර

1. Adrian, T. and Khan, A. (2019) 'Central Bank Accountability, Independence, and Transparency', *IMF Blog,* 25 November. Available at: https://meetings.imf.org/en/IMF/Home/Blogs (Accessed 30 March 2025).
2. Bank of Canada. (2008) *Monetary Policy Report Summary - October 2008.*
3. Goodhart, C.A.E. (2010) 'The Changing Role of Central Banks', *BIS Working Papers No. 326,* Bank for International Settlments.
4. Mishkin, F.S. (1997) 'Strategies for Controlling Inflation', In Lowe, P. (ed.), *Monetary Policy and Inflation Targeting, 21-22 July 1997, Kirribilli.* Sydney: Reserve Bank of Australia, pp. 7-38.
5. Reserve Bank of New Zealand. (2011) *Monetary Policy Statement - March 2011.*
6. Rusnok, J. (2018) 'Two Decades of Inflation Targeting in the Czech Republic', *Finance a Uver,* 68(6), pp.514-517.

නම්‍යශීලී විනිමය අනුපාතිකයක් ආර්ථිකයේ කම්පන අවශෝෂකයක් ලෙස ක්‍රියා කරන අතර අවසානයේ ගෙවුම් තුලනයේ ගැළපීම් හරහා විදේශීය අංශයේ ස්ථාවරත්වය සුරක්ෂිත කරයි. විනිමය අනුපාතිකය පෙර තීරණය කළ මට්ටමක පවත්වා ගැනීමේ අවශ්‍යතාවයකට සීමා නොවී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩි ස්වාධීනත්වයක් ද මහ බැංකුවට එමගින් සැපයේ. විදේශ විනිමය වෙළඳපොළ ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී විදේශ විනිමය පිළිබඳ ගෝලීය ප්‍රශස්ත භාවිත සංග්‍රහය (FX Global Code) සම්මත කරගැනීම මගින් වෙළඳපොළ විශ්වසනීයත්වය වැඩි දියුණු වී වෙළඳපොළ භාවිතයන් ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල කරන ලද අතර, 2025 වසරේ මාර්තු මාසය වන විට විදේශ විනිමය ගනුදෙනු ගැළපුම් වේදිකාව (FX matching platform) ක්‍රියාත්මක කිරීම මගින් වෙළඳපොළ පුළුල් බව සහ විනිවිදභාවය වැඩිදියුණු වී, මහ බැංකුවේ නියාමන අධීක්ෂණය ශක්තිමත් කෙරුණි. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මිල අනාවරණ ක්‍රියාවලියට හිතකර ප්‍රතිපත්තියක් සහ මෙහෙයුම් රාමුවක් මගින් විනිමය අනුපාතිකය බොහෝ දුරට වෙළඳපොළ මූලිකාංග පිළිබිඹු

කරන බවත්, වෙළඳපොළ විශ්වාසනීයත්වය වර්ධනය කිරීම සහ පුළුල් සහ ද්‍රවශීලී වෙළඳපොළක් ඇති කිරීමට සහාය ලබා දෙන බවත් සහතික කරයි.

3.3 විදේශීය අංශයේ ප්‍රතිපත්ති

විදේශ විනිමය සීමා කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග

2024 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්ව ක්‍රමයෙන් වැඩිදියුණු වීම සහ විදේශීය අංශයේ දක්නට ලැබුණු ඉහළ ස්ථාවරත්වයට අනුකූලව, රජය විසින් මහ බැංකුව සමඟ සාකච්ඡා කර, වසංගතය සහ ආර්ථික අර්බුදය අතරතුර පනවන ලද පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ලිහිල් කිරීමට කටයුතු කරන ලදී. එවැනි ක්‍රියාමාර්ග අතරට ආනයන සීමා ලිහිල් කිරීම්, විදේශ විනිමය සීමා ලිහිල් කිරීම් සහ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ඇතුළත් වේ. මෙම පසුබිම තුළ, මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ජංගම ජාත්‍යන්තර ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීමට පනවා තිබූ ඇතැම් සීමාවන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය නියෝග සහ විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම මගින්, අනේවාසිකයින් වෙත, ලැයිස්තුගත ණය සුරුකුම්පත්වල හෝ ලැයිස්තුගත කොටස්වල (නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් නාමනය කරන ලද) යම් ආදායමක් හෝ කල්පිරීමේ දී ලද ප්‍රතිලාභ ගෙවීමට සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සඳහා ලබාගත් ණය ආපසු ගෙවීමට නේවාසික සමාගම්වලට අවසර දෙන ලදී. තවද, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් දරන නේවාසික සමාගම් විසින් ලබා ගන්නා ලද දැනට පවතින කෙටි කාලීන ණය, ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති අවස්ථාවල දී ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම මගින් අනේවාසිකයින්ට ගෙවීමට ද නේවාසිකයන්ට අවසර දෙන ලදී. තවද, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, අවසර ලත් අඩු කිරීම්වලින් පසු ඉතිරි අපනයන ආදායම සඳහා අනිවාර්ය පරිවර්තන අවශ්‍යතාවය සඳහා වන කාල සීමාව, ලැබුණු දිනයේ සිට දිනදර්ශිත මාස තුනක් කල් ඉකුත් වීමෙන් පසු මාසයේ 10වන දින දක්වා දීර්ඝ කරන ලද අතර, එමගින් අපනයනකරුවන්ට වඩා දිගු කාලයක් විදේශ විනිමය රඳවා ගැනීම මඟින් වඩා හොඳ මුදල් ප්‍රවාහ කළමනාකරණයක් සඳහා සහ විනිමය පරිවර්තන අලාභ අවම කර ගැනීමට ඉඩ සැලසේ. තවද, මෙරටින් සිදු කරන ලද අපනයන සහ රටට ආපසු එවන ලද අපනයන ආදායම සංසන්දනය කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතිය වැඩිදියුණු කරන ලදී.

ගෙවුම් තුලන තත්ත්වයෙහි සිදු වූ වර්ධනයන් සමඟ ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ලෙස ප්‍රාග්ධන ගනුදෙනු මත පනවා තිබූ ඇතැම් අත්හිටුවීම් සහ සීමා කිරීම් 2024 වසරේ දී ක්‍රමයෙන් ලිහිල් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් විදේශීය ආයෝජන සිදු කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts) හරහා කරන ලද ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් කරනු ලබන ප්‍රේෂණ ගෙවීම්වලට පනවා තිබූ තාවකාලික සීමාවන් 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස ලිහිල් කරන ලද අතර, එමගින් දේශීය ව්‍යාපාර සඳහා ගෝලීයව ව්‍යාප්ත වීමට ඇති අවශ්‍යතාවලට ප්‍රමුඛතාවය දෙන ලදී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නේවාසිකයන් සතුව ඇති පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් කෙරෙන ප්‍රේෂණ ගෙවීම්වලට පනවා ඇති තාවකාලික සීමාවන් දිගටම පවතී. මීට අමතරව, සංක්‍රමණ දීමනාව යටතේ සංක්‍රමණිකයින් විසින් සිදු කරන අරමුදල් ගෙවීම් මත පනවා තිබූ සීමාවන් තවදුරටත් ලිහිල් කරන ලදී. තවද, තාවකාලික විදේශීය නේවාසික වීසා බලපත්‍රලාභී ශ්‍රී ලාංකිකයන්ට ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් මාරු කිරීම සඳහා ලබා දෙන දීමනාව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී නිකුත් කරන ලද විදේශ විනිමය රෙගුලාසිවල නියම කර ඇති සීමාවට නැවත ප්‍රතිස්ථාපනය කරන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සිදු වන වර්ධනයන් සහ ගෙවුම් තුලන තත්ත්වවලට අනුකූලව විදේශ විනිමය පනත යටතේ දැනට ක්‍රියාත්මක කෙරෙන ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රමානුකූලව ඉවත් කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි.

විදේශ විනිමය ලැබීම් නවදුරටත් දිරිමත් කිරීම සඳහා 2024 වසරේ දී මහ බැංකුව ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් හඳුන්වා දුන්නේය. ඒ අනුව, කොළඹ කොටස් වෙළඳපොළෙහි මූලපිරීමක් වන සුරුකුම්පත් සමපේක්ෂණ විකුණුම් සඳහා ඉඩ සැලසීමේ අරමුණින් 'සුරුකුම්පත් ණයට ගැනීම සහ ණයට දීමේ ගනුදෙනු' යටතේ ලැයිස්තුගත කර ඇති ඕනෑම සුරුකුම්පතක් අත්පත් කර ගැනීමට, රඳවා ගැනීමට, විකිණීමට හෝ ඇපයට තැබීමට අනේවාසිකයින්ට ඉඩ සැලසෙන පරිදි, විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ නව රෙගුලාසි හඳුන්වා දෙන ලදී. එයට අමතරව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වීසා වැඩසටහන් යටතේ නේවාසික වීසා ලබා ගන්නා විදේශිකයින්ගේ ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ විධාන නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, නේවාසික සමාගම්වලට අනේවාසිකයන්ගෙන් ලබාගත් ණයවලින් ලැබෙන මුදල් භාවිතා කරමින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීමට ඇති අවසරය වසර තුළ දී අවලංගු කරන ලදී.

3

ආනයන සීමා ලිහිල් කිරීම

මහ බැංකුවේ නිර්දේශය මත, 2024 සහ 2025 වසරේ මුල් භාගයේ දී රජය විසින් ආනයන සඳහා පනවා තිබූ බොහෝ සීමාකාරී පියවර ලිහිල් කරන ලදී. 2025 වන විට මෝටර් රථ ආනයනය සම්පූර්ණයෙන් ම ලිහිල් කිරීම සඳහා මහ බැංකුවේ නිර්දේශයන්ට අනුකූලව රජය මූලික ඉදිරි දැක්මක් සකස් කළේය. එවැනි ලිහිල් කිරීම්වලට මුහුණදීම සඳහා විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ මට්ටමක පැවතීම සැලකිල්ලට ගනිමින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ වන අවශ්‍යතා සපුරාලීමේ අරමුණෙන් මෙය සිදු කරන ලදී. වාහන ආනයන සීමා ඉවත් කිරීම, 2024 වසරේ තුන්වන කාර්තුවේ දී පළමු අදියර ලෙස පොදු මගී ප්‍රවාහන හා විශේෂ කාර්යයන් සඳහා වන වාහන සහ මෝටර් රථ නොවන කාණ්ඩයේ භාණ්ඩ ආනයනයට අවසර දීමෙන් ආරම්භ කර, ඉන් අනතුරුව 2024 වසරේ සිව්වන කාර්තුවේ දී වාණිජ හෝ භාණ්ඩ ප්‍රවාහන වාහන සඳහා ද, 2025 වසරේ පළමු කාර්තුවේ දී පුද්ගලික පරිහරණය පිණිස මෝටර් රථ ආනයනය සඳහා ද අවසර ලබා දීම ලෙස අදියර තුනකින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී අදියර අනුව මෝටර් වාහන ආනයන සීමා ලිහිල් කිරීමේ සැලැස්ම අනුමත කරන ලදී. අදියර 1 යටතේ ලිහිල් කිරීම්, ප්‍රමාදයක් සහිතව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ආරම්භ කරන ලද අතර, 2025 වසරේ ජනවාරි මාසයේ දී අදියර 2 සහ අදියර 3 ක්‍රියාත්මක කරන ලදී. එක් එක් ලිහිල් කිරීමේ අදියරට සම්බන්ධ අවදානම් ඉස්මතු කරමින් මහ බැංකුව සිය නිරීක්ෂණ සහ නිර්දේශ රජයට ඉදිරිපත් කළේය. මෝටර් රථ ආනයනය වසර 5කට ආසන්න කාලයක් සීමා කර තිබීම හේතුවෙන්, ආනයනය නොකළ අවදියේ දී අධික ලෙස වර්ධනය වී ඇති මෝටර් රථ සඳහා වන ඉල්ලුම සීමා කිරීම සඳහා, මහ බැංකුවේ නිර්දේශයන්ට අනුකූලව, රජය විසින් සුදුසු බදු සහ බදු නොවන ක්‍රියාමාර්ග ගෙන ඇත. මෙම සීමාකාරී පියවර තිබුණ ද, මෝටර් රථ ආනයනය හේතුවෙන් ආනයන වියදම්වල සැලකිය යුතු වැඩිවීමක් අපේක්ෂා කරන අතර එමගින් වෙළඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මෝටර් රථ ආනයනය මගින් ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය වනු ඇතැයි (ප්‍රධාන වශයෙන් වාණිජ කටයුතු සඳහා යොදාගන්නා වාහන හරහා) අපේක්ෂා කරන අතර, රජයේ ආදායම ද වැඩි වනු ඇත.

3.4 මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති

සාර්ව විවේකණ ප්‍රතිපත්ති

ඇති විය හැකි පද්ධතිමය අවදානම් හඳුනා ගැනීම, මූල්‍ය ස්ථායීතාව ශක්තිමත් කිරීම සහ අවශ්‍ය සාර්ව විවේකණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින් සාර්ව විවේකණාත්මක ආවේක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 63(2) වගන්තියට අනුකූලව, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කිරීමෙහිලා සාර්ව විවේකණ ප්‍රතිපත්තියේ වැදගත් කාර්යභාරය ඉස්මතු කිරීම සඳහා මහ බැංකුව විසින් සාර්ව විවේකණ ප්‍රතිපත්ති රාමුව මෙම වසර තුළ දී ප්‍රකාශයට පත් කරන ලදී. මෙම රාමුව මගින් සාර්ව විවේකණ ප්‍රතිපත්තිවල ප්‍රධාන අරමුණු, පද්ධතිමය අවදානම් ආවේක්ෂණය, ප්‍රතිපත්ති මෙවලම් සහ මහ බැංකුවේ අනෙකුත් ප්‍රධාන ප්‍රතිපත්ති සමඟ සාර්ව විවේකණාත්මක ක්‍රියාමාර්ග ඒකාබද්ධ කිරීම පිළිබඳ තොරතුරු දක්වා ඇත. තවද, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු (Domestic Systemically Important Banks) නම් කිරීම සහ එම බැංකු සඳහා වන ස්වාරක්ෂකවල ප්‍රමාණයන් නිශ්චය කිරීම සඳහා පැවති රාමුව, බැංකු පද්ධතියෙහි වත්මන් වර්ධනයන් පිළිබිඹු වන පරිදි සමාලෝචනය කරන ලදී. පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකුවල සංශෝධිත ලැයිස්තුව ඉදිරියේ දී ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

ආර්ථිකය යථා තත්ත්වයට පත් වී ස්ථාවර වීමත් සමඟ, මහ බැංකුව විසින් බැංකු අංශයේ ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම සඳහා, විශේෂයෙන් රාජ්‍ය සංස්ථා සම්බන්ධ විශාල ගනුදෙනු නිරාවරණයන් (Large Exposure) සඳහා දැඩි සීමාවන් හඳුන්වා දෙන ලදී. මෙමගින්, බාසල් (Basel) අවශ්‍යතාවලට අනුකූලව දැඩි විවේකණ සීමාවන් සහ ණය ගනුදෙනුකරුවන් අතර අන්තර් සම්බන්ධතාවය තීරණය කිරීම සඳහා වන පාලන සම්බන්ධතාවය (Control Relationship) සහ ආර්ථික අන්තර් රැඳියාව (Economic Interdependence) ආවරණය කරන ශක්තිමත් නිර්ණායක ඇතුළත් කරන ලද අතර, බැංකු අංශයේ ණය සංකේන්ද්‍රණ අවදානම අවම කිරීම, සුරක්ෂිතතාව සහ ශක්තිමත් බව සහතික කිරීම මෙන්ම බැංකු අංශය කෙරෙහි පවත්නා මහජන විශ්වාසය ආරක්ෂා කිරීම ද අපේක්ෂිතය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු සඳහා ඔවුන්ගේ විශාල ගනුදෙනු නිරාවරණ ප්‍රමාණය, සිය පළමු ස්ථර (Tier I) ප්‍රාග්ධනයෙන් 25%ක් දක්වා සීමා කරමින් 2026 වසරේ ජනවාරි 1 සිට බලාත්මක වන පරිදි 2024 වසරේ මාර්තු මාසයේ දී බලපත්‍රලාභී බැංකු වෙත විධානයක් නිකුත් කරන ලදී. 2024 අංක 01 දරන විධානය යටතේ, මෙම සීමාවන් තනි සමාගම්, රාජ්‍ය සංස්ථා, ආයතන, පුද්ගල සංගම් සහ තනි පුද්ගලයින් ඇතුළු ණය ගනුදෙනුකරුවන්ට තනි පදනමක් මත මෙන්ම සම්බන්ධිත ණය ගැනියන් සඳහා සමස්ත පදනමින් ද අදාළ වේ. මෙම නියාමනය, 2026 ජනවාරි 1 වන දින සිට ස්වාධීන පදනමින් (Standalone Basis) සහ 2030 ජනවාරි 1 වන දින සිට ඒකාබද්ධ පදනමින් (Consolidated Basis) ක්‍රියාත්මක වේ. පවත්නා සාර්වමූල්‍ය තත්ත්වයන් සහ ආර්ථිකය යළි නගා සිටුවීම සඳහා සහාය වීමේ අඛණ්ඩ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, මෙම නිරාවරණ

සීමාවන්, වසර තුනක කාලයක් තුළ ක්‍රමිකව ක්‍රියාත්මක කරනු ලබන අතර 2028 වසර වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කෙරේ. බලපත්‍රලාභී බැංකු රාජ්‍ය සංස්ථා වෙත සමස්ත නිරාවරණ සම්බන්ධයෙන් පැනවෙන උපරිම නිරාවරණ සීමාව සපුරාලීම සඳහා 2030 වසර වන විට රාජ්‍ය සංස්ථා වෙත පවත්නා නිරාවරණ ප්‍රමාණය ක්‍රමයෙන් අඩු කළ යුතුය. මෙම ප්‍රවේශය මගින්, පවතින තත්ත්වයේ සිට වඩා යහපත් තත්ත්වයක් වෙත සුමටව සංක්‍රමණය වීම සඳහා පහසුකම් සලසනු ලබන අතර මූල්‍ය ස්ථායීතාව පවත්වා ගනිමින් ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ද ඉඩ සැලසේ. සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳ වැඩිදුර විස්තර, 2024 මූල්‍ය ස්ථායීතා සමාලෝචනයෙන් ලබා ගත හැකිය.[6]

බලපත්‍රලාභී බැංකුවලට අදාළ ප්‍රතිපත්ති

බැංකු අංශයේ ඔරොන්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා රෙගුලාසි නිකුත් කිරීම සහ අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කිරීම ඇතුළු විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වා දීමට, මහ බැංකුව 2024 වසර තුළ දී නොකඩවා කටයුතු කළේය. 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත බලාත්මක කිරීම, බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ නෛතික රාමුව ශක්තිමත් කිරීමෙහිලා වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. එය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින්, මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නව රෙගුලාසි/මාර්ගෝපදේශ කිහිපයක් වසර තුළ දී නිකුත් කරන ලදී. ඒ අනුව, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින්, බලපත්‍රලාභී බැංකු සඳහා ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව නිර්ණය කරමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කෙරිණි. ඊට අමතරව, බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර පිළිබඳ වන බැංකු පනත් විධානය සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සඳහා භාවිතා වන විදේශ ව්‍යවහාර මුදල් නම් කරමින් බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු) නියෝගය යනාදී රෙගුලාසි කිහිපයක් ද නිකුත් කළේය. තවද, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය ඇගයීම පිළිබඳ බැංකු පනත් නිර්ණ සහ විධාන ද නිකුත් කෙරිණි. තවදුරටත්, බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් (Related Parties) නිශ්චිතව දක්වමින්, එවැනි සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන්, අනුමත සුරැකුම් සහ ඊට අදාළ සීමාවන් නිශ්චය කරමින් රෙගුලාසි නිකුත් කළේය.

වර්තමාන වෙළඳපොළ වර්ධනයන්, ගෝලීය ප්‍රශස්ත භාවිතයන් සහ යාවත්කාලීන වන නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු අධීක්ෂණය කිරීම ඇතුළුව අවදානම් අධීක්ෂණ හා පාලන උපක්‍රමයන් වැඩිදියුණු කරන අතර ම බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ එහි භාවිතයන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ නිපුණතාවය සහ වෘත්තීමය අවංකභාවය අවධාරණය කිරීම ප්‍රධාන වශයෙන් අරමුණු කර ගනිමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

වත්කම් හානිය ඉහළ යාම විචක්ෂණශීලී ලෙස කළමනාකරණය, ණය අවදානම අවම කිරීම සහ සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර තිරසර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකු තුළ ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" යන චක්‍රලේඛය නිකුත් කරන ලදී. තවද, ජාතික ණය සුරැකුම් ආයතනය දක්වන ලද මූල්‍ය ආයතන ලැයිස්තුවට ඇතුළත් කරමින් සහ එම ආයතනය විසින් ඇපවන නිරාවරණ ප්‍රමාණය සඳහා අවදානම මත බර තැබීමේදී සහනදායී අනුපාතයක් ලබා දෙමින් බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පිළිබඳ වන බැංකු පනත් විධාන සංශෝධනය කරන ලදී. මහ බැංකුව විසින් ආර්ථික අංශවලට සහාය වීම සඳහා සිය ප්‍රයත්නයන් අඛණ්ඩව සිදු කරන අතර පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීන අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා සහන සැලසීමේ ක්‍රියාමාර්ග දක්වමින් ඒ පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

තවද, බැංකු පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් කලින් කලට නියාමන ක්‍රියාමාර්ග රාශියක් හඳුන්වා දී ඇත. බලපත්‍රලාභී බැංකුවල කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ප්‍රකාශන ආකෘති නියම කිරීම, තෝරාගත් බලපත්‍රලාභී බැංකුවල අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව තීරණය කිරීම පිළිබඳ බැංකු පනත් නිර්ණයක් නිකුත් කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ජංගම බැංකු ඒකක පිහිටුවීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම යනාදිය මෙම නියාමන ක්‍රියාමාර්ග අතර වේ.

මුදල් සමාගම්වලට අදාළ ප්‍රතිපත්ති

මුදල් සමාගම් තුළ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින්, මහ බැංකුව විසින් ණය අවදානම් සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා විධාන දෙකක් නිකුත් කරන ලදී. මෙම රාමු මගින්, අවදානම් කළමනාකරණ

6 https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/fssr/fsr_2024e.pdf

3

ක්‍රමෝපායයන්, ප්‍රතිපත්ති හා ක්‍රියාවලි, පාලන ව්‍යුහයන් සහ අංශයට ඇතිවිය හැකි අවදානම් කළමනාකරණය සඳහා වන පද්ධති ඇතුළු තීරණාත්මක අංශ ආවරණය කරයි. තවද, දත්තවල ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා "කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා" පිළිබඳ විධානයක් නිකුත් කිරීම මගින් මුදල් සමාගම් විසින් කාලීන, නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ තොරතුරු වාර්තා කිරීම සහතික කරන ලදී.

මූල්‍ය ස්ථායීතාව වැඩි දියුණු කිරීමේ සහ සාධාරණ වෙළඳපොළ පිළිවෙත් සහතික කිරීමේ අරමුණින්, මුදල් සමාගම්වල තැන්පතු කැඳවීමේ පිළිවෙත් සහ වේතන ප්‍රතිපත්තිවලට අදාළව ප්‍රධාන නියාමන පියවර ක්‍රියාත්මක කරන ලදී. "මූල්‍ය සමාගම් විසින් තැන්පතු කැඳවීම" පිළිබඳ විධානයේ දක්වා ඇති පරිදි, තැන්පතු භාරගැනීම, වෙළඳ දැන්වීම් පළකිරීම සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනාක්‍රම ඉදිරිපත් කිරීමට අදාළ කොන්දේසි සඳහා වන සුවිශේෂී පිළියම් තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමට සහ මුදල් සමාගම් අතර සාධාරණ තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. තවද වසර තුළ දී, "වැටුප් ප්‍රතිපත්ති සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ" නිකුත් කිරීම මගින් මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා වැටුප් ලබා දීමේ දී ස්ථාවර බව, සාධාරණත්වය සහ විනිවිදභාවය සහතික කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

බැංකු නොවන මූල්‍ය ආයතන (Non-Bank Financial Institutions) ඒකාබද්ධකරණ සැලැස්මෙහි පළමු අදියර සාර්ථකව නිම කිරීම සහ දෙවන අදියර හඳුන්වාදීමත්, ඒ හා සමගාමීව නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවීම් සහ මූල්‍ය ස්ථායීතා ගැටලු සඳහා පිළියම් යෙදීම මගින්, බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණය හා අධීක්ෂණය සාර්ථක ප්‍රගතියක් ලබා ගන්නා ලදී. 2020 වසරේ දී ආරම්භ කරන ලද බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ සැලැස්මෙහි පළමු අදියර, එහි දක්වා ඇති අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගනිමින් අවසන් කරන ලද අතර ඒකාබද්ධකරණ සැලැස්මෙහි සංශෝධිත දෙවන අදියර වසර තුනක ක්‍රියාත්මක කිරීමේ කාල සීමාවක් සහිතව 2024 දෙසැම්බර් මාසයේ දී හඳුන්වා දෙන ලදී. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව අනුව, ප්‍රාග්ධනය හා සම්බන්ධ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවන මුදල් සමාගම්වලට සහ අනෙකුත් නියාමන අවශ්‍යතා සමඟ අනුකූල නොවන මුදල් සමාගම්වලට එරෙහිව නියාමන ක්‍රියාමාර්ග වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. ඇතැම් මුදල් සමාගම් විසින් අදාළ නියාමන විධාන සමඟ අනුකූලතාවය තහවුරු කිරීමෙන් පසු, එම සමාගම්වල තැන්පතු සහ ණය මත පනවා තිබූ සීමාවන් ඉවත් කරන ලදී. තවද, බිඳවැටුණු මුදල් සමාගම් සඳහා වූ නිරාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලද අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා එම සමාගම්වල ඈවරකරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී.

රාජ්‍ය ණය කළමනාකරණ ප්‍රතිපත්ති

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීම රාජ්‍ය ණය කළමනාකරණයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එම පනත 2024 වසරේ ජුනි 18 වන දින නීතිගත කරන ලද අතර, මුදල් අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ගැසට් නිවේදනයක් හරහා 2024 වසරේ නොවැම්බර් 25 වන දින සිට බලාත්මක කරනු ලැබූ එම පනතේ විධිවිධානවලට අනුකූලව, 2024 වසරේ දෙසැම්බර් 2 වන දින මුදල් අමාත්‍යංශය යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වගන්තියට අනුකූලව, රාජ්‍ය ණය කළමනාකරණ ආයතනය හෝ කාර්යාලයට අදාළ නීතිය බලාත්මක වන තෙක් මහ බැංකුව විසින් රජය වෙනුවෙන් රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණය අඛණ්ඩව සිදු කරනු ඇත. එමෙන්ම, රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 37 වන වගන්තියට අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වීමට මාස 18ක කාලයක් ලබා දෙමින්, අමාත්‍යවරයා විසින් පත් කරන ලද දින සිට මාස 18ක කාලයක් ඇතුළත, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගයක් මගින් ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 132 වන වගන්තියට අදාළ වීම ක්‍රියාත්මක විය යුතුය. මේ අනුව, අදාළ නීති මගින් අර්ථ දක්වා ඇති පරිදි රාජ්‍ය ණය කළමනාකරණ පනතේ පත් කළ දින වනම්, 2024 නොවැම්බර් 25 වන දින සිට උපරිම වශයෙන් මාස 18ක්, මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් එහි කාර්යයන් ඉටු කිරීම සිදු කළ යුතුය.

මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ප්‍රතිපත්ති

මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රමුඛතාවක් ලෙස ඉස්මතු වී ඇති අතර, එය වඩාත් සාධාරණ හා තිරසර මූල්‍ය පරිසරයක් සඳහා වන ප්‍රමුඛතාවයට අනුකූලව සිදු කෙරේ. 2021 වසරේ දී ආරම්භ කරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි ක්‍රියාකාරී සැලැස්ම, එහි පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක විය. මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය, 2024 වසරේ මැයි මාසයේ දී එළිදක්වන ලද අතර එය මූල්‍යමය සාක්ෂරතාවයෙන් සහ හැකියාවෙන් යුත් සමාජයක් ඇති කිරීම අරමුණු කරයි.

2023 වසරේ දී පිහිටුවන ලද ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම අත්හිටුවීම 2024 වසරේ දී ද ක්‍රියාත්මක විය. මෙය, මහ බැංකුවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ණය ලබාදීමේ ක්‍රියාකාරකම් ක්‍රමානුකූලව අවම කිරීමේ උපාය මාර්ගික අභිප්‍රාය ඇතිව, රජය සහ

පරිත්‍යාගශීලී ආයතන විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම අත්හිටුවීමට මහ බැංකුවේ පාලක මණ්ඩලය ගත් තීරණයට අනුකූල වේ. එසේ වුවද, රජය විසින් මෙහෙයවනු ලබන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී භූමිකාවක් මහ බැංකුව විසින් ඉටු කරනු ලබයි.

ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා වන ප්‍රතිපත්ති

ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ ස්ථායීතාව සුරක්ෂිත කරමින් ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් මහ බැංකුව විසින් මෙම වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. මෙම ප්‍රයත්නයන්හි කොටසක් ලෙස අන්තර්ජාතික ප්‍රමිතීන්වලට අනුකූලව ඉහළ වටිනාකමින් යුතු දේශීය ගෙවීම් සඳහා ISO 20022 ප්‍රමිතීන් ක්‍රියාත්මක කරන ලදී. සුළු පරිමාණ ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව LANKAQR ගනුදෙනු සඳහා වූ උපරිම වෙළඳ වට්ටම් අනුපාතය (Merchant Discount Rate - MDR) ගනුදෙනු මුදලින් 1% ක් ලෙස නැවත ස්ථාපිත කළ අතර, ගනුදෙනුවක උපරිම සීමාව රුපියල් 200,000 සිට රුපියල් 500,000 දක්වා වැඩි කරන ලදී.

රාජ්‍ය ආයතනවලට සිදු කරන මාර්ගගත ගෙවීම් සක්‍රීය කිරීමට සහ වීවායේ කාර්යක්ෂමතාව මෙන්ම මහජනතාවට එම මාර්ගගත ගෙවීම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව ද වැඩි දියුණු කිරීමේ අරමුණින්, සියලුම බලපත්‍රලාභී බැංකුවලට ඔවුන්ගේ අන්තර්ජාල බැංකුකරණ පද්ධති සහ ජංගම ගෙවීම් යෙදුම් හරහා නම ගනුදෙනුකරුවන්ට GovPay පහසුකම ලබා දෙන ලෙස මහ බැංකුව උපදෙස් ලබා දුන්නේය. දැනට තමන්ගේම අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ පද්ධතියක් නොමැති, විශේෂයෙන් පළාත් පාලන මට්ටමේ රාජ්‍ය ආයතනවලට මහජනතාවගෙන් ඩිජිටල් ගෙවීම් භාරගැනීමට GovPay මගින් හැකියාව ලබා දෙයි.

ඩිජිටල් ගෙවීම්වල ආරක්ෂාව ශක්තිමත් කිරීම, ඩිජිටල් ගනුදෙනුවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම කෙරෙහි පාරිභෝගික විශ්වාසය වැඩි කිරීම සඳහා මහ බැංකුව විසින් පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. ජස්ට්පේ (JustPay) පහසුකම සක්‍රීය කර ඇති සියලුම ජංගම යෙදුම් හරහා සිදු කරනු ලබන රුපියල් 10,000 හෝ ඊට වැඩි ගනුදෙනු සඳහා එක් වරක් පමණක් භාවිත කළ හැකි මුරපදයක් (OTP) ඉල්ලා සිටීම අනිවාර්ය කිරීම මගින් ඩිජිටල් ගෙවීම් තවදුරටත් ශක්තිමත් කරන ලදී. ජංගම ගෙවීම් යෙදුම් සමඟ සම්බන්ධ කර ඇති ගනුදෙනුකරුවන්ගේ ජංගම ගිණුම් හෝ ඉතිරි කිරීමේ ගිණුම් (Current Accounts/Savings Accounts) අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා කිරීම සඳහා, ජංගම ගෙවීම් යෙදුම් සඳහා ලියාපදිංචි කිරීමේ දී පරිශීලක තොරතුරු සත්‍යාපනය කිරීමෙන් පාරිභෝගිකයා හඳුනාගැනීමේ හැකියාව වැඩි දියුණු කරන ලෙස මහ බැංකුව, ජංගම ගෙවීම් යෙදුම් සපයන්නන් (Mobile Payment Application Providers) වෙත උපදෙස් දුන්නේය. මීට අමතරව, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් ලියාපදිංචි කිරීම සඳහා, 2024 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග නිකුත් කරන ලද අතර, එමගින් ඔවුන්ගේ මෙහෙයුම් ක්‍රමවත් කිරීමට සහ විධිමත් මාර්ග හරහා මුදල් පැවරීමේ ව්‍යාපාරයේ නිරත වීමට අවස්ථාව සැලසේ.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

ශ්‍රී ලංකාවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ජාතික අවදානම් ඇගයීම යාවත්කාලීන කිරීමේ කාර්යය මේ වන විටත් ආරම්භකර ඇති අතර අනතුරුව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්නවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ප්‍රතිපත්තිය යාවත්කාලීන කරනු ඇත. මෙම යාවත්කාලීන කිරීමට, බදු සහ සමූල ඝාතක අවි ප්‍රගුණනය සඳහා අරමුදල් සැපයීම පිළිබඳ අවදානම් තක්සේරු ද ඇතුළත් වන අතර, 2025 වසර මැද දී අවසන් කිරීමට නියමිතය. 2023-2028 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවේ ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්තිය පිළියෙළ කිරීමේ දී, 2021/22 ජාතික අවදානම් තක්සේරුවෙහි හඳුනාගැනීම් මගින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළේය. මූල්‍ය බුද්ධි ඒකකය, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අරමුණු කරගනිමින්, පාර්ශ්වකරුවන් 24 දෙනෙකු සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කළ අතර, එමගින් ශ්‍රී ලංකාව ගෝලීය මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රමිතීන්ට අනුකූල වීම ශක්තිමත් කරන ලදී. ජාතික මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ප්‍රතිපත්ති අරමුණු සහ නියාමන අපේක්ෂාවන් සමඟ පෙළගැස්වීම සහතික කරමින්, එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද කාර්ය සාධක බලකාය වසර තුළ පාර්ශ්වකරුවන් සමඟ රැස්වීම් 39ක් පැවැත්වීය. මීට අමතරව, 2026 වසරේ මාර්තු මාසයේ දී මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කණ්ඩායම විසින් පැවැත්වීමට නියමිත තුන්වන අන්‍යොන්‍ය ඇගයීම සඳහා සූදානම් වීමේ දී, මහ බැංකුව විචක්ෂණශීලී අධීක්ෂකයෙකු ලෙස නියාමන රාමුව ශක්තිමත් කිරීමට සහ මූල්‍ය ආයතනවල අනුකූලතා අධීක්ෂණය ඉහළ නැංවීමට අඛණ්ඩව කටයුතු කරමින් සිටියි.

මූල්‍ය බුද්ධි ඒකකය, තම නියාමන අධීක්ෂණයේ කොටසක් ලෙස, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, මූල්‍ය ආයතන සහ රක්ෂණ සමාගම් සඳහා

3

3

පාරිභෝගිකයින් පිළිබඳව නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ අවශ්‍යතා, පරිසීමිත අලෙවිකරුවන් සහ වටිනා ලෝහ හා මැණික් ගල් අලෙවිකරුවන් සඳහා වන අවශ්‍යතා සමඟ අනුකූල වීමට 2024 වසර තුළ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කර ඇත. මෙම පියවර මහ බැංකුවේ නියාමන ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, මූල්‍ය අංශයේ සුපිළිපන්භාවය ශක්තිමත් කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත පරිචයන් පිළිපැදීම සහතික කිරීම සඳහා වන පුළුල් උපාය මාර්ගයක කොටසකි. මෙම මුලපිරීම් මගින්, සාමූහිකව ගත් කල, මූල්‍ය ස්ථායීතාව පවත්වා ගැනීම, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන්ගෙන් ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුවේ අඛණ්ඩ කැපවීම පිළිබිඹු කෙරේ.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති

2024 වසර තුළ දී, රටේ මූල්‍ය අංශය තුළ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම උදෙසා මහ බැංකුව විසින් තීරණාත්මක පියවර රැසක් ගනු ලැබීය. 2024 වසරේ අගෝස්තු 9 වන දින සිට මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි පූර්ණ වශයෙන් බලාත්මක වීම මෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මෙම රෙගුලාසි මගින් මූල්‍ය සේවාවන්හි සාධාරණත්වය, විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගිකයන්ට සමානව සැලකීම, සහ පැහැදිලි හා නිවැරදි තොරතුරුවලට ප්‍රවේශවීම සඳහා ඇති හැකියාව තහවුරු කරන ලදී.

මෙම රෙගුලාසිවල තවත් වැදගත් අංගයක් වන්නේ එමඟින් මහ බැංකුවට වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය කිරීම සඳහා බලය ලබාදීමයි. මෙමඟින්, මූල්‍ය ආයතන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට අනුගතවීම හා පාරිභෝගික අයිතීන් ඵලදායී ලෙස ආරක්ෂා කිරීම නියාමනය කිරීමට මහ බැංකුවට අවස්ථාව සැලසේ. මෙවැනි ක්‍රමවත් ඇගයීම් සිදුකිරීමෙන්, නියාමන අධිකාරිය ලෙස, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ දී පවතින හිඩැස් හෝ අභියෝග හඳුනාගැනීමට අවස්ථාව ලැබෙන අතර, අනාගතයේදී වෙළඳපොළ හැසිරීම පිළිබඳ නව රෙගුලාසි සම්පාදනය කිරීමේ දී එම රෙගුලාසි යොදා ගත හැකිය.

තැන්පතු රක්ෂණය සහ මූල්‍ය ආයතනවල නිරාකරණ පිළිබඳ ප්‍රතිපත්ති

2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ රාමුව ශක්තිමත් කිරීමේ දී සැලකිය යුතු ප්‍රගතියක් මහ බැංකුව විසින් 2024 වසරේ දී ලබා ගන්නා ලදී. මේ අනුව, ඵලදායී නිරාකරණ උපාය මාර්ග සඳහා මූලික පියවර තබමින්, බැංකු (විශේෂ විධිවිධාන) පනතට අනුකූලව "නිරාකරණ ප්‍රතිපත්තිය" නිර්මාණය කරන ලදී. තවද, මෙම වසර තුළ දී පූර්ව මැදිහත්වීමේ ක්‍රියාවලිය සක්‍රීය කිරීම සහ මූල්‍ය අංශයේ අර්බුද පූර්ව කළමනාකරණය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ ප්‍රේරක සාර්ථකව ස්ථාපිත කරන ලදී. නිරාකරණ සැලසුම් සඳහා සහාය වීමේ අරමුණෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවල ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා නියෝගයන් නිකුත් කරන ලදී. මීට අමතරව, අර්බුදකාරී අවස්ථාවන්හි දී ක්‍රමවත් ක්‍රියාවලියක් පැවතීම සහතික කිරීම සඳහා තෝරාගත් බලපත්‍රලාභී බැංකු සඳහා නිරාකරණ සැලසුම් සකස් කෙරෙමින් පවතී. තවද, තැන්පතු රක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන වෙත 2024 අංක 02 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගයන් මහ බැංකුව විසින් නිකුත් කරන ලදී.

මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියෙහි කොටසක් ලෙස සහ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත පරිචයන්ට අනුකූලව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂිත තැන්පතු ආපසු ගෙවීම සිදුකරන ආකාරය පිළිබඳව නව මාර්ගෝපදේශ හඳුන්වා දෙන ලදී. මෙම මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින් හිමිකම් ඉදිරිපත් කිරීමේ සහ රක්ෂණ වන්දි මුදල් ගෙවීමේ ක්‍රියා පටිපාටිය විධිමත් සහ කඩිනම් කරමින් රක්ෂිත තැන්පත්කරුවන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම අරමුණු කර ඇත. මීට අමතරව, ගැටලු ඵලදායී ලෙස නිරාකරණය කිරීම සඳහා සහ සීමාවන් තවදුරටත් නිරවද්‍ය ලෙස අවබෝධ කරගැනීම සඳහා, බැංකු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක (Unique Identification Numbers) සටහන් කිරීම අනිවාර්ය කිරීම පිළිබඳ 2024 අංක 01 දරන මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. මෙම මෙහෙයුම් උපදෙස් මගින් තැන්පත්කරුවන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම මෙන්ම වන්දි ගෙවීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම අරමුණු කරයි.

3

විශේෂාංග සටහන

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ඊට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

මුදල් ප්‍රතිපත්තිය

2024 පෙබරවාරි 09	2024 පෙබරවාරි 16 වැනි දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි, නිත්‍ය ණය පහසුකම මත පනවා තිබූ සීමාව ඉවත් කෙරුණු අතර, නිත්‍ය තැන්පතු පහසුකම මත පනවා තිබූ සීමාව මාසයක් තුළ පස් වතාවක (05) සිට දස වතාවක් (10) දක්වා ලිහිල් කරන ලදී.[2]
2024 මාර්තු 26	2024 අප්‍රේල් මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම සඳහා පැවති සීමාව ඉවත් කරන ලදී. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 8.50%ක් සහ 9.50%ක් දක්වා අඩු කරන ලදී.
2024 ජූලි 24	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 8.25%ක් සහ 9.25%ක් දක්වා අඩු කරන ලදී.
2024 නොවැම්බර් 27	මහ බැංකුව පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් වෙත යොමු විය. ඒ අනුව, මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීමට භාවිතා කරන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) හඳුන්වා දෙන ලද අතර එය පදනම් අංක 50ක අඩු කිරීමක් පිළිබිඹු කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00%ක් ලෙස තීරණය කරන ලදී. තවද, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක ± 50ක ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කරමින්, පිළිවෙළින්, 7.50% සහ 8.50%ක් ලෙස නම් කරන ලදී.[3]

විශේෂ ණය යෝජනා ක්‍රම

2024 ජනවාරි 03	ඉදිරියේ දී රජයේ අරමුදල් මගින් හෝ අරමුදල් සපයනු ලබන නියෝජිත ආයතනවල අරමුදල් භාවිතයෙන් ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී. නමුදු දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ණය යෝජනා ක්‍රමයන්හි මෙහෙයුම් කාලය අවසන් වනතෙක් එම ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ඇත.

ගෙවීම් හා සියවීම්

2024 අප්‍රේල් 20	2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ විධිවිධාන යටතේ 2024 අංක 1 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා වන නියෝග නිකුත් කරන ලදී. ඒ අනුව, මෙම නියෝග මගින් සියලුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් 2024 වසරේ ජූනි 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම අවශ්‍ය වන අතර, එමගින් ලියාපදිංචි නොකළ හෝ බලපත්‍ර රහිත මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් හට ඔවුන්ගේ මෙහෙයුම් විධිමත් කිරීමට සහ විධිමත් මාර්ග හරහා මුදල් හුවමාරු ව්‍යාපාරයේ නිරත වීමට අවස්ථාව ලබා දේ.

1 2024 ජනවාරි 01 සිට 2025 මාර්තු 15 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2 මහ බැංකුවේ නිත්‍ය පහසුකම් මත සහභාගීත්ව ආයතන අධික ලෙස රඳා පැවතීම අඩු කිරීමේ අරමුණින්, 2023 ජනවාරි 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය පහසුකම් සඳහා සීමාවන් පනවන ලදී.

3 නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස සලකනු නොලබන අතර, සහභාගීත්ව ආයතනවලට නිත්‍ය පහසුකම් සඳහා අදාළ වන අනුපාතික ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි.

2024 ජනවාරි 01 සිට 2025 මාර්තු 15 දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ එයට අදාළ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එම කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සවිස්තරාත්මක අනුවාදයක් මාර්ගගතව ලබා ගත හැක.

යොමුව : ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2024 → ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද හෝ ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

සබැඳිය : https://www.cbsl.gov.lk/si/ප්‍රකාශන/ආර්ථික-හා-මූල්‍ය-වාර්තා/වාර්ෂික-ආර්ථික-විවරණය/වාර්ෂික-ආර්ථික-විවරණය-2024/ප්‍රධාන-ආර්ථික-ප්‍රතිපත්තිමය-ක්‍රියාමාර්ග

2024 දෙසැම්බර් 03	ගනුදෙනුකරුවන්ගේ ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා කරගැනීම අරමුණු කර ගනිමින්, ගෙවීම් යෙදුම් වෙත ලියාපදිංචි වීමේදී පරිශීලකයා හඳුනා ගැනීම සහ පරිශීලකයින් විසින් සපයනු ලබන තොරතුරු තහවුරු කරගැනීම සඳහා තොරතුරු ලබාගැනීමට සුදුසු යාන්ත්‍රණයක් 2025 වසරේ මාර්තු 31 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථාපිත කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන් හට උපදෙස් ලබාදෙන ලදී. තවද, ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම් ජස්ටිපේ පහසුකම සහිත ගෙවීම් යෙදුමකට සම්බන්ධ කිරීමේ දී ගෙවීම් යෙදුමේ පරිශීලකයා සහ ජංගම ගිණුම්/ඉතුරුම් ගිණුම්හි හිමිකරු එකම අයෙකු බව සහතික කරගන්නා ලෙස ජංගම ගෙවීම් යෙදුම් සැපයුම්කරුවන් වෙත උපදෙස් දෙන ලදී.
2025 ජනවාරි 27	ඩිජිටල් ගනුදෙනු ප්‍රවර්ධනය කිරීම සඳහා, ඩිජිටල් ගෙවීම් ලබාගැනීමට හැකි තොරතුරු තාක්ෂණ පද්ධතියක් නොමැති රාජ්‍ය ආයතන වෙත ඩිජිටල් ගෙවීම් පිළිගැනීම පහසු කිරීමට හඳුන්වාදුන් ගෙවීම් වේදිකාව වන GovPay හරහා සිදු කරනු ලබන එක් ගනුදෙනුවක් සඳහා අයකළ හැකි උපරිම ගාස්තුව 2025 වසරේ පෙබරවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රුපියල් 15/-ක් ලෙස නියම කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2024 අප්‍රේල් 01	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත අනිවාර්යයෙන් ලබා දිය යුතු වාර්තා සම්බන්ධයෙන් වන අනුකූලතාවය පිළිබඳව ආයතන වෙත 2024 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 05	මූල්‍ය ආයතන විසින්, ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්ට අනුකූලවීම සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 සැප්තැම්බර් 19	රක්ෂණ ආයතන විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීතින්ට අනුකූලවීම සම්බන්ධයෙන් රක්ෂණ ආයතන වෙත 2024 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 ඔක්තෝම්බර් 02	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන යටතේ පරිසීමිත වෙළඳුන්ගේ ආයතනික අනුකූලතාව සහතික කිරීම සම්බන්ධයෙන් පරිසීමිත වෙළඳ ආයතන වෙත 2024 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.
2024 නොවැම්බර් 04	2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතට සහ 2018 අංක 1 දරන නාමෝද්දිෂ්ට මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන්ට අනුකූල වීම සම්බන්ධයෙන් 2024 අංක 04 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු

2024 ජනවාරි 01	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ 2023 වසරේ පෙබරවාරි 27 දිනැති ජංගම ගනුදෙනු සඳහා වන "විශේෂ විදේශ මුදල් ගිණුම් - ආයෝජිතයා" යන මැයෙන් නිකුත් කරන ලද 2023 අංක 01 දරන විධාන සංශෝධනය කිරීම සඳහා 2024 අංක 01 දරන විධාන නිකුත් කරන ලද අතර එමගින් මෙම ගිණුම් විවෘත කිරීමේ වලංගු කාලය 2024 ජූනි 30 දක්වා දීර්ඝ කරන ලදී.
2024 පෙබරවාරි 15	2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍රලාභී නිෂ්කාශන ආයතනයක් විසින් ප්‍රකාශයට පත් කරන ලද රීති ප්‍රකාර ව "සුරුකුම්පත් ණයට ගැනීම ණයට දීම" යන ගනුදෙනු යටතේ කොළඹ කොටස් වෙළෙඳපොලේ ලැයිස්තුගත කර ඇති සුරුකුම්පත් අත්පත් කර ගැනීමට, විකිණීමට හෝ ඇපයට තැබීමට අනේවාසිකයන්ට අවසර දීමේ අරමුණින්, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2021 පෙබරවාරි 15 දිනැති අංක 2371/31 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් 2024 අංක 02 දරන විධාන 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී.
2024 පෙබරවාරි 16	නේවාසික සමාගම්වලට අනේවාසිකයින්ගෙන් වසර 3 කට අඩු කාලයක් සඳහා ණය ලබාගැනීමට ඇති අවසරය අවලංගු කිරීම සහ නේවාසික සමාගමට ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති විට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් දැනටමත් ලබාගෙන ඇති එවැනි ණය සඳහා ආපසු ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දීමේ අරමුණින් 2021 වසරේ පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2024 වසරේ පෙබරවාරි 16 දිනැති අංක 2371/48 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් වන 2024 අංක 3 දරන උපදෙස් 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී.

	ප්‍රමාණවත් විදේශ විනිමය ශේෂ/මුදල් ප්‍රවාහ නොමැති විට ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීම මගින් අනේවාසික පුද්ගලයන්ට හිමි ලැයිස්තුගත ණය සුරුකුම්පත් සහ ලැයිස්තුගත කොටස් සම්බන්ධ ආදායම් හෝ කල්පිරුම් සඳහා ගෙවීම් සිදු කිරීමට අවසර ලබා දීමේ අරමුණින් 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් පළ කර ඇති 2021 අංක 2 දරන රෙගුලාසි සංශෝධනය කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/49 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති රෙගුලාසි නිකුත් කරන ලදී. මෙම පියවර සම්බන්ධයෙන් වන 2024 අංක 04 දරන විධාන 2024 මාර්තු 20 වන දින බලයලත් අලෙවිකරුවන් වෙත නිකුත් කරන ලදී. අනේවාසිකයින්ගෙන් ලබා ගත් ණය වලින් ලැබෙන මුදල් භාවිත කරමින් නේවාසික සමාගම්වලට ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර ලබා දී ඇති 2021 ජූනි 30 දිනැති අංක 2234/20 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2021 අංක 06 දරන රෙගුලාසි අවලංගු කිරීම සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 07 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ 2024 පෙබරවාරි 16 දිනැති අංක 2371/50 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවලට ප්‍රකාශයට පත් කරන ලද රෙගුලාසි නිකුත් කරන ලදී.
2024 ජූනි 18	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අතර 2023 වසරේ දෙසැම්බර් 20 දිනැති අංක 2363/26 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද නියෝගය යටතේ පනවන ලද යම් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර කිහිපයක් ලිහිල් කිරීමේ අරමුණින් 2024 ජූනි 18 දිනැති අංක 2389/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝගය නිකුත් කරන ලදී.
2024 ජූලි 01	2024 ජූලි 01 දිනැති අංක 2391/02 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති 2024 අංක 01 දරන අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධ රීති, 2023 අංක 16 දරන මහ බැංකු පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද අතර එමගින් අපනයන ආදායම්වල ඉතිරි කොටස සම්බන්ධ අනිවාර්ය පරිවර්තනය අවශ්‍යතාව සඳහා වන කාල සීමාව පෙර රීතිවල නියම කර තිබූ පරිදි, පසු මාසයේ 07 වන දිනට සාපේක්ෂව, එම ආදායම ලැබුණු දින සිට දින දර්ශන මාස තුනක් (ලැබුණු මාසය ද ඇතුළුව) කල් ඉකුත් වීමෙන් පසුව මාසයේ 10 වන දින දක්වා දීර්ඝ කරන ලදී. පාර්ලිමේන්තු අනුමැතියෙන් පසු මෙම රීති 2024 සැප්තැම්බර් 4 දින සිට බලාත්මක විය.
2024 අගෝස්තු 01	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විශේෂ වීසා වැඩසටහන යටතේ නේවාසික වීසා ලබාගන්නා විදේශිකයන්ගේ ගනුදෙනු සහ පහසුකම් සැලසීම සඳහා 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ 2024 අංක 05 දරන විධානය සහ 2024 අංක 06 දරන විධාන නිකුත් කරන ලදී.
2024 දෙසැම්බර් 19	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අංක 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද 2024 ජූනි 18 දිනැති අංක 2389/08 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝග යටතේ පනවන ලද යම් ප්‍රාග්ධන ප්‍රවාහ පියවර තවත් මාස 6 කට දීර්ඝ කරමින් සහ එවැනි පියවරවල ඇතැම් අඩුලුහුඩුකම් සපුරාලීමේ අරමුණින් 2024 දෙසැම්බර් 19 දිනැති අංක 2415/56 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කර ඇති නියෝගය නිකුත් කරන ලදී.
රාජ්‍ය ණය කළමනාකරණය	
2024 මාර්තු 11	2024 වසරේ මාර්තු 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2024 වසරේ මාර්තු 07 වන දින නිකුත් කරන ලද සංශෝධිත විධානයන්ට අනුව, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී දෙවන අදියර සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සමස්ත වෙන්දේසි හිඟය සහ ඉදිරිපත් කරන ලද මුළු වටිනාකමින් 10%ක් හෝ රුපියල් බිලියන 5ක් (යන අගයන්ගෙන් ඉහළ අගය) දක්වා අඩු කර ඇත. 2024 වසරේ මාර්තු 11 වන දින සිට බලපැවැත්වෙන පරිදි, 2024 වසරේ මාර්තු 07 දින නිකුත් කරන ලද සංශෝධිත විධානයන්ට අනුව, භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල දී සෘජු නිකුතු කවුළුව සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රමාණය, පළමු අදියරේ දී සම්පූර්ණයෙන්ම පිළිගනු ලැබූ සුරුකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා ඉදිරිපත් කරන ලද වටිනාකමින් 10% දක්වා අඩු කර ඇත.
2024 අප්‍රේල් 01	රජයේ සුරුකුම්පත් ආයෝජනවලට අදාළ මුද්‍රිත කාලීන ප්‍රකාශන යැවීම අත්හිටුවනු ලැබූ අතර, එය සම්පූර්ණයෙන් ම විද්‍යුත් ප්‍රකාශන පහසුකම බවට පරිවර්තනය කරන ලදී. මේ සඳහා ලංකාසෙක්‍යු පද්ධතියේ (Lanka Secure System) සියලුම සුරුකුම්පත් ගිණුම් හිමියන් සඳහා වලංගු විද්‍යුත් තැපැල් ලිපිනයන් යාවත්කාලීන කිරීම අනිවාර්ය වේ.

3

2024 දෙසැම්බර් 20

විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ISBs) හුවමාරුව සුදුසුකම් ලත් බැඳුම්කර හිමියන්ගෙන් 97.86%කගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක විය.

එම හුවමාරුව තුළ බැඳුම්කර හිමියන්ට උපචිත පොලී සඳහා 2028 කල්පිරෙන බැඳුම්කරයක්, ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත ආර්ථික කාර්යසාධන හා බැඳුනු බැඳුම්කර හතරක් (04), ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත යහපාලනය හා බැඳුණු බැඳුම්කරයක් සහ එක් ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත ඒ.ජ. ඩොලර් බැඳුම්කරයක් පහත දැක්වෙන පරිදි නිකුත් කරන ලදී.

විස්තරය	කූපන් අනුපාතය (%)	මුල් මුදල (ඒ.ජ. ඩොලර්)
උපචිත පොලී සඳහා 2028 වසරේ දී කල්පිරෙන බැඳුම්කරය	4.0	1,647,735,257
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2030 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.1	1,086,993,557
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2033 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.35	2,132,120,275
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2036 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.6	999,165,345
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2038 වසරේ දී කල්පිරෙන ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරය	3.6	1,999,171,191
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2035 වසරේ දී කල්පිරෙන යහපාලනය හා බැඳුණු බැඳුම්කරය	3.6	1,439,672,065
ක්‍රමයෙන් වැඩි වන කූපන් පොලී අනුපාතික සහිත 2038 වසරේ දී කල්පිරෙන ඒ.ජ. ඩොලර් බැඳුම්කරය	1.0	1,126,487,250

මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මීට අමතරව, බැඳුම්කර හුවමාරුව සඳහා වූ යෝජනාව කල් ඉකුත්වන දිනට හෝ ඊට පෙර, පවතින බැඳුම්කර මාලාවක් සම්බන්ධයෙන් වන වලංගු උපදෙස් ලබා දී ඇති බැඳුම්කර හිමියන් සඳහා හුවමාරු ගාස්තු ගෙවීම් සඳහා, ඒ.ජ. ඩොලර් 215,237,873ක වටිනාකමින් යුත් ඒ.ජ. ඩොලර්වලින් නාමනය කරන ලද "හුවමාරු ගාස්තු" බැඳුම්කර නිකුත් කරන ලදී. තවද, ජාත්‍යන්තර බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමේ දේශීය විකල්පය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 155,728.6 වන නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා සම්බන්ධිත නව භාණ්ඩාගාර බැඳුම්කර අටක් (08) නිකුත් කරන ලදී.

2024 දෙසැම්බර් 30

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී ශ්‍රී ලංකා රුපියල් මගින් ණය පියවීම ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා සම්බන්ධිත නව භාණ්ඩාගාර බැඳුම්කර පහක් (05) නිකුත් කරන ලදී.

මූල්‍ය අංශය

බලපත්‍රලාභී බැංකු

2024 මාර්තු 25

සිදුවිය හැකි ණය සංකේන්ද්‍රණ අවදානම අවම කරමින් බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාවය සහ ශක්තිමත්භාවය තහවුරු කර ගැනීම සහ මහජන විශ්වාසය ආරක්ෂා කිරීමේ අරමුණින්, 2026 ජනවාරි 01 දින සිට බලාත්මක කිරීමට නියමිතව, "බලපත්‍රලාභී බැංකුවල විශාල ගනුදෙනු නිරාවරණයවීම්" පිළිබඳ බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2024 මාර්තු 28

දැනටමත් බලපත්‍රලාභී බැංකුවල ස්ථාපිත පශ්චාත් කොවිඩ්-19 යළි පණගැන්වීමේ ඒකක තවදුරටත් ශක්තිමත් කරමින් සහ එම ඒකක, ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක ලෙස වැඩිදියුණු කරමින්, සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර තිරසාර ලෙස යළි නඟා සිටුවීමට පහසුකම් සැලසීමේ අරමුණින් සහ බලපත්‍රලාභී බැංකුවල ඉහළ ගිය අක්‍රීය ණය නිසි ලෙස හැසිරවීම තහවුරු කිරීමේ අරමුණින් "බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර යළි පණගැන්වීමේ ඒකක පිහිටුවීම සඳහා වන මාර්ගෝපදේශ" පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2024 ජූනි 13

2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලද 1988 අංක 30 දරන බැංකු පනතේ 21(1) සහ 76(ඌ) වගන්ති ප්‍රකාරව, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වාගෙන යාම අත්හිටුවමින්, සෑම බලපත්‍රලාභී බැංකුවක් ම, බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත ලෙස, ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය පවත්වා ගත යුතු බව නිර්ණය කරමින්, "බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාත" යන බැංකු පනත් නිර්ණය නිකුත් කරන ලදී.

2024 ජූනි 14	2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ, අක්වෙරළ බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසුකම් සැලසීමේ අරමුණින් "බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු" පිළිබඳ වන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. අක්වෙරළ බැංකු ව්‍යාපාර සිදු කිරීම සඳහා අවසරලත් ව්‍යාපාර, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්, අවසර ලත් ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර යටතේ ලබා දිය හැකි ණය යනාදිය මෙම විධානයන් මගින් නිශ්චිතව දක්වනු ලැබේ. තවද, බැංකු (අක්වෙරළ බැංකු කටයුතු පටිපාටිය) නියෝග සහ එවැනි අනෙකුත් බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු ඒකක සඳහා අදාළ වූ නියෝග අහෝසි කරමින් බැංකු පනත් නියෝගයක් නිකුත් කරන ලදී.
2024 ජූනි 15	බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන නීතිමය සහ නියාමන රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් කෙටුම්පත් කරන ලද බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත, 2024 අප්‍රේල් 02 දින පාර්ලිමේන්තුවේ දී අනුමත කරන ලද අතර, එය 2024 ජූනි 15 දින සිට 2024 අංක 24 දරන බැංකු (සංශෝධන) පනත ලෙස ක්‍රියාත්මක විය. මෙම සංශෝධන මගින්, බලපත්‍රයක් අයදුම් කිරීම සඳහා වන අවම අවශ්‍යතාවයන්, කොටස් හිමියන්ගේ යෝග්‍යතාවය සඳහා වන නිර්ණායක, බැංකු හිමිකාරිත්වය, අත්පත් කර ගැනීම්, එක් කිරීම සහ ඒකාබද්ධ කිරීම්, ඒකාබද්ධ අධීක්ෂණය, සමානුපාතිකත්වය, ගිණුම් සහ විගණනය පිළිබඳ අවශ්‍යතා, විශාල ගනුදෙනු නිරාවරණයන්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු, ආයතනික යහපාලනය, අක්වෙරළ බැංකු ව්‍යාපාර යනාදිය සඳහා අදාළ වන නීතිමය ප්‍රතිපාදන ශක්තිමත් කර ඇත.
2024 ජූලි 19	සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය විසින් ඇපවන නිරාවරණ ප්‍රමාණය සඳහා 20%ක අවදානම මත බර තැබීමක් නියම කරමින් "බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතාවන්" පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනත් විධානවලට සංශෝධන නිකුත් කරන ලද අතර, ඒ අනුව දක්වන ලද විධානයන්හි භාවිතය සඳහා මූල්‍ය ආයතනවල නම් ලැයිස්තුවට සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය ද ඇතුළත් කරන ලදී.
2024 සැප්තැම්බර් 30	අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු නියාමන අවශ්‍යතා වැඩිදියුණු කිරීම ඇතුළුව අවදානම් අධීක්ෂණය සහ පාලන කාර්යයන්හි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවල ආයතනික යහපාලන ක්‍රියාවලීන් සහ භාවිතයන් ශක්තිමත් කිරීම වැනි අරමුණු ඇතිව, "බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය" පිළිබඳව වන බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2024 ඔක්තෝබර් 01	බලපත්‍රලාභී බැංකුවල සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ඇතිවිය හැකි සබැඳියාවන් පිළිබඳ ගැටුම් අවම කිරීම සහ සම්බන්ධිත පාර්ශ්වයන් හට වඩාත් වාසිදායක සැලකිල්ලක් දැක්වීම වැළැක්වීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවලට අදාළ සම්බන්ධිත පාර්ශ්වයන් සහ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දී ඇති අනුග්‍රාහක සම්බන්ධයෙන් අනුමත සුරැකුම්පත් නිශ්චිතව සඳහන් කරමින් බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී. තවද, මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද බැංකු පනත් විධාන අවලංගු කරන ලදී.
2024 ඔක්තෝබර් 03	බලපත්‍රලාභී බැංකු විසින් අදාළ සම්බන්ධිත පාර්ශ්වයන්ට ලබා දෙන අනුග්‍රාහකත්ව සම්බන්ධයෙන් වන අනුමත සීමාවන් දක්වමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කරන ලදී.
2024 දෙසැම්බර් 19	ශ්‍රී ලංකා බැංකු සංගමය එකඟ වූ පරිදි, පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ මෑත කාලීනව පැවති සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදිය යුතු සහන අවධාරණය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2025 ජනවාරි 01	බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහන සැලසීම පිළිබඳ වන 2024 අංක 04 දරන චක්‍රලේඛයෙහි දක්වන ලද සහන, සියලුම බලපත්‍රලාභී බැංකු මගින් ඵලදායී සහ ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අරමුණින්, එම චක්‍රලේඛයෙහි අන්තර්ගතය තවදුරටත් පැහැදිලි කරමින් එකී චක්‍රලේඛයට අතිරේකයක් නිකුත් කරන ලදී.
අපේක්ෂිත	බලපත්‍රලාභී බැංකු සඳහා වන ආයතනික යහපාලනය පිළිබඳ විධාන සඳහා අතිරේකය. ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිරින් සේවාවන් ලබා ගැනීම පිළිබඳ විධාන. වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීම පිළිබඳ රාමුව.

මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2024 පෙබරවාරි 13	මුදල් සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතු සිදු කෙරෙන ආකාරය දැනගැනීම හෝ වෙනත් යම් නිශ්චිත වූ අරමුණක් සඳහා මුදල් සමාගම්වල කාලීන, නිරවද්‍ය, අඛණ්ඩ සහ පූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් කාලාවර්තක වාර්තා කිරීමේ අවශ්‍යතා පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2024 මැයි 03	ණය අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය, ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා විවක්ෂණ සීමා ඇතුළත් ණය අවදානම් පාලන ව්‍යුහය සැකසීම සහ ණය අවදානම හඳුනාගැනීම, මැනීම, නිරීක්ෂණය සහ පාලනය සඳහා ඵලදායී පද්ධතියක් පවත්නා බවට තහවුරු කිරීම මගින් ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින් ණය අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2024 ඔක්තෝබර් 23	මුදල් සමාගම්වල අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා වැටුප් ලබා දීමේ දී ස්ථාවර බව, සාධාරණත්වය සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් වැටුප් ප්‍රතිපත්ති සහ අනාවරණ අවශ්‍යතා පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

3

2024 නොවැම්බර් 21	තැන්පතු භාරගැනීම, වෙළඳ දැන්වීම් පළකිරීම සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනාක්‍රම ඉදිරිපත් කිරීමට අදාළව කොන්දේසි නියම කිරීම තුළින් තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සහ මුදල් සමාගම් අතර සාධාරණ තරගකාරිත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, මුදල් සමාගම් විසින් තැන්පතු කැඳවීම පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2024 නොවැම්බර් 29	මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය හා කාර්ය පටිපාටි, මෙහෙයුම් අවදානම් පාලන ව්‍යුහය සහ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සේවා සැපයීම තහවුරු කරමින් මෙහෙයුම් අවදානම හඳුනාගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය හා වාර්තා කිරීම සහ අවම කිරීම හා පාලනය, මුදල් සමාගම පුරා ක්‍රියාත්මක කිරීම සඳහා වන ඵලදායී මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලි සැකසීම තුළින් ශක්තිමත් මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කිරීමේ අරමුණින්, මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ විධානය නිකුත් කරන ලදී.
2024 දෙසැම්බර් 27	ඒකාබද්ධකරණ සැලැස්මෙහි I වන අදියර නිමාවට පත් වීමත් සමඟ, මැදි සහ දිගු කාලයේ දී වඩාත් තිරසර මුදල් සමාගම් අංශයක් ඇති කිරීමේ අරමුණින්, ඒකාබද්ධකරණ සැලැස්මෙහි සංශෝධිත II වන අදියර මුදල් සමාගම් අංශය සඳහා හඳුන්වා දෙන ලදී. මෙම සංශෝධිත රාමුව 2025 මාර්තු 31 සිට 2028 මාර්තු 31 දක්වා විහිදෙන තුන් අවුරුදු කාලසීමාවක් තුළ ක්‍රියාත්මක වීමට නියමිතය.
අපේක්ෂිත	මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන ඇතුළුව, වර්තමාන වෙළඳපොළ ප්‍රවණතා සමඟ අනුකූලවන පරිදි පවත්නා නියාමන රාමුව සංශෝධනය කිරීම.

මූල්‍ය අංශයට අදාළ වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය.

ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[4] සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර ලෝක බැංකුව යටතේ ක්‍රියාත්මක වන මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ණය ගිවිසුම් අත්සන් කරන ලදී.

2024 ජනවාරි 31	ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[4] අතර අත්සන් කරන ලද මූල්‍ය ගිවිසුම
2024 පෙබරවාරි 01	ලෝක බැංකු ජාත්‍යන්තර සංවර්ධන සංගමය සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද ව්‍යාපෘති ගිවිසුම
2024 පෙබරවාරි 06	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය[4] සහ ශ්‍රී ලංකා මහ බැංකුව අතර අත්සන් කරන ලද අනුබද්ධ ගිවිසුම.
2024 අප්‍රේල් 10	නියාමන ආංශික අධීක්ෂණය ශක්තිමත්කිරීම හා මූල්‍ය පාරිභෝගිකයන්ට සාධාරණ ලෙස සැලකීම තහවුරුකිරීම පිණිස මූල්‍ය පාරිභෝගික අධීක්ෂණ රෙගුලාසි යටතේ වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණ අංශය ස්ථාපිත කර ඇත. මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන අතර වෙළඳපොළ හැසිරීමට අදාළ ප්‍රමිතීන් සඳහා අනුකූලතාවය, නියාමනය කිරීම, ඇගයීම හා බලාත්මකකිරීම ආදියෙහි දී මෙම අංශය තීරණාත්මක භූමිකාවක් ඉටුකරයි.
2024 මැයි 21	ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය හැසිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් සියළු මූල්‍ය සාක්ෂරතා පාර්ශ්වකරුවන් හට සාක්ෂිමත පදනම් වූ මාර්ගෝපදේශකත්වයක් සැපයීම සඳහා, මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන ජාතික උපාය මාර්ගය යටතේ, ශ්‍රී ලාංකීය මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශය (2024-2028) එළි දක්වන ලදී.
2024 ජූලි 17	**මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහ අර්බුද කළමනාකරණය** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරාකරණ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීම උදෙසා 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ අර්බුද කළමනාකරණය සඳහා ඇති සුදානම වැඩි දියුණු කරන ලදී. පුළුල් නිරාකරණ ප්‍රතිපත්ති රාමුවක් ඇති කිරීම මගින්, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථායීතා රාමුව ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන් සමඟ සමපාත කරවීම සිදුවන අතර, පීඩාවට පත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රවේශයක් සහතික කරයි.
2024 අගෝස්තු 08	2023 අගෝස්තු 8 වනදින නිකුත් කරන ලද 2023 අංක 1 දරන මූල්‍ය ආරක්ෂණ රෙගුලාසි 2024 වසරේ පෙබරවාරි 08 දින සිට අර්ධ වශයෙන් බලාත්මක වූ අතර 2024 වසරේ අගෝස්තු 08 වන දින සිට පූර්ණ වශයෙන් ද බලාත්මක විය.
2024 නොවැම්බර් 01	2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ දක්වා ඇති පරිදි මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමේ අරමුණට දායක වෙමින් ණය උපදේශන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමය සමඟ එක්ව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

4 ගිවිසුම් අත්සන් කරනු ලැබූ අවස්ථාවේ දී අමාත්‍යාංශයේ නම සඳහන් වූයේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යනුවෙනි.

4 පරිච්ඡේදය

සාර්ව ආර්ථික ඉදිරි දැක්ම

සාරාංශය

සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් වීමත්, දේශීය අවිනිශ්චිතතා ක්‍රමයෙන් පහව යාමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය වර්ධන මාවතක දිගට ම ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකයෙන් ඇති විය හැකි බාධා හේතුවෙන් ආර්ථිකයේ ඉදිරි ගමන් මගට බලපෑමක් ඇති විය හැකි වුව ද, එම කම්පනවලට පූර්වයෙන් සහ ප්‍රතිචාර වශයෙන් ගනු ලබන කාලෝචිත ප්‍රතිපත්ති පියවර මඟින් එම අහිතකර බලපෑම් සීමා කරනු ඇත. අඩු හා ස්ථාවර උද්ධමනය, අඩු පොලී අනුපාතික පරිසරය, ධනාත්මක වෙළඳපොළ අපේක්ෂා සහ ස්ථාවර ආර්ථික හා දේශපාලන සාධක මඟින් කෙටි කාලීන සහ මැදි කාලීන ආර්ථික වර්ධනයට රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වත්මන් අවධමනකාරී තත්ත්වය 2025 වසරේ පළමු භාගය තුළ දී පහව යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත 5%ක මට්ටමට ආසන්නව ස්ථාවර වනු ඇත. භූ දේශපාලනික ගැටුම්, චක්සත් ජනපද රජයේ ප්‍රතිපත්ති ගැළපීම්වල බලපෑම් සහ අනෙකුත් ප්‍රධාන ආර්ථිකයන් විසින් එයට එදිරිව ගන්නා පියවර මෙන්ම දේශගුණික විපර්යාස නිසා ඇතිවන කාලගුණික කැළඹීම් මඟින් ආර්ථික වර්ධනය සහ උද්ධමනය පුරෝකථනවලින් අපගමනය වීමට අවදානම් ඇති විය හැකිය. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ඉදිරි දැක්මක් සහිතව සහ දත්ත මත පදනම්ව ක්‍රියාත්මක වනු ඇත. රජය විසින් විශාල වශයෙන් ණය ගැනීම නිසා පෞද්ගලික අංශයට සම්පත් සීමා වීමේ පීඩනය ලිහිල් වීම සහ අඩු පොලී අනුපාතික හේතුවෙන් පෞද්ගලික අංශයේ ණය වර්ධනය යහපත් මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂිතය. රාජ්‍ය අංශයට බැංකු අංශයේ නිරාවරණය අඩු මට්ටමක පවතිනු ඇති අතර, එයට රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනයෙහි අපේක්ෂිත දියුණුව බොහෝ දුරට සහාය වනු ඇත. විදේශීය අංශය සැලකූ විට, මෝටර් රථ ආනයනය සඳහා පනවා තිබූ සීමා ඉවත් කිරීම සහ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම සමඟ වෙළඳ හිඟය පුළුල් වනු ඇතැයි අපේක්ෂා කරන නමුත්, විදේශ විනිමය ලැබීම්වල අපේක්ෂිත යහපත් වර්ධනයන් සමඟ එය කළමනාකරණය කළ හැකි මට්ටමක පවතිනු ඇත. ඉහළ යන සංචාරක ඉපැයීම්, අනෙකුත් සේවා අපනයන අංශවල ශක්තිමත් කාර්ය සාධනය, ප්‍රේෂණවල අඛණ්ඩ වර්ධනය සහ විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසන් වීම නිසා ප්‍රාථමික ආදායම් හිඟුම මත ඇති පීඩනය ලිහිල් වීම හේතුවෙන් 2025 වසරේ දී අඛණ්ඩව තුන්වන වසරටත්, සුළු වශයෙන් හෝ, විදේශ ජංගම හිඟුමේ අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරෙන් පසුව ජංගම හිඟුමේ ඍණ ශේෂයක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය තිරසාර මට්ටමක පවතිනු ඇත. මේ අතර, ණය තිරසාරභාවය නැවත ස්ථාපිත කිරීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන් විදේශ මූල්‍ය හිඟුම වෙත වන ශුද්ධ ලැබීම් වර්ධනය වනු ඇත. මහ බැංකුව විසින් නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර, බාහිර කම්පනවලින් ආර්ථිකයට ඇතිවන පීඩන අවම කිරීමට මැදි කාලීනව බාහිර ස්වාරක්ෂක ගොඩ නැගීමට කටයුතු කරනු ඇත. පසුගිය වසර දෙක තුළ කැපී පෙනෙන දියුණුවක් වාර්තා කළ රාජ්‍ය මූල්‍ය අංශය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සඳහා වන නව නීති රාමුව සහ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මඟින් ශක්තිමත් වී ඉදිරි වසරවල දී එහි යහපත් කාර්ය සාධනය දිගට ම පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වැඩිදියුණු වූ සාර්ව මූල්‍ය තත්ත්ව සමඟ ඉදිරි කාලය තුළ දී මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය යහපත්ව පවතිනු ඇතැයි අපේක්ෂිතය. ආර්ථික ක්‍රියාකාරකම් ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම සහ අඩු පොලී අනුපාතික වසුහය මධ්‍යයේ, ණය ගැතියන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු වීමත් සමඟ මූල්‍ය ආයතනවල ණය කළඹවල අවදානම් මට්ටම් අඩු වනු ඇත. මූල්‍ය අංශයේ අධීක්ෂණය වැඩිදියුණු කිරීම, එම අංශයේ සිදු කරන ඒකාබද්ධ කිරීම්, සහ නීතිමය හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලබන අඛණ්ඩ ප්‍රයත්න මඟින්


මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරනු ඇත. ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් වීම, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අබණ්ඩව පවත්වාගෙන යෑම සහ අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට මැදි කාලීනව තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට හැකි වනු ඇත.

4.1 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

වෙළඳ ප්‍රතිපත්ති වෙනස් වීම සහ උත්සන්න වන භූ දේශපාලනික අර්බුද හේතුවෙන් භූ ආර්ථික බෙදීම් වැඩි වන අතර, ඒ හේතුවෙන් ගෝලීය වර්ධන අපේක්ෂා, මූල්‍ය තත්ත්ව සහ ජාත්‍යන්තර සහයෝගීතාවය මත බලපෑම් ඇති වන බැවින් ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා ඉහළ මට්ටමක පවතී. 2025 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ජා.මූ. අරමුදලෙහි ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි (World Economic Outlook) යාවත්කාලීනය අනුව, 2023 වසරේ දී 3.3%ක් වූ ගෝලීය වර්ධනය, 2024 වසරේ දී 3.2%ක් දක්වා අඩු වනු ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, මෙතෙක් වාර්තා වූ (2000-2019) ආර්ථික වර්ධනයේ සාමාන්‍යය වන 3.7%කට වඩා අඩු මට්ටමක, එනම් 3.3%ක අගයක, 2025 සහ 2026 යන වසර දෙකෙහි ම ආර්ථික වර්ධනය පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, එතැන් සිට මේ දක්වා ගෝලීය දේශපාලනික හා ආර්ථික පසුබිම සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති අතර, ඉදිරි කාලපරිච්ඡේදය තුළ දී මෙම පුරෝකථන සඳහා සංශෝධන එක් වීමට හැකියාවක් පවතියි. තවමත් පවතින අවිනිශ්චිතතාවයට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ එක්සත් ජනපද රජය වේගවත්ව සහ විශාල වශයෙන් සිදුකරන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වෙනස්කිරීම් සහ එයට ප්‍රතිචාර ලෙස අනෙක් රටවල් ගනු ලබන ප්‍රති-පියවරයන්ය. මෙම වාර්තාව සකස් කර අවසන් වන විට කිසිදු නිල නිවේදනයක් නිකුත් කර නොමැති වුවද, අන්‍යොන්‍ය තීරුබදු (reciprocal tariff) ක්‍රමයක් පිළිබඳ ඇඟවීම් තිබේ. එමෙන්ම, එක්සත් ජනපද පරිපාලනය ඔවුන්ගේ නිෂ්පාදනය ඉහළ නැංවීම සහ රටේ වෙළඳ හිඟය අඩු කිරීම අරමුණු කර ගෙන ආනයන සඳහා ආදේශන හඳුන්වා දෙන ක්‍රමවේදයක් සකස් කර ඇති අතර, විදේශ ආධාර ලබා දීම, දේශගුණික විපර්යාස සහ තිරසාර සංවර්ධනයට අදාළ ඇතැම් ජාත්‍යන්තර වගකීම් කිහිපයකින් ඉවත් වීමට ද සැලසුම් කර ඇත.

දැනට සිදු වෙමින් පවතින ගෝලීය ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් මතු වන වෙළඳ අවිනිශ්චිතතා, සැපයුම් දාම බාධා, උද්ධමනකාරී පීඩන සහ විදේශ ආධාර බෙදී යෑමේ හා ප්‍රාග්ධන ප්‍රවාහවල වෙනස්කම් නිසා ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම නැවත සකස් වනු ඇත. එක්සත් ජනපද රජයේ ප්‍රතිපත්තිමය වෙනස්කම් හරහා නුදුරු කාලයේ දී ඇතිවන ප්‍රතිඵලවලින් එකක් ලෙස වෙළඳ අවිනිශ්චිතතා ඉහළ යනු ඇති අතර, එමඟින් ගෝලීය වටිනාකම් දාම අවහිර වී ගෝලීය වෙළඳ ප්‍රවාහවල දැඩි වෙනසක් ඇති විය

4.1 රූප සටහන: ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය (Global Economic Policy Uncertainty Index)



මූලාශ්‍රය: Baker, Scott R.; Bloom, Nick; Davis, Stephen J. via Federal Reserve Economic Data

හැක. එක්සත් ජනපදයේ තීරු බදු ඉහළ යෑම නිසා බලපෑමට ලක් වූ ආර්ථිකයන් විසින් එයට එදිරිව වෙළඳ ක්‍රියාමාර්ග ගතහොත්, විශේෂයෙන් ම එම ක්‍රියාමාර්ග ගෝලීය ආයෝජන සහ වෙළඳාමට බාධාවක් වන ලෙස ක්‍රියා කළ හැකි බැවින් එයින් ගෝලීය වර්ධනය අඩු වීමක් ද සිදු විය හැක. 2025 වසරේ මාර්තු මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ෆෙඩරල් සංචිත බැංකුවේ නවතම ආර්ථික පුරෝකථන අනුව, 2024 වසරේ දී 2.5%ක ආර්ථික වර්ධන වේගයක් වාර්තා කළ එක්සත් ජනපදය 2025 වසර සඳහා 1.7%ක අඩු වර්ධනයක් අපේක්ෂා කරන අතර, එමගින් එක්සත් ජනපද නව තීරුබදු ක්‍රමවේදය සහ එයට එදිරිව අනෙකුත් ආර්ථිකයන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ගේ අපේක්ෂිත බලපෑම පිළිබිඹු කෙරේ. පිරිවැය ඉහළ යෑම සහ අපනයන තරඟකාරිත්වය පහත වැටීම හේතුවෙන් එක්සත් ජනපදය සමඟ ශක්තිමත් වෙළඳ සබඳතා සහිත රටවල් ආර්ථික දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෙන ඇති තීරුබදු පියවර හේතුවෙන් යුරෝ කලාපීය ආර්ථිකයන්ට වැල්ල වන සෘජු බලපෑම සීමිත වුවද, ඉහළ යන භූ දේශපාලනික සහ ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතා හේතුවෙන් කලාපයේ වර්ධන අපේක්ෂාවන්ට යම් අභියෝගයක් වැල්ල විය හැකිය. චීනයේ සිදු විය හැකි තීව්‍ර රාජ්‍ය මූල්‍ය ලිහිල්කරණය කිරීම් තුළින්, එක්සත් ජනපද තීරුබදු ඉහළ නැංවීමෙන් චීනයේ කෙටි කාලීන වර්ධන අපේක්ෂාවන් කෙරෙහි ඇති විය හැකි බලපෑම යම් පමණකට අඩු විය හැකිය. එමෙන්ම, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය (USAID), ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සහ දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම ඇතුළු ජාත්‍යන්තර සංවිධානවලින් ඉවත් වීමට එක්සත් ජනපදය සැලසුම් කිරීම හේතුවෙන් දේශගුණික විපර්යාසය, සෞඛ්‍ය අර්බුද සහ තිරසාර සංවර්ධනය වැනි තීරණාත්මක ගැටලු විසඳීමට දරනු ලබන ගෝලීය ප්‍රයත්නයන්වලට බාධා ඇති විය හැක.

තීරුබදු අබණ්ඩව ඉහළ යෑමෙන් ගෝලීය නිර්-උද්ධමන ප්‍රවණතාවන්ට බාධා ඇති විය හැකි අතර, එමගින් උද්ධමන පීඩනය නැවත ඇති විය හැකිය. අමුද්‍රව්‍ය සහ වානේ හා ඇලුමිනියම් වැනි වෙළඳ භාණ්ඩ මත තීරුබදු පැනවීම නිසා මිල උච්චාවචනයන් සහ උද්ධමන පීඩනයන් ඇති විය හැක. දුර්වල පාරිභෝගික ඉල්ලුම සහ මන්දගාමී වර්ධනය හේතුවෙන් තීරුබදුවලින් බලපෑමට ලක් වූ ඇතැම් ආර්ථිකයන් අඩු උද්ධමනයක් අත්විඳිය හැකි අතර, සමහර රටවල් එක්සත් ජනපදයට එදිරිව පැන වූ තීරුබදු හේතුවෙන් ඇතිවන සැපයුම් බාධා හා දුර්වල මුදල් ඒකක හේතුවෙන් උද්ධමන පීඩනවලට ලක් විය හැකිය. කෙසේ වෙතත්, චීනයේ ඉල්ලුම දුර්වල වීම, ගෝලීය බලශක්ති ඉල්ලුම දුර්වල වීම සහ එක්සත් ජනපදය ඇතුළු තෙල් අපනයනය කරන රටවලින් ඉහළ සැපයුමක් අපේක්ෂා කිරීම පිළිබිඹු කරමින් ඉදිරි වසර දෙක තුළ දී ගෝලීය බලශක්ති මිල ගණන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ යන අවිනිශ්චිතතා සහ ඉහළ වෙළඳ පිරිවැය හේතුවෙන් වේතන හා මිල පීඩනයන් ඉහළ යෑමේ හැකියාව සැලකිල්ලට ගනිමින් ගෝලීය වශයෙන් මහ බැංකු සුපරීක්ෂාකාරීව සිටිනු ඇත. තීරුබදුවලින් බලපෑමට ලක් වූ රටවල සමහර මහ බැංකු මගින් ආර්ථික වර්ධනය උත්තේජනය කිරීම සඳහා පොලී අනුපාත අඩු කිරීම තෝරා ගත හැකි අතර, අනෙකුත් රටවල් විසින් යටිදැරි උද්ධමන පීඩනය දිගු කාලීනව පාලනය වීම සහතික කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම පිළිබඳව සලකා බැලිය හැකිය. කෙසේ වෙතත්, දිගු කාලීන ඉහළ පොලී අනුපාතිකවල අවදානම මගින් ගෝලීය මූල්‍ය තත්ත්ව සහ ප්‍රාග්ධන වෙළඳපොළවල් කෙරෙහි පීඩනයක් ඇති විය හැකිය.

2024 මුල් කාලයේ දී බොහෝ දුරට දැඩිව පැවති ගෝලීය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමත් උද්ධමනකාරී වාතාවරණය පහව යෑමත් සමඟ 2024 වසරේ අග භාගයේ දී සහ 2025 වසරේ මුල් කාලයේ දී ක්‍රමයෙන් ලිහිල් විය. මතුපිට උද්ධමනයෙහි පහළ යෑමක් දක්නට ලැබුණ ද දියුණු ආර්ථිකයන්හි මහ බැංකු උද්ධමන පීඩන පාලනය වී ඇති බව මනාව පෙන්නුම් කරන තෙක් මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ප්‍රමාද කළේය. තවද, මූලික උද්ධමනයෙහි පහළ යෑම මන්දගාමී වීම සහ ශක්තිමත් ශ්‍රම වෙළඳපොළ තත්ත්ව හේතුවෙන් 2024 වසරේ මුල් කාලයේ දී දියුණු ආර්ථිකයන්හි මහ බැංකු ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී වඩාත් සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කළේය. කෙසේ වෙතත්, හිතකර උද්ධමන ඉදිරි දැක්මත් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීමත් සමඟ 2024 වසරේ අග භාගයේ දී සහ 2025 වසරේ මුල් කාලයේ දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් ලිහිල් කිරීම් සිදු විය. මේ අතර, 2024 වසර සහ 2025 වසරේ මුල් කාලය තුළ දී නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මිශ්‍ර ස්වභාවයක් පෙන්නුම් කළේය. දුර්වල දේශීය ඉල්ලුම සහ අඩු උද්ධමනය හේතුවෙන් ඇතැම් මහ බැංකු ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අනුගමනය කළ අතර, තවත් මහ බැංකු විසින් ආහාර හා බලශක්ති මිල ගණන් උච්චාවචනය වීමෙන් ඇතිවන උද්ධමන පීඩන පාලනය කිරීමට සහ ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා මධ්‍යයේ දේශීය විනිමය ස්ථාවරව පවත්වා ගැනීමට සිය මුදල් ප්‍රතිපත්තිය දැඩි ස්ථාවරයක පවත්වාගෙන යෑමට කටයුතු කරන ලදී. ඉදිරි කාලය තුළ දී, භූ දේශපාලනික අවිනිශ්චිතතා, ගෝලීය සැපයුම් දාම සඳහා වන බාධාවන්, විනිමය උච්චාවචනයන් සහ එමගින් උද්ධමනය කෙරෙහිවන බලපෑම වැනි සාධක ලොව පුරා මහ බැංකු විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.

ආරක්ෂණ ප්‍රතිපත්ති වැඩි වීම, භූ දේශපාලන අවිනිශ්චිතභාවය සහ දුර්වල ගෝලීය වර්ධන අපේක්ෂා, විවිධාකාර මාර්ග හරහා ශ්‍රී ලංකා ආර්ථිකයට බලපෑ හැකිය. වෙනස් වන එක්සත් ජනපද තීරුබදු ප්‍රතිපත්ති මගින් ශ්‍රී ලංකාවේ අපනයන රටාවලට බලපෑම් ඇති කළ හැකි බැවින්, අවධානය යොමු කළ යුතු මූලික අංශයක් වන්නේ භාණ්ඩ

වෙළඳාමයි. සාමාන්‍යයෙන්, ශ්‍රී ලංකාව එක්සත් ජනපදයට කරනු ලබන අපනයන සහ ආනයන, පිළිවෙළින්, ඒ.ජ. ඩොලර් බිලියන 3ක් සහ ඒ.ජ. ඩොලර් බිලියන 0.5ක් පමණ වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට වාසිදායක වන අන්දමින් ඒ.ජ. ඩොලර් බිලියන 2.5ක පමණ වෙළඳ අතිරික්තයක් ඇති වේ. එක්සත් ජනපදය විසින් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා පනවන ලද සහ ක්‍රියාත්මක කරන ඕනෑම අන්‍යෝන්‍ය තීරු බද්දකින් රටෙහි අපනයන අංශයට විශාල බලපෑමක් ඇති කළ හැකිය. මීට අමතරව, එක්සත් ජනපද රජයේ ප්‍රතිපත්ති ගැළපීම්වලින් ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ට ඇති විය හැකි බලපෑමෙන් ශ්‍රී ලංකාවේ අපනයන සඳහා අහිතකර බලපෑමක් ඇති විය හැකිය. පුරෝකථනය කරන ලද පරිදි ගෝලීය තෙල් මිලෙහි පහත වැටීම වෙළඳ ශේෂය මත ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය. කෙසේ වෙතත්, එක්සත් ජනපද රජයේ තීරුබදු ප්‍රතිපත්ති හේතුවෙන් ගෝලීය ආර්ථිකයේ ඇතිවිය හැකි පසුබෑම හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට බලපෑම් ඇති විය හැකිය. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රධාන මූලාශ්‍ර රටවල ආර්ථික වර්ධනය දිගුකාලීනව අඩුවීම, සංචාරක ක්ෂේත්‍රයේ දැනට නිරීක්ෂණය වන ධනාත්මක ප්‍රවණතාවට බලපෑ හැකිය. එක්සත් ජනපදය විසින් ප්‍රතිපත්ති වෙනස් කිරීම හේතුවෙන් ගෝලීය මුදල් ප්‍රතිපත්ති වෙනස්වීම් නිසා මුදල් තත්ත්වයන්ට බලපෑම් ඇති විය හැකි අතර ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොළ වෙත මූල්‍ය ප්‍රවාහයන්ට ද බලපෑම් එල්ල විය හැකිය. මෙම වාර්තාව සකස් කර අවසන් වන විට එක්සත් ජනපද ආර්ථික ප්‍රතිපත්ති සහ ඒවායේ බලපෑම අවිනිශ්චිත සහ පුරෝකතනය කළ නොහැකි තත්ත්වයක පවතී.


වෙනස්වීම්වලට ලක් වෙමින් පවතින ගෝලීය ප්‍රතිපත්ති සහ ඒවායේ බලපෑම් කළමනාකරණය කිරීම සඳහා ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් ලොව පුරා රටවල් අනුගමනය කරයි. ගෝලීය පරිසරයේ අවිනිශ්චිතතාවය සැලකිල්ලට ගෙන, නව නිදහස් වෙළඳ ගිවිසුම් සක්‍රීයව ක්‍රියාත්මක කිරීම සහ භාණ්ඩ වෙළඳාම් විතැන් වීමේ අවස්ථා ශ්‍රී ලංකාවට වාසිදායක වන පරිදි යොදා ගැනීම සඳහා ප්‍රතිපත්තිමය සූදානම ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වේ. අන්‍යෝන්‍ය තීරුබදු පිළිබඳව සලකා බලා තීරුබදු ව්‍යුහයන් නැවත සමාලෝචනය කිරීම අත්‍යවශ්‍ය වන අතර, ඉක්මනින් මැදිහත්වීම සඳහා මතුවිය හැකි සාර්ව ආර්ථික අවදානම් සමීපව නිරීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. ආර්ථික බෙදී යෑම් තීව්‍ර වන විට, යම් වෙළඳපොළක් මත යැපීම අඩු කිරීමට සහ සිය කලාපය තුළ වෙළඳාම වර්ධනය කිරීමට, කලාපීය වෙළඳ සන්ධාන සහ සම මට්ටමේ පවතින රටවල් අතර සහයෝගිතා ශක්තිමත් කිරීමට රටවල් සලකා බලයි. අනෙක් අතට, අනාගත කම්පනවලට ප්‍රතිචාර දැක්වීමට රජයන්ට ඇති හැකියාව පවත්වා ගැනීම සහ වර්තමාන සහ අනාගත වියදම් පීඩන දරා ගැනීම සඳහා ණය තිරසර බව සහතික කිරීමට රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම අවශ්‍ය වේ.

4.2 දේශීය ආර්ථිකයේ ඉදිරි දැක්ම

4.2.1 උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම

2024 වසරේ අවසාන කාලයේ සිට 2025 වසරේ මුල් කාලය දක්වා අවධමන කාලපරිච්ඡේදයකින් පසුව, 2025 වසර මැද වන විට, මතුපිට උද්ධමනය ධන අගයකට පත් වී, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහායයෙන් මැදි කාලීනව 5%ක ඉලක්කය ආසන්නයේ ස්ථායී වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2024 වසර අවසානය වන විට දක්නට ලැබුණු අවධමනකාරී තත්ත්වය 2025 වසරේ මුල් මාස තුනෙහි දී ද පැවතුණි. 2025 වසරේ පළමු කාර්තුවේ අවධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) 2024 වසර අවසානයේ වාර්තා වූ අවධමනයට වඩා වැඩි විය. මේ සඳහා, ප්‍රධාන වශයෙන් ම, වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ යෑමට දායක වූ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු විය. මීට අමතරව, 2025 වසරේ ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස පහළ දැමීම ද 2025 වසරේ පළමු කාර්තුවේ අවධමනය සඳහා දායක විය. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය අවධමන තත්ත්වයේ සිට ඉහළ ගොස් 2025 වසර මැද භාගය වන විට ධන අගයකට පත්වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ලෝක ආහාර උද්ධමනයේ ඉහළ යෑම, ඉල්ලුම් පීඩන ක්‍රමයෙන් වර්ධනය වීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම මතුපිට උද්ධමනයේ මෙම ඉහළ යෑම සඳහා දායකවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2026 වසරේ දෙවන භාගය දක්වා මතුපිට උද්ධමනයේ ක්‍රමානුකූල ඉහළ යෑමක් වත්මන් පුරෝකථනවලින් පෙන්නුම් කෙරේ. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා නොකරන අතර, 2026 වසරේ අවසාන කාලයේ සිට එය ක්‍රමානුකූලව පහළ ගොස් අවසානයේ සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව 5%ක ඉලක්කගත මට්ටම ආසන්නයේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, යටිදැරි ඉල්ලුම් පීඩන හඳුනාගැනීමට උපකාරී වන, නිතර මිල උච්චාවචන සහිත භාණ්ඩ හා සේවා ඉවත් කිරීමෙන් පසු මනිනු ලබන මූලික උද්ධමනය, මැදි කාලීනව සමස්තයක් ලෙස ස්ථායීව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මතුපිට උද්ධමනයට සමානව, මූලික උද්ධමනයේ හැසිරීම කෙරෙහිද, 2025 වසරේ පළමු කාර්තුවේ දී සංඛ්‍යානමය පදනම් බලපෑම හේතු වී ඇත. මෙය මූලික උද්ධමනයේ තාවකාලික පහළ යෑමට හේතු විය. කෙසේ වෙතත්, මතුපිට උද්ධමනය පහළ යෑමට හේතු වන බලශක්ති සහ ප්‍රවාහන ආශ්‍රිත කාණ්ඩයේ අයිතම බොහෝ දුරට මූලික උද්ධමන දර්ශකයෙන් බැහැර කරන බැවින්, මතුපිට උද්ධමනයේ මෑත කාලීන පහළ යෑම මූලික උද්ධමනයේ වී ආකාරයෙන් ම පිළිබිඹු නොවේ. ඉදිරි කාලපරිච්ඡේදයේ දී, මූලික උද්ධමනය, මතුපිට උද්ධමනය සඳහා වන ඉලක්කයට අනුකූලව, අඩු විචලනයක් සහිතව සාමාන්‍ය තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට අපේක්ෂා කර ඇති පරිදි ස්ථාවර ලෙස

4.2 රූප සටහන: මතුපිට උද්ධමනයේ පුරෝකථන* (කාර්තුමය සාමාන්‍යය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)



*උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිට්වන කාර්තුවේ වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2013=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කො.පා.මි.ද. (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.

සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ.
2025 වසරේ මාර්තු මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පවතින දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි.

උද්ධමන ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්මිත පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූපසටහනේ දැක්වෙන විශ්මිත ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන උද්ධමනය විචලනය විය හැකි අනාගත පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද කොළ පැහැති ප්‍රදේශය 50% විශ්මිත ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් උද්ධමනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ 50%ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්මිත පරාසයන් මගින් උද්ධමනය දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම මධ්‍යයේ, ඉල්ලුම් තත්ත්ව ක්‍රමානුකූලව වැඩිදියුණු වීම මූලික උද්ධමනයේ දිශානතියට රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පවතින ගෝලීය ආර්ථික අවිනිශ්චිතතා සහ අහිතකර දේශීය කාලගුණික තත්ත්ව මධ්‍යයේ වර්තමාන පුරෝකථන සඳහා වන අවදානම් සාමාන්‍ය කාලයන්ට වඩා ඉහළ මට්ටමක පවතී. ගෝලීය බලශක්ති හා ආහාර මිල ගණන් පිළිබඳ පුරෝකථන, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපේක්ෂිත ආර්ථික ගමන් මග, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පුරෝකථන අනුව අපේක්ෂිත දේශීය රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම, විදුලිබල සහ ඉන්ධන මිල ගණන් පිරිවැය නිරූපණය වන ලෙස පවතිනු ඇති බවට වන උපකල්පනය සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව මත මෙම පුරෝකථන රඳා පවතී. එසේම, ආර්ථික ආකෘතිය මගින් ලබා දෙන පොලී අනුපාතික මාර්ගය සහ ඒ හා සබැඳි සාර්ව ආර්ථික විචල්‍යයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථන සඳහා සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් සැලකිය යුතු විතැන් වීම් අපේක්ෂා නොකෙරේ. පුරෝකථන සඳහා භාවිතා කර ඇති උපකල්පන සහ විනිශ්චයන්හි සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම්, සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. පුරෝකථන සඳහා ඍජුව හෝ වක්‍රව භාවිතා වන විවිධ සාධක ඒවායේ දැනට සලකා ඇති මට්ටම්වලින් අපගමනය වීමේ හැකියාව සහ කිසියම් අනපේක්ෂිත වර්ධන හේතුවෙන් පුරෝකථන සඳහා අවිනිශ්චිතතා හට ගනී. විශේෂයෙන් ම, ඉහළ වැටුප් හේතුවෙන් ඇති විය හැකි ඉල්ලුමේ බලපෑම, ඇති විය හැකි අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් කෘෂිකාර්මික නිෂ්පාදනයට සිදු වන බලපෑම, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් යම් අපගමනයක් සිදු වීමට ඇති හැකියාව සහ රුපියල ඉහළ මට්ටම්වලින් අවප්‍රමාණය වීමට ඇති හැකියාව වැනි සාධක මගින් උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයට වඩා ඉහළ යෑම සඳහා සැලකිය යුතු මට්ටමේ බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, උද්ධමන පුරෝකථන පහළ යෑමේ අවදානම් සැලකූවිට, අනෙකුත් සාධක අතර, ගෝලීය ආර්ථික වර්ධනය මන්දගාමී වීම හේතුවෙන් ගෝලීය වෙළඳ භාණ්ඩ මිල තවදුරටත් පහළ යෑමට ඇති හැකියාව ඇතුළත් වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ, දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය හරහා දේශීය හා ගෝලීය ආර්ථික තත්ත්වයන්හි ඉදිරි වෙනස්වීම් මත පදනම්ව, උද්ධමන ඉදිරි දැක්මෙහි ඇති විය හැකි අපගමනයන් පිළිබඳව සෑම මුදල් ප්‍රතිපත්ති වාරයක දී ම මහ බැංකුව විසින් මහජනතාව වෙත අඛණ්ඩව සන්නිවේදනය කරනු ඇත.

4.2.2 මුදල් අංශයේ ඉදිරි දැක්ම

දේශීය ආර්ථිකයේ ප්‍රවණතා සහ වෙනස්වන ගෝලීය ආර්ථික තත්ත්ව මගින් ඇති විය හැකි බලපෑම් සැලකිල්ලට ගනිමින් මහ බැංකුව ඉදිරියේ දී දන්න මත පදනම් වූ ප්‍රවේශයක් මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ දී අනුගමනය කරනු ඇත. සැපයුම් අංශයේ සාධක හේතුවෙන් තාවකාලිකව ඇති වූ අවධමන තත්ත්වයෙන් පසුව 2025 වසර අග භාගයේ දී උද්ධමනය ඉලක්කකගත මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කරන අතර, උද්ධමන ඉලක්කය ළඟා කර ගැනීම සඳහා මැදි කාලීනව ඇති විය හැකි බාධා වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මහ බැංකුව ඉල්ලුම් අංශයෙන් ඇතිවිය හැකි අවදානම් සමීපව නිරීක්ෂණය කරනු ඇත. තවද, එක්සත් ජනපද රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති හේතුවෙන් ගෝලීය වශයෙන් ඇතිවන වෙනස්වන ආර්ථික හා මූල්‍ය පරිසරය මෙන්ම ඒ ආශ්‍රිත අවිනිශ්චිතතා මගින් දේශීය ආර්ථිකයට සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට බලපෑම් ඇති කළ හැකිය. මේ අතර, දේශීය වෙළඳපොළ පොලී අනුපාතික පහළ මට්ටමක ස්ථායීව පවතිනු ඇති අතර, දැනට ඉහළ මට්ටමක පවතින ඇතැම් ණය උපකරණ සඳහා වන පොලී අනුපාතික තවදුරටත් අඩු වනු ඇත. තවද, ලිහිල් මුදල් ප්‍රතිපත්තිය, වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ යෑමත් සමඟ අවදානම් අධිමිල අඩු වීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ලිහිල් මුදල් තත්ත්වයන්ගේ සහාය ඇතිව ඉදිරි කාලය තුළ දී මුදල් ප්‍රසාරණය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. අඩු පොලී අනුපාතික මට්ටම් ව්‍යාපාර සහ කුටුම්භ සඳහා ණය ගැනීමේ පිරිවැය අඩු කරනු ඇති අතර, එමගින් ආනයන ඉල්ලුම ඉහළ යෑම සහ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු වීම මධ්‍යයේ පරිභෝජනය සඳහා මෙන්ම ආර්ථිකයේ අනෙකුත් ඵලදායී අංශ සඳහා ණය ප්‍රවාහ ගලායෑම ඉහළ නැංවෙනු ඇත. මේ අතර, රාජ්‍ය මූල්‍ය කර්යසාධනයේ අපේක්ෂිත වැඩිදියුණු වීම් මෙන්ම රජය සතු වාණිජ ව්‍යාපාරයන්හි අඛණ්ඩ ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හේතුවෙන් රාජ්‍ය අංශය අරමුදල් අවශ්‍යතා සඳහා බැංකු අංශය මගින් ණය ලබා ගැනීම අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් පෞද්ගලික අංශයට වැඩි වශයෙන් ණය ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසෙනු ඇත. රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතිකවල විචලන ස්ථායී කිරීම සඳහා ප්‍රමාණවත් රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක පවත්වා ගැනීම රජය විසින් සහතික කළ යුතුය. මේ අතර, විදේශ සංචිත තත්ත්වය ඉහළ නැංවීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය මිලදී ගැනීම අඛණ්ඩව සිදු කිරීම තුළින් ඉදිරි කාලය තුළ දී බැංකු පද්ධතියේ විදේශීය වත්කම් තවදුරටත් ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින්, ඇතිවිය හැකි බාහිර කම්පනවලට ඔරොත්තු දීම සඳහා වන ස්වාරක්ෂක ශක්තිමත් කෙරෙනු ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මෙන්ම නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමවේදය සමඟ පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ කොටසක් ලෙස විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ මහජන විශ්වාසය වර්ධනය කිරීම සඳහා මහ බැංකුව සිය ප්‍රතිපත්ති සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා පිළිබඳව අඛණ්ඩව සන්නිවේදනය කරනු ඇත. සන්නිවේදන ප්‍රයත්න ශක්තිමත් කිරීම මහජන අපේක්ෂා කළමනාකරණය කිරීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ඇති අතර, එමගින් මිල ස්ථායිතාව මෙන්ම පුළුල් සාර්ව ආර්ථික ස්ථායිතාව සාක්ෂාත් කර ගැනීමට සහාය වනු ඇත. මෙම ක්‍රියාමාර්ගවල අංගයක් ලෙස සියලුම පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා අනෙකුත් කාලීන ප්‍රකාශන සහ නිවේදනවලට අමතරව මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති වාර්තාව අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කිරීම අඛණ්ඩව සිදු කරනු ඇත.

4.2.3 විදේශීය අංශයේ ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තුළ අභියෝගවලට මුහුණ දීමේ හැකියාව කෙටි කාලීනව අඛණ්ඩව පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කරන අතර, අභියෝගාත්මක ගෝලීය ආර්ථික ඉදිරි දැක්ම හමුවේ සිදුවිය හැකි ඕනෑම අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීම සඳහා කාලෝචිත ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. ස්ථාවර දේශීය සමාජ ආර්ථික හා දේශපාලන පරිසරයක් මධ්‍යයේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම, කෙටි කාලීනව විදේශීය අංශයේ ඉදිරි දැක්මට සහාය වනු ඇත. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ විදේශ ප්‍රතිපත්තිවල අපේක්ෂිත වෙනස්කම් සමඟ විදේශීය අංශයේ කෙටි කාලීන අවිනිශ්චිතතා ඇති විය හැකිය. ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට මෙමගින් ඇති විය හැකි සෘජු හා වක්‍ර බලපෑම් අවිනිශ්චිත වේ. විදේශීය ජංගම ගිණුමේ මෑත කාලීන ප්‍රවණතා සහ දැනට පවතින තොරතුරුවලින් පෙනී යන්නේ 2025 වසරේ දී ද ජංගම ගිණුමෙහි අතිරික්තයක් වාර්තා වනු ඇති බවයි. කෙසේ වෙතත්, මෙම ඉදිරි දැක්ම කෙරෙහි ගෝලීය අභියෝග සහ මෙම අභියෝගවලට දේශීයව දක්වන ප්‍රතිචාර මගින් බලපෑම් ඇති කෙරෙනු ඇත.

2025 වසරේ දී, ආනයන සීමා ලිහිල් කිරීම මෙන්ම වැඩිදියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම් සහ ලිහිල් මූල්‍ය තත්ත්ව මධ්‍යයේ ව්‍යාපාර හා ගෘහ ඒකකවල වියදම් කිරීමේ හැකියාව ඉහළ යෑම පිළිබිඹු කරමින් ආනයන ඉල්ලුම වැඩි වීම හේතුවෙන් වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් වනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙටි කාලීනව වාහන ආනයන සඳහා ඉල්ලුම අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩු මට්ටමක පැවතිය ද, ඉල්ලුම ක්‍රමයෙන් ඉහළ යෑමට ඇති හැකියාව බැහැර කළ නොහැක. 2025 වසරේ දී ගෝලීය බොරතෙල් මිල අඩු වනු ඇතැයි පුරෝකථනය කර තිබුණ ද, දේශීය ආර්ථික

ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීම නිසා ඇති විය හැකි ඉල්ලුම් පරිමාවන්හි වැඩි වීම සහ භූ දේශපාලනික ආතතීන් හේතුවෙන් ඇති විය හැකි අහිතකර මිල උච්චාවචනයන් හේතුවෙන් 2024 වසරට සාපේක්ෂව තරමක් ඉහළ බනිජ තෙල් ආනයන වියදමක් 2025 වසර සඳහා ඇස්තමේන්තු කර ඇත. එමෙන්ම, ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත යථා තත්ත්වයට පත් වීමට අනුකූලව 2025 වසරේ දී අනෙකුත් අතරමැදි භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වන වියදම් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන්, ආනයනවල අඛණ්ඩ වර්ධනයක් තිබියදීත්, අපනයනවල ස්ථාවර වර්ධනයෙහි දායකත්වයෙන් මැදි කාලීනව වෙළඳ හිඟය කළමනාකරණය කළ හැකි මට්ටම්වල පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක ඉපැයීම් ඉහළ යෑම සහ අනෙකුත් සේවා අපනයනවල තරඟකාරීත්වය වැඩිදියුණු වීම හේතුවෙන් සේවා හිඟුමේ අතිරික්තය 2025 වසරේ දී සහ මැදි කාලීනව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය සඳහා ගෝලීය පිළිගැනීම සහ ආංශික විභවතාවය උපරිම කිරීම සඳහා අඛණ්ඩව පියවර ගැනීමේ දායකත්වයෙන් සංචාරක අංශයේ පවතින ඉහළ වර්ධනයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට ශ්‍රී ලංකාව සූදානමින් සිටී. මීට අමතරව, මුහුදු හා ගුවන් ප්‍රවාහන සේවා අංශයන්හි නැවත යථා තත්ත්වයට පත් වීම සහ තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශයෙහි ශක්තිමත් ක්‍රියාකාරිත්වය සේවා හිඟුමේ අතිරික්තයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉදිකිරීම්, කළමනාකරණ උපදේශන සහ ගෘහ නිර්මාණ හා ඉංජිනේරු සේවා වැනි අනෙකුත් සේවා අංශ ද මැදි කාලීනව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂිතය. ඉහළ විභවතාවයක් සහිත මෙම නැගී එන අංශ ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීම රටට සම්පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කාලෝචිත වේ. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු පොලී ගෙවීම් අඩු වීම හේතුවෙන් 2025 වසරේ දී ප්‍රාථමික ආදායමේ හිඟුමේ හිඟය අඩු වීමේ හැකියාවක් ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ආයෝජනය කර ඇති සෘජු ආයෝජන ව්‍යාපාර විසින් අඛණ්ඩව ලාභාංශ ගෙවීම් සහ පොලී ගෙවීම් හේතුවෙන් ප්‍රාථමික ආදායම් හිඟුමේ ගෙවීම් ක්‍රමයෙන් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විදේශ රැකියා සඳහා පිටත්වීම්වල අඛණ්ඩ ප්‍රවණතාව සහ සංක්‍රමණික සේවකයින් විසින් මුදල් නුවමාරුව සඳහා විධිමත් මාර්ග භාවිතා කිරීම වැඩි වීම හේතුවෙන් 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ක්‍රමයෙන් වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන්, 2025 වසරේ දී ජංගම හිඟුමේ අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, වාහන ආනයන සීමා ලිහිල් කිරීම මගින් සිදුවන බලපෑමෙහි විශාලත්වය මත එය පදනම් වේ. කෙසේ වෙතත්, මැදි කාලීනව ජංගම හිඟුමේ හිඟයන් තිරසාර මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ධනාත්මක ආයෝජක අපේක්ෂා සහ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ මගින් මූල්‍ය හිඟුම වෙත ලැබීම් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ගෝලීය වර්ධනයේ සහ මූල්‍ය තත්ත්ව පිළිබඳ අපේක්ෂාවන්හි අපැහැදිලිතා සමඟ ආයෝජන අවිනිශ්චිතතාවයක් ඇති වීමට ඉඩ ඇති බැවින්, මූල්‍ය හිඟුම වෙත වන සමස්ත ලැබීම් කෙටි කාලීනව අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම බාධාවන් තිබියදීත්, ඉදිරි කාලය තුළ දී ද්විපාර්ශ්වික මූල්‍යයන පහසුකම් නැවත ආරම්භ කිරීමට සමගාමීව, කෙටි හා මැදි කාලීනව බහුපාර්ශ්වික ආයතනවලින් විදේශීය මූල්‍යයන සහාය අපේක්ෂිතය. මෙම ලැබීම් මූල්‍ය හිඟුමට සහාය වෙනවා පමණක් නොව, 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට දළ නිල සංචිත ශක්තිමත් කිරීමට ද දායක වනු ඇත. ආයෝජන පරිසරය වැඩිදියුණු කිරීමට ඒකාබද්ධව ගනු ලබන ප්‍රයත්න ක්‍රියාත්මක වීම මගින්, මෑත වසරවල අඩු මට්ටම්වල පැවති ණය නොවන විදේශීය ලැබීම්, විශේෂයෙන් විදේශීය සෘජු ආයෝජන, ආකර්ෂණය කිරීමට හැකි වනු ඇතැයි පුරෝකථනය කෙරේ. රජයේ සුරුකුම්පත් වෙළඳපොළෙහි සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන මධ්‍යස්ථව පවතිනු ඇතැයි අපේක්ෂිතය. තවද, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් අපේක්ෂිත ශුද්ධ මිලදී ගැනීම් හේතුවෙන් මහ බැංකුවේ දළ නිල සංචිත ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, මහ බැංකුව විදේශීය වගකීම් අඛණ්ඩව අඩු කරමින් සිටියි. මැදි කාලීනව ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කළ හැකි ආකාරයට ආනයනවල ඇති විය හැකි ඉහළ යෑම, ඉදිරියේ දී සිදුකළ යුතු ණය ආපසු ගෙවීම් සහ ගෝලීය භූ දේශපාලනික වර්ධනයන් හේතුවෙන් විදේශීය අංශයට ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා විදේශීය සංචිත ස්වාරක්ෂක ගොඩනැගීමට මහ බැංකුව සුපරීක්ෂාකාරීව කටයුතු කරයි.

4.2.4 මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම

සාර්ව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ධනාත්මක බලපෑම, ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මෙන්ම, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ සමඟ, 2025 වසරේ දී මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම, වෙළඳාම සම්බන්ධ සීමා ලිහිල් කිරීම සහ සාර්ව ආර්ථික පරිසරයේ වැඩිදියුණු වීමත් සමඟ 2024 වසරේ දී බැංකු සහ මුදල් සමාගම් යන අංශ දෙකෙහි ම ණය වර්ධනය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම ආරම්භ විය. දිගු කාලීන සංකෝචනය වීමකින් අනතුරුව පෞද්ගලික අංශයට ලබාදුන් ණය නැවත යථා තත්ත්වයට පත්වීමත් සමඟ ණය චක්‍රය ප්‍රසාරණ අවධියකට සංක්‍රමණය විය. හිතකර සාර්ව ආර්ථික දැක්මෙහි අඛණ්ඩ පැවැත්ම සහ අඩු පොලී අනුපාත මගින්, පෞද්ගලික අංශයට ලබාදුන් ණය තවදුරටත් ප්‍රසාරණය වී ණය චක්‍රය ද ප්‍රසාරණ

අවධිය තුළ තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු සහ මුදල් සමාගම් යන අංශ දෙකෙහි ම ණය තවදුරටත් ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, ණය චක්‍රයේ ප්‍රසාරණ අවධියේ දී ඇතිවිය හැකි පද්ධතිමය අවදානම් අවම කිරීම සඳහා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතිය සුපරීක්ෂාකාරීව අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරනු ලබන අතර අවශ්‍ය අවස්ථාවන්හි දී සාර්ව විචක්ෂණතා ප්‍රතිපත්ති භාවිත කරනු ඇත. තවද, පෞද්ගලික අංශයට ලබාදුන් ණය වැඩි වීමත් සමඟ මූල්‍ය ආයතන රජයට ණය ලබාදීමේ නැඹුරුව නිවැරදි වීමේ සලකුණු 2024 වසරේ දී පෙන්නුම් කළේය. කුටුම්භ සහ ආයතනික අංශවල ණය ඉල්ලුමේ අපේක්ෂිත වර්ධනයත් සමඟ රාජ්‍ය අංශය වෙත ඇති ස්වෛරීත්ව ණය නිරාවරණ තවදුරටත් පහළ වැටීමක් අපේක්ෂා කෙරේ. විශාල ගනුදෙනු නිරාවරණයවීම් පිළිබඳ විධානයන් ක්‍රමානුකූලව අනුගමනය කිරීම තුළින් ද බලපත්‍රලාභී බැංකු රාජ්‍ය ව්‍යවසායයන් වෙත නිරාවරණය වීම අවම වනු ඇති අතර එමගින් ස්වෛරී-බැංකු සම්බන්ධතාවය අවම කෙරේ. රාජ්‍ය ව්‍යවසායයන්හි ණය ඇතුළුව ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම බැංකු අංශයට අවම බලපෑම් සහිතව සම්පූර්ණ කර ඇතත්, බැංකු විසින් තවදුරටත් ස්වෛරී-බැංකු සම්බන්ධතාවය පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කළ යුතුය. ආර්ථික ක්‍රියාකාරකම්හි යථා තත්ත්වයට පත්වීම සහ සාපේක්ෂව අඩු පොලී අනුපාත සහිත පරිසරයක් තුළ ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාව වැඩිදියුණු වීමත් සමඟ බලපත්‍රලාභී බැංකු සහ මුදල් සමාගම්වල ණය කළඹෙහි ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම මගින් බැංකුවල ද්‍රවශීල නොවන විදේශ විනිමය ස්වෛරීත්ව උපකරණ වෙනුවට ද්‍රවශීල විදේශ විනිමය ස්වෛරීත්ව උපකරණ හුවමාරු කෙරුණු අතර, එමගින් බැංකුවල විදේශ විනිමය ද්‍රවශීලතා මට්ටම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කර තිබේ. කෙසේ වෙතත්, විනිමය අනුපාතික උච්චාවචනයන්, බාහිර අසමතුලිතතා සහ විදේශ විනිමය හිඟයන් ආශ්‍රිත අවදානම්වලින් ආරක්ෂා වීම සඳහා බැංකු තම විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වයන් විචක්ෂණශීලීව කළමනාකරණය කළ යුතුය. 2024 වසර තුළ දී බැංකු අංශයේ ලාභදායීත්වය ඉහළ ගිය අතර, හිතකර සාර්ව මූල්‍ය තත්ත්වයන් මධ්‍යයේ, ලාභදායීත්වය පිළිබඳ ඉදිරි දැක්ම සුභවාදී වනු ඇත. තවද, මෑත කාලීනව බැංකු විසින් වාර්තා කරන ලද මෙහෙයුම් අවදානම් ආශ්‍රිතව සිදු වූ සිදුවීම් සලකා බැලීමේ දී සහ තාක්ෂණය පදනම් කරගත් උපකරණ මත යැපීම වැඩිවීම හේතුවෙන්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම් ඇතිවීමේ අවදානම අවම කිරීමට තොරතුරු තාක්ෂණ පද්ධති සහ සයිබර් ආරක්ෂාව සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු සඳහා නිරාකරණ සැලසුම් සකස් කෙරෙමින් පවතින අතර, මූල්‍ය සමාගම් සඳහා නිරාකරණ රාමුවක් පිහිටුවීමට මූල්‍ය ව්‍යාපාර පනත සංශෝධනය කිරීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. තවද, රජයේ සහාය ඇතිව මූල්‍ය ස්ථායීත්ව අරමුදල ශක්තිමත් කිරීම සඳහා ද ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. ලෝක බැංකුවේ අනුග්‍රහයෙන් සිදු කරන ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය සහ මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වන ප්‍රතිපත්ති පාදක වැඩිදියුණු කිරීම් තුළින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයෙහි මූල්‍ය සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කෙරේ. තවද, වැඩි දියුණු කළ පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලි, වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය සහ මූල්‍ය පාරිභෝගික අධ්‍යාපනය තුළින් මහ බැංකුව විසින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව අඛණ්ඩව ශක්තිමත් කරනු ඇත.

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා පුළුල් පරාසයකින් යුතු ව්‍යුහාත්මක, නෛතික සහ ප්‍රතිපත්ති මට්ටමේ ප්‍රතිසංස්කරණ සහ නවෝත්පාදනයන් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධකරණ සැලැස්මෙහි පළමු අදියර සාර්ථකව නිම කිරීමත් සමඟ, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ආරම්භ වූ දෙවන අදියර තුළින් මුදල් සමාගම් අංශයේ ඔරොත්තු දීමේ හැකියාව සහ කාර්යක්ෂමතාව තවදුරටත් ශක්තිමත් කරමින් 2025 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වීමට නියමිතය. මාර්ගගත බැංකුකරණය සහ ජංගම ගෙවීම් යෙදුම් හරහා රට තුළ ක්‍රියාත්මක වන ක්ෂණික ගෙවීම් පද්ධතිය වැඩි වශයෙන් භාවිත කිරීම හේතුවෙන් ඩිජිටල් ගනුදෙනුවල සැලකිය යුතු වැඩිවීමක් අපේක්ෂා කරන අතර මධ්‍ය කාලීනව සහ දිගු කාලීනව ගෙවීම් සඳහා මුදල් සහ චෙක්පත් භාවිතය ක්‍රමයෙන් අඩුවනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. ඉදිරි කාලය පුරාවට ඩිජිටල් ගෙවීම් ක්‍රම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීමේ ක්‍රියාමාර්ග වැඩි කිරීමට මහ බැංකුව සැලසුම් කරන අතර ඩිජිටල් ගෙවීම් විසඳුම් ප්‍රවර්ධනය සහ පහසුවෙන් සහ දැරිය හැකි ගෙවීම් සේවා ලබා ගැනීම හා ඒවායේ ආරක්ෂිත භාවිතය සහතික කිරීම සඳහා මහ බැංකුව මූල්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත. කෙසේ වුවද, සයිබර් ප්‍රහාර සහ අන්තර්ජාලය හරහා සිදු කෙරෙන වංචා ඇතුළු ගෝලීය අන්තර් සම්බන්ධිතභාවය හා සම්බන්ධ අවදානම් ඉහළ යාම මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවට සැලකිය යුතු අභියෝග ඒල්ල කරයි. මෙම තාක්ෂණය ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා, ගෙවීම් සහ තොරතුරු යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම, ගෙවීම් පද්ධතිවල පාර්ශ්වකරුවන් අතර මනා සහයෝගිතාවයක් ඇති කිරීම සහ පාරිභෝගික දැනුම්වත්භාවය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, රට තුළ ක්‍රියාත්මක වන ගෙවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ඒ ආශ්‍රිත අවදානම් අවම කිරීම, සිදු වෙමින් පවතින තාක්ෂණික දියුණුවට සහ වෙනස්වන පාරිභෝගික

ඉල්ලීම්වලට සමගාමීව නීතිමය සහ නියාමන රාමුව යාවත්කාලීන කිරීමට ද අවශ්‍ය වනු ඇත. ඒ අනුව, ගෙවීම් පද්ධති සහ ඒ ආශ්‍රිත ගෙවීම් සේවා සඳහා අදාළ වන නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කරමින් ගෙවීම් සහ පියවීම් පද්ධති සඳහා නව පනතක් ඉදිරියේ දී හඳුන්වා දීමට නියමිත වේ. මෙම පියවර මඟින් ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධති ස්ථායීතාව සහතික කරන අතර ම, ඩිජිටල් ගෙවීම් භාවිතයේ අඛණ්ඩ වර්ධනය සහතික කරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ගෝලීය ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාව දක්වන කැපවීම නිරූපණය කරමින් 2026 වසරේ දී පැවැත්වීමට නියමිත තුන්වන අන්‍යොන්‍ය ඇගයීමට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකාව මේ වනවිට සූදානම් වෙමින් සිටියි. මෙම ඇගයීමේ දී ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන වැඩපිළිවෙලෙහි ගෝලීය අනුකූලතාව පවත්වා ගැනීම සහ මූල්‍ය කාර්ය සාධක බලකාය (FATF) විසින් ශ්‍රී ලංකාව අළුවැලියස්තුගත කිරීමේ අවදානමින් වළක්වා ගැනීම අතිශය වැදගත් වේ. යම් හෙයකින් ශ්‍රී ලංකාව මූල්‍ය කාර්ය සාධක බලකාය විසින් අළුවැලියස්තුගත කිරීමක් සිදුකළහොත් එය ඉතා අහිතකර ලෙස ශ්‍රී ලංකාවෙහි මූල්‍ය, ආර්ථික තත්ත්වයන්ට මෙන්ම කීර්ති නාමයට ද බලපානු ඇත. තවද, දැනට සකස් කර ඇති මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ උපාය මාර්ගවල සමස්ථ බලපෑම තක්සේරු කිරීම සඳහා එකී උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙන් පසු විශ්ලේෂණයක් කිරීමටත්, ඉන් පසුව ජාතික මට්ටමේ ඉල්ලුම් පාර්ශ්වීය සමීක්ෂණයක් පැවැත්වීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි දෙවන අදියරය, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය රාමුවක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර, එය 2026 වර්ෂයේ මැද භාගයේ දී ක්‍රියාත්මක කිරීමට නියමිතය. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයෙහි සහාය ඇතිව ගොඩනගන ලද තිරසර මූල්‍ය පෙරදැක්ම 2.0, 2025 වසරේ දී දියත් කෙරෙන අතර එය වසර පහක් තුළ ක්‍රියාවට නැංවීමට නියමිතය. එමඟින් මූල්‍ය අංශයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ද ඇතිව තිරසර මූල්‍යකරණයේ පාරිසරික හා සමාජයීය අංශ ආමන්ත්‍රණය කෙරෙනු ඇත.

4.2.5 රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම

ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සහ රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීම සඳහා රජය කැපවීමෙන් සහ නොපසුබට උත්සාහයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. වාර්ෂික රාජ්‍ය මූල්‍ය උපාය මාර්ග ප්‍රකාශනයක් සහ පස් අවුරුදු මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවක් ප්‍රකාශයට පත් කිරීම ඇතුළු රාජ්‍ය මූල්‍ය අංශයේ මෙහෙයුම්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත (රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත) යටතේ නියම කර ඇත. ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රමාණාත්මක ඉලක්ක සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි අවශ්‍යතා සමඟ සමපාත වන පරිදි, ආදායම් මත පාදක වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් මත පදනම්ව, වත්මන් රාජ්‍ය මූල්‍ය උපාය මාර්ගය පවත්වා ගෙන යනු ඇත. ඒ අනුව, රජයේ මැදි කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2025 සඳහා වන අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ දක්වා ඇති 2024-2029 මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවෙහි දක්වා ඇත. 2025 වසර තුළ දී රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 15.0%ක් දක්වා වැඩි කිරීමට සහ තවදුරටත් මැදි කාලීනව එය වැඩිදියුණු කර ගැනීමටත් ප්‍රාථමික වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 13.0%ට වඩා අඩුවෙන් පවත්වා ගැනීමටත් රජය අපේක්ෂා කරයි. සමස්ත අයවැය හිඟය 2026 වසරේ සිට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 5.0%ට වඩා අඩු මට්ටමක පවත්වා ගන්නා අතර අවම වශයෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2.3%ක ප්‍රාථමික අතිරික්තයක් 2025 සහ ඉන් ඉදිරියට පවත්වා ගැනීමට උත්සාහයන් ගනු ඇත. ණය මට්ටම් තිරසාර ගමන් මගකට ගෙන ඒමට සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය විනය පවත්වා ගැනීමෙන් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියම කර ඇති පරිදි ප්‍රාථමික වියදම් සඳහා වන රාජ්‍ය මූල්‍ය රීතියට අනුගත වීම සහ ප්‍රාථමික අතිරික්තයක් ළඟාකර ගැනීම ඉතා වැදගත්ය. ඒ අනුව, වත්මන් මැදි කාලීන රාජ්‍ය මූල්‍ය රාමුවට අනුව මධ්‍යම රජයේ ණය මැදි කාලීනව ක්‍රමයෙන් තිරසාර මට්ටමකට අඩු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ මාලාව ආර්ථික ස්ථාවරත්වය සහ දිගුකාලීන රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසාරභාවය සහතික කිරීම කෙරෙහි ධනාත්මක ලෙස බලපෑම් ඇති කරමින් පැවැතීම සැලකිය යුතු කරුණකි.

ඉදිරි කාලය තුළ රජයේ ආදායම් ඉලක්ක කරා ළඟා වීමට මෙන්ම රාජ්‍ය මූල්‍ය අංශයේ අවදානම් අවම කිරීමට දැනටමත් ක්‍රියාත්මක ප්‍රතිසංස්කරණ වැඩසටහනට අඛණ්ඩව ඉදිරියටත් පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාව මධ්‍යයේ, 2022 වසරේ මැද භාගයේ දී ආරම්භ කරන ලද ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය, සැලකිය යුතු සහ පැහැදිලිව පෙනෙන මට්ටමක ප්‍රතිඵල ලබා දීමට පටන් ගෙන තිබේ. වසර දෙකක් තුළ අඛණ්ඩව පැවති ධනාත්මක ප්‍රාථමික ශේෂ තත්ත්වය, බදු ආදායම් එකතු කිරීමේ සැලකිය යුතු වර්ධනය සහ වියදම් තාර්කීකරණය මඟින්, පසුගිය වසර දෙක තුළ රජයේ මූල්‍ය කටයුතු ශක්තිමත් වී ඇති අතර, එය මෑත ඉතිහාසයේ මින් පෙර දක්නට නොලැබූ ආකාරයේ ප්‍රවණතාවකි.


4

දැනටමත් ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇති බැවින්, බදු ආදායමේ ඉදිරි අපේක්ෂිත වර්ධනය බදු පරිපාලන ප්‍රතිසංස්කරණ තුළින් ලබා ගත යුතුය. මේ සම්බන්ධයෙන්, විශේෂයෙන් ම එකතු කළ අගය මත බදු (Value Added Tax) ගෙවීම් ඉහළ නැංවීම තුළින් බදු අනුකූලතාව වැඩි කිරීම ඉතා වැදගත් වේ. මීට අමතරව, රජයේ ඩිජිටල්කරණ ක්‍රියාවලියට සමගාමීව, සරල කරන ලද පුද්ගල බදු ගොනු කිරීම සඳහා මාර්ගගත ක්‍රමයක් හඳුන්වාදීම, ආදායම් පරිපාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හරහා බදු එකතු කිරීමේ ක්‍රියාවලීන් ඒකාබද්ධ කිරීම, මගින් ආදායම් එකතු කිරීම ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 15%ක ඉහළ බදු ආදායම් ඉලක්කය කරා ළඟා වීමට, වාහන ආනයනය සඳහා වන සීමා ලිහිල් කිරීමෙන් අපේක්ෂිත ආදායම ඇතුළුව, බදු එකතු කිරීම සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීම සඳහා ගන්නා මෙම පියවර අත්‍යවශ්‍යය. මීට අමතරව, රජය සතු ව්‍යවසායයන්හි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම, පරිපාලනය ශක්තිමත් කිරීම සහ ඒවායින් රාජ්‍ය මූල්‍ය අංශය වෙත ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන්වල අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් වේ. රජයේ අවිනිශ්චිත වගකීම් සහ රාජ්‍ය ව්‍යවසායයන් විසින් ණය ගැනීම් ඉහළ යෑම මගින් දේශීය මූල්‍ය පද්ධතියට ඇති විය හැකි පීඩනයන් වළක්වා ගැනීමට, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන මිල යාන්ත්‍රණයන් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

4.2.6 වර්ධන අපේක්ෂා

සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් වීමත් සමඟ, 2024 වසරේ දී සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළ ශ්‍රී ලංකා ආර්ථිකය, මැදි කාලීනව එහි ධනාත්මක වර්ධන ප්‍රවණතාව පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය, අඩු පොලී අනුපාතික හා අඩු උද්ධමන පරිසරය සහ ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂා, මැදි කාලීනව ආර්ථික වර්ධනය වේගවත් කරනු ඇත. විශේෂයෙන් ආනයන සීමා කිරීම් ඉවත් කිරීමෙන් පසු, යෙදවුම් ලබා ගැනීමේ හැකියාව වැඩිදියුණු වීමත් සමඟ, කර්මාන්ත අංශයෙහි වර්ධන ප්‍රවණතාව ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. අඩු පොලී අනුපාත, අමුද්‍රව්‍ය සඳහා ප්‍රවේශය වැඩිදියුණු වීම සහ විදේශ ප්‍රදාන මගින් මූල්‍යනය වන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සහ පෞද්ගලික අංශයේ හා නිවාස ඉදිකිරීම් නැවත ආරම්භ කිරීම හේතුවෙන්, විශේෂයෙන් ම ඉදිකිරීම් අංශය ස්ථාවර වර්ධනයක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තයේ වර්ධන අපේක්ෂා සහ අනෙකුත්

4.3 රූප සටහන: කාර්තුමය මුර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)



සටහන: පුරෝකථනයන් යනු පොරොන්දුවක් නොව බැඳීමක් නොවේ.
2025 වසරේ මාර්තු මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි.

ව්‍යාප්ති සටහන මගින් මූලික පුරෝකථන පථය වටා පවතින අවිනිශ්චිතතාව ක්‍රමයෙන් වර්ණය අඩු වන පරිදි වූ විශ්වාසීය පරාස භාවිත කිරීමෙන් විදහා දැක්වේ. රූපසටහනේ දැක්වෙන විශ්වාසීය ප්‍රාන්තර (Confidence Intervals, CI) මගින් මැදිකාලීන මූර්ත ද.දේ.නි.යේ වර්ධනය විචලනය විය හැකි අගය පරාසයන් දක්වයි. උදාහරණයක් ලෙස, තද නිල් පහැති ප්‍රදේශය 50% විශ්වාසීය ප්‍රාන්තරය නිරූපණය කරන අතර, එමගින් මූර්ත ද.දේ.නි.යේ වර්ධනයේ සැබෑ අගය මෙම පරාසය තුළ පැවතීමේ 50%ක සම්භාවිතාවක් පවතින බව හඟවනු ලබයි. විශ්වාසීය පරාසයන් මගින් සාර්ව ආර්ථික විචල්‍යවල දීර්ඝ කාලයකට පුරෝකථනය කිරීමේදී ඇතිවිය හැකි අවිනිශ්චිතතාවයේ ඉහළ යෑම පෙන්නුම් කරයි. තිහර වෙනස්වන ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා හමුවේ, මූලික පුරෝකථන මත විවිධ ඉහළ යෑමේ හා පහළ යෑමේ අවදානම් ඇති විය හැකිය. සලකන ලද උපකල්පනවල සහ විනිශ්චයන්හි සිදුවන සැලකිය යුතු වෙනස්කම් සැබෑ ආර්ථික වර්ධන මාර්ගය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැක.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ආශ්‍රිත අංශ වෙත ද එමගින් ඇති කරන ධනාත්මක බලපෑම් හේතුවෙන්, කෙටි කාලීනව සිට මැද කාලීනව, සේවා අංශයේ ඉදිරි ප්‍රවණතා ද යහපත් මට්ටමක පවතිනු ඇත. කෙසේ වෙතත්, 2024 වසරේ අග භාගයේ සහ 2025 වසරේ මුල් භාගයේ ඇති වූ කාලගුණික බාධා හේතුවෙන් කෘෂිකාර්මික අංශය සැලකිය යුතු පසුබෑමකට මුහුණ දුන් අතර, එය එම අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න අපේක්ෂිත ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන් සංකෝචනාත්මක බලපෑමක් ආර්ථිකය කෙරෙහි ඇති කළ හැකිය. එමෙන්ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මගින් වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සහ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඵලදායී පෞද්ගලික අංශය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යොමු වීම හේතුකොට ගෙන, ආර්ථික කාර්යක්ෂමතාව සහ ආයෝජකයන්ගේ සුභවාදී අපේක්ෂා ඉහළ නැංවීම මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය නිසා ඇතිවන ආර්ථික සංකෝචන බලපෑම් සීමා විය හැකිය.

අභියෝගාත්මක ගෝලීය පරිසරය තුළ, තිරසාර ලෙස හා සාර්ව සහභාගීත්වයෙන් යුක්තව ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීමට, දීර්ඝ කළක් තිස්සේ සිදුකිරීමට බලාපොරොත්තු වූ ප්‍රතිසංස්කරණ, වඩාත් ශක්තිමත් ලෙස ඉදිරි කාලය තුළ දී සිදු කළ යුතුය. විශේෂයෙන් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති සහ භූ ආර්ථික ඛණ්ඩනය හේතුවෙන් විදේශ අංශයෙන් මතුවන බාධා දිගට ම පවතී. අපනයන විවිධාංගීකරණය, ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම් ජාලය ශක්තිමත් කිරීම සහ කලාපීය ඒකාබද්ධතාවය වැනි ශ්‍රී ලංකාවේ අපනයන කාර්ය සාධනය වැඩිදියුණු කළ හැකි පියවර හරහා විදේශීය අංශයේ කම්පන වලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට ගන්නා ප්‍රයත්නයන්ගේ වැදගත්කම මෙයින් අවධාරණය කෙරේ. වයස්ගත ජනගහනය වැඩි වන පසුබිමක් තුළ, විශේෂයෙන් ම තරුණ හා පුහුණු ශ්‍රමිකයන් ද ඇතුළුව, මෑත කාලීනව විදේශ රටවල් වෙත මෙරටින් සිදු වූ ශ්‍රම ගලනය ආර්ථිකයේ මානව ප්‍රාග්ධන පදනමට යම් අභියෝගයක් එල්ල කරයි. තවද, කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතීම හා උගත් තරුණ පිරිස් අතර ඉහළ විරැකියා අනුපාතය මගින් පිළිබිඹු වන පරිදි, ශ්‍රම සම්පත් උපරිමයෙන් භාවිත නොවීම (ඌන උපයෝජනය), ආර්ථිකය එහි උපරිම ප්‍රගතිය කරා ළඟා වීමට බාධා කරයි. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවේ වේගයෙන් ඉහළ යන වයස්ගත වන ජනගහනය ද සැලකිල්ලට ගනිමින්, මෙම ගැටලු විසඳීම සඳහා සුදුසු කෙටිකාලීන හා මැදකාලීන ප්‍රතිපත්තිමය පියවර අවශ්‍ය වනු ඇත. ආර්ථිකයේ වර්ධන ගම්‍යතාවයට සම්පූර්ණයෙන් ම දායක වීමට ඇති හැකියාව සීමා කරමින්, ජනගහනයෙන් සැලකිය යුතු කොටසක් දරිද්‍රතාවයේ මායිමේ ජීවත් වන බැවින්, සමාජ ආරක්ෂණ ජාලය සවිමත් කිරීම සඳහා නුදුරු කාලීනව ප්‍රමුඛතාවය දිය යුතුය. ජාත්‍යන්තර කම්කරු නීති හා සමපාත වන පරිදි, පවතින කම්කරු නීති විධිමත් හා නවීකරණය කිරීම මගින් එක් සේවක නීති රාමුවකට අනුගත කිරීම හරහා කම්කරු ඵලදායීතාව සහ සමස්ත ආර්ථික කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අපේක්ෂා කළ හැකිය. තවද, අපේක්ෂිත ඉඩම් ප්‍රතිසංස්කරණ, කර්මාන්ත සංවර්ධනය සඳහා නව ජාතික ප්‍රතිපත්තිය සහ රටේ නිෂ්පාදන හා විදේශීය අංශවල ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීමේ මැදි කාලීන උපායමාර්ගික සැලැස්ම මෙන්ම ඩිජිටල් ආර්ථිකයක් ගොඩ නැංවීම සඳහා රජයේ ඇති ශක්තිමත් සැලසුම්, ශ්‍රී ලංකාව නව මානයකට ඔසවා තැබීමට ඒකාබද්ධව සහාය වනු ඇත. මීට අමතරව, අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය සහ පර්යේෂණ සඳහා ආයෝජනය කිරීම මානව සම්පත්වල විභවතාව ළඟා කරගැනීමට ඉතා වැදගත් වන අතර, තාක්ෂණික දියුණුව හරහා විවිධ අංශවල ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා නවෝත්පාදනයන් දියුණු කිරීම අවශ්‍ය වේ. එමෙන්ම, වඩා හොඳ සම්පත් බෙදී යාමක් සහ සේවා සැපයීම සහතික කිරීම සඳහා රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතා ගැටලු විසඳීම ඉතා වැදගත් වේ. තවද, ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා ආයතනික ප්‍රතිසංස්කරණ හරහා හිතකර ආයෝජන වාතාවරණයක් නිර්මාණය කිරීම ඉතා වැදගත් වේ. දරිද්‍රතාවයේ විෂම චක්‍රයෙන් මිදීමට හැකියාව ලබා දෙමින්, සමාජයේ වරප්‍රසාද නොලත් කොටස්වලට ඉහළ ආදායම් මට්ටමක් කරා ළඟා වීම සඳහා ආර්ථික අන්තර්ගතභාවය පුළුල් කිරීම සහ බලගැන්වීම කෙරෙහි මෙම ක්‍රියාමාර්ග මගින් අවධානය යොමු කළ යුතුය. තවද, ප්‍රතිපත්ති අනුකූලතාව සහ නිශ්චිතභාවය, තිරසර ලෙස ආර්ථික වර්ධනය පවත්වා ගැනීම සහ ආයෝජක විශ්වාසය ගොඩනැගීම සඳහා තීරණාත්මක වේ. පාලනයේ පවතින පද්ධතිමය දුර්වලතා, දූෂණය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ ගැටලු නිසි කලට විසඳීම, සාර්ව සහභාගීත්වයකින් යුතු තිරසර වර්ධන මාවතක ආර්ථිකය ඉදිරියට යාම සහතික කිරීම සඳහා අතිශයින් වැදගත් වේ.

4.3. සමාප්ති සටහන්

ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික සමෘද්ධිය බොහෝ දුරට රඳා පවතින්නේ වෙහෙස වී ඇති කරගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ වර්ධනය ඉලක්ක කරගත් සුදුසු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම මතය. එකිනෙකට නොගැළපෙන ප්‍රතිපත්ති සහ නැවත නැවතත් ප්‍රතිපත්ති ආපසු හැරවීම් හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය අවස්ථා ගණනක දී ම වසර ගණනාවක් ආපස්සට ගමන් කර ඇත. මෑත දී ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් සිදු වූ ආර්ථික පසුබෑම, පුරවැසියන්ට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා සහ ඉහළ ගොස් ඇති ආර්ථික දුර්වලතා නිසා නවවුරටත් ප්‍රතිපත්තිමය වැරදි සිදු කිරීමට කිසිදු ඉඩක් නොමැත. රාජ්‍ය මූල්‍ය හා ණය තිරසාරභාවය ඇති කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය හා වර්ධනයට බලපෑම් ඇති කරන දිගු කාලීන ව්‍යුහාත්මක බාධක නිවැරදි කිරීම සඳහා අවශ්‍ය රාමුවක්

4

වත්මන් ප්‍රතිසංස්කරණ ප්‍රයත්න මගින් සැපයේ. මෙම පසුබිම තුළ, ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට දිගු කාලීන ප්‍රතිලාභයක් සහතික කිරීම සඳහා, දැනට ක්‍රියාත්මක වන සාර්ව ආර්ථික ගැළපුම් සහ වර්ධනය වැඩිදියුණු කරන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැඩසටහන දැඩි කැපවීමකින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වනු ඇත. විශේෂයෙන් ආරක්ෂණවාදී ප්‍රතිපත්ති සහ ගෝලීය වශයෙන් භූ ආර්ථික බෙදී යෑම් වැනි නීවූ වූ අවහිරතා, ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ අවදානම තවත් උග්‍ර කළ හැකිය. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන විවිධාංගීකරණය සහ ගෝලීය හා කලාපීය ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම තුළින් විදේශීය අංශයේ කාර්ය සාධනය හා ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමේ වැදගත්කම මෙමගින් නැවත අවධාරණය කෙරේ. මෙය විදේශ විනිමය ඉපැයීමේ ධාරිතාව වැඩිදියුණු කිරීම සහතික කරනු ඇති අතර, බාහිර ස්වාරක්ෂක තවදුරටත් ගොඩනැගීමට සහාය සපයයි. මේ අතර, අර්බුදයෙන් පසු සමයේ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්වීමේ තිරසාරභාවය රඳා පවතින්නේ නිෂ්පාදන සහ විදේශ විනිමය උත්පාදනය කරන අංශ සඳහා විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රටට ඇති හැකියාව මතය. විදේශීය මෙන්ම දේශීය ආයෝජකයින් වෙනුවෙන්, දූෂණ අවදානම්වලින් තොර, සාධාරණ සහ ආරක්ෂිත ව්‍යාපාරික පරිසරයක් සහතික කිරීම සහ කාර්යක්ෂම නෛතික පද්ධතියක් ඇති කිරීම සඳහා, ව්‍යාපාර සඳහා සුදුසු පරිසරය වැඩිදියුණු කිරීමේ කඩිනම් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. විශේෂයෙන් නාක්ෂණය භාවිතා කිරීම, ඩිජිටල් අන්තර්ගතභාවය සහ කුසලතා වර්ධනය හරහා සිදු කෙරෙන ව්‍යුහාත්මක ආර්ථික පරිවර්තන ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ආර්ථිකයේ වර්ධන විභවය පුළුල් කිරීම සඳහා ඉතා වැදගත් වේ. දිගු කාලීන රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම සඳහා රජයට ඉතා කුඩා රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ කටයුතු කිරීමට සිදු වී ඇති බැවින්, කෙටි හා මැදි කාලීනව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ඇති ඉඩ ප්‍රස්තා සීමිතය. එබැවින්, ස්ථාවර ප්‍රතිපත්ති සහ අවශ්‍ය නෛතික, නියාමන සහ ආයතනික සහයෝගය තුළින් පෞද්ගලික අංශයේ සහභාගීත්වයට සහාය දැක්වීම මගින් ආර්ථික ප්‍රසාරණය උත්ප්‍රේරණය කිරීම අත්‍යවශ්‍ය වේ. එම නිසා, මෙම අපේක්ෂිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම, දේශීය ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා අනිශයින් ම වැදගත් වන අතර, සාර්ව සහභාගීත්වයකින් යුතුව, තිරසාර ආර්ථික වර්ධනයක් කරා රට ගෙනයාමට එය මග පාදනු ඇත.

4

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය[1]

	සංඛ්‍යා සටහන් අංක
1. මූර්ත අංශය	1 - 5
2. විදේශීය අංශය	6 - 14
3. රාජ්‍ය මූල්‍ය අංශය	15 - 16
4. මුදල් සහ මූල්‍ය අංශය	17 - 21

[1] සංඛ්‍යාලේඛන පරිශිෂ්ටයේ මාර්ගගත සංස්කරණය Excel පැතුරුම්පත් ආකෘතියෙන් ලබා ගත හැකි අතර එහි අමතර දත්ත අන්තර්ගත වේ.

යොමුව - ප්‍රධාන මෙනුව → ප්‍රකාශන → ආර්ථික සහ මූල්‍ය වාර්තා → වාර්ෂික ආර්ථික විවරණය → වාර්ෂික ආර්ථික විවරණය 2024 → සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

බර සහ මිණුම්

පරිවර්තන සාධක

බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක

අක්කර 1	=	හෙක්ටයාර (හෙ.) 0.405
රාත්තල් 1	=	කිලෝග්‍රෑම් (කි.ග්‍රෑ.) 0.454
දිගු ටොන් 1 (රා. 2,240)	=	මෙට්‍රික් ටොන් (මෙ.ටො.) 1.016
හොණ්ඩර 1	=	කිලෝග්‍රෑම් 50.802
සැතපුම් 1	=	කිලෝමීටර් (කි.මී.) 1.609
දිගු ටොන් සැතපුම් 1	=	මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1.635
අක්කරයකට රාත්තල් 1	=	හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1.121
අක්කරයකට හොණ්ඩර 1	=	හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 125.535
ඒ.රා. පයින්ට් 1	=	ලීටර් 0.568
ඒ.රා. ගැලුම් 1	=	ලීටර් 4.55

මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක

හෙක්ටයාර 1	=	අක්කර 2.471
කිලෝග්‍රෑම් 1	=	රාත්තල් 2.205
මෙට්‍රික් ටොන් 1 (කිලෝග්‍රෑම් 1,000)	=	දිගු ටොන් 0.984
මීටර් 1	=	අඩි 3.281
කිලෝමීටර් 1	=	සැතපුම් 0.621
මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1	=	දිගු ටොන් සැතපුම් 0.612
ලීටර් 1	=	ඒ.රා. පයින්ට් 1.76 = ඒ.රා.ගැ. 0.220
හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1	=	අක්කරයට රාත්තල් 0.892

වී/සහල් පරිවර්තන

වී බුසල් 1 (රාත්තල් 46)	=	කිලෝග්‍රෑම් 20.87
වී මෙට්‍රික් ටොන් 1	=	වී බුසල් 47.92
	=	සහල් මෙට්‍රික් ටොන් 0.7
සහල් මෙට්‍රික් ටොන් 1	=	වී බුසල් 68.46
	=	වී මෙට්‍රික් ටොන් 1.43
අක්කරයකට වී බුසල් 1	=	හෙක්ටයාරයට වී කිලෝග්‍රෑම් 51.55

පොල්/පොල් නිෂ්පාදන පරිවර්තන

කපාපු පොල් (දිසිඳි පොල්) මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 8,960
පොල් තෙල් මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 9,250
කොප්පරා මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 5,500
උකු කළ පොල් කිරි මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 4,000

දළ දේශීය නිෂ්පාදිතය (අ)

රුපියල් මිලියන

ශීර්ෂය	පවත්නා වෙළෙඳපොළ මිල අනුව			2015 ස්ථාවර මිල අනුව		
	2022 (ආ)	2023 (ආ)(ඇ)	2024 (ඇ)	2022 (ආ)	2023 (ආ)(ඇ)	2024 (ඇ)
නිමැවුම් ප්‍රවේශය						
භෝග වගාව	1,365,181	1,382,566	**1,605,597**	619,859	634,559	**633,802**
කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදන	258,897	382,836	**419,913**	83,307	83,587	**95,363**
වන වගාව, ගස් කැපීම, වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන හා පැළ බෝ කිරීම	143,234	162,991	**171,304**	84,958	80,838	**78,702**
ධීවර කර්මාන්තය	265,532	299,168	**284,672**	123,128	126,838	**129,237**
පතල් හා කැණීම් කර්මාන්තය	450,746	401,517	**438,501**	198,613	154,303	**184,166**
ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය	1,703,904	1,923,757	**2,052,231**	869,371	899,739	**954,409**
රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය	1,516,471	1,432,788	**1,607,073**	511,860	450,438	**500,210**
වෙනත් නිෂ්පාදන කර්මාන්ත	1,508,290	1,592,886	**1,600,388**	581,223	550,105	**590,681**
විදුලිය නිෂ්පාදනය, ජලය බෙදාහැරීම සහ මලාපවහන කටයුතු	71,457	298,251	**290,787**	220,188	213,563	**226,202**
ඉදිකිරීම් කර්මාන්තය	1,921,358	1,420,359	**1,643,766**	927,319	734,821	**877,339**
තොග හා සිල්ලර වෙළඳාම	3,343,974	3,861,799	**3,960,306**	1,675,528	1,677,941	**1,700,232**
මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම	2,643,732	3,519,313	**3,614,826**	1,384,456	1,443,136	**1,485,924**
නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවා	350,893	517,808	**695,044**	166,030	209,172	**274,921**
තොරතුරු හා සන්නිවේදන	575,546	559,246	**606,743**	416,328	361,295	**379,388**
මූල්‍ය සහ රක්ෂණ සේවා	1,701,400	2,133,830	**2,218,227**	607,931	578,719	**571,587**
නිවාස අයිතිය හා දේපළ වෙළෙඳාම සහ වෘත්තීයමය සේවා	1,461,506	1,713,972	**1,774,120**	802,923	775,823	**806,648**
රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ සේවා	1,947,558	2,055,872	**2,231,482**	1,169,143	1,162,341	**1,149,427**
වෙනත් පුද්ගලික සේවා	1,707,403	2,046,582	**2,081,811**	995,147	998,069	**1,012,933**
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**22,937,082**	**25,705,544**	**27,296,792**	**11,437,311**	**11,135,286**	**11,651,170**
භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර	1,126,080	1,714,260	**2,601,772**	723,576	742,270	**821,299**
වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය	**24,063,162**	**27,419,804**	**29,898,564**	**12,160,886**	**11,877,556**	**12,472,469**
වියදම් ප්‍රවේශය						
පරිභෝජනය	18,358,203	21,270,344	**22,623,016**	9,411,644	9,184,423	**9,477,522**
පෞද්ගලික	16,618,427	19,411,969	**20,542,233**	8,054,637	7,901,238	**8,218,038**
රාජ්‍ය	1,739,776	1,858,375	**2,080,782**	1,357,007	1,283,184	**1,259,484**
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය	6,562,445	6,741,168	**8,060,344**	2,749,748	2,592,539	**3,138,991**
වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදම	**24,920,648**	**28,011,512**	**30,683,360**	**12,161,392**	**11,776,962**	**12,616,512**
භාණ්ඩ හා සේවා අපනයන	5,187,912	5,672,921	**5,945,724**	2,370,906	2,684,186	**3,019,623**
භාණ්ඩ හා සේවා ආනයන	6,045,399	6,264,628	**6,730,520**	2,371,412	2,583,592	**3,163,665**
වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය	**24,063,162**	**27,419,804**	**29,898,564**	**12,160,886**	**11,877,556**	**12,472,469**
ආදායම් ප්‍රවේශය						
සේවක ආදායම්	6,688,065	7,270,257	**7,645,273**	3,516,316	3,404,991	**3,529,469**
දළ මෙහෙයුම් අතිරික්තය	7,625,306	8,631,351	**9,217,760**	3,603,536	3,423,908	**3,643,586**
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	6,735,091	7,656,785	**8,236,091**	3,025,375	2,855,691	**3,087,518**
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	890,215	974,567	**981,669**	578,161	568,217	**556,068**
දළ මිශ්‍ර ආදායම	8,567,000	9,621,580	**10,196,011**	4,280,357	4,224,267	**4,399,538**
ශුද්ධ මිශ්‍ර ආදායම	8,219,750	9,232,833	**9,804,865**	4,107,414	4,054,659	**4,232,693**
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	347,250	388,747	**391,146**	172,943	169,608	**166,845**
නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද වෙනත් බදු	56,712	182,356	**237,748**	37,103	82,120	**78,577**
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**22,937,082**	**25,705,544**	**27,296,792**	**11,437,311**	**11,135,286**	**11,651,170**
භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු - සහනාධාර	1,126,080	1,714,260	**2,601,772**	723,576	742,270	**821,299**
වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය	**24,063,162**	**27,419,804**	**29,898,564**	**12,160,886**	**11,877,556**	**12,472,469**

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ජනගහනය, ශ්‍රම බලකාය සහ විදේශ සේවා නියුක්තිය

ශීර්ෂය	2020	2021	2022	2023	2024 (අ)
ජනගහනය					
මධ්‍ය වාර්ෂික ජනගහනය, පුද්ගලයින් දහස් (ආ)	21,919	22,156	22,181	22,037	**21,916**
පුරුෂ	10,613	10,727	10,740	10,670	**10,611**
ස්ත්‍රී	11,306	11,429	11,441	11,367	**11,305**
මධ්‍ය වාර්ෂික ජනගහන වර්ධනය, %	0.5	1.1	0.1	-0.6	**-0.5**
ජන ඝනත්වය, ව.කි.මී. 1කට පුද්ගලයන්	350	353	354	351	**352 (ඇ)**
ශ්‍රම බලකායෙහි ප්‍රවණතා (ඈ)					
ශ්‍රම බලකාය, '000	8,467	8,553	8,547	8,408	**8,316 (ඉ)**
ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය (ඊ)	50.6	49.9	49.8	48.6	**47.4 (ඉ)**
ස්ත්‍රී /පුරුෂ භාවය අනුව					
පුරුෂ	71.9	71.0	70.5	68.6	**ලැ.නො.**
ස්ත්‍රී	32.0	31.8	32.1	31.3	**ලැ.නො.**
රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය					
රාජ්‍ය අංශයේ සේවකයන්	14.8	15.2	15.1	14.6	**ලැ.නො.**
පෞද්ගලික අංශයේ සේවකයන්	42.7	42.0	42.9	44.5	**ලැ.නො.**
සේව්‍යයන්	2.5	2.7	2.9	2.6	**ලැ.නො.**
ස්වයං රැකියාවල නියුතු වූවන්	33.2	33.4	33.1	32.8	**ලැ.නො.**
ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන්	6.8	6.6	5.9	5.5	**ලැ.නො.**
එකතුව	100.0	100.0	100.0	100.0	**ලැ.නො.**
ආර්ථික ක්‍රියාකාරීත්වය අනුව සේවා නියුක්තිය (උ)					
කෘෂිකර්මාන්ත	27.1	27.3	26.5	26.1	**ලැ.නො.**
කර්මාන්ත	26.9	26.0	26.5	25.5	**ලැ.නො.**
සේවා	46.0	46.7	47.0	48.4	**ලැ.නො.**
සේවා වියුක්ති අනුපාතිකය, ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස	5.5	5.1	4.7	4.7	**4.4 (ඉ)**
ස්ත්‍රී /පුරුෂ භාවය අනුව					
පුරුෂ	4.0	3.7	3.7	3.6	**ලැ.නො.**
ස්ත්‍රී	8.5	7.9	6.5	7.0	**ලැ.නො.**
තරුණ සේවා වියුක්ති අනුපාතිකය (වයස අවු. 15-24)	26.5	26.5	22.8	23.0	**ලැ.නො.**
විදේශ සේවා නියුක්තිය					
විදේශීය රැකියා සංඛ්‍යාව	53,711	122,264	310,953	297,656	**314,828**
ස්ත්‍රී/පුරුෂ භාවය, ප්‍රතිශතයක් ලෙස					
පුරුෂ	60.5	66.3	60.1	55.3	**59.3**
ස්ත්‍රී	39.5	33.7	39.9	44.7	**40.7**
ශ්‍රම කාණ්ඩ, ප්‍රතිශතයක් ලෙස					
පුහුණු ශ්‍රමිකයන්	74.0	74.1	66.1	70.1	**72.2**
අඩු පුහුණු ශ්‍රමිකයන්	26.0	25.9	33.9	29.9	**27.8**

(අ) තාවකාලික

(ආ) 2012 ජන හා නිවාස සංගණනය පදනම් කොටගෙන සකස්කර ඇත.

(ඇ) ජනගහන ඝනත්වය ගණනය කරනු ලබන්නේ මධ්‍ය වාර්ෂික ජනගහනය රටේ මුළු භූමි ප්‍රමාණයෙන් බෙදීමෙනි. ශ්‍රී ලංකා මිහින්දෝරු දෙපාර්තමේන්තුව 2024 වසරේ දී රටේ ප්‍රමාණය වර්ග කිලෝමීටර 67,240 (භූමි ප්‍රමාණය: වර්ග කිලෝමීටර 62,302) දක්වා නැවත ගණනය කරන ලද අතර, එය මීට පෙර වර්ග කිලෝමීටර 65,610 (භූමි ප්‍රමාණය: වර්ග කිලෝමීටර 62,705) ලෙස වාර්තා විය.

(ඈ) අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය

(ඉ) කාර්තු හතරෙහි සාමාන්‍යය

(ඊ) කුටුම්බ ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස ශ්‍රම බලකාය

(උ) ජාත්‍යන්තර ප්‍රමිත කර්මාන්ත වර්ගීකරණය 4 වන සංශෝධනය මත පදනම් වේ.

ලැ.නො. - ලැබී නොමැත.

මූලයන්: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

මූර්ත අංශය

3 වැනි සංඛ්‍යා සටහන

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100)

කාලපරිච්ඡේදය		දර්ශකය		මාසික වෙනස (%)		වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%)		වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස (%)	
		කො.පා.මි.ද.	මූලික කො.පා.මි.ද.	කො.පා.මි.ද.	මූලික කො.පා.මි.ද.	කො.පා.මි.ද.	මූලික කො.පා.මි.ද.	කො.පා.මි.ද.	මූලික කො.පා.මි.ද.
2024	ජනවාරි	200.7	176.2	2.9	2.1	6.4	2.2	14.2	11.3
	පෙබරවාරි	200.6	177.2	0.0	0.6	5.9	2.8	11.3	8.5
	මාර්තු	196.7	177.3	-1.9	0.1	0.9	3.1	8.0	6.1
	අප්‍රේල්	195.2	177.3	-0.8	0.0	1.5	3.4	5.7	4.4
	මැයි	194.1	177.0	-0.6	-0.2	0.9	3.5	3.9	3.3
	ජූනි	195.6	177.4	0.8	0.2	1.7	4.4	3.1	2.8
	ජූලි	194.7	177.9	-0.5	0.3	2.4	4.4	2.8	2.7
	අගෝස්තු	191.1	177.3	-1.8	-0.3	0.5	3.6	2.5	2.7
	සැප්තැම්බර්	190.9	177.6	-0.1	0.2	-0.5	3.3	2.4	2.8
	ඔක්තෝබර්	189.9	177.5	-0.5	-0.1	-0.8	3.0	2.2	2.9
	නොවැම්බර්	189.4	177.1	-0.3	-0.2	-2.1	2.7	1.7	3.1
	දෙසැම්බර්	191.7	177.1	1.2	0.0	-1.7	2.7	1.2	3.3

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

4 වැනි සංඛ්‍යා සටහන

ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100)

කාලපරිච්ඡේදය		දර්ශකය		මාසික වෙනස (%)		වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස (%)		වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස (%)	
		ජා.පා.මි.ද.	මූලික ජා.පා.මි.ද.	ජා.පා.මි.ද.	මූලික ජා.පා.මි.ද.	ජා.පා.මි.ද.	මූලික ජා.පා.මි.ද.	ජා.පා.මි.ද.	මූලික ජා.පා.මි.ද.
2024	ජනවාරි	215.0	193.9	3.0	2.2	6.5	2.2	13.4	12.3
	පෙබරවාරි	214.5	194.6	-0.2	0.4	5.1	2.7	10.2	9.2
	මාර්තු	210.0	194.5	-2.1	-0.1	2.5	3.4	7.2	6.5
	අප්‍රේල්	208.2	193.9	-0.9	-0.3	2.7	3.0	5.2	4.6
	මැයි	206.3	193.6	-0.9	-0.2	1.6	3.1	3.7	3.3
	ජූනි	208.1	193.7	0.9	0.1	2.4	3.9	3.0	2.7
	ජූලි	206.9	193.7	-0.6	0.0	2.5	3.0	2.9	2.5
	අගෝස්තු	204.1	193.0	-1.4	-0.4	1.1	2.3	2.8	2.3
	සැප්තැම්බර්	203.1	192.5	-0.5	-0.3	-0.2	1.9	2.7	2.3
	ඔක්තෝබර්	202.1	192.4	-0.5	-0.1	-0.7	1.7	2.5	2.4
	නොවැම්බර්	202.4	192.2	0.1	-0.1	-1.7	1.5	2.2	2.5
	දෙසැම්බර්	204.6	192.1	1.1	-0.1	-2.0	1.3	1.6	2.5

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වැටුප් ප්‍රමාණ දර්ශක

	දර්ශකය		වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස (%)	
	නාමික	මූර්ත (අ)	නාමික	මූර්ත (අ)
රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) (ආ)				
2020	114.6	94.8	9.2	2.9
2021	114.6	88.7	0.0	-6.4
2022	133.1	70.5	16.1	-20.6
2023	133.1	58.1	0.0	-17.5
2024 (ඇ)	**157.8**	**67.9**	**18.5**	**16.8**
විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) (ඈ)				
2020	4,282.0	88.8 (ඉ)	0.2	-4.2
2021	7,469.5	146.0 (ඉ)	74.4	64.3
2022	8,198.6	112.9 (ඉ)	9.8	-22.7
2023	8,232.9	93.0 (ඉ)	0.4	-17.6
2024 (ඇ)	**8,239.7**	**92.0 (ඉ)**	**0.1**	**-1.1**
අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) (ඊ)				
2020	112.7	102.6	6.4	0.2
2021	123.1	104.7	9.2	2.1
2022	153.3	88.3	24.5	-15.7
2023	170.8	82.0	11.4	-7.1
2024 (ඇ)	**181.1**	**85.6**	**6.0**	**4.4**

(අ) ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) මත පදනම් වේ.

(ආ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2016 පෙබරවාරි 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මඟින් රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහයට සිදුකරන ලද වෙනස්කම් ග්‍රහණය කරගැනීම සඳහා රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 වසරේ සිට 2016 වසරට යාවත්කාලීන කරන ලදී. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්ති ව්‍යුහය පිළිබඳ දත්ත, ජනලේඛණ හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 නොවැම්බර් මස පවත්වන ලද රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශවල සේවා නියුක්තිය පිළිබඳ සංගණනයෙන් ලබා ගන්නා ලදී.

(ඇ) තාවකාලික

(ඈ) 1978 දෙසැම්බර් 31 වන දින සේවයේ යෙදී සිටි සංඛ්‍යාව පදනම් කොටගත් බර තැබීම් මත දර්ශක අංක ගණනය කරනු ලැබේ. දර්ශක අංක ගණනය කිරීම සඳහා යොදාගෙන ඇත්තේ පඩි පාලක සභා මඟින් අනුමත කළ විවිධ කර්මාන්තවල අවම වැටුප්ය.

(ඉ) කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2006/07=100) මත පදනම් වේ.

(ඊ) අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් හා රැකියා ව්‍යුහයේ මෑතකාලීනව සිදු වූ වෙනස්කම් නිරූපණය කිරීමේ අරමුණින් අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ පදනම් වර්ෂය 2012 සිට 2018 දක්වා යාවත්කාලීන කරන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ පද්ධතිය මඟින් රැස් කරනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් භාවිතා කරමින් දර්ශක අගය ගණනය කරනු ලැබේ. පදනම් කාලපරිච්ඡේදයේ සේවා නියුක්ති ව්‍යුහය පිළිබඳ දත්ත, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේ දී පවත්වන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණවලින් ලබාගන්නා ලදී.

අපනයන සංයුතිය

වටිනාකම එ.ජ.ඩොලර් මිලියන වලිනි

කාණ්ඩය	2020	2021	2022	2023	2024 (අ) වටිනාකම	2024 (අ) දායකත්වය (%)	වාර්ෂික වෙනස්වීම (%) 2023/2024
කෘෂිකාර්මික අපනයන	**2,336.2**	**2,729.5**	**2,568.0**	**2,566.5**	**2,774.5**	**21.7**	**8.1**
තේ	1,240.9	1,324.4	1,258.8	1,309.9	**1,435.9**	**11.2**	**9.6**
කුළුබඩු	333.5	454.8	368.7	392.9	**454.7**	**3.6**	**15.7**
පොල්	345.2	425.2	400.3	336.8	**416.5**	**3.3**	**23.7**
මුහුදු ආහාර	189.8	274.1	269.0	262.2	**233.0**	**1.8**	**-11.2**
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	134.7	148.8	178.8	180.9	**154.2**	**1.2**	**-14.8**
එළවළු	36.6	28.5	26.7	27.7	**28.5**	**0.2**	**3.1**
රබර්	30.1	42.2	41.4	28.0	**26.0**	**0.2**	**-7.4**
සකස් නොකළ දුම්කොළ	25.5	31.6	24.4	28.1	**25.7**	**0.2**	**-8.4**
කාර්මික අපනයන	**7,672.0**	**9,702.0**	**10,465.3**	**9,277.7**	**9,946.9**	**77.9**	**7.2**
රෙදිපිළි හා ඇඟලුම්	4,423.1	5,435.1	5,952.0	4,878.9	**5,061.0**	**39.6**	**3.7**
බනිජතෙල් නිෂ්පාදිත	373.6	506.4	568.0	539.4	**1,063.5**	**8.3**	**97.2**
රබර් නිෂ්පාදිත	786.1	1,050.4	977.0	902.2	**975.6**	**7.6**	**8.1**
ආහාර, පාන වර්ග හා දුම්කොළ	464.0	586.9	519.5	539.3	**651.5**	**5.1**	**20.8**
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	337.5	500.9	580.9	598.2	**485.5**	**3.8**	**-18.8**
මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ	181.5	276.7	450.6	500.0	**381.9**	**3.0**	**-23.6**
රසායනික නිෂ්පාදිත	172.7	223.2	223.5	193.5	**234.1**	**1.8**	**21.0**
මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	110.9	156.4	176.7	178.3	**186.8**	**1.5**	**4.8**
සත්ත්ව ආහාර	102.9	149.4	170.5	145.6	**133.4**	**1.0**	**-8.3**
දැව හා කඩදාසි නිෂ්පාදිත	99.3	129.9	136.9	114.0	**123.6**	**1.0**	**8.4**
ප්‍රවාහන උපකරණ	71.4	148.2	129.3	149.3	**107.0**	**0.8**	**-28.3**
සම් භාණ්ඩ සංචාරක භාණ්ඩ හා පාවහන්	53.9	58.4	85.8	71.2	**62.2**	**0.5**	**-12.7**
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	176.3	78.6	60.9	56.3	**53.8**	**0.4**	**-4.4**
මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත	47.9	50.0	53.1	55.1	**47.5**	**0.4**	**-13.9**
පිගන්මැටි නිෂ්පාදිත	24.0	37.4	38.1	34.0	**32.1**	**0.3**	**-5.6**
වෙනත් කාර්මික අපනයන	247.0	314.1	342.4	322.5	**347.3**	**2.7**	**7.7**
බනිජමය අපනයන	**25.1**	**44.5**	**50.0**	**38.5**	**24.5**	**0.2**	**-36.2**
වර්ග නොකළ අපනයන	**14.1**	**22.6**	**23.2**	**28.0**	**26.1**	**0.2**	**-6.6**
මුළු අපනයන	**10,047.4**	**12,498.6**	**13,106.4**	**11,910.7**	**12,772.0**	**100.0**	**7.2**

(අ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් බනිජ තෙල් අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන සංයුතිය

වටිනාකම ඒ.ජ.ඩොලර් මිලියන වලිනි

කාණ්ඩය	2020	2021	2022	2023	2024 (අ)		වාර්ෂික වෙනස්වීම (%) 2023/2024
					වටිනාකම	දායකත්වය (%)	
පාරිභෝගික භාණ්ඩ	**3,401.7**	**3,848.7**	**2,813.0**	**3,043.9**	**3,465.7**	**18.4**	**13.9**
ආහාර හා පාන වර්ග	**1,554.4**	**1,666.5**	**1,607.9**	**1,693.0**	**1,914.3**	**10.2**	**13.1**
එළවළු (ආ)	352.9	384.3	318.4	358.6	**446.0**	**2.4**	**24.4**
සීනි හා රසකැවිලි	277.1	288.8	257.8	435.5	**389.5**	**2.1**	**-10.6**
තෙල් සහ මේද	106.9	184.1	43.9	133.9	**247.9**	**1.3**	**85.1**
කිරි ආශ්‍රිත නිෂ්පාදිත	333.8	317.7	225.3	273.7	**239.7**	**1.3**	**-12.4**
ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත	33.6	97.4	430.5	116.9	**163.2**	**0.9**	**39.6**
මුහුදු ආහාර	188.6	122.3	66.4	79.4	**118.8**	**0.6**	**49.5**
කුළුබඩු	126.9	127.2	136.6	133.4	**115.7**	**0.6**	**-13.2**
වෙනත් ආහාර හා පාන වර්ග	134.7	144.7	128.9	161.6	**193.6**	**1.0**	**19.8**
වෙනත් පාරිභෝගික භාණ්ඩ	**1,847.3**	**2,182.2**	**1,205.1**	**1,350.9**	**1,551.4**	**8.2**	**14.8**
බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත	595.5	882.5	533.4	667.0	**575.6**	**3.1**	**-13.7**
ඇඟලුම් හා උපාංග	200.7	221.3	215.6	170.0	**225.8**	**1.2**	**32.8**
ගෘහ උපකරණ	174.2	257.1	85.5	72.4	**155.6**	**0.8**	**115.1**
විදුලි සංදේශ උපකරණ	268.4	382.9	69.0	98.8	**141.9**	**0.8**	**43.6**
ගෘහ හා දැව භාණ්ඩ	146.9	161.2	116.3	122.1	**138.1**	**0.7**	**13.1**
රබර් ආශ්‍රිත නිෂ්පාදන	58.3	102.3	60.6	59.2	**84.9**	**0.5**	**43.4**
ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය	52.6	69.7	46.5	55.0	**75.2**	**0.4**	**36.8**
පෞද්ගලික රථවාහන	282.9	12.8	11.7	27.7	**66.2**	**0.4**	**139.2**
වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ	67.9	92.5	66.7	78.7	**88.0**	**0.5**	**11.8**
අන්තර් භාණ්ඩ	**9,076.5**	**12,308.9**	**12,438.8**	**11,006.6**	**11,914.5**	**63.2**	**8.2**
ඉන්ධන	2,542.6	3,742.9	4,896.8	4,702.6	**4,354.4**	**23.1**	**-7.4**
බොරතෙල්	583.0	625.1	483.8	1,137.5	**863.6**	**4.6**	**-24.1**
පිරිපහදු කළ ඛනිජතෙල්	1,742.2	2,840.0	4,048.2	3,095.4	**3,173.3**	**16.8**	**2.5**
ගල්අඟුරු	217.3	277.8	364.8	469.8	**317.4**	**1.7**	**-32.4**
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	2,335.1	3,066.9	3,065.2	2,371.2	**2,847.1**	**15.1**	**20.1**
රසායනික නිෂ්පාදිත	831.5	1,074.4	966.2	814.7	**987.0**	**5.2**	**21.2**
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	540.2	765.7	650.8	474.6	**609.3**	**3.2**	**28.4**
මූල ලෝහ	460.3	866.4	323.2	313.8	**473.4**	**2.5**	**50.8**
කඩදාසි හා ඍන කඩදාසි	383.1	468.9	465.9	412.4	**447.0**	**2.4**	**8.4**
තිරිඟු හා ඉරිඟු	384.4	418.3	303.1	338.2	**382.5**	**2.0**	**13.1**
රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	218.7	400.7	334.7	200.2	**316.5**	**1.7**	**58.1**
වාහන හා යන්ත්‍රසූත්‍ර කොටස්	239.4	349.4	254.9	232.5	**301.1**	**1.6**	**29.5**
කෘෂිකාර්මික යෙදවුම්	200.8	264.2	214.5	233.8	**263.8**	**1.4**	**12.9**
ආහාර සැකසුම්	235.1	269.9	189.7	171.3	**223.0**	**1.2**	**30.1**
දියමන්ති හා අගනා ගල් වර්ග	117.2	143.6	203.8	268.4	**216.9**	**1.2**	**-19.2**
පොහොර	258.9	158.2	275.9	235.0	**201.1**	**1.1**	**-14.4**
ඛනිජ නිෂ්පාදිත	168.9	158.9	123.7	80.9	**127.2**	**0.7**	**57.3**
වෙනත් අන්තර් භාණ්ඩ	160.3	160.4	170.4	156.9	**164.1**	**0.9**	**4.6**
ආයෝජන භාණ්ඩ	**3,563.2**	**4,462.7**	**3,030.5**	**2,744.6**	**3,448.2**	**18.3**	**25.6**
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	2,176.1	2,809.5	1,969.0	1,867.6	**2,363.1**	**12.5**	**26.5**
ගොඩනැගිලි ද්‍රව්‍ය	1,035.6	1,248.9	926.3	775.1	**927.2**	**4.9**	**19.6**
ප්‍රවාහන උපකරණ	348.3	398.5	132.1	98.5	**154.8**	**0.8**	**57.1**
ඛණිජ ආයෝජන භාණ්ඩ	3.2	5.8	3.0	3.3	**3.1**	**0.0**	**-6.6**
වර්ග නොකළ ආනයන	**14.0**	**17.1**	**8.8**	**16.0**	**13.0**	**0.1**	**-18.8**
මුළු ආනයන	**16,055.4**	**20,637.4**	**18,291.0**	**16,811.1**	**18,841.4**	**100.0**	**12.1**
ඛණිජ නොවන ආනයන	**13,512.8**	**16,894.6**	**13,394.2**	**12,108.5**	**14,487.0**	**76.9**	**19.6**

(අ) තාවකාලික
(ආ) පරිප්පු, එෑණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව
ශ්‍රී ලංකා අයි.ඕ.සී. පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන වෙළඳ දිශාව (අ)

වටිනාකම එ.ජ.ඩොලර් මිලියන වලිනි

රටවල්	2020		2021		2022		2023		2024 (ආ)	
	වටිනාකම	දායකත්වය (%)	වටිනාකම	දායකත්වය (%)	වටිනාකම	දායකත්වය (%)	වටිනාකම	දායකත්වය (%)	වටිනාකම	දායකත්වය (%)
2024 වසරේ ප්‍රධානතම අපනයන ගමනාන්ත										
ඇමෙරිකා එක්සත් ජනපදය	2,500	24.9	3,108	24.9	3,321	25.3	2,769	23.2	**2,911**	**22.8**
එක්සත් රාජධානිය	908	9.0	938	7.5	963	7.3	849	7.1	**906**	**7.1**
ඉන්දියාව	606	6.0	829	6.6	860	6.6	853	7.2	**884**	**6.9**
ජර්මනිය	570	5.7	758	6.1	742	5.7	589	4.9	**629**	**4.9**
ඉතාලිය	455	4.5	581	4.6	641	4.9	675	5.7	**596**	**4.7**
නෙදර්ලන්තය	290	2.9	426	3.4	428	3.3	343	2.9	**393**	**3.1**
එක්සත් අරාබි එමීර් රාජ්‍යය	190	1.9	287	2.3	355	2.7	364	3.1	**337**	**2.6**
කැනඩාව	213	2.1	316	2.5	361	2.8	294	2.5	**321**	**2.5**
චීනය	225	2.2	277	2.2	255	1.9	279	2.3	**273**	**2.1**
ප්‍රංශය	184	1.8	252	2.0	249	1.9	304	2.5	**264**	**2.1**
වෙනත් අපනයන ගමනාන්ත										
ඕස්ට්‍රේලියාව	175	1.7	260	2.1	256	2.0	228	1.9	**248**	**1.9**
ඔස්ට්‍රියාව	33	0.3	44	0.4	51	0.4	45	0.4	**42**	**0.3**
අසර්බයිජානය	53	0.5	49	0.4	69	0.5	51	0.4	**65**	**0.5**
බංගලාදේශය	153	1.5	222	1.8	211	1.6	174	1.5	**241**	**1.9**
බෙල්ජියම	295	2.9	341	2.7	310	2	223	2	**251**	**2.0**
බ්‍රසීලය	43	0.4	60	0.5	65	0	73	1	**85**	**0.7**
චිලී	55	0.5	56	0.4	46	0	47	0	**57**	**0.4**
හොංකොං	108	1.1	179	1.4	168	1.3	173	1.4	**134**	**1.1**
ඉන්දුනීසියාව	35	0.3	49	0.4	50	0.4	50	0.4	**46**	**0.4**
ඉරානය	79	0.8	78	0.6	82	0.6	43	0.4	**68**	**0.5**
ඉරාකය	110	1.1	177	1.4	156	1.2	129	1.1	**160**	**1.3**
අයර්ලන්තය	60	0.6	75	0.6	96	0.7	81	0.7	**89**	**0.7**
ඊශ්‍රායලය	103	1.0	234	1.9	189	1.4	180	1.5	**118**	**0.9**
ජපානය	188	1.9	227	1.8	231	1.8	190	1.6	**180**	**1.4**
ජෝර්දානය	37	0.4	47	0.4	62	0.5	88	0.7	**73**	**0.6**
කෙන්යාව	25	0.2	40	0.3	44	0.3	44	0.4	**49**	**0.4**
